321 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 321 - இல. 11
Volume 321 - No. 11

2025 ඔක්තෝබර් 09 වන බ්‍රහස්පතින්දා
2025 ஒக்ரோபர் 09, வியாழக்கிழமை
Thursday, 09th October, 2025

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

## அதிகார அறிக்கை

## OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
වරප්‍රසාද: 2025.05.28 දින "අද" පුවත් පත් වාර්තාව [තීරුව 1741]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1741]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1743-1788]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ නාරිවේද ඒකකය ක්‍රියාත්මක කිරීම [තීරුව 1788]
විවාහ ලියාපදිංචි කිරීමේ නීතියේ ඇති නොගැළපීම් නිසා මුස්ලිම්වරුන් මුහුණ දෙන ගැටලු [තීරුව 1791]

**ස්වාධීන කොමිෂන් සභාවල පරිපාලන රාමුව සහ වගවීම:**
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 1794]

**එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 60වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සම්මත කරගත් යෝජනාව:**
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1798]

**ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයට එරෙහි චෝදනා:**
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1809]

**වරප්‍රසාද:**
2025.10.08 දින ගරු අග්‍රාමාත්‍යතුමියට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය හරහා පැහැදිලි කිරීමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීම [තීරුව 1812]

**සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 1815]

**වරප්‍රසාද යෝජනා:**
2025.07.17 දින කෝප් කමිටුවේදී කරන ලද චෝදනාව [තීරුව 1816]

**කල්තැබීමේ යෝජනාව:**
"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාවට නැංවීම [තීරු 1817-1929]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 1929-1936]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
சிறப்புரிமை: 2025.05.28ஆந் திகதிய “அத” பத்திரிகை அறிக்கை [ப: 1741]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1741]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1743-1788]

**தனி அறிவித்தல் மூல வினா:**
கிளிநொச்சி மாவட்ட பொது வைத்தியசாலையின் பெண் நோயியல் அலகை இயக்குதல் [ப: 1788]
திருமணப் பதிவு தொடர்பான சட்டங்களிலுள்ள முரண்பாடுகளால் முஸ்லிம்கள் எதிர்நோக்கும் பிரச்சினைகள் [ப: 1791]

**சுயாதீன ஆணைக்குழுக்களின் நிருவாகக் கட்டமைப்பு மற்றும் பொறுப்புக்கூறல்:**
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 1794]

**ஐ.நா. மனித உரிமைகள் பேரவையின் 60ஆவது கூட்டத்தொடரில் நிறைவேற்றப்பட்ட இலங்கை தொடர்பான பிரேரணை:**
வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று [ப: 1798]

**கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சுக்கெதிரான குற்றச்சாட்டுகள்:**
கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரினது கூற்று [ப: 1809]

**சிறப்புரிமை:**
2025.10.08ஆம் திகதி மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கப்பட்ட வினாமூலம் விளக்கம் பெறும் வாய்ப்பை இழத்தல் [ப: 1812]

**சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1815]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
2025.07.17ஆம் திகதி 'கோப்' குழுவில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு [ப: 1816]

**ஒத்திவைப்புப் பிரேரணை:**
"வளமான நாடு - அழகான வாழ்க்கை" கொள்கைப் பிரகடனத்தை நடைமுறைப்படுத்தல் [ப: 1817-1929]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப: 1929-1936]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Privilege: News Report in "Ada" Newspaper of 28.05.2025 [Col. 1741]

SECTORAL OVERSIGHT COMMITTEE REPORT [Col. 1741]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1743-1788]

QUESTION BY PRIVATE NOTICE:
Operationalization of Gynaecology Unit at Kilinochchi District General Hospital [Col. 1788]
Issues Faced by Muslims Due to Inconsistencies in Marriage Registration Laws [Col. 1791]

ADMINISTRATIVE FRAMEWORK AND ACCOUNTABILITY OF INDEPENDENTCOMMISSIONS:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 1794]

RESOLUTION ON SRI LANKA ADOPTED AT 60TH SESSION OF UNITED NATIONS HUMAN RIGHTS COUNCIL:
Statement by Minister of Foreign Affairs, Foreign Employment and Tourism [Col. 1798]

ALLEGATIONS AGAINST MINISTRY OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES:
Statement by Minister of Fisheries, Aquatic and Ocean Resources [Col. 1809]

PRIVILEGE:
Loss of Opportunity to Seek Clarification Through Question Posed to Hon. Prime Minister on 08.10.2025 [Col. 1812]

SOCIAL SECURITY CONTRIBUTION LEVY (AMENDMENT) BILL:
Read the First time [Col. 1815]

PRIVILEGE MOTIONS:
Allegation Made at COPE Held on 17.07.2025 [Col. 1816]

ADJOURNMENT MOTION:
Implementation of Manifesto “A Thriving Nation, A Beautiful Life” [Cols. 1817-1929]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1929-1936]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ඔක්තෝබර් 09වන බ්‍රහස්පතින්දා***
*2025 ஒக்ரோபர் 09, வியாழக்கிழமை*
*Thursday, 09th October, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m., MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### වරප්‍රසාද: 2025.05.28 දින "අද" පුවත් පත් වාර්තාව
### சிறப்புரிமை: 2025.05.28ஆந் திகதிய “அத” பத்திரிகை அறிக்கை
### PRIVILEGE: NEWS REPORT IN "ADA" NEWSPAPER OF 28.05.2025

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් හේවගේ මහතා විසින් 2025 ජූලි 09 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද -

(i) 2023 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2023 හා 2024 වර්ෂ සඳහා අම්පාර, ත්‍රිකුණාමලය, යාපනය, වවුනියාව, මන්නාරම, මුලතිව්, කිලිනොච්චිය සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වාර්ෂික කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ටී.බී. සරත් මහතා (නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரீ.பி. சரத் - வீடமைப்புப் பிரதி அமைச்சர்)
(The Hon. T.B. Sarath - Deputy Minister of Housing)

ගරු කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් දෙක මම පිළිගන්වමි.

(1) පොළොන්නරු, පුලස්තිගම, බීඕපී 400 ග්‍රාමීය බැංකුව ඉදිරිපිට යන ලිපිනයෙහි පදිංචි කේ.එම්. අනිල් ඉන්ද්‍රකුමාර කාරියවසම් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) හිඟුරක්ගොඩ, හරිත පෙදෙස, අංක 31 යන ලිපිනයෙහි පදිංචි කේ.ඩබ්ලිව්. තර්සි මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

Hon. Speaker, I present a petition from Mr. P.A.D.A. Gunathilaka of No 501/02, Galle Road, Panadura.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මාකෙවිට, තම්මිට, අංක 94/ඒ/සී/1 යන ලිපිනයෙහි පදිංචි ජී.එල්.ආර්. මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, පේරාදෙණිය, ගන්නෝරුව, රණබිම, අංක 439/7 යන ලිපිනයෙහි පදිංචි වලවේ දූරගේ සමන්ත විජේවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, මත්තේගොඩ, කුඩා මාදුව, අංක 203/01/ඊ යන ලිපිනයෙහි පදිංචි එල්. ඩී. ඩී. ස්වර්ණලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි දෙක සහ නළ පද්ධතිය: විස්තර
காங்கேசன்துறையிலுள்ள சீமெந்து கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான இரு எண்ணெய்த் தாங்கிகள் மற்றும் குழாய் அமைப்பு: விபரம்
TWO OIL TANKS AND PIPELINE IN KANKESANTHURAI OWNED BY CEMENT CORPORATION: DETAILS

18/2024

**1. ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව කන්කසන්තුරේ පිහිටා ඇති තෙල් ටැංකි දෙකක් සහ නළ පද්ධතියක් තිබෙන බව දන්නේද;

(ii) එම තෙල් ටැංකි දෙක හා නළ පද්ධතිය භාවිත කරන ලද රජයේ ආයතනය කවරේද;

(iii) එම තෙල් ටැංකි දෙක හා නළ පද්ධතිය භාවිත කිරීම වෙනුවෙන් සිමෙන්ති සංස්ථාවට අය විය යුතු මුදල කොපමණද;

(iv) එම මුදල අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காங்கேசன்துறையில் இலங்கை சீமெந்து கூட்டுத்தாபனத்துக்குச் சொந்தமான இரு எண்ணெய் தாங்கிகளும் குழாய் அமைப் பொன்றும் உள்ளது என்பதை அறிவாரா;

(ii) மேற்படி இரு எண்ணெய் தாங்கிகளையும் குழாய் அமைப்பையும் பயன்படுத்தும் அரச நிறுவனங்கள் யாவை;

(iii) மேற்படி இரு எண்ணெய் தாங்கிகளையும் குழாய் அமைப்பையும் பயன்படுத்துவதற்காகச் சீமெந்து கூட்டுத்தாபனத்துக்குக் கிடைக்கவேண்டிய பணத்தொகை யாது;

(iv) மேற்படி பணத்தொகையை அறவிடுவதற்காக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) whether he is aware that the Sri Lanka Cement Corporation has in its possession two oil tanks and a pipeline located in Kankesanthurai;

(ii) the government institution which had been using the two oil tanks and the pipeline concerned;

(iii) the amount of money that should be payable to the Cement Corporation for the use of the two oil tanks and the pipeline; and

(iv) the measures that will be taken to recover the aforesaid amount?

(b) If not, why?

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය නැඟුවාට බොහොම ස්තුතියි. මේ තුළ අපිට පෙර පව් පිළිබඳව තමයි කථා කරන්න තිබෙන්නේ. මේක ගොඩක් කාලයක් ඇදුණු ප්‍රශ්නයක්.

(අ) (i) ඔව්. ඒ පිළිබඳව අපි දැනුවත්.

(ii) ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම.

මුලින්ම ඛනිජ තෙල් සමාගම. ඊට පස්සේ තොග ගබඩා පර්යන්ත සමාගම.

(iii) 2025.07.31 දිනට අයවිය යුතු මුදල රු. 244,450,000කි.

(iv) ඉහත මුදල් අයකර ගැනීම සම්බන්ධව 2016 වර්ෂයේ සිට සාකච්ඡා වට 6ක් පවත්වා ඇත. මෙම සාකච්ඡා සඳහා මුදල් අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව යන ආයතන නියෝජනය කරමින් නිලධාරීන් සහභාගි වී ඇත.

කර්මාන්ත අමාත්‍යාංශය 2016 ඉඳලා මේ සම්බන්ධයෙන් විවිධ සාකච්ඡා පවත්වා කැබිනට් තීරණ සහ යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඉඩමේ ප්‍රශ්නයක් නිසා ඒ සේවාවට අවශ්‍ය කරන මුදල ගෙවීම පැහැර හැර තිබෙනවා, ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම.

තවද, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් 2016.09.13 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ලබා දුන් අංක. අමප/16/1891/746/001-1 හා 2016.10.11 දිනැති

තීරණය මඟින් පහත සඳහන් යෝජනාව සඳහා අනුමැතිය ලබා දී ඇත.

කන්කසන්තුරේ පිහිටා ඇති ඉන්ධන ගබඩා ටැංකි, නළ මාර්ග සහ ඊට සම්බන්ධ පහසුකම් සහිත අක්කර 6ක පමණ විශාලත්වයෙන් යුක්ත ඉඩම් කොටසේ අයිතිය පිළිබඳව නීතිමය ගැටලුවක් පවතින බැවින් මෙම තත්ත්වය නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව කිසියම් ගෙවීමක් 2010-2015 දක්වා කාලය වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු නම් එපරිද්දෙන්ම එම ගෙවීම සිදු කිරීම.

කෙසේ වෙතත්, තෙල් ටැංකි පිහිටි ඉඩමේ අයිතිය තහවුරු නොවන බව පෙන්වා දෙමින් ඉහත මුදල් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් මෙතෙක් ගෙවා නොමැත. නමුත් ඉහත සඳහන් තෙල් ටැංකි සහ නළ පද්ධතිය ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ඉදිකර ඇති බැවින් එම තෙල් ටැංකි භාවිත කිරීම වෙනුවෙන් ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම විසින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වෙත ගෙවීමක් කළ යුතු බව නිරීක්ෂණය වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, වර්තමාන රජය බලයට පත් වුණාට පසුව ආයතන ආයතන අතර ගැටලුවක් තිබුණු නිසා මේක ප්‍රමුඛතා ලැයිස්තුවේ ටිකක් පහළින් තිබුණු එකක්. 2025 ඔක්තෝබර් 24වැනි දා අපේ ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡාවක් කැඳවා තිබෙනවා, මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්නේ කොහොමද කියලා විමසන්න. එම නිසා මේ මුදල අය කර නොගැනීමට අපට අදහසක් නැහැ.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සාර්ථක පිළිතුරක් ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ සිද්ධි ඔය ආයතන දෙක අතර විතරක් නොවෙයි, රටේ ගොඩක් තැන්වල සිද්ධ වනවා. ශ්‍රීලන්කන් ගුවන් සමාගම ගැන හොයලා බැලුවොත්, පසුගිය කාලයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට රුපියල් බිලියන ගණනක් ගෙවීමට තිබුණා. මේ ආයතන අතර නිවැරදි ආකාරයෙන් ගනුදෙනු සිදු නොවීම සහ ඒවාට නිසි ක්‍රමවේදයක් නොමැති වීම හරහා අපි හිතන්නේ නැති තැනකට මේ ප්‍රශ්න තල්ලු වෙනවා. ඕනෑ නම් මම ඔබතුමාට කියන්නම්, අද -මේ මොහොතේත්- මෙන්න මේ සමහර ආයතනවල නිවැරදි ආකාරයෙන් ගනුදෙනු නොවීම නිසා අපට සිදු වන හානි ගැන. ඔබතුමාගේ පිළිතුර ආරම්භයේදීම කිව්වා, "පෙර පව්" කියලා. මේවා කරලා තිබෙන්නේ කවුද කියන එක හොයලා මේ ප්‍රශ්නවලට උත්තර හොයන්න ගියොත් අපට ඒක කරන්න වෙන්නේ නැහැ. ඇත්තටම ඉතින් පසුගිය කාලයේ අයාලෙ ගිය ආයතන ඕනෑ තරම් තිබෙනවා. ඒ අතර තමන් වෙනුවෙන් හදා ගත් සමහර ආයතනත් තිබෙනවා. මේ රටට වග කියන ආණ්ඩුව විධියට, මේ රටේ මිනිස්සුන්ගේ බලාපොරොත්තු ඔබතුමන්ලා ළඟ තිබෙන වෙලාවක, ඔබතුමන්ලා බලයට ඇවිල්ලා අවුරුද්දක් ගෙවිලා තිබෙන වෙලාවක මේ ප්‍රශ්නය අවසන් වෙන්න ඕනෑ නේද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? ඒ නිසා, ප්‍රස්තුත කාරණා වාගේ තිබෙන මේ ප්‍රශ්න ඉවර වෙන time frame එකක් අපට කියන්න පුළුවන්ද, මේ ටිකට අපි උත්තර හොයනවා කියලා? නැත්නම් ඔබතුමන්ලාගේ අවුරුදු 5ත් අවසන් වුණාම නැවත තව කවුරු හරි බලයට ඒවි, එහෙම වුණාම මේ රට හැදෙන්නේ නැහැ. ඔබතුමා තරුණ නියෝජ්‍ය ඇමතිවරයෙක්. ඔබතුමාගේ විෂය පථය තුළ ඔය වාගේ ප්‍රශ්න තවත් තිබෙනවා. මම පළමුවන අතුරු ප්‍රශ්නය ඔබතුමාගෙන් අහනවා. මේක ඔබතුමාට උත්තරයක් දෙන්න පුළුවන් එකක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්න අවසන් කිරීම සඳහා ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන වැඩසටහන මොකක්ද?

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ඔබතුමා කියන කාරණය හරියටම හරි. වෙච්ච දේවල් දැන් වැඩක් නැහැ. අපි කොහොමද දැන් මේ ප්‍රශ්න විසඳන්නේ කියන එක තමයි ප්‍රධාන දේ. මොකද අපට තිබෙන ආයතන පද්ධතිය ගත්තොත්, පෙර සිද්ධ වෙච්ච අක්‍රමිකතා - irregularities - නිසා ඇති වෙච්ච ප්‍රශ්න මේ තුළ තිබෙනවා. ප්‍රමුඛතා ලැයිස්තුවක් අනුව මේ හැම ආයතනයකම නිලධාරින්ගෙන් අපේ අමාත්‍යාංශය ඉල්ලා තිබෙනවා, මේ ආයතනවල පවතින නොවිසඳුණු ගැටලු සම්බන්ධව ලිස්ට් එකක් ලබා දෙන්න කියලා. ඒ නොවිසඳුණු ගැටලු සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්තුමිය විසින් ඒ අදාළ ආයතනවලට අලුතෙන් පත් කර සිටින සභාපතිවරුන්ට ලබා දීලා තිබෙනවා, KPIs, එහෙම නැත්නම් management agreement එකක්. ඒ වාගේම ඒ නොවිසඳුණු ගැටලු විසඳන එකත් ඔවුන්ගේ වගකීමක් බවට පත් කරලා තිබෙනවා.

මම ඔබතුමාට මේකත් එක්කම පුංචි උදාහරණයක් කියන්නම්. බීසීසී ලංකා ආයතනය විසින් නීති කටයුතු දෙපාර්තමේන්තුවට - Legal Affairs Department එකට - භාර දුන් ඉඩමක් තිබෙනවා. ඒකේ compensation එක රුපියල් බිලියන 6ක්. ඒක අවුරුදු ගාණක් තිස්සේ නොගෙවා තිබුණා. අපි මාස හයක් විතර සාකච්ඡා කරලා තමයි යම්කිසි එකඟතාවකට ආවේ ඊට අදාළ ගෙවීම් කර ගන්න. මේ විධියට ආයතන ආයතන අතර ගැටලු තිබෙනවා. කර්මාන්ත අමාත්‍යාංශයේ තිබෙන මේ වාගේ ගැටලු බහුතරයකට මේ වෙනකොට එක්කෝ සාකච්ඡා ආරම්භ කරලා තිබෙනවා, එහෙම නැත්නම් initiations අරගෙන තිබෙනවා. හිස්තැන් නැහැ. අපි Audit Reports refer කර තමයි කටයුතු කරන්නේ. ඒ ඒ ආයතනවල සභාපතිතුමන්ලාට අපි වගකීම් පවරා තිබෙනවා, ඒ ආයතන සුද්ධ කරන්න. ඉතින් ඒ සුද්ධ කරන ක්‍රියාවලිය තමයි යන්නේ; balance sheet එක clear කරගන්න ක්‍රියාවලිය තමයි යන්නේ. මොකද, එහෙම නැත්නම් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලට තමයි දැන් audit queries ඇවිල්ලා තිබෙන්නේ, ඔයගොල්ලන්ගේ වත්කමක් මෙහෙම භාවිත වෙලා තිබෙනවා, ඔයගොල්ලන් අයකරගෙන නැහැ කියලා. මේක අපේ අමාත්‍යාංශයේ විතරක් නොවෙයි, අනෙක් අමාත්‍යාංශවලත් තිබෙනවා. මේ සඳහා අපි කඩිනම් ක්‍රියාමාර්ග ගන්නවා. මේවා සාමූහික තීරණ. අමාත්‍යාංශ කිහිපයක් එකතු වෙලා ගන්න ඕනෑ තීරණ. මේකට Treasury එකත් සම්බන්ධ වෙනවා. ඒක අර effort එක මත තමයි ඉස්සරහට යන්නේ.

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය කඩදාසි කම්හල පිහිටා තිබෙනවා. මේ කම්හල ඉතිහාසයේදී මේ රටේ විශාල වශයෙන් කඩදාසි නිෂ්පාදනය කරන්න දායක වෙච්ච ආයතනයක්. එක් එක් ආණ්ඩුවල බල හුවමාරුවත් එක්ක දිගින් දිගටම මෙහි වෙනස්කම් සිදු වුණා. ඔබතුමාගේ අසුනට පසුපස අසුනේ සිටින ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාත් දන්නවා, මෑත කාලයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ හිටපු අමිල මීගස්දෙනිය කියන සභාපතිවරයා, මේ කඩදාසි කම්හල වසා තිබෙන වෙලාවේ කිසිම හිරිකිතයක් නැතිව ඒකේ සියලුම යකඩ ටික කපලා විකුණපු බව. ඒ ගැන පොලිස් දෙපාර්තමේන්තුවේ recordsවලත් තිබෙනවා. නමුත්, ඔහුට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනාත් නැහැ, මොකුත්

[ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා]

නැහැ. ඒ, පසුගිය කාලයේ බලය තිබෙනකොට බලයෙන් උමතු වෙලා කරපු දේවල්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, හැබැයි මේ වෙනකොට ඒ කාරණා එළියට එන්න ඕනෑය කියලා මම විශ්වාස කරනවා. ඇගේ හයිය අරගෙන මේ රටේ වටිනා සම්පත් තමයි ඒ නැති කළේ. මම නමත් එක්කම කිව්වේ ඔබතුමන්ලාට ඉදිරි පියවර ගන්න ලෙහෙසි වෙන්න. ඔබතුමාගේ සහයෝගයට ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගෙන් තොරතුරු ගන්නත් පුළුවන්.

මම ඒ ඇඹිලිපිටිය කඩදාසි කම්හල ගැන කථාව කියන ගමන් මේ කාරණයත් කියන්න කැමැතියි. ඔබතුමා නියෝජ්‍ය අමාත්‍යවරයා විධියටත්, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කැබිනට් අමාත්‍යවරයා විධියටත් කටයුතු කරන කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ තිබෙන සෙවනගල සීනි කම්හල පිළිබඳවත් අවධානමක් මතුව තිබෙනවා. මම දන්නේ නැහැ, සෙවනගල සීනි කම්හල ලාභ ලැබුවේ එතනෝල්වලින්ද, සීනිවලින්ද කියලා. නමුත්, අද වනකොට ඒ උක් ගොවීන්ට මෙතෙක් කල් නොතිබුණු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. ඒ මිනිස්සුන්ගේ උක් ගස් ටික කැපුවාට පස්සේ අද ඒ ටික ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. අද වනවිට ඔවුන්ට ඒ විශ්වාසය නැති වෙලා තිබෙනවා; සභාපතිතුමාගේ හැසිරීමත් එක්ක ඒ විශ්වාසය පලුදු වෙලා තිබෙනවා. යම් තැන්වල ඔබතුමන්ලාගේ ආණ්ඩුවටත්,- මම දන්නේ නැහැ, ආණ්ඩුව මේ සම්බන්ධයෙන් තීන්දුවක් අරගෙන තිබෙනවාද කියලා. ඒ ජනතාවට භයක් දැනිලා තිබෙනවා, මේ ආයතනය පෞද්ගලීකරණය වෙයි කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම ප්‍රදේශයේ මන්ත්‍රීවරයෙක් විධියට මම මේ ගැන සෘජු පිළිතුරක් ඔබතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට ඔබතුමා තමයි මීට කලින් ඔය කියපු එක්කෙනාට සභාපතිකම භාර දීලා ගිහින් තිබෙන්නේ. එහෙම නේද? ඒ කියන්නේ ඔය දැන්,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. මම කියන්නේ, අපි පක්ෂ දේශපාලනය පැත්තක තැබුවොත් මේ එකම system එකේ, එකම team එක කියන එකයි. මම ඔබතුමාට වැරැද්දක් කියනවා නොවෙයි. මේ වාගේ අක්‍රමිකතා තිබෙන තැන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්න ඕනෑ. දැන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ෆයිල් 21,000ක් තිබෙනවාය කියනවා. අපේ අමාත්‍යාංශය පැත්තෙනුත් අපේ සභාපතිවරු පෙර තිබුණු ගැටලුවලට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඔබතුමා අහපු නිශ්චිත කාරණය පිළිබඳව මට update එකක් දෙන්න බැහැ. නමුත්, සමස්තයක් විධියට ගත්තාම අපි දන්නා ව්‍යාපාර බොහොමයක ඇස් පනා පිට සිද්ධ වෙච්ච අක්‍රමිකතා සම්බන්ධයෙන් අපි files හදලා, ඒවා විමර්ශන සඳහා යොමු කරන්න කියලා සභාපතිවරුන්ට අවශ්‍ය කරන උපදෙස් ලබා දීලා තිබෙනවා, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි. ඒ වාගේම, සෙවනගල සීනි කර්මාන්තශාලාවේ තිබෙන ගැටලුව සම්බන්ධයෙන් ගත්තොත්, අපි වාගේම ඔබතුමාත් මේකේ තිබෙන සංකීර්ණතාව පිළිබඳව දන්නවා. ආණ්ඩුවේ අරමුණ තිබෙන්නේ මේක රජයේ ආයතනයක් විධියට පවත්වාගෙන යන්නයි. නමුත්, මේකේ තිබෙන ඉඩම් සහ උපයෝජනය නොවුණු සම්පත් සඳහා පෞද්ගලික ආයෝජන කැඳවන්න කියන එකඟතාව දැන් management decision එකක් විධියට ඇවිල්ලා තිබෙනවා. Public -private partnership එකකට ගිහිල්ලා මේ core business එක, sugar business එක improve කරගැනීමට අවශ්‍ය කරන ප්‍රාග්ධන ප්‍රමාණයක් අපට හොයා ගන්න පුළුවන්ද කියලා අපි බලනවා.

ඒ ප්‍රතිපත්තියම තමයි කර්මාන්ත අමාත්‍යාංශයේ තිබෙන අනෙකුත් ව්‍යාපාරවලටත් තිබෙන්නේ. ඒවා අද තිබෙන තත්ත්වයෙන් එහාට ගන්න නම් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයට යන්න ඕනෑ කියන ප්‍රතිපත්තියේ තමයි අපි වැඩ කරන්නේ. එතකොට ගොවීන්ට හෝ එහි සේවය කරන අයට කිසිම අවදානමක් නැහැ. අපි ඔවුන්ගේ රැකියා සුරක්ෂිතතාවත්, ඒ ගොවි බිම් ටිකේ නිෂ්පාදන ධාරිතාවත් ඇතුළු සමස්තය ආයතනයට අරගෙන මේක කාර්යක්ෂම කරන වැඩ පිළිවෙළට තමයි මේ වෙලාවේදී යොමු වෙලා තිබෙන්නේ. මම හිතන විධියට, කිසිම කෙනෙක් අවදානමට ලක් වෙන්න ඕනෑ නැහැ. මොකද, ගරු ජනාධිපතිතුමාත්, මුදල් අමාත්‍යාංශයත්, අපිත් අවබෝධයෙන් තමයි වසරක Development Plan එකක ඉදිරියට යන්නේ. ඒ වසරක Development Plan එක තුළ පුංචි පුංචි අර්බුද ආවා. ඒ අර්බුද ටික විසඳාගෙන මේ කර්මාන්තශාලා රජයේ අයිතිය සහිත කර්මාන්තශාලා විධියට තමයි ඉදිරියට පවත්වාගෙන යන්න සූදානමක් තිබෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -1272/2025- (1), ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதாரம் மற்றும் வெகுசன ஊடகப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health and Mass Media)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පළාත් පාලන ආයතනවලට තේරී පත් වූ රාජ්‍ය සේවකයින්: නෛතික තත්ත්වය
### உள்ளூராட்சி மன்றங்களுக்குத் தெரிவு செய்யப்பட்டுள்ள அரச உத்தியோகத்தர்கள்: சட்ட நிலைமை
### PUBLIC SERVANTS ELECTED TO LOCAL AUTHORITIES: LEGAL STATUS

1284/2025

**3. ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන මැතිවරණ නීතිය අනුව රජයේ සේවකයන්ට පළාත් පාලන මැතිවරණයක අපේක්ෂකයන් ලෙස තරග කළ හැකිද;

(ii) ඒ සඳහා දේශපාලන හිමිකම් සහිත රජයේ සේවකයන්ට වැටුප් රහිත නිවාඩු ලබා දෙන බවත්, හිමිකම් නොමැති රජයේ සේවකයන් සේවයෙන් ඉල්ලා අස්විය යුතු බවත් දන්නේද;

(iii) පළාත් පාලන ආයතනයක නගරාධිපති/සභාපති තනතුරට රජයේ සේවකයෙකු පත්වුවහොත්, එම ධුරය දරන කාල සීමාව තුළදී ඔහුට/ඇයට මැතිවරණයට පෙර කරන ලද රජයේ රැකියාවේ නියුක්ත විය හැකිද;

(iv) ඊට අදාළ නෛතික තත්ත්වය කවරේද;

(v) 2018 පළාත් පාලන මැතිවරණයේදී, මඩුල්ල සහ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් සිය සභාපති ධුර දරන ලද කාල සීමාව තුළදී, සභාපති ධුරයට හිමි වැටුපත්, රජයේ රැකියාවේ වැටුපත් යන දෙකම ලබා ගත් බව දන්නේද;

(vi) ඒ සඳහා ඔවුන්ට නෛතික හිමිකමක් තිබේද;

(vii) ඔවුන් වැටුප් දෙකම ලබා ගෙන තිබේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(viii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் உள்ளூராட்சித் தேர்தல் சட்டத்துக்கமைய அரச உத்தியோகத்தர்களுக்கு உள்ளூராட்சி மன்றத் தேர்தலில் வேட்பாளர் களாகப் போட்டியிட முடியுமா;

(ii) அதற்காக அரசியல் உரித்துடைய அரச உத்தியோகத்தர்களுக்குச் சம்பளமற்ற விடுமுறை வழங்கப்படுகிறது என்பதையும் அரசியல் உரித்தற்ற அரச உத்தியோகத்தர்கள் பதவி விலக வேண்டும் என்பதையும் அறிவாரா;

(iii) உள்ளூராட்சி மன்றமொன்றில் நகரபிதா/ தவிசாளர் பதவிக்கு அரச உத்தியோகத்தர் ஒருவர் தெரிவு செய்யப்பட்டால், அப்பதவியில் இருக்கும் காலப்பகுதியினுள் அவர் தேர்தலுக்கு முன்பு ஈடுபட்ட அரச உத்தியோகத்தில் ஈடுபட முடியுமா;

(iv) அதற்குரியதான சட்ட நிலைமை யாது;

(v) 2018 உள்ளூராட்சி மன்றத் தேர்தலின்போது, மடுல்ல மற்றும் சியம்பலாண்டுவ பிரதேச சபைகளின் தவிசாளர்கள் தமது தவிசாளர் பதவியை வகித்த காலப் பகுதியினுள், தவிசாளர் பதவிக்குரிய சம்பளம், அரச உத்தியோகத் துக்கான சம்பளம் என இரண்டையும் பெற்றுக் கொண்டார்கள் என்பதை அறிவாரா;

(vi) அதற்கான சட்ட உரித்து அவர்களுக்கு உள்ளதா;

(vii) அவர்கள் இரண்டு சம்பளங்களையும் பெற்றுக் கொண்டுள்ளார்கள் எனில், அது தொடர்பில் எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

(viii) இன்றேல், அதற்கான காரணங்கள் யாவை;

என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he state-

(i) whether public servants can contest as candidates at a Local Authorities Election as per the Local Authorities Election Law of Sri Lanka;

(ii) whether he is aware that the public officers entitled to political rights are provided unpaid leave while the public officers who are not so entitled must resign from service for contesting;

(iii) if a public officer is elected to the position of Mayor/Chairman of a local authority, whether he/she is allowed to engage in the government job that he/she held prior to the election while holding that position;

(iv) the legal status regarding that;

(v) whether he is aware that the Chairpersons of the Madulla and Siyambalanduwa Pradeshiya Sabhas elected at the 2018 local authorities election received both the salaries as Chairpersons and from the government job during the period they held the office of Chairperson;

(vi) whether they have a legal right to do so;

(vii) if they have received both salaries, the actions that have been taken in this regard; and

(viii) if not, the reasons for it?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්. ආයතන සංග්‍රහයේ XXXIIවැනි පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන අනුව.

(iii) ඔව්.

(iv) අංක 32/91(III) හා 2008.01.10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 12/2021 හා 2021/06/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධිත ආයතන සංග්‍රහයේ XXXIIවැනි පරිච්ඡේදය අනුව.

(v) ඔව්.

(vi) ඔව්.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 32/91(III) හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2021 අනුව නෛතික හිමිකමක් ලැබෙන අතර, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(III)හි 2.1 ඡේදයේ

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

විධිවිධාන අනුව පළාත් පාලන ආයතනවල නගරාධිපති හෝ සභාපති තනතුරට පත්ව ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරින්ට පළාත් පාලන ආයතනයේ කටයුතුවල නිරත වීම සඳහා මසකට දින 07ක් රාජකාරි නිවාඩු ලබා දී නිත්‍ය තනතුරේ සේවයේ යෙදීමට අවස්ථාව ලබා දීම හෝ එම නිවාඩු ලබා ගැනීමට මනාපය පළ නොකරන නිලධාරියෙකු නගරාධිපති හෝ සභාපති තනතුරකට පත් වුවහොත් හෝ එවන් තනතුරක වැඩ බැලීමට පත් වුවහොත් හෝ එම තනතුර දැරීමට නියමිත සම්පූර්ණ කාලයම වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමෙන් පසු තනතුර දැරීමේ හැකියාව ඇත.

සමෘද්ධි කොමසාරිස් ජනරාල්ගේ අංක DSD/HO/02/AD/05/පාර්ලි.ප්‍රශ්න හා 2025.10.07 දිනැති ලිපිය අනුව ඔවුන් දෙදෙනාට මසකට දින 07ක් සභාපති ධුරයෙහි රාජකාරි සඳහා රාජකාරි නිවාඩු ලබා දී ඇති අතර, ඉතිරි වැඩ කරන දිනවල සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිත්‍ය රාජකාරි කළ යුතු වේ.

තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/91(III)හි 2.1 ඡේදයෙහි විධිවිධාන අනුව ඔවුන්ට මසකට දින 07ක් රාජකාරි නිවාඩු ලබා දී අනෙකුත් වැඩ කරන දිනවල නිත්‍ය තනතුරේ සේවයේ යෙදීමට අනුමැතිය දී ඇති බැවින් රජයේ සේවයේ වැටුප හා සභාපති තනතුරට හිමි දීමනා ලබා ගැනීමේ බාධාවක් නොමැත.

(vii) අදාළ නොවේ.

(viii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ, පූර්ණ කාලීනව පළාත් පාලන ආයතනයක සභාපතිවරු හැටියට කටයුතු කරමින් සිටියදී තමන්ගේ රැකියාවෙත් කටයුතු කරමින් වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන්. සියඹලාණ්ඩුව සහ මඩුල්ල ප්‍රාදේශීය සභා දෙකේම සභාපතිවරු මේ ආකාරයට කටයුතු කරලා තිබෙනවා. ඒ ආකාරයට වැටුප් ලබා ගැනීම නීත්‍යානුකූල බවට තමයි ගරු අමාත්‍යතුමාගේ පිළිතුර ලැබෙන්නේ. නමුත් ගරු අමාත්‍යතුමනි, මේ දෙදෙනාම පූර්ණ කාලීනව සභාපති තනතුරේ සිටිමින් රැකියාව සඳහා කිසිදු ආකාරයක දායකත්වයක් ලබා නොදී මේ ආයතන දෙකෙන්ම වැටුප් ලබා ගත් බවටයි අපට තොරතුරු ලැබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් දැනට කිසියම් හෝ ආයතනයක විමර්ශනයක් පවතින්නේ ද යන කාරණාව මා දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, දැනට එබඳු විමර්ශනයක් පැවැත්වෙන බවට තොරතුරු ලැබෙන්නේ නැහැ. කෙසේ වුවත්, මම සඳහන් කළේ මේ තත්ත්වයට අදාළව දැනට පවතින නීතිමය රාමුව ඇතුළත ඔවුන්ට කටයුතු කළ හැකි ආකාරය පමණයි. විමර්ශනයක් දැනට සිදු වෙන බවට වාර්තා වෙන්නේ නැහැ.

**ගරු නීතිඥ සරත් කුමාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சரத் குமார)
(The Hon. Sarath Kumara, Attorney-at-Law)

ගරු අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පසුගිය කාල පරිච්ඡේදය පුරාම අපරාධ රාජ්‍යයක සෙවණේ හැදුණු වැඩුණු මහජන නියෝජිතයන් නීතියේ පාලනයට අභියෝග කරපු අවස්ථා ගණනාවක් අපි දැක්කා. මේ තත්ත්වය තුළ මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, මේ සිද්ධියේදී නීතිය අවභාවිත කිරීමක් සිදුව තිබෙන්නේද, නැද්ද කියන කාරණය.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

ගරු කථානායකතුමනි, මම කලිනුත් සඳහන් කළ ආකාරයට, පවතින නීතිමය ප්‍රතිපාදන ඇතුළේ කටයුතු කළ හැකි ආකාරය තමයි මම පිළිතුරේ අන්තර්ගත කළේ. කිසියම් ආකාරයකින් ඔවුන් නීතිය අවභාවිත කළ බවට යම් තොරතුරක් තිබෙනවා නම්, ඒ වාගේම නියමිත පරිදි තමන්ට නියමිත රාජකාරි ස්ථානයේ රාජකාරි කරලා නැත්නම් ඒ පිළිබඳව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් පරීක්ෂණයක් කරන්න පුළුවන්. ආයතනික මට්ටමින් පරීක්ෂණයක් කරන්නත් අපට බාධාවක් නැහැ. අපි ඒ අනුව කටයුතු කරන්න සූදානම්. සියලු තොරතුරු අප සතුව නැති බැවින් නීතිය අවභාවිත කර තිබෙනවාද කියන එක පිළිබඳව අර්ථ දැක්වීමක් කරන්න පුළුවන්කමක් නැහැ. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඊට අදාළ කරුණු ඉදිරිපත් කළොත්, විමර්ශනයක් කරන්න පුළුවන්.

## කෑගල්ල දිස්ත්‍රික්කයේ දුම්රිය ස්ථාන: සංවර්ධනය
### கேகாலை மாவட்டத்திலுள்ள புகையிரத நிலையங்கள்: அபிவிருத்தி
### RAILWAY STATIONS IN KEGALLE DISTRICT: DEVELOPMENT

1285/2025

**4. ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)

ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ ඇති දුම්රිය ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා කවරේද;

(iii) එම දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) කෑගල්ල දිස්ත්‍රික්කය තුළ දුම්රිය මාර්ගයේ නාය යාමේ අවදානම් ස්ථාන හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, ඒ සඳහා ලබාදී ඇති විසඳුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கேகாலை மாவட்டத்திலுள்ள புகையிரத நிலையங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அவை யாவை என்பதையும்;

(iii) மேற்படி புகையிரத நிலையங்களை அபிவிருத்தி செய்வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iv) கேகாலை மாவட்டத்திலுள்ள புகையிரத வீதியில் மண்சரிவு ஏற்படக்கூடிய அபாயத்துக்குரிய இடங்கள் அடையாளம் காணப்பட்டுள்ளனவா என்பதையும்;

(v) ஆமெனில், அதற்காக வழங்கப்பட்டுள்ள தீர்வுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways, Ports and Civil Aviation:

(a) Will he inform this House -

(i) the number of railway stations in the Kegalle District;

(ii) the names of such railway stations;

(iii) the steps that have been taken to develop the said railway stations;

(iv) whether any landslide-prone areas on the railway line in the Kegalle District have been identified; and

(v) if so, the solutions that have been provided for it?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways) \
ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) දුම්රිය ස්ථාන තුනයි. උප දුම්රිය ස්ථාන තුනයි.

(ii) දුම්රිය ස්ථාන

රඹුක්කන

කඩිගමුව

ඉහළ කෝට්ටේ

උප දුම්රිය ස්ථාන

තිස්මල්පොල

යටගම

ගංගොඩ

(iii) රඹුක්කන: රඹුක්කන දුම්රිය ස්ථානයේ දුම්රිය වේදිකාව නවීකරණය කිරීමට කටයුතු යොදා ඇති අතර, Clean Sri Lanka ව්‍යාපෘතිය යටතේ දුම්රිය ස්ථාන සියයක් සංවර්ධනය කිරීමට අදාළව රඹුක්කන දුම්රිය ස්ථානය නවීකරණය කිරීමද ඉදිරියේදී සිදු කෙරෙනු ඇත.

අපි ඉස්සෙල්ලාම තෝරා ගත්තේ දුම්රිය ස්ථාන සියයක් -තුන්සිය ගණනම නොවේ- පමණයි. අපි වැඩක් පටන් ගන්න ඕනෑ නිසා තමයි 100ක් තෝරා ගත්තේ. නමුත්, තව පෞද්ගලික ව්‍යවසායකයන් ඉදිරිපත් වෙනවා නම් ඕනෑ ප්‍රමාණයක් මේකට එකතු කරගන්න පුළුවන්.

කඩිගමුව: ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ - NBROහි - මැදිහත් වීම මත පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමක් විසින් කඩිගමුව දුම්රිය ස්ථානයේ ක්‍රියාත්මක කරනු ලබන ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නාය යෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ දුම්රිය වේදිකා දිගු කිරීම, මගී ගුවන් පාලමක් ඉදි කිරීම, එක් නිල නිවාසයක් සම්පූර්ණයෙන්ම ඉදි කිරීම, එක් නිල නිවාසයක් නවීකරණය කර අලුත්වැඩියා කිරීම, දුම්රිය ස්ථානයට අයත් ළිඳෙහි ගැඹුර වැඩි කිරීම, කානු පද්ධතිය සකස් කිරීම, පිවිසුම් මාර්ගය සකස් කිරීම හා භූමිය සකස් කිරීම ආදී සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

(iv) ඔව්. කෑගල්ල දිස්ත්‍රික්කය තුළ දුම්රිය මාර්ගයේ නාය යෑමේ ස්ථාන තුනක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ -NBRO- යටතේ ක්‍රියාත්මක ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නාය යෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය, එහෙම නැත්නම් Reduction of Landslide Vulnerability by Mitigation Measures Project - RLVMMP - මඟින් හඳුනා ගෙන ඇත. එනම්,

(i) කඩිගමුව දුම්රිය ස්ථානය අසල

(ii) කන්සලගමුව

(iii) තිස්මල්පොල

(v) කඩිගමුව දුම්රිය ස්ථානය අසල: කඩිගමුව දුම්රිය ස්ථානය ආශ්‍රිතව නාය යෑමේ අවදානම අවම කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය -NBRO- මඟින් ක්‍රියාත්මක කරනු ලබන ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නාය යෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය - RLVMMP - මඟින් අවශ්‍ය සියලු කටයුතු මේ වන විට අවසන් කර ඇත.

කන්සලගමුව: ප්‍රධාන දුම්රිය මාර්ගයේ රඹුක්කන හා කඩිගමුව දුම්රිය ස්ථාන අතර නාය යෑමේ අවදානමක් සහිත "සැතපුම් 53 දම්වැල් 70" ස්ථානය ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නාය යෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය - RLVMMP - මඟින් අවශ්‍ය ඉදිකිරීම් සිදු කර නාය යෑමේ අවදානම අවම කර ඇත.

ඊළඟට, අවසානයට හඳුනාගත්තු, තිස්මල්පොල තිබෙනවා.

තිස්මල්පොල: මේ වන විට මෙම ස්ථානයේ නාය යෑමේ අවදානමක් පවතින බවට හඳුනාගෙන ඇති අතර, ස්ථායීකරණ ක්‍රමවේද මඟින්, නාය යෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය -RLVMMP - මඟින් නාය යෑමේ අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දුම්රිය සේවාව අපේ රටේ ආර්ථිකයටත්, මගී ජනතාවටත් විශාල සේවයක් සපයනවා. නමුත්, පසුගිය කාල පරිච්ඡේදය තුළ ඒකට අදාළ නවීකරණයන් සිදු වෙලා තිබුණේ නැහැ. ඒ නිසා විශාල ගැටලු ප්‍රමාණයකට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ විශේෂයෙන්ම මගීන් මුහුණ දෙනවා.

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

දුම්රිය සේවය ගත්විට, මගී ප්‍රවාහනය වාගේම වැදගත් එකක් තමයි, අපේ රටේ භාණ්ඩ ප්‍රවාහනයට තිබුණු තැන. සුදු අධිරාජ්‍යවාදින් විසින් තමයි දුම්රිය දෙපාර්තමේන්තුව ආරම්භ කර තිබෙන්නේ. ඒ කාලයේ දුම්රිය වැඩිපුරම භාවිත කරලා තිබෙන්නේ භාණ්ඩ ප්‍රවාහනය සඳහායි. මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, නව ආර්ථික වැඩ පිළිවෙළක් යටතේ ශ්‍රී ලංකා දුම්රිය සේවය මඟින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඔබතුමන්ලා ඉදිරියේදී ගනු ලබන්නේ මොන වාගේ ක්‍රියාමාර්ගද කියලා.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම දුම්රිය සේවාව ආරම්භ වන්නේ, මගී ප්‍රවාහනයට වඩා භාණ්ඩ ප්‍රවාහනය පදනම් කරගෙනයි. මේ වන විට දුම්රිය සේවය දායකත්වය දෙන්නේ දළ වශයෙන් සියයට 2ක පමණ භාණ්ඩ ප්‍රවාහනයක් සඳහායි. එනම්, වාර්ෂිකව භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය සේවය දායක වන්නේ, මෙට්‍රික්ටොන් 1.99 - 2.1 වාගේ ප්‍රමාණයකින්. ඒක වැඩි කර ගැනීම සඳහා 2025 අය වැයෙනුත් යෝජනාවක් ඉදිරිපත් වුණා, තඹුත්තේගම logistics hub එකක් හැටියට develop කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව. රුපියල් මිලියන 100ක වියදමින් ඒකේ feasibility study එක මේ වන විට ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම, අපි ඒ railway line එක කන්කසන්තුරේ ඉන්ධන ගබඩා සංකීර්ණය දක්වා දීර්ඝ කරනවා. එතැනින් ඛනිජ තෙල් ප්‍රවාහනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එහි survey කටයුතු මේ දවස්වල සිදු කෙරෙමින් පවතිනවා. ඒ වාගේම ඒක KKS Port එක දක්වා දීර්ඝ කිරීම සඳහා වන survey කටයුතුත් මේ දවස්වල සිදු කෙරෙමින් පවතිනවා. ඒ හරහා භාණ්ඩ ප්‍රවාහනය සඳහා - විශේෂයෙන් උතුරු පැත්තේ ඉඳලා භාණ්ඩ ප්‍රවාහනය සඳහා - ඒ line එක ඉදිරියේදී සම්පූර්ණයෙන් වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ survey කටයුතු තමයි මේ දවස්වල සිදු වෙමින් යන්නේ.

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ දුම්රිය දෙපාර්තමේන්තුව ගත්තොත්, මගී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය වාගේම වැදගත් අංශයක් සංචාරක කර්මාන්තය ආශ්‍රිතවත් තිබෙනවා. ඇත්තටම සංචාරක කර්මාන්තයේ පුළුල් වීමක් ඉදිරි වසරවලදී විශාල වශයෙන් සිදු වෙනවා. ඒත් එක්කම සංචාරකයන්ට ගමනාගමනය සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සූදානම් කරන්නේ කොහොමද, ඒ සඳහා තිබෙන සැලසුම් මොනවාද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ප්‍රධාන වශයෙන් ගත්තාම, සංචාරකයෙකු ලංකාවට ආවාම ලංකාවේ කොච්චර දවසක් ගත කරනවාද, ඒ ගත කරන කාලය තුළ දවසකට කොච්චර මුදල් ප්‍රමාණයක් වියදම් කරනවාද කියන කාරණය මත අප ලබන ආදායම තීරණය වෙනවා. දැනට දළ වශයෙන් ඩොලර් 172ක පමණ මුදලක් තමයි දෛනිකව වියදම් කරන්නේ. Tourist stayed days බැලුවොත්, මා හිතන විධියට 8.5ක් වාගේ ප්‍රමාණයක් වෙන්නේ. ලංකාවට එන සංචාරකයෙක් තමන්ගේ journey එක තුළ සාමාන්‍යයෙන් ඩොලර් 1,500 - 2,000 වාගේ ප්‍රමාණයක් වියදම් කරනවා. හැබැයි ඒ සංචාරකයාම Maldives ගියොත්, ඩොලර් 4,500ක් විතර වියදම් කරනවා. එහෙම නම්, අපි ලංකාවේ activities වැඩි කරන්න ඕනෑ. අපේ අමාත්‍යාංශය පැත්තෙන් දුම්රිය හරහා දෙන්න පුළුවන් දායකත්වය යම් ප්‍රමාණයකට කලිනුත් ලබා දී තිබුණා. අපි ඒක ප්‍රවර්ධනය කළා, බදුල්ල පැත්තට යන ඇල්ල ඔඩිසි දුම්රිය ගමනාන්තය දක්වා. Nine Arch Bridge එකත් එක්ක target කරලා තමයි ඒ programme එක කරගෙන ගියේ. ඒක සාර්ථක වුණා. එහි සාර්ථකත්වය කොච්චරද කියනවා නම්, itinerary එකකට පවා ඇතුළත් කරලා තිබුණා, ඇල්ල ඔඩිසි ගමනාන්තය. අපි tour එකක් යනකොට itinerary එක check කරනවා. ඒ කියන්නේ, ඒ යන දවස් ටිකේ තමන් ගමන් කරන තැන් මොනවාද කියලා check කරනවා. ඒ itinerary එකට පවා ඇතුළත් කරලා තිබුණා, ඇල්ල ඔඩිසි ගමනාන්තය. ඒක එච්චරටම ජනප්‍රිය වුණා. ඒ ජනප්‍රිය වීමත් එක්කම අනෙක් පැත්තෙන් අර්බුදයක් මතු වුණා. තුන්වන පාර්ශ්වයක් එහි ටිකට් මාෆියාවක් පටන්ගෙන තිබුණා. අපි දැන් ඒක යම්තාක් දුරකට පාලනය කර තිබෙනවා. ඒ වාගේම, Calypso Train එකක් ධාවනය කරවන්න පටන් ගත්තා. ඒ, මට මතක විධියට බදුල්ල සහ නානු ඔය අතරයි. ඊළඟට, ඇල්ල ඔඩිසි දුම්රිය ගමන් වාර ප්‍රමාණය වැඩි කළා. මහනුවර ඉඳලා බදුල්ල දක්වාත් එකක් පටන් ගත්තා. මේ ආකාරයෙන් තමයි අපි දුම්රිය දෙපාර්තමේන්තුව පැත්තෙන් සංචාරක කර්මාන්තයට දායකත්වය ලබා දෙන්නේ. ඒ වාගේම සංචාරකයන් ගමන් කරන දුම්රියවල සුව පහසුව, cleanliness එක කෙරෙහි අපි වැඩි අවධානයක් යොමු කරනවා. සාමාන්‍යයෙන් season එක ඉවර වුණාට පස්සේ ඇල්ල ඔඩිසි ධාවනය කරවපු trains ටික රත්මලානට දාලා service වැඩ ටික තමයි කළේ. ඊළඟ season එක පටන් ගන්න ඕනෑ නිසා සාමාන්‍ය ධාවනයට ඒවා ගත්තේ නැහැ. ඒ විධියට තමයි මේ වන විට දුම්රිය දෙපාර්තමේන්තුව පැත්තෙන් සංචාරක ව්‍යාපාරයට දායකත්වය ලබා දීම කරගෙන යන්නේ.

## ගාල්ල දිස්ත්‍රික්කයේ රෝහල්: විස්තර
காலி மாவட்டத்திலுள்ள வைத்தியசாலைகள்: விபரம்
HOSPITALS IN GALLE DISTRICT: DETAILS

1286/2025

5. **ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය (1):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයේ හා පළාත් සභා රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ නම සහ ශ්‍රේණිගත කර ඇති රෝහල් කාණ්ඩය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) බද්දේගම දිස්ත්‍රික් රෝහලේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) එම රෝහලේ පවතින අඩු පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් දත්ත හා තොරතුරු පද්ධතියක් තිබේද;

(ii) එසේ නම්, එම මධ්‍යස්ථානවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් අවබෝධයක් තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்திலுள்ள மத்திய அரசுக்கும் மாகாண சபைக்கும் சொந்தமான வைத்திய சாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு வைத்தியசாலையின் பெயர், தரவரிசைப்படுத்தலுக்கு அமைவாக வைத்திய சாலை வகை என்பன வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) பத்தேகம மாவட்ட வைத்தியசாலையின் தற்போதைய நிலைமை குறித்து ஆராயப் பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி வைத்தியசாலையில் நிலவும் குறை பாடுகளை நிவர்த்தி செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையிலுள்ள பிராந்திய சுகாதார நிலையங் களின் தற்போதைய நிலைமை குறித்த தரவுகளும் தகவல் தளமொன்றும் உள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி நிலையங்களின் தற்போதைய நிலைமை பற்றிய புரிதல் உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு மேலும் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of Central Government hospitals and provincial council hospitals in the Galle District, separately;

(ii) the name of each of the said hospitals and the category they are graded into, separately;

(iii) whether a supervision has been carried out with regard to the current situation of the Baddegama District Hospital; and

(iv) whether steps will be taken to address the shortcomings that exist in the said hospital?

(b) Will he also inform this House -

(i) whether there is a data and information system regarding the current situation of the Regional Health Services Centres in Sri Lanka; and

(ii) if so, whether he has an understanding regarding the current situation of the said Centres?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹன்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| මධ්‍යම රජයේ රෝහල් | |
|---|---|
| ජාතික රෝහල් | 01 |
| ශික්ෂණ රෝහල් | 01 |
| පළාත් සභා රෝහල් | |
| A වර්ගයේ මූලික රෝහල් | 03 |
| A වර්ගයේ ප්‍රාදේශීය රෝහල් | 02 |
| B වර්ගයේ ප්‍රාදේශීය රෝහල් | 08 |
| C වර්ගයේ ප්‍රාදේශීය රෝහල් | 11 |
| ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක - PMCU - | 25 |
| එකතුව | **51** |

(ii) ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

ඇමුණුම 01

**Table A: Hospitals operating under the line ministry in Galle district**

| No | Name | Type |
|---|---|---|
| 1. | NH Galle | National Hospital |
| 2. | German Sri Lanka Friendship Hospital for Women | Teaching |

**2. Table B: Table 1: Hospitals operating under provincial council in Galle district**

| No | Name | Type |
|---|---|---|
| 1. | Balapitiya Hospital | Base Hospital Type A |
| 2. | Elpitiya Hospital | Base Hospital Type A |
| 3. | Udugama Hospital | Base Hospital Type A |
| | | |
| 1. | Ambalangoda Hospital | Divisional Hospital Type A |
| 2. | Baddegama Hospital | Divisional Hospital Type A |
| | | |
| 1. | Batapola Hospital | Divisional Hospital Type B |
| 2. | Bentota Hospital | Divisional Hospital Type B |
| 3. | Hikkaduwa Hospital | Divisional Hospital Type B |
| 4. | Hiniduma Hospital | Divisional Hospital Type B |
| 5. | Imaduwa Hospital | Divisional Hospital Type B |
| 6. | Karandeniya Hospital | Divisional Hospital Type B |
| 7. | Neluwa Hospital | Divisional Hospital Type B |
| 8. | B Unawatuna Hospital | Divisional Hospital Type B |
| | | |
| 1. | Ahangama Hospital | Divisional Hospital Type C |
| 2. | Habaraduwa Hospital | Divisional Hospital Type C |
| 3. | Induruwa Hospital | Divisional Hospital Type C |
| 4. | Madampagama) Hospital | Divisional Hospital Type C |
| 5. | Nagoda Hospital | Divisional Hospital Type C |
| 6. | Niyagama Hospital | Divisional Hospital Type C |
| 7. | Opatha Hospital | Divisional Hospital Type C |
| 8. | Pitigala Hospital | Divisional Hospital Type C |

[ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා]

| | | |
|---|---|---|
| 9. | Rathgama Hospital | Divisional Hospital Type C |
| 10. | Thalapitiya Hospital | Divisional Hospital Type C |
| 11. | Uragaha (Uragahasmandiya) Hospital | Divisional Hospital Type C |
| | | |
| 1. | Agaliya | Primary care Unit |
| 2. | Ahangama | Primary care Unit |
| 3. | Ahungalle | Primary care Unit |
| 4. | Aluththanayamgoda* | Primary care Unit |
| 5. | Ambalangoda | Primary care Unit |
| 6. | Amugoda | Primary care Unit |
| 7. | Dellawa* | Primary care Unit |
| 8. | Gintota | Primary care Unit |
| 9. | Haburugala | Primary care Unit |
| 10. | Halwitigala | Primary care Unit |
| 11. | Hemmeliya | Primary care Unit |
| 12. | Hikkaduwa | Primary care Unit |
| 13. | Hipankanda | Primary care Unit |
| 14. | Kahaduwa | Primary care Unit |
| 15. | Kiridiela | Primary care Unit |
| 16. | Kosgoda | Primary care Unit |
| 17. | Lankagama | Primary care Unit |
| 18. | Maha Indhuruwa | Primary care Unit |
| 19. | Maththaka | Primary care Unit |
| 20. | Nakiyadeniya | Primary care Unit |
| 21. | Omaththa | Primary care Unit |
| 22. | Pilana | Primary care Unit |
| 23. | Thelikada | Primary care Unit |
| 24. | Yakkalamulla | Primary care Unit |
| 25. | Wanduramba | Primary care Unit |
| 51 | | |

(Sources: List of Hospitals, Ministry of Health & Mass Media)

(iii) ඔව්.

බද්දේගම දිස්ත්‍රික් රෝහලේ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා 2025.09.01 දින දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්, පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, බද්දේගම ප්‍රාදේශීය සභා සභාපති සහ ප්‍රාදේශීය ලේකම් ප්‍රමුඛ නිලධාරින්ගේ සහභාගිත්වයෙන් ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කරන ලදී.

(iv) ඔව්.

පවතින ගැටලු හා අඩුපාඩු සම්බන්ධව ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමට ගාල්ල දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත වගකීම් පවරා ඇත. ඒවා මොනවාද කියන එක ඇමුණුම 02 මඟින් දක්වා තිබෙනවා. ඇමුණුම 02 **සභාගත*** කරනවා.

(ආ) (i) ඔව්.

(ii) රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල, ක්ෂේත්‍ර සෞඛ්‍ය සායන මධ්‍යස්ථාන ඇතුළු සියලු සෞඛ්‍ය ආයතන සිතියම් ගත කර ඇති අතර, එම සෞඛ්‍ය මධ්‍යස්ථානවල සංයුතිය හා ක්‍රියාකාරකම් පිළිබඳව දැනුවත්භාවය පවතී. මේ සියල්ල දත්ත පද්ධතියකට ගොනු කර තිබෙනවා.

(ඇ) පැන නොනඟී.

***** සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

*ඇමුණුම 02*

**සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව - දකුණු පළාත**
**சுகாதார சேவைத் திணைக்களம் - தென் மாகாணம்**
**Department of Health Services - Southern Province**

අංක 15 ඒ, පහළ ඩික්සන් පාර, ගාල්ල, ශ්‍රී ලංකාව.
15 ஏ,கீழ் டிக்ஸன் பாதை, காலி, ஸ்ரீ லங்கா.
No. 15A, Lower Dickson Rd, Galle, Sri Lanka.

E-mail: pdhssp@yahoo.com
Web : www.healthdept.sp.gov.lk
Skype : Pdhs.sp

මගේ අංකය / My No: SPH/MDP/PA/1/2/2
ඔබේ අංකය / Your No:
දිනය / Date: 2025.09. 16

දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
උණවටුන,
ගාල්ල.

**<u>බද්දේගම ප්‍රාදේශීය රෝහලේ පවතින ගැටළු නිරාකරණය කර ගැනීමේ ක්ෂේත්‍ර පරීක්ෂාව හා සාකච්ඡාව 2025.09.01</u>**

උක්ත කාරුණ සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත යොමු කර ඇති අංක දපස/ප්‍රඅ/සැල/04/05/1 වෙළම හා 2025.09.09 දිනැති ලිපිය හා බැඳේ. (පිටපත අමුණා ඇත.)

02. එමඟින් 2025.09.01 වන දින බද්දේගම දිස්ත්‍රික් රෝහලේ සිදු කරනු ලැබූ ස්ථානීය පරීක්ෂාවේ දී හා එහි දී පැවති සාකච්ඡාවේ දී ඉදිරිපත් වූ පහත යෝජනා සම්බන්ධයෙන් අවධානය යොමු කර ප්‍රමුඛතාවය අනුව 2025 හා 2026 වර්ෂයන්හි සංවර්ධන සැලසුම් සඳහා ඇතුලත් කිරීමේ හැකියාව පිළිබඳව සලකා බලන ලෙස දන්වා එවා ඇත.

- සනීපාරක්ෂක කටයුතු සම්බන්ධව රෝහලේ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීම (OPD, Clinic, WD 02)
- රැම්ප් එකක් නොමැති වීම නිසා වාට්ටු අංක 01 ට රෝගීන් රැගෙන යාමට අපහසු වීම
- ගිලන්රථයට ගරාජයක් හා රියදුරුට විවේකාගාරයක් නොමැති වීම
- දන්ත ශල්‍යාගාරය ඉඩකඩ මදවීම නිසා පුළුල් කිරීම හා වායුසමන යන්ත්‍රයක් ලබා ගැනීම
- කාණු පද්ධතිය අබලන් වීම
- ප්‍රධාන ගොඩනැගිල්ල වසර 75කට වඩා පැරණි බැවින් නව ඉදිකිරීමක් හෝ නවීකරණයක් අවශ්‍ය වීම
- නිල නිවාස අළුත්වැඩියාව

03. එබැවින් ඉහත යෝජනා, අවශ්‍යතාවය හා ප්‍රමුඛතාවය අනුව ඉදිරි දිස්ත්‍රික් සැලසුම්වලට ඇතුළත් කර ඉටු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
දකුණු පළාත.

වෛද්‍ය ටී.බී. විමලසේන
MBBS, MSC, MD, (Med. Admin)
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
දකුණු පළාත
15A, පහළ ඩික්සන් පාර
ගාල්ල

පිටපත:-01. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය , දකුණු පළාත - කා.දැ.පි.
02. ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී, ප්‍රාදේශීය රෝහල, බද්දේගම - කා.දැ.පි.

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, බද්දේගම දිස්ත්‍රික් රෝහල කියන්නේ Expressway exit point එකට ආසන්නතම රෝහල. Expressway එකේ යම් ආකාරයක අනතුරක් සිදු වුණොත්, ඊට ළඟම තිබෙන රෝහලක් විධියට හඳුනාගෙන තිබෙනවා, බද්දේගම රෝහල.

පසුගිය දා දකුණු පළාත් සෞඛ්‍ය ලේකම්තුමාත්, අධ්‍යක්ෂතුමාත් සමඟ මාත් ඒ නිරීක්ෂණ කටයුතුවලට සම්බන්ධ වුණා. ඇත්තටම ගත්තොත්, බද්දේගම රෝහලට අදාළව අපේ සම්බන්ධීකරණ කමිටුව තුළත් නිරන්තරයෙන්ම කථා කරන අඩුපාඩු ගොඩක් තිබෙනවා. විශේෂයෙන්ම ගත්තොත්, එම රෝහලේ තට්ටු දෙකක ගොඩනැගිල්ලක් තිබෙනවා, ඒකට ramp එකක් නැහැ. එම ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ හදිසි ලෙඩෙක්

***** පිළිතුර අවසානයේ පළ කර ඇත.**
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

සිටියොත් හෝ යම් ආකාරයකින් මරණයක් සිදු වුණොත් පඩිපෙළ දිගේ අත් දෙකෙන් තමයි අරගෙන එන්න වෙන්නේ. ඒ වාගේ අඩුපාඩුත් තිබෙනවා.

ඒ වාගේම බද්දේගම සිට ගාල්ල දක්වා මාර්ගය පුළුල් කිරීමේදී රෝහලේ ඉදිරිපස කොටස සම්පූර්ණයෙන්ම එම මාර්ගයට යටවෙලා යනවා. එක පැත්තකින් ගොඩනැඟිලිවල හිඟයකුත්, අනෙක් පැත්තෙන් කාණු පද්ධතියේ සහ වැසිකිළි වැනි සනීපාරක්ෂක කටයුතු සම්බන්ධ ප්‍රශ්න ඇතුළු තවත් බොහෝ අඩුපාඩු ගණනාවකුත් මේ රෝහලේ තිබෙනවා. නමුත් අපි මධ්‍යස්ථව ගත්තොත්, එම රෝහල විශාල පිරිසකට පහසුකම් සපයන, ජනතාවගේ අවශ්‍යතා ඉටු කරන රෝහලක් විධියට පෙන්වා දෙන්න පුළුවන්. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම නිසා ඉතා ඉක්මනින් මැදිහත් වීමක් කරලා ඒ රෝහලේ තිබෙන අඩුපාඩු සපුරා දෙන්න පුළුවන් නම් ඉතාම වැදගත්. 2026 අය වැය යෝජනාවලට ඇතුළත් කරලා හෝ එම අඩුපාඩු සපුරන්න හැකියාවක් තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

බද්දේගම රෝහලේ පවතින තත්ත්වය පිළිබඳ වාර්තාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයටත් එවලා තිබෙනවා. ඒ සඳහා ප්‍රතිපාදන සලසන්නේ දකුණු පළාත් සභාව නිසා අපි ඒ දිස්ත්‍රික් අධ්‍යක්ෂ වෙත දැනුම් දීලා තිබෙනවා, මේ සඳහා වූ සියලු වැඩ පිළිවෙළ හදලා අපට දැනුම් දෙන්න කියලා. ඒ සඳහා වූ ප්‍රතිපාදන ලබා දීමේ හැකියාව දකුණු පළාත් සභාවට ඇති. මොනවා හරි හේතුවක් නිසා එහෙම ප්‍රතිපාදන සම්බන්ධ ගැටලුවක් ඇති වුණොත්, ඉදිරි අවුරුදු කිහිපයේ ඔය වාගේ රෝහල් සංවර්ධනය කරන්න අපේ project එකක් තිබෙනවා. එයින් අවශ්‍ය මූල්‍යාධාර ලබා දෙන්න පුළුවන්.

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, "ආරෝග්‍යා සුවතා" මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ඉතාම ප්‍රශංසනීය ව්‍යාපෘතියක් විධියට අපට පෙන්වා දෙන්න පුළුවන්. එහි පළමු මධ්‍යස්ථානය ගාල්ල දිස්ත්‍රික්කයේ මාපලගම ආරම්භ කිරීමට හැකිවීම ගැන අපගේ ස්තුතියත් මේ වෙලාවේ පුද කරන්න ඕනෑ. ඒ එක්කම මම මේ කාරණයත් මතු කරනවා. ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන වර්තමානයේ ලොකු ගැටලුවලට මුහුණ දීලා තිබෙනවා. පසුගිය කාලය තිස්සේම ඒ සම්බන්ධයෙන් හරි මැදිහත් වීමක් සිදු නොවීම නිසා බොහෝ අඩුපාඩු, දුෂ්කරතා සහිතව තමයි අදාළ සේවා සපයන්න සිදු වෙලා තිබෙන්නේ. වඳුරඹ, යක්කලමුල්ල වාගේ ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථාන සම්බන්ධයෙන් මම පෞද්ගලිකව මැදිහත් වුණා. ඒවායේ මාතෘ සායන, ළදරු සායන වාගේ පවත්වනකොට එහි ඉන්න ඉඩ පහසුකම් නැති තත්ත්වයක් තිබෙනවා. වහිනකොට ඒ දරුවන් අරගෙන තැන් තැන්වලට යන්න සිදු වෙලා තිබෙනවා. අම්මලාට දවල් දවසේ අව්වේ ඉන්න සිදුවෙලා තිබෙනවා. මේ නිසා සමහරුන්ට කලන්තය හැදෙන අවස්ථා තිබෙනවා. ඒ වාගේ ගොඩාක් අඩුපාඩු තිබෙනවා. මේක රට පුරාම තිබෙන තත්ත්වයක්. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල තිබෙන එවැනි සෞඛ්‍ය මධ්‍යස්ථාන පිළිසකර කිරීමක් හෝ ඉතා ඉක්මන් මැදිහත් වීමක් තුළින් ජනතාවට එම පහසුකම් සපයන්න රජයක් විධියට හැකියාවක් තිබෙනවාද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

දැනට මුළු ලංකාවේම මාතෘ සායන - maternity clinics - දහස් ගණනක් තිබෙනවා. ඒ බිල්ඩින් සම්බන්ධව වගකීම දරන්නේ ප්‍රාදේශීය සභාව. ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ අනෙකුත් කටයුතු ප්‍රාදේශීය සභාව මඟින් තමයි ඉෂ්ට කරන්නේ. නමුත් අපි "ආරෝග්‍යා" සංකල්පය යටතේ පටන් ගන්න ප්‍රාථමික සත්කාරක සේවා මධ්‍යස්ථාන ඊට වඩා වෙනස් අරමුණකින් තමයි අපි පවත්වාගෙන යන්නේ. ඒවායේ ඔය කියන සේවාව පවත්වාගෙන යන අතරම, මෙතෙක් සම්ප්‍රදායික සෞඛ්‍ය සේවයෙන් මඟ හැරුණු සේවාවන් කිහිපයක් සලසන්න තමයි අපි බලාපොරොත්තු වෙන්නේ. රෝගී වෙන්න ඉස්සෙල්ලා ජනතාවගේ තිබෙන රෝගී තත්ත්ව හඳුනා ගැනීමේ screening tests සිදු කිරීම වාගේ දේවල්, අපේ ජනතාවට අත්‍යවශ්‍ය වූ සෞඛ්‍ය පණිවුඩ දෙන ඒවා, රෝගියෙක් නැවත තමන්ගේ සාමාන්‍ය ජීවිතයට පරිවර්තනය වීම සඳහා අවශ්‍ය පුනරුත්ථාපන ක්‍රියාවලිය වාගේ දේවල්, සමහර රෝගීන් ජීවිත කාලය පුරාවට එම රෝගයෙන් ගලවා ගන්න බැරි අවස්ථාවක ඒකත් එක්ක ජීවත් වෙන්නේ කොහොමද කියන palliative care එක දීම වාගේ බොහොම පැතිරුණු කාරණා රාශියක් සඳහා පිළිතුරු හොයන්න තමයි, "ආරෝග්‍යා" මධ්‍යස්ථාන හදන්නේ. ඒක ඇතුළේ ඔය කියන කාර්යයත් කරන්න පුළුවන්. නමුත් අපිට යම් කිසි කාලයක්; අවුරුදු ගණනක් ගත වෙනවා, ලංකාව පුරාම මෙම කටයුත්ත නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ ජාලය එළා ගැනීම සඳහා.

## පහළ යාන් ඔය ව්‍යාපෘතිය: විස්තර
## பஹல யாங் ஓயா கருத்திட்டம்: விபரம்
## LOWER YAN OYA PROJECT: DETAILS

1296/2025

**6. ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර, පහළ යාන් ඔය ව්‍යාපෘතිය ආරම්භ කරන ලද වර්ෂය කවරේද;

(ii) එම ව්‍යාපෘතියට මුදල් වෙන් කරන ලද මූලාශ්‍රය කවරේද;

(iii) වෙන් කරන ලද මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන ප්‍රදේශ කවරේද;

(v) ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරනු ලැබුවේද;

(vi) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vii) ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන්වන පවුල් සංඛ්‍යාව සහ ඔවුන්ට අයත් ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පවුල් පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් කවරේද;

(iv) අවතැන්වන පවුල් ඉවත් කිරීමේ ක්‍රමවේදය කවරේද;

(v) අවතැන්වූ එහෙත් මේ වනතෙක් වන්දි ලබා නොදුන් පවුල් සිටින්නේද;

(vi) ඔවුන්ට වන්දි ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු නිමල් පලිපේන මහතා]

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம், பஹல யாங் ஓயா கருத்திட்டம் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்துக்கான நிதிமூலம் யாது என்பதையும்;

(iii) ஒதுக்கப்பட்ட நிதி எவ்வளவு என்பதையும்;

(iv) கருத்திட்டத்தின்மூலம் பயனடையும் பிரதேசங்கள் யாவை என்பதையும்;

(v) கருத்திட்டத்தை ஆரம்பிப்பதற்கு முன்னர், சாத்தியவள ஆய்வு மேற்கொள்ளப்பட்டதா என்பதையும்;

(vi) இன்றேல், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

(vii) எத்திகதியில் மேற்படி கருத்திட்டம் நிறைவு செய்யப்படவுள்ளது என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டம் காரணமாக இடம்பெயர்ந் துள்ள குடும்பங்களின் எண்ணிக்கை மற்றும் அவர்களுக்குச் சொந்தமான காணியின் அளவு வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி குடும்பங்களை குடியமர்த்துவதற்குத் தேவையான காணிகள் அடையாளம் காணப் பட்டுள்ளனவா என்பதையும்;

(iii) ஆமெனில், அக்காணிகள் யாவை என்பதையும்;

(iv) இடம்பெயரும் குடும்பங்களை அகற்றும் வழிமுறை யாது என்பதையும்;

(v) இடம்பெயர்ந்துள்ள போதிலும், இதுவரை இழப்பீடு வழங்கப்படாத குடும்பங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(vi) அவர்களுக்கான இழப்பீட்டை வழங்குவதில் தாமதம் நிலவுவதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) the year in which the Lower Yan Oya Project in Anuradhapura was commenced;

(ii) the source of funding for the said project;

(iii) the amount that was allocated;

(iv) the areas that will benefit from the project;

(v) whether a feasibility study was conducted before initiating the project;

(vi) if not, the reasons for it; and

(vii) the expected date of completion of the project?

(b) Will he also state -

(i) the number of families which are displaced due to the above project and the extent of land belonging to them, separately;

(ii) whether the lands required for the settlement of those families have been identified;

(iii) if so, the whereabouts of such lands;

(iv) the methodology for evacuating displaced families;

(v) whether there are families which have been displaced but have not yet been compensated; and

(vi) the reasons for the delay in providing compensation to them?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 2013.06.20.

(ii) ශ්‍රී ලංකා ජනරජය.

(iii) රුපියල් මිලියන 48,355.30කි.

(iv) වම් ඉවුරු ඇළ මඟින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඕමාරකඩ, ඉස්සන්වැව, සිවලාකුලම, උස්ගල්පිටිය, කුඹුක්වැව සහ පදවිය ජලාශය යටතේ ඇති ජයන්තිවැව යටතේ වගා කරන ප්‍රදේශවලට ජලය සපයනවා.

දකුණු ඉවුරු ඇළ මඟින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මහසොරොව්ව, ඉන්දුල්හිටියව, තල්ගස්වැව, මොරගම, බෙල්ලික්කදවල, මයිලවැව, ආඩියාගල, නබඩවැව, වෙහෙරවැව සිට නීලපනික්කම් කුලම් ආදී ප්‍රදේශ සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රිකක්යේ පුල්මුඩේ අමුණ යටතේ ඇති වගා බිම් ප්‍රදේශවලට ජලය සපයනවා.

(v) සහ(vi) ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඇත. එම ශක්‍යතා අධ්‍යයනය සිදු කර තිබෙන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින්.

(vii) මෙම ප්‍රශ්නයෙන් ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය ගැන අසා තිබෙනවා. මේවා දිගින් දිගට කල්ගත වුණු ප්‍රශ්න සහගත, පැටලිලි තිබෙන ව්‍යාපෘති. අපි 2025.12.31 දක්වා දිනය දීර්ඝ කළා. නමුත් මේ තිබෙන වැඩ කටයුතු ඉවර කර ගැනීම සඳහා ව්‍යාපෘති කාලය 2026.12.31 දක්වා දීර්ඝ කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් යොමු කර තිබෙනවා.

(ආ) (i) යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ඉඩම් අත්පත් කිරීම, ඉඩම් කට්ටි ගණන අනුව පහත පරිදි සිදු කර ඇත.

- ජලාශය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අත්පත් කරගත් මුළු ඉඩම් කට්ටි ගණන | රජයට අයත් කට්ටි ගණන | වන්දි ලබා දිය යුතු කට්ටි ගණන |
|---|---|---|---|
| හොරොව්පොතාන | 3153 | 421 | 2699 |
| ගෝමරන්කඩවල | 1232 | 310 | 922 |

- වම් ඉවුර ඇළ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | අත්පත් කරගත් මුළු ඉඩම් කට්ටි ගණන | රජයට අයත් කට්ටි ගණන | වන්දි ලබා දිය යුතු කට්ටි ගණන |
|---|---|---|---|
| කැබිතිගොල්ලෑව | 103 | 50 | 53 |
| හොරොව්පොතාන | 170 | 73 | 97 |
| පදවිය | 477 | 112 | 365 |
| ශ්‍රී පුර | 13 | 0 | 13 |

ඒ අතරින් පහත පරිදි ජලාශය ඉදිකිරීම සඳහා පදිංචි වී සිටි නිවාස අත්පත් කර ගැනීම සිදුකර ඇත.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| හොරොව්පොතාන | 102 |
| ගෝමරන්කඩවල (කජු වත්ත හා මල් පෝරුව) | 201 |

මෙම ඉඩම් අත්පත් කර ගැනීම ඉඩම් අත්පත් කර ගැනීමේ සාමාන්‍ය ක්‍රියාවලිය යටතේ සිදු කර ඇති අතර, ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද තක්සේරු වටිනාකම ගෙවා ඇත.

ඊට අමතරව ඉඩම් අමාත්‍යාංශ චක්‍රලේඛ 1/2016 අනුව ලබා දිය යුතු දීමනා සහ විකල්ප ඉඩම් එම පවුල් සඳහා ලබා දී ඇත.

(ii) එම පවුල් පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගෙන තිබේ.

(iii) අවතැන් පවුල් නැවත පදිංචි කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුරු ඉඩම් සඳහා කොහොඹගස් වැව ප්‍රදේශයත්, ගොඩ ඉඩම් සඳහා මල්පොරුව සහ කජුවත්ත ප්‍රදේශත් හඳුනා ගෙන තිබෙනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුරු ඉඩම් සඳහා ඉස්සන්වැව ප්‍රදේශයත්, ගොඩ ඉඩම් සඳහා D 6 වාහල්කඩ ප්‍රදේශයත් හඳුනාගෙන තිබෙනවා.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹුරු ඉඩම් සඳහා ඕමාරකඩ වැව ප්‍රදේශයත්, ගොඩ ඉඩම් සඳහා ඕමාරකඩ ප්‍රදේශයත් හඳුනාගෙන තිබෙනවා.

(iv) ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රමවේදය අනුව තක්සේරු වටිනාකම මුදලින් ගෙවීම සිදු කර ඇත.

ඊට අමතරව ඉඩම් අමාත්‍යාංශ 1/2016 චක්‍රලේඛයට අනුව අනෙකුත් දීමනා සහ විකල්ප ඉඩම් ලබා දීම සිදු කර ඇත.

(v) ගොඩ සහ මඩ ඉඩම් අත්පත් කරගත් මේ දක්වා වන්දි නොගෙවූ ඉඩම් කට්ටි තිබේ. එහෙත් පදිංචි ඉඩම් අත්පත් කරගත් පවුල් සඳහා සියලු ගෙවීම් සිදු කර ඇත.

ගරු කථානායකතුමනි, ඒ ප්‍රදේශවල ජනතාවට විශාල ගැටලුවක් තිබෙනවා. නිවාස යටවෙච්ච කට්ටියට ඉඩම් දීලා තිබෙනවා. නමුත් ගොඩ සහ මඩ ඉඩම්වලට විකල්ප ඉඩම් ලබා දීමේදී ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම මේ සංඛ්‍යා දත්ත ඉදිරිපත් කරන්නම්. මෙතැන ඒ ගැන විස්තරයක් තිබෙනවා.

- ජලාශයට යට වූ ඉඩම් සඳහා පූර්ණ වන්දි ගෙවීමට ඉතිරිව ඇති කට්ටි ගණන:

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජලාශය යටතේ |
|---|---|
| හොරොව්පොතාන | 28 |
| ගෝමරන්කඩවල | 23 |
| එකතුව | 51 |

- වම් ඉවුරු ඇළ සඳහා පූර්ණ වන්දි ගෙවීමට ඉතිරිව ඇති කට්ටි ගණන:

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | වම් ඉවුර ඇළ යටතේ |
|---|---|
| හොරොව්පොතාන | 03 |
| කැබිතිගොල්ලෑව | 0 |
| පදවිය | 17 |
| ශ්‍රී පුර | 02 |
| එකතුව | 22 |

විකල්ප ඉඩම් ලබා දීම, 1/2016 චක්‍රලේඛය අනුව:

යාන් ඔය ව්‍යාපෘතියේ දැනට පවතින ගැටලුව, මෙම විකල්ප ඉඩම් ලබා දීමේ ප්‍රමාදයයි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සියලුම පවුල් වෙත විකල්ප ඉඩම් ලබා දී ඇත. එහි විස්තර පහත පරිදිය.

විකල්ප ඉඩම් ලබා දීමේ ප්‍රමාදයක් තිබෙනවා. ඒ ප්‍රමාදයත් සමඟ විකල්ප ඉඩම් ලබා දී තිබෙන්නේ මේ විධියටයි.

| කුඹුරු ඉඩම් ලබා දීම | | ගොඩ ඉඩම් ලබා දීම | |
|---|---|---|---|
| කොහොඹගස් වැව | 106 | කජු වත්ත | 91 |
| ඉඳුල්හිටියාව | 151 | මල්පෝරුව | 110 |
| මෝරගම | 208 | | |
| මුළු ගණන | 465 | | 201 |

ගස් ඉවත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ඉඳුල්හිටියාවේ කුඹුරු ඉඩම් 40ක් මේ වන විට සංවර්ධනය කරමින් පවතී.

අනුරාධපුර දිස්ත්‍රික්ය (හොරොව්පොතාන ප්‍රාදේශී ලේකම් කොට්ඨාසය)

[ගරු (වෛද්‍ය) සුසිල් සුසිල් රණසිංහ මහතා]

- ජලාශය සඳහා

  විකල්ප කුඹුරු ඉඩම් ලබා දිය යුතු පවුල් ගණන - 1,113කි.

  දැනට ලබා දී ඇති පවුල් ගණන
  - 56 (ඕමාරකඩ)
  - 403 (ඉස්සන්වැව)

  විකල්ප කුඹුරු ඉඩම් වෙනුවට වන්දි මුදල් ලද පවුල් ගණන - 536යි.

  විකල්ප කුඹුරු ඉඩම් වෙනුවට වන්දි ඉල්ලා සිටින පවුල් ගණන - 127යි.

  අදාළ තහවුරු කිරීම් සහ අනුමැතින් ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගැටලුව විසඳිය හැක.

  වම් ඉවුරු ඇළ මාර්ගය සඳහා

  අමාත්‍ය මණ්ඩල අනුමැතියකට අනුව විකල්ප කුඹුරු වෙනුවට තක්සේරු වටිනාකම ලබා දී මෙම ගැටලුව විසඳා ඇත.

(vi) තක්සේරු වාර්තා ප්‍රාදේශීය ලේකම් වෙත නොලැබුණු ඉඩම් කට්ටි සඳහා වන්දි ගෙවීම් ප්‍රමාද වී ඇත. හිමිකම් නිවැරදිව නිශ්චය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි මුදල් ලබා දීම ප්‍රමාද වී ඇත.

(ඈ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු කථානායකතුමනි, මම නියෝජ්‍ය ඇමතිතුමා වෙත ඉදිරිපත් කරන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇත්තටම මේක කෘෂි කාර්මික ප්‍රදේශයක්. වේල්ල ඉදි වෙන්නේත් කෘෂි කාර්මික කටයුතු සංවර්ධනය කිරීම අරමුණු කරගෙනයි. නමුත්, පුරවැසියන්ගෙන් අප වෙත ලැබෙන දුක්ගැනවිලි අනුව ඒ අවතැන් වූ ප්‍රජාවට සාධාරණය ඉටු වුණාද කියන ප්‍රශ්නය අපි හමුවේ තිබෙනවා. ඒ නිසා, මේ වන්දි ගෙවා අවසන් කිරීමට අමාත්‍යාංශය විධියට ගෙන ඇති පියවර සහ එය කිනම් කාලයකින් අවසන් කිරීමට නියමිතද කියලා නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, මම ඉස්සෙල්ලා කිව්වා වාගේ යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය විදේශ ආධාර යටතේ තමයි ආරම්භ කර තිබෙන්නේ. නමුත් එහි වෙනසක් සිදු වෙලා, අන්තිමට ලංකා රජයේ මුදල් යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් තමයි ව්‍යාපෘතිය කරලා තිබෙන්නේ. කොහොම වුණත් තවමත් - අවුරුදු 10කට වැඩි කාලයක් ගියත් - විශාල පිරිසක් මේකෙන් දුක් විඳිනවා; පීඩා විඳිනවා, තමන්ට විකල්ප ඉඩමක් නැහැ, වන්දි ලැබිලා නැහැ, වගා කර ගන්න කුඹුරක් නැහැ කියලා. එම නිසා ඒ මිනිස්සු උද්ඝෝෂණය කරලා තිබෙනවා, මිනිස්සු කාර්යාලවල රස්තියාදු වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ සිටින ප්‍රාදේශීය ලේකම්ලාත්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරිනුත් පීඩාවට පත් වෙලා ඉන්නවා; අපහසුතාවට පත් වෙලා ඉන්නවා, මේ ප්‍රශ්නය විසඳන්නේ කොහොමද කියලා.

ඒ නිසා අපි මේ අමාත්‍යාංශය භාර ගත්තාට පසුව අපේ ඇමතිතුමාගේ උපදෙස් මත මේ සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගන්න කමිටුවක් පත් කළා. ඒක හිටපු අමාත්‍යාංශ ලේකම්වරු දෙදෙනෙකුගේ ප්‍රධානත්වයෙන්, හත් දෙනෙකුගෙන් යුතු කමිටුවක්. මෙහිදී හිටපු අමාත්‍යාංශ ලේකම් එම්.කේ. දිසානායක, හිටපු අමාත්‍යාංශ ලේකම් සරත් විජේසිංහ යන මහත්වරුන් දෙපළට මම ස්තුතිවන්ත වෙනවා. ඒ අයගේ ප්‍රධානත්වයෙන් තමයි මේ කමිටුව පත් කළේ, ගරු කථානායකතුමනි.

ඇත්තටම ඒ කමිටුවේ වාර්තාව දැන් ලැබිලා තිබෙනවා. අමාත්‍යාංශය විධියට ඔවුන් ලබා දුන් නිර්දේශ මත වන්දි ගෙවීම් සහ විකල්ප ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් සිටිනවා. අපේ ඉලක්කය, මේ අවුරුද්දේ මේ වන්දි ගෙවීමේ කටයුතු අවසන් කිරීමටයි. ඒ සඳහා අපි මුදල් වෙන් කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, මා මෙය අවස්ථාවක් කර ගන්නවා, හිටපු අමාත්‍යාංශ ලේකම්තුමන්ලා දෙදෙනා ඇතුළු මේ කමිටු සාමාජිකයන්ට ස්තුති කරන්න. මොකද, ඔවුන් ස්වේච්ඡාවෙන් තමයි මේ වැඩේ කළේ. ඔවුන් බොහෝ වෙහෙසක් ගත්තා, මේ ප්‍රදේශවලට ගිහිල්ලා ජනතාව හමු වෙලා, නිලධාරින් හමු වෙලා, මේ ප්‍රදේශ නිරීක්ෂණය කරලා, මේ ඉදිකිරීම් බලලා, ඉඩම් බලලා, ජනතාවට ඇහුම්කන් දීලා, නැවත අපිත් එක්ක සාකච්ඡා කරලා මේ වාර්තාව සකස් කරන්න. ඒ අනුව අපි මේ වන්දි ගෙවන්න දැන් කටයුතු කරමින් සිටිනවා.

**ගරු නිමල් පලිහේන මහතා**
(மாண்புமிகு நிமல் பலிஹேன)
(The Hon. Nimal Palihena)

ගරු කථානායකතුමනි, නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ දෙවන අතුරු ප්‍රශ්නය අහනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙය කෘෂිකාර්මික බිමක් නිසා ඇත්තටම ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය පරිසරය නිර්මාණය කර ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව වශයෙන් කළ යුතු වැඩකටයුතු රාශියක් ඉතිරි වෙලා තිබෙනවා කියන කාරණාව බිමෙන් තහවුරු වෙනවා. ඒ කටයුතු අවසන් කිරීමට අමාත්‍යාංශය විධියට ගෙන ඇති පියවර මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඉස්සෙල්ලා අපි සාකච්ඡා කළේ වන්දි ගෙවන්නේ කොහොමද සහ විකල්ප ඉඩම් ලබා දෙන එක සම්බන්ධයෙන් වූ කාරණා ගැන. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ තිබුණු ඉඩම් තමයි කුඹුරු කරන්න අරගෙන තිබෙන්නේ. ඒ නිසා ඒ ඉඩම් සංවර්ධනය කරන්න, ඇළ වේලි හදන්න කාලයක් ගත වෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව තමයි ඒ කටයුතු කරන්නේ. මේ අවුරුද්දේ අපට මේ වැඩ සියයට සියයක් ඉවර කර ගන්න බැහැ. ඒ නිසා ලබන අවුරුද්දේත් යම් කාලයක් ගත වෙයි, මේ කුඹුරු ඉඩම්වල ඇළ වේලි සකස් කරලා ඉවර කරන්නට. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපි තීරණය කර තිබෙනවා, 2026 අවුරුද්දේ මුල් මාස කිහිපය ඇතුළත මේ වැඩකටයුතු අවසන් කරලා කොහොමටත් 2026 මාස් කන්නය වෙනකොටවත් මිනිස්සුන්ට ඒ කුඹුරු ඉඩම් වගා කර ගැනීම සඳහා අවස්ථාව ලබා දෙන්න. ඒක තමයි අපේ සැලසුම.

## තේ වගා කරන ඉඩම්වල පසෙහි සාරවත් බව වැඩි කිරීම: ගෙන ඇති ක්‍රියාමාර්ග

தேயிலைக் காணிகளின் மண் வளத்தை அதிகரித்தல்: நடவடிக்கை

INCREASE OF SOIL FERTILITY OF TEA CULTIVATING LANDS: MEASURES TAKEN

1307/2025

**7. ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) අමු තේ දළු නිෂ්පාදනය අඩු වීම තේ කර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන ගැටලුවක් බවත්;

(ii) කාලයක් තිස්සේ තේ වගා කිරීම හේතුවෙන් තේ ඉඩම්වල පස නිසරුවීම සහ පසේ ආම්ලිකතාව වැඩි වීම, මේ සඳහා බලපා ඇති බවත්;

(iii) උණ ශාකය භාවිතයෙන් නිෂ්පාදනය කරනු ලබන ජෛව අඟුරු - bio charcoal - භාවිත කිරීම මඟින් තේ ඉඩම් දීර්ඝ කාලීනව සශ්‍රීක කළ හැකි බව තේ පර්යේෂණ ආයතනය සහ විශ්වවිද්‍යාල විසින් සනාථ කර ඇති බවත්;

(iv) යොදනු ලබන පොහොර ප්‍රමාණයට සාපේක්ෂව අවශෝෂණය කර ගත හැකි පොහොර ප්‍රමාණයේ වේගවත් වර්ධනයක් ජෛව අඟුරු භාවිත කිරීම මඟින් සිදු වන බැවින් අනවශ්‍ය ලෙස පොහොර යෙදීම පාලනය කළ හැකි බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තිය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් තේ කර්මාන්තයට අදාළ ආයතන ඒකාබද්ධ කර ගනිමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பச்சை தேயிலைக் கொழுந்து உற்பத்தி குறைந்துள்ளமை தேயிலைக் கைத்தொழில் சார்ந்த பிரதானமானதொரு பிரச்சனை என்பதையும்;

(ii) நீண்ட காலமாக தேயிலைச் செய்கை மேற் கொள்ளப்பட்ட காரணத்தினால் தேயிலைக் காணிகளின் மண் வளமற்றுப் போயுள்ளமை மற்றும் மண்ணில் அமிலத் தன்மை அதிகரித் துள்ளமை இதற்குத் தாக்கம் செலுத்தியுள்ளது என்பதையும்;

(iii) மூங்கிலைப் பயன்படுத்தி உற்பத்தி செய்யப் படுகின்ற உயிர் கரியை (Bio Charcoal) பயன் படுத்துவதன் மூலம் தேயிலைக் காணிகளை நீண்ட காலத்துக்கு வளப்படுத்த முடியுமென தேயிலை ஆராய்ச்சி நிறுவகம் மற்றும் பல்கலைக்கழகங்களினால் உறுதிப்படுத்தப் பட்டுள்ளது என்பதையும்;

(iv) பயன்படுத்தும் உரத்தின் அளவுக்கு நிகராக உயிர்க் கரிப் பயன்பாட்டின்மூலம், அகத் துறிஞ்சக்கூடிய உரத்தின் அளவில் துரித வளர்ச்சி ஏற்படுவதால் தேவையற்ற முறையில் உரம் இடுவதைக் கட்டுப்படுத்த முடியும் என்பதையும்;

அவர் ஏற்றுக்கொள்கின்றாரா?

(ஆ) (i) ஆமெனில், அது தொடர்பில் அரசாங்கத்தின் கொள்கை யாது என்பதையும்;

(ii) இந்த விடயம் தொடர்பாக தேயிலைக் கைத்தொழில் துறையுடன் தொடர்புடைய நிறுவனங்களை இணைத்துக்கொண்டு தேவை யான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he admit that-

(i) the decline in the production of raw tea leaves is a major problem relating to the tea industry;

(ii) infertility of the soil and increase of the acidity of the soil due to the cultivation of tea for a long time in tea lands have resulted in this situation;

(iii) the Tea Research Institute and universities have confirmed that the tea lands can be made fertile in the long term by using bio charcoal produced from the bamboo plant; and

(iv) the use of bio charcoal can rapidly increase the fertilizer absorption capacity of the soil against the amount of fertilizer applied, and therefore, excessive application of fertilizer can be controlled?

(b) Will he inform this House-

(i) if so, the policy of the Government in that regard; and

(ii) whether necessary measures will be taken regarding this matter in collaboration with the institutions related to the tea industry?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K. V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) අමු තේ දළු නිෂ්පාදනය අඩුවීම තේ කර්මාන්තය ආශ්‍රිත ප්‍රධාන ගැටලුවකි. 2013 වසරේදී මෙරට තේ නිෂ්පාදනය උපරිමයට ළඟා වූ අතර, 2015 සිට තේ නිෂ්පාදනයේ අඩුවීමක් සිදුවී ඇත.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

(ii) තේ වගා කරන පසේ අඩංගු වන භාෂ්මික පෝෂක කැටායන, තේ ශාක මඟින් අවශෝෂණය කරන අතර දීර්ඝ කාලීනව තේ වගා කිරීමේදී පසේ අඩංගු වන එම භාෂ්මික පෝෂක ප්‍රමාණය දිගින් දිගටම අඩුවීම හේතුවෙන් එය එම පසේ ආම්ලිකතාව වැඩිවීමට සහ පස නිසරුවීමට හේතු වේ.නමුත් තේ වගා පසේ සාරවත් බව අඩු වීම තේ අස්වැන්න අඩුවීමට බලපා ඇති හේතු අතරින් එක් සාධකයක් පමණි. පසේ ඇතිවන ආම්ලිකතාව යාමනය කිරීම සඳහා ඩොලමයිට් යෙදීම තේ වගාකරුවන් විසින් සිදු කරයි.

(iii) ජෛව අඟුරු - biochar - භාවිත කිරීම මඟින් තේ ඉඩම්වල පාංශු ප්‍රතිසාධනය සිදු කළ හැකි බව තේ පර්යේෂණායතනය විසින් සනාථ කර ඇති අතර, ඒ සම්බන්ධ පර්යේෂණ තවදුරටත් ක්‍රියාත්මක වේ.

එනම්, ජෛව අඟුරු පසට එකතු කිරීම මඟින් පසේ සවිවර බව, පසේ ක්ෂුද්‍රජීවී ක්‍රියාකාරිත්වය, ජලය රඳවා තබා ගැනීමේ ධාරිතාව, පසේ අඩංගු කාබන් ප්‍රමාණය සහ පෝෂක රඳවා ගැනීම වැඩි කිරීම නිසා එමඟින් තේ ඉඩම්වල පාංශු සාරවත් බව වැඩිදියුණු කළ හැකි බව සොයාගෙන ඇත. එසේම උණ ශාකයෙන් මෙන්ම වෙනත් ශාකවලින් ද ජෛව අඟුරු නිෂ්පාදනය කළ හැකි බව තේ පර්යේෂණ ආයතනය මඟින් සොයාගෙන තිබේ.

(iv) ජෛව අඟුරු පසට යෙදීම තුළින්, තේ වගා කරන පසට එකතු කරන පොහොරවල කාර්යක්ෂමතාව වැඩි කළ හැකි ආකාරය, පසේ සෞඛ්‍ය වැඩිදියුණු කිරීම ප්‍රතිස්ථාපනය කිරීමට සහ තවදුරටත් පසේ ගුණාත්මක ලක්ෂණ වැඩිදියුණු කිරීමට ජෛව අඟුරු යොදාගත හැකි ආකාරය පිළිබඳ පර්යේෂණ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් සිදු කෙරෙමින් පවතින අතර, එම පර්යේෂණ අවසානයේ ඒවායේ ප්‍රතිඵල විශ්ලේෂණයෙන් අනතුරුව නිර්දේශ හා වාර්තා ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය.

(ආ) (i) රජය මඟින් අදාළ පර්යේෂණ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ලබා දී ඇත. එමෙන්ම ජෛව අඟුරු - biochar - නිපදවීම සඳහා යොදාගත හැකි අමුද්‍රව්‍ය පිළිබඳව ද අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී.

(ii) තේ ක්ෂේත්‍රයේ සියලු ආයතන ඒකාබද්ධ වී උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඇති අතර, එහි ඒකාබද්ධ පෝෂක කළමනාකරණය සහ ජල කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම යටතේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. එහිදී ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් පර්යේෂණය කර අවසානයේදී ලබා දෙන නිර්දේශ ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

(ඇ) අදාළ නොවේ.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, පිළිතුරු ලබා දීම සම්බන්ධව ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. පසුගිය දවස් ටිකේම අපි මේ සම්බන්ධයෙන් කථා කළා, විද්වතුන් සමඟ සහ වැවිලි අමාත්‍යාංශය සමඟ. නමුත්, මේ සම්බන්ධයෙන් හොඳ අවධානයක් යොමු වෙලා තිබුණාය කියලා මට සෑහීමට පත් වෙන්න අමාරුයි.

ගරු ඇමතිතුමනි, ඇත්තටම ඔබතුමා කිව්වා වාගේම අපේ රටේ පසේ තිබෙන ප්‍රධාන ප්‍රශ්න වන, පොහොර දැමීම නිසා ආම්ලික බව වැඩිවීමත්, ඒ නිසාම පසේ සෘණ බණ්ධක රැකගන්න තිබෙන අසමත්කමත්, ඒ වාගේම දීර්ඝ කාලීනව කාබනික සංයුතිය රැකගන්න බැරිවීමත් හේතුකොටගෙන අපේ රටේ තේ කර්මාන්තය සහ ඒ ආශ්‍රිත වැවිලි කර්මාන්තයට පමණක් නොවෙයි, කෘෂි කර්මාන්තයට අදාළ සියලුම කර්මාන්තවලට බරපතළ ප්‍රශ්නයක් වේගයෙන් මතු වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දැන් මේකෙදි මේ ප්‍රශ්නයට යම් පිළිතුරකුත් අපට පෙනෙනවා. විශේෂයෙන්ම ඔබතුමා කිව්වා වාගේම ක්ෂුද්‍රජීවී වර්ධනයට හේතු වන හොඳ පොහොරක් වන බවක්, නැත්නම් සවිවර බවක් විශේෂයෙන්ම මේ ජෛව අඟුරුවල - biocharවල - තිබෙනවා. ඒකෙනුත් වැඩීම හොඳම ප්‍රතිඵල ලැබෙන්නේ උණ ශාකයෙන් කියලා හොයාගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. පසෙහි තිබෙන spongy ගතිය, නැත්නම් සවිවර බව නිසාම ජලය උරාගෙන ටිකෙන් ටික, ටිකෙන් ටික තමයි නිදහස් කරන්නේ. දැන් තිබෙන ප්‍රශ්නයක් තමයි, වාෂ්පීකරණ වේගය වැඩිවීම නිසා එක පාරටම වැස්ස වැඩිවෙලා, වතුර වැඩි වෙනවා වාගේම ආපහු පස වියළීම. නමුත්, මේකට උත්තරයක් විධියට මෙන්න මේ spongy ගතිය, නැත්නම් සවිවර බව හදන්නත් මේ ජෛව අඟුරු විශේෂයෙන්ම උණ ශාකය ආශ්‍රයෙන් සෑදීම තමයි හොඳම දේ කියලා කියනවා.

අනෙක් එක තමයි, දීර්ඝ කාලීනව කාබන් ප්‍රතිශතයක් ලබා දීම. කාබනික බව දෙන්නත් මේක ඉතාම හොඳයි කියලා තෝරාගෙන තිබෙනවා. එම නිසා මේක ඇත්තටම වැවිලි අමාත්‍යාංශයට විතරක් නොවෙයි, කෘෂිකර්ම අමාත්‍යාංශයත් ඒකාබද්ධ වෙච්ච, විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශයත් ඒකාබද්ධ වෙච්ච, මෙන්න මේ වාගේ ඉක්මනින් පිළිතුරක් අවශ්‍ය දේකට අපි මැදිහත් වෙන්න ඕනෑය කියලා මම හිතනවා. හේතුව, මේක ජාතික ප්‍රශ්නයක්. විශේෂයෙන්ම මේක ජාතික ප්‍රශ්නයක් වෙන්නේ මේ නිසායි. පොහොර භාවිතය පිළිබඳව දැන් ලොකු ප්‍රශ්නයක් රට තුළ මතුවෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තයට අදාළ සෑම ක්ෂේත්‍රයකටම මේක බලපානවා. එම නිසා කෘෂිකර්ම අමාත්‍යාංශයත්, වැවිලි අමාත්‍යාංශයත්, මුදල් අමාත්‍යාංශයත් ඒකාබද්ධ වෙච්ච යම් සංවිධාන ව්‍යුහයක් මේ සම්බන්ධව හදන්න කියන යෝජනාව මගේ පැත්තෙන් කරනවා. ඒ පිළිබඳව ඔබතුමා දරන මතය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා රජය හැටියට පොහොර සම්බන්ධයෙන් වග කියන ප්‍රධාන රාජ්‍ය ආයතනය වන්නේ අපේ කෘෂිකර්ම අමාත්‍යාංශයට අනුබද්ධ ජාතික පොහොර ලේකම් කාර්යාලයයි. ඔබතුමා කියන මේ යෝජනාව සම්බන්ධයෙන් ඒ කාර්යාලයත් එක්ක තමයි සාකච්ඡා කර බලන්න වෙන්නේ. කොහොම නමුත්, තේ සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශය යටතේ පර්යේෂණ ආයතනයක් තිබෙනවා. ලෝකයේ පරණම තේ පර්යේෂණ ආයතනය ශ්‍රී ලංකාවේ තිබෙන්නේ. ලබන නොවැම්බර් මාසය වෙනකොට එම ආයතනයට අවුරුදු 100ක් සපිරෙනවා. තේ සම්බන්ධයෙන් රජයක් හැටියට අපට වග කියන්න පුළුවන් වන්නේ, නිර්දේශ කරන්න පුළුවන් වන්නේ, පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ කරන පොහොර හෝ බෙහෙත් වර්ගයි. මගේ පිළිතුරේදීත් ඔබතුමාට පැහැදිලි කළා, මූලික වශයෙන්ම තේ පර්යේෂණ ආයතනය මේ biochar අනුමත කරලා තිබෙනවා සහ තවදුරටත් පරීක්ෂණ පවත්වමින් තිබෙනවා කියලා. උණ ශාකය හැර තවත් ශාක සම්බන්ධයෙනුත් මේ සම්බන්ධව පර්යේෂණ කරනවා. මොකද, දැනට තිබෙන තත්ත්වය ඇතුළේ රටේ තිබෙන උණ ශාකයම විතරක් මේකට ප්‍රමාණවත් වෙන එකක් නැහැ. ඒ හින්දා ඒ අදාළ පර්යේෂණ තිබෙනවා.

නමුත් ඔබතුමා කියන කාරණය අමාත්‍යාංශයක් හැටියට අපි පිළිගෙන තිබෙනවා. ඒ වාගේම තේ පර්යේෂණ ආයතනයත් පිළිගෙන තිබෙනවා. අපේ පසේ තිබෙන ගුණාත්මකභාවය පිරිහිලා තිබෙනවා. ඒක අස්වැන්නට බලපා තිබෙනවා. එමෙන්ම අනාගතයේදී ඒක දැඩි ප්‍රශ්නයක් බවට පත් වෙන්න පුළුවන්කම තිබෙනවා. වසර සිය ගණනක් තේ හෝ රබර් හෝ පොල් වගා කළාම පසේ තිබෙන සාරවත්භාවය පසින් ඉවත් වෙනවා. එතකොට පසට අවශ්‍ය පෝෂක නැවත ලබා නොදුන්නොත් අපිට සාරවත් අස්වැන්නක් ඉන් ලබා ගන්න බැහැ කියන අදහස තිබෙනවා. ඒකට තමයි රසායනික පොහොර සහ කාබනික පොහොර සපයලා මේ පස සාරවත් කරන්න, පසේ ගුණාත්මකභාවය ආරක්ෂා කරගන්න මහන්සි ගන්නේ. ගරු මන්ත්‍රීතුමනි, කොහොම නමුත් ඔබතුමාගේ අදහස අනුව අපි ඉදිරියට තවදුරටත් ඒ ගැන සාකච්ඡා කරලා, ජාතික පොහොර ලේකම් කාර්යාලයත් එක්ක කටයුතු කරන්න සූදානම් කියන පණිවුඩය මම මේ මොහොතේදී ලබා දෙනවා.

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම තව නව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ තමයි, ගංගා ඉවුරු ආශ්‍රිතව විශාල උණ ගස් ප්‍රමාණයක් අවිධිමත් ලෙස වැවෙන එක. ඒ විතරක් නොවෙයි, ගංවතුර කාලයට ඒ කණ්ඩි කඩාගෙන යනවා. ඒ නිසා පාලම් block වෙලා ගංවතුර ඇති වෙනවා. එවැනි දැවැන්ත ප්‍රශ්න තොගයක් ඇති වෙනවා.

මේ උණ ගස් නිසාම විශේෂයෙන්ම මතු වෙලා තිබෙන තව ප්‍රශ්න ටිකකුත් තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි ගාල්ල ප්‍රදේශයේ උණ ආශ්‍රිත කර්මාන්ත ගම්මානයක් ආරම්භ කර තිබෙනවා. ඒ, වැලිවිටිය, උඩුවැලිවිටිය සහ උනන්විටිය කියන ප්‍රදේශවල. විශේෂයෙන්ම අපි ක්‍රියාත්මක කරගෙන යන project එකට අමතරව මෙන්න මේ biochar හදන, එහෙම නැත්නම් උණ ආශ්‍රිත ජෛව අඟුරු හදන ව්‍යාපෘතියකුත් යෝජනා වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමාගේ පැත්තෙන් මේ සඳහා උපරිම දායකත්වය ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයත් එක්ක කථා කළාම දැනගන්න ලැබුණා, දැනට වුණත් ඒ ජෛව අඟුරු ග්‍රෑම් 15ක් තේ පැළයකට දානවාට ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය පැත්තෙන් කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. දැනටමත් අපිට මේක ආරම්භ කරන්න පුළුවන්. ඒ ප්‍රමාණය ග්‍රෑම් 15ට වැඩි වෙනවා නම් තමයි ඒගොල්ලන් කියන්නේ ඒ pH අගය වැඩිවීමේ ප්‍රශ්නයක් එනවා කියලා. නමුත් දැනට වුණත්, තේ පැළයකට ඒ ජෛව අඟුරු ග්‍රෑම් 15ක් දමන එකට ඒගොල්ලන් එකඟයි. ඒ නිසා මෙන්න මේ biochar හදන ව්‍යවසායකයනුත් අපි හොයාගෙන තිබෙනවා. ඒ අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මැදිහත් වෙලා තේ කර්මාන්තය ආශ්‍රිතව වාගේම විශේෂයෙන්ම මේ උණ ගම්මානය ආශ්‍රිතව මේ නිෂ්පාදන හඳුන්වා දෙන වැඩ පිළිවෙළක් යෝජනා කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ සඳහා ඔබතුමාගේ අනුමැතිය ලැබෙනවාද, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ මතය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන ආකාරයට අපේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය දැනටමත් ඔය කාර්යයට මැදිහත් වෙලා තිබෙනවා. ඒ වාගේම, අපි තේ ක්ෂේත්‍රයේ ඉන්න පෞද්ගලික ව්‍යවසායකයන් මේ සඳහා යොමු කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් ඔබතුමන්ලාත් සහාය ලබා දෙන්න. එතකොට මේ කටයුත්ත තවදුරටත් ඉදිරියට කරගෙන යන්න පුළුවන්.

## අවිස්සාවේල්ල නගරයේ කෞතුකාගාරය: විස්තර
## அவிசாவளை நகரிலுள்ள அருங்காட்சியகம்: விபரம்
## MUSEUM IN AVISSAWELLA TOWN: DETAILS

1308/2025

**8. ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අවිස්සාවේල්ල නගරයට ආසන්නව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයක් තිබෙන බව දන්නේද;

(ii) එය ඉදිකරන ලද දිනය කවරේද;

(iii) ඒ සඳහා වියදම් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) එහි සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කෞතුකාගාරය ඉදිකර ඇති ඉඩම රජයට අයත් ඉඩමක්ද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත කෞතුකාගාරය සතු කෞතුක භාණ්ඩ සංඛ්‍යාව කොපමණද;

(ii) එම කෞතුක භාණ්ඩ අයත් කාල වකවානු කවරේද;

(iii) මෙම කෞතුකාගාරය ආදායම් උපයන්නේද;

(iv) එසේ නම්, විවෘත කරන ලද දිනයේ සිට මේ දක්වා උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அவிசாவளை நகருக்கு அண்மித்ததாக தொல்பொருளியல் திணைக்களத்துக்குச் சொந்தமான அருங்காட்சியகம் ஒன்று உள்ளதை அறிவாரா என்பதையும்;

(ii) அது நிர்மாணிக்கப்பட்ட திகதி யாது என்பதையும்;

(iii) அதற்காகச் செலவிடப்பட்ட மொத்தப் பணத் தொகை எவ்வளவு என்பதையும்;

(iv) அங்கு பணியாற்றுகின்ற ஊழியர்களின் எண்ணிக்கை ஒவ்வொரு பதவி வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(v) அருங்காட்சியகம் நிர்மாணிக்கப்பட்டுள்ள காணி அரசாங்கத்துக்குரிய காணியா என்பதையும்;

(vi) ஆமெனில், அது தொடர்பான விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி அருங்காட்சியகத்துக்குச் சொந்தமான அருங்காட்சிப் பொருட்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

[ගරු චන්දන සූරියආරච්චි මහතා]

(ii) மேற்படி அருங்காட்சிப் பொருட்கள் எந்தெந்தக் காலத்துக்குரியவை என்பதையும்;

(iii) மேற்படி அருங்காட்சியகம் வருமானம் ஈட்டு கின்றதா என்பதையும்;

(iv) ஆமெனில், திறக்கப்பட்ட நாளிலிருந்து இது வரை ஈட்டப்பட்ட வருமானம் ஆண்டு வாரியாக வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ)இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana, Religious and Cultural Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that there is a museum belonging to the Department of Archaeology located near the Avissawella Town;

(ii) the date it was built;

(iii) the total amount spent on it;

(iv) the number of employees working there, separately by each position;

(v) whether the land on which the museum was built is a State-owned land; and

(vi) if so, the details in that regard?

(b) Will he also inform this House -

(i) the number of artefacts owned by the aforesaid museum;

(ii) the time periods to which the aforesaid artefacts belong;

(iii) whether aforesaid museum generates income; and

(iv) if so, the income generated from the date it was opened to date, separately for each year?

(c) If not, why?

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) අවිස්සාවේල්ල නගරයට ආසන්නව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයක් නොමැති අතර, එම ස්ථානයේ පවත්වාගෙන යන කෞතුකාගාරයක් තිබෙනවා. එම කෞතුකාගාරය පවත්වාගෙන යනු ලබන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදල විසින්.

ගරු කථානායකතුමනි, එම නිසා ගරු මන්ත්‍රීතුමා විසින් අසා තිබෙන අනෙකුත් ප්‍රශ්න සඳහා පිළිතුර අදාළ නොවන බව තමයි ප්‍රකාශ කරන්න තිබෙන්නේ. එනමුත්, ගරු මන්ත්‍රීතුමා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂා කළ අරමුණ වෙනුවෙන් පිළිතුරක් ලබා දීමට මා බලාපොරොත්තු වනවා.

(ii) එහි ඉදිකිරීම් කටයුත්ත සිදු කරනු ලැබුවේ 2024.05.10වැනි දා. නමුත්, මහජන ප්‍රදර්ශන කටයුතු වෙනුවෙන් එම කෞතුකාගාරය විවෘත කරනු ලැබුවේ 2024.07.21වැනි දා.

(iii) එම කෞතුකාගාරය ගොඩනැඟීම වෙනුවෙන් වියදම් දරලා තිබෙනවා, රුපියල් 14,605,466.68ක්.

(iv) දෛනික රාජකාරි කටයුතුවල සේවකයින් හත්දෙනෙක් නිරත වනවා. එම හත්දෙනා ගැන කිව්වොත්, එහි පුහුණු වන උපාධිධාරිනියක් මූලික කටයුතු වෙනුවෙන් මැදිහත් වනවා. ඊට අමතරව ප්‍රවේශ පත්‍ර අලෙවියට සහ ප්‍රකාශන හා අනුරූ අලෙවිය සඳහා අනියම් කම්කරු සේවිකාවක් යොදවා තිබෙනවා. එහි පවිත්‍ර කටයුතු වෙනුවෙන් පුද්ගලයන් දෙදෙනෙකුත්, ආරක්ෂක කටයුතු වෙනුවෙන් පුද්ගලයන් තිදෙනෙකුත් යොදවා තිබෙනවා. කොන්ත්‍රාත් පදනම මත තමයි ඔවුන් යොදවා තිබෙන්නේ. ඒ අනුව දෛනික රාජකාරිවල යෙදෙන පිරිස සංඛ්‍යාත්මකව ගත්තොත් හත්දෙනෙක්.

(v) පැහැදිලිවම එම ස්ථානය ගොඩනැංවීම සඳහා එම ඉඩම පවරාගෙන තිබෙන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව මඟින්.

(vi) ඒ වාගේම මෙය පවරාගෙන තිබෙන්නේ මධ්‍යම සංස්කෘතික අරමුදලට. මධ්‍යම සංස්කෘතික අරමුදලේ මැදිහත්වීමෙන් තමයි කෞතුකාගාරය පවත්වාගෙන යන්නේ.

(ආ) (i) ඇමුණුම 01 මඟින් දක්වා තිබෙනවා.

එහි සඳහන් වෙනවා, මෙම කෞතුකාගාරය තුළ ඇතුළත් වන කෞතුක භාණ්ඩ ප්‍රමාණය කොයි තරම්ද කියන කාරණය.

(ii) මෙම භාණ්ඩවල කාල නියමයක් සිදු කර නොමැති නිසා කාල වකවානුව කුමක්ද කියන කාරණය පිළිබඳව නිශ්චිතව සටහන් කරන්න බැහැ. ඒ, කාල නියමයක් මේ භාණ්ඩ සම්බන්ධයෙන් නොකරපු නිසා.

(iii) ඔව්. මෙම ප්‍රවේශපත් අලෙවි කිරීම හරහා කෞතුකාගාරයට එන සංචාරකයන්ගෙන් ආදායම් උත්පාදනයක් සිදු වෙනවා. ඒ ආදායම් උපදවන ආකාරය සම්බන්ධයෙන් විස්තර ඇමුණුම 02, 03, 04 සහ 05 මඟින් දක්වා ඇත. ඒ අනුව පසුගිය කාලය තුළ මෙහි ලැබූ ආදායම රුපියල් 233,820ක් හැටියට සඳහන් වෙනවා. ඒ වාගේම පසුගිය වර්ෂය තුළ රුපියල් 205,920ක් විධියට මෙහි ආදායම් පෙන්වා තිබෙනවා.

(iv) විශේෂයෙන් 2024 වර්ෂයේ තමයි මෙය ආරම්භ කරනු ලැබුවේ. මා පෙර සඳහන් කළේ 2024 වර්ෂයට සහ 2025 වර්ෂයට අදාළව මේ කෞතුකාගාරය හරහා ලබන ලද ආදායම්.

(ඇ) මේ සඳහාත් කියන්න තිබෙන්නේ මේකයි. අවිස්සාවේල්ල නගරයට ආසන්නයේ පුරාවිද්‍යා

දෙපාර්තමේන්තුවට අයත් කෞතුකාගාරයක් නොමැත. එහෙත් මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන කෞතුකාගාරයක් තිබෙනවා.

ඇමුණුම් 01, 02, 03, 04 සහ 05 **සභාගත*** කරමි.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රාජධානි ඉතිහාසය ගත්තොත්, 1521-1594 කාල පරිච්ඡේදය තමයි සීතාවක රාජධානි කාල සීමාව වෙන්නේ. ඔබතුමා කිව්වා වාගේ මීට වසර දෙකකට පමණ පෙර අවිස්සාවේල්ල තැපැල් කාර්යාලය අසල තමයි මේ කෞතුකාගාරය හදලා තිබෙන්නේ. කෞතුකාගාරයක් හැදෙන එක හොඳයි. ඒ පිළිබඳව අපේ කිසි ගැටලුවක් නැහැ. නමුත්, මේ කෞතුකාගාර නිරීක්ෂණය කිරීමේදී පෙනෙන්න තිබෙන දේ තමයි, රජය දරා ඇති වැය බරත් එක්ක අවශ්‍ය මට්ටමේ කෞතුක වටිනාකමක් ඒ මඟින් ලැබෙනවා ද කියන එක. ඒ ගැන ගැටලුවක් තිබෙනවා. සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විධියට මේ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවාද? යොමු කරලා තිබෙනවා නම් ඒ කොහොමද කියන එක වැඩිදුරටත් මගේ පළමු අතුරු ප්‍රශ්නයෙන් දැනගන්න කැමැතියි.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා මතු කළ විධියටම සීතාවක රාජධානියේ ප්‍රෞඪත්වය, ඒ ඓතිහාසික උරුමය මතු වන ආකාරයේ කෞතුකාගාරයක් මෙහි ස්ථාපනය කිරීම තමයි මූලික අභිප්‍රාය බවට පත් වෙලා තිබුණේ. නමුත් ගරු මන්ත්‍රීතුමා කියන විධියටම සීතාවක රාජධානියට අයත් ඒ උරුමය නිසියාකාරයෙන් පිළිබිඹු වන ආකාරයේ ප්‍රදර්ශනයක්, එහෙම නැත්නම් ඔප් නැංවීමක් මේ ස්ථානය තුළ තවමත් විධිමත්ව සිදු වෙලා නැති බව නිරීක්ෂණයේදී අපටත් හෙළිදරව් වෙනවා. ඒ අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් මැදිහත් වීමෙන් එය විධිමත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා යෝජනා ඉදිරිපත් වී තිබෙනවා.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. දැනට දැනගන්න තිබෙන තොරතුරු අනුව මේ කෞතුකාගාරය ඉදි කළ වර්ෂය තුළ මෙය මධ්‍යම සංස්කෘතික අරමුදලේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේත් නොතිබුණු එකක්. එහෙම තමයි හදිසියක් විධියට මේ කටයුත්ත වෙලා තිබෙන්නේ. සීතාවක කියන්නේ ස්වාභාවික පරිසරය වාගේම ඓතිහාසික රාජධානියක් පිහිටි මූලාශ්‍ර සහිත ප්‍රදේශයක්. ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකම්, ඒ වාගේම ස්වාභාවික පරිසර පද්ධතිය කියන කාරණා සහ විශේෂයෙන් දේශීය හා විදේශීය සංචාරක ව්‍යාපාරයද ඉලක්ක කර ගනිමින් මීට වඩා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වුණා නම් එහි වටිනාකම ඉහළ යන්න පුළුවන්කම තිබුණා. දැනට සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය ඒ සඳහා මැදිහත් වී එම වටිනාකම නිර්මාණය කරන්නත්, එහි ඇත්ත ඓතිහාසික වටිනාකම උද්දීපනය කරගන්නත් පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවාද, මෙය ඉදිවන වකවානුවේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මෙහි මූලික වගකීම දැරුවේ නැත්තේ ඇයි කියන කාරණාවලටත් මම වැඩිදුර පිළිතුරු දැනගන්න කැමැතියි.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)

ගරු කථානායකතුමනි, පසුගිය කාලය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ යම් යම් ක්‍රියාකාරිත්ව පිළිබඳ අපි වරින්වර විවිධ අවස්ථාවල යම් යම් කරුණු කාරණා ඉදිරිපත් කරලා තිබෙනවා. විශේෂයෙන් පසුගිය කාලයට අදාළව මධ්‍යම සංස්කෘතික අරමුදලේ සිද්ධ වෙච්ච යම් යම් අකටයුතුකම් පිළිබඳව, අවිධිමත් මැදිහත්වීම් පිළිබඳව දැන් ත්‍රිපුද්ගල කමිටුවක් හරහා විමර්ශනයකුත් පැවැත්වෙමින් තිබෙනවා. එවැනි ආකාරයේ අවිධිමත් මුදල් පරිහරණයක් සිද්ධ වෙච්ච ආයතනයක් හැටියට ප්‍රකට වෙලා තිබෙනවා, මධ්‍යම සංස්කෘතික අරමුදල. එහෙම එකක දිගුවක් හැටියට තමයි මේ අවස්ථාවත් අපට හඳුනාගන්න තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමා මතු කරන විධියටම මෙම ව්‍යාපෘතිය සඳහා ඉතාම කඩිනම් මැදිහත්වීමක් සිද්ධ කරලා තිබෙනවා. අපි දන්නේ නැහැ එවැනි ආකාරයේ කඩිනම් මැදිහත්වීමක් තුළින් කෞතුකාගාරයක් වාගේ එකක් ස්ථාපනය කරන්නේ ඇයි කියලා. 2024.05.10 දින තමයි මීට අදාළ නිල යතුර භාර ගැනීම සිද්ධ වෙන්නේ, දුම්රිය දෙපාර්තමේන්තුවෙන්. එතැන් සිට ඉතාම වේගවත්ව මාස කිහිපයක් ඇතුළත සාකච්ඡා වට හතක් පවත්වලා ඒ සාකච්ඡා වට හත තුළ ගත්ත තීන්දු තීරණ අනුව තමයි කඩිනමව මේ ව්‍යාපෘතිය සිද්ධ කරලා තිබෙන්නේ. මම හිතන විධියට, ඔවුන්ට -මේ සාකච්ඡාවට සම්බන්ධ වෙච්ච අයට- යම් දෙගිඩියාවක් තිබෙන්න ඇති, තමන්ගේ කාල සීමාව තුළ මේක සිද්ධ කර ගැනීම තමයි වැදගත් කියලා. ඒ අනුව කඩිනමින් මේ කටයුතු කරන්න යාම නිසා අපේ තිබෙන ඓතිහාසික උරුමයත්, පෞරාණිකත්වයත් පිළිබඳව ද්විතීයිකව කල්පනා කරලා වෙනත් පරමාර්ථයක් මූලිකව තබා ගනිමින් තමයි මෙය කඩිනමින් ඉදිකර තිබෙන්නේ. ඒ නිසා අපට නිරීක්ෂණවලදී පැහැදිලිව පේනවා, යම් ආකාරයේ අවිධිමත්භාවයන් ගණනාවක් මේ තුළ තිබෙනවා කියලා. නමුත් දැන් මන්ත්‍රීතුමාත් මතු කරනවා වාගේම අපේ සීතාවක රාජධානියේ ඓතිහාසික ප්‍රෞඪත්වය ඔප්නැංවීම සඳහා මෙවැනි කෞතුකාගාරයක අවශ්‍යතාව තිබෙනවා. එය විධිමත් කරලා පවත්වා ගෙන යාමේ වගකීම දැන් අපට තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා අපේක්ෂා කරන විධියටම ඒ වගකීම දරන්න මධ්‍යම සංස්කෘතික අරමුදලත්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවත් සූදානම් කියන අදහස මේ වෙලාවේදී මා දන්වා සිටින්න කැමැතියි.

## දෙහිඅත්තකණ්ඩිය කොට්ඨාසයේ රජයේ ඉඩම්වල ඉදිකළ දුරකථන සන්නිවේදන කුලුනු: බදු ගෙවීම්
## தெஹியத்தகண்டிய தொகுதியில் அரச காணியில் தாபிக்கப்பட்டுள்ள தொலைத்தொடர்புக் கோபுரங்கள்: குத்தகைப் பணம்
## TELECOMMUNICATION TOWERS ERECTED ON STATE LANDS IN DEHIATTAKANDIYA DIVISION: LEASE PAYMENTS

1320/2025

**9. ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දුරකථන සමාගම් සඳහා මහවැලි-සී කලාපයේ, දෙහිඅත්තකණ්ඩිය කොට්ඨාසය තුළ ඉදිකිරීමට අනුමතිය ලබාදී ඇති දුරකථන සන්නිවේදන කුලුනු සංඛ්‍යාව කොපමණද;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය]

(ii) ඒ සඳහා රජයේ ඉඩම් බදු පදනම මත ලබාදී තිබේ නම්, එම ඉඩම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

(iii) පුද්ගලයකු වෙත බැහැර කර ඇති රජයේ ඉඩමක ඉදිකර ඇති දුරකථන කුලුනකට අදාළ ඉඩම් කොටසේ වටිනාකමට හිමිකම් කීමට අදාළ පුද්ගලයාට ක්‍රමවේදයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) නවමැදගම කොට්ඨාසයේ කාර්මික කටයුතු සඳහා වෙන් කරන ලද ඉඩමේ කොටසක් බෞද්ධ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බැහැර කර තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් කොටසේ විශාලත්වය කොපමණද;

(iii) එම බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වෙන් කරන ලද ඉඩම් කොටස ආසන්නයේ ඉදිකරන ලද ඩයලොග් සමාගමේ සන්නිවේදන කුලුනට අදාළ බදු මුදල් නිසි පරිදි අයකර ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை மகாவலி அதிகாரசபையால் தொலைபேசிக் கம்பனிகளுக்கு மகாவலி 'சீ' வலயத்தின், தெஹியத்தகண்டிய தொகுதியினுள் நிர்மாணிக்க அனுமதி வழங்கப்பட்டுள்ள தொலைத்தொடர்புக் கோபுரங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(ii) அதற்காக அரச காணிகள் குத்தகை அடிப் படையில் வழங்கப்பட்டு இருப்பின், அக் காணிகள் வழங்கப்பட்ட நடைமுறை யாது என்பதையும்;

(iii) தனி நபரொருவருக்கு கையுதிர்க்கப்பட்டுள்ள அரச காணியொன்றில் நிர்மாணிக்கப்பட்டுள்ள தொலைத்தொடர்புக் கோபுரத்துடன் தொடர்புடைய காணித் துண்டின் பெறுமதிக்கு உரித்துக் கோருவதற்கு சம்பந்தப்பட்ட தனிநபருக்கு ஏதேனும் முறையொன்று உள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

ஆ) (i) 'நவமெதகம' தொகுதியில் கைத்தொழில் நடவடிக்கைகளுக்காக ஒதுக்கப்பட்ட காணியின் ஒரு பகுதி பௌத்த நிலையம் ஒன்றை ஆரம்பிப் பதற்காக ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி காணித் துண்டின் விஸ்தீரணம் எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி பௌத்த நிலையத்தின் நிர்மாணத்துக் காக ஒதுக்கப்பட்ட காணித் துண்டுக்கு அருகில் நிர்மாணிக்கப்பட்ட 'டயலொக்' நிறுவனத்தின் தொலைத்தொடர்புக் கோபுரத்துக்கு ஏதுவான குத்தகைப் பணம் முறையாக அறவிடப் பட்டுள்ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation :

(a) Will he inform this House-

(i) the number of telecommunication towers that have been permitted to be erected in the Dehiattakandiya Division of Mahaweli System C by the Mahaweli Authority of Sri Lanka for telecommunication companies;

(ii) if the State-owned lands have been leased out for this purpose, the process that has been followed there; and

(iii) whether there is a mechanism for an individual to whom a plot of State-owned land was disposed of to claim the value of that land, if a telephone tower has been constructed on it?

(b) Will he also inform this House-

(i) whether a portion of the land that has been allotted for industrial works in the Nawamedagama Division has been disposed of to construct a Buddhist Centre;

(ii) if so, the extent of the said portion of land; and

(iii) whether the lease payments for the Dialog telecommunication tower, which has been erected near the plot of land allotted for the construction of a Buddhist Centre, have been duly collected?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) මහවැලි සී කලාපයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දුරකථන කුලුනු 16ක් ඉදිකර ඇත. එම දුරකථන කුලුනු කොට්ඨාස වශයෙන් පහත පරිදි වේ.

සඳුන්පුර කොට්ඨාසය - කුලුනු 06

මැදගම කොට්ඨාසය - කුලුනු 05

සිරිපුර කොට්ඨාසය - කුලුනු 03

මහවනාවෙල කොට්ඨාසය - කුලුනු 02

(ii) යෝජිත ස්ථානය සඳහා දුරකථන කුලුනක් ඉදිකිරීමට අදාළව භෞතික සැලසුම් කමිටු නිර්දේශය හා රේඛීය ආයතනයන්හි නිර්දේශ සමඟ පළමුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සිදු වේ. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා විෂයභාර අමාත්‍යතුමාගේ විධිමත් බදු අනුමැතිය ලැබීමෙන් අනතුරුව භාර දීමේ වාර්තාවක් හරහා අදාළ ආයතනය වෙත ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අනුමැතිය ලබා දේ. පසුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ දීර්ඝ කාලීන බදු පදනම මත දීර්ඝ කාලීන බදුකරයක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදුකෙරේ.

මේ දුරකථන කුලුනු 16හිම තත්ත්වය - ඉඩම බුක්තියට දීලාද, බදු අනුමැතිය ඇවිල්ලාද කියන එක - සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් මෙම පිළිතුරෙහි අන්තර්ගත කර තිබෙනවා ගරු මන්ත්‍රීතුමියනි.

සඳුන්පුර කොට්ඨාසය - දුරකථන කුලුනු 06

- විධිමත් බදු අනුමැතිය ලැබී නොමැති බැවින් විධිමත් පරිදි බැහැර කර නොමැත.

  මැදගම කොට්ඨාසය - දුරකථන කුලුනු 05

- හෙනානිගල උතුර ඩයලොග් කුලුන - අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් අනතුරුව විධිමත් බදු අනුමැතිය ලැබෙන තෙක් අධ්‍යක්ෂ ජනරාල්ගේ ආවරණ අනුමැතිය මත රජයේ ඉඩම් ආඥාපනත යටතේ බැහැර කර ඇත.
- ඉහළගම මොබිටෙල් කුලුන - භෞතික සැලසුම් කමිටු නිර්දේශ ලැබී ඇති අතර විධිමත් බදු අනුමැතිය ලැබී නොමැති බැවින් විධිමත් පරිදි බැහැර කර නොමැත.
- පහලගම හච් කුලුන කුඩාගම මොබිටෙල් කුලුන - රජයේ ඉඩම් ආඥාපනත යටතේ විධිමත් බදු අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බැහැර කර ඇත.
- මැදගම ඩයලොග් කුලුන - අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලද ආවරණ අනුමැතිය මත රජයේ ඉඩම් ආඥාපනත යටතේ බැහැර කර ඇත.

  සිරිපුර කොට්ඨාසය - දුරකථන කුලුන 03

- දෙහිඅත්තකණ්ඩිය හච් කුලුන හා ඩයලොග් කුලුන - විධිමත් බදු අනුමැතිය ලැබී නොමැති අතර භාරදීමේ වාර්තාවක් හරහා භුක්තිය භාර දී ඇත.
- රිදීඇල ඩයලොග් කුලුන - රජයේ ඉඩම් ආඥාපනත යටතේ විධිමත් බදු අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව බැහැර කර ඇත.

  මහවනාවෙල කොට්ඨාසය - දුරකථන කුලුනු 02

- මහවනාවෙල මොබිටෙල් කුලුන - විධිමත් බදු අනුමැතිය ලැබී නොමැති බැවින් විධිමත් පරිදි බැහැර කර නොමැත.
- සමනලතැන්න හච් කුලුන - රජයේ ඉඩම් ආඥාපනත යටතේ විධිමත් බදු අනුමැතිය ලැබෙන තෙක් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලද ආවරණ අනුමැතිය මත බැහැර කර ඇත.

(iii) පුද්ගලයෙකු වෙත බැහැර කර ඇති ඉඩමක දුරකථන කුලුනක් ඉදි කරන අවස්ථාවක 2/1/65/ චක්‍රලේඛ/2021 හා 2021.12.30 චක්‍රලේඛය ප්‍රකාරව ඉඩමට අදාළ ඉඩමෙහි බලපත්‍රය/ දීමනාපත්‍රය නැවත රජයට භාර ගැනීමත්, දුරකථන කුලුන ඉදි කිරීමට යෝජිත බිම් කොටස සඳහා බලපත්‍රකරු/දීමනාපත්‍රකරු නමින් දීර්ඝ කාලීන බදුකරයක් ලබා දීමත්, අනතුරුව අදාළ දුරකථන සමාගම වෙත අතුරු බදු දීම සිදු වේ.

(ආ) (i) මුල් සැලසුමෙහි (සැලසුම් අංක 304) "work shop" කාර්යය සඳහා වෙන් කරන ලද කොටසෙහි බෞද්ධ මධ්‍යස්ථානය ඉදි කර ඇති අතර කාර්මික කටයුතු සඳහා වෙනත් ස්ථානයක් වෙන් කර ඇත. එම වෙන් කරන ලද ස්ථානය ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නවමැදගම ගම්මානයේ මු.පි.අම්.4956 පිඹුරෙහි කැබලි අංක 1 දරන ප්‍රමාණයෙන් හෙක්ටෙයාර 0.5635ක් වූ ඉඩම් කොටස

(iii) බදු මුදල් අය කිරීමක් සිදු වී නොමැත.

(ඇ) විධිමත් බදු අනුමැතිය ලැබී නොමැති බැවින් බදු මුදල් අය කිරීමක් සිදු වී නොමැත.

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අසනු ලබන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මහවැලි කලාපය ආරම්භයේ ඉඳලාම මේ වන විට වාරි ඉඩම් හැර ගොඩ ඉඩම්වල සියයට 25ක වාගේ ප්‍රමාණයක් තමයි ප්‍රයෝජනයට ගන්නේ. නමුත්, පසුගිය දේශපාලන අධිකාරියේ කැමැත්ත මත, යම් යම් පුද්ගලයන් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරලා, ඉඩම් කට්ටි වෙන් කරගෙන තිබෙනවා. නමුත්, මේ වන විටත් ඒ සමහර ඉඩම් කට්ටි මුඩු බිම් වශයෙන් පවතිනවා. සමහර ඉඩම් කට්ටි ඒ අදාළ ව්‍යාපෘතියෙන් බැහැරව වෙනත් අනවශ්‍ය කටයුතුවලට යොදවලා තිබෙනවා. මේවා වාණිජ වටිනාකම් තිබෙන ඉඩම්. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කෙරුණු ඉඩම්වලින් අදාළ ව්‍යාපෘතිය නොකෙරෙන ඉඩම් සම්බන්ධයෙන් ඔබතුමාගේ ස්ථාවරය මොකක්ද කියන එක.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ඉඩම් අල්ලා ගැනීමේ එක් ක්‍රමයක් තමයි ඔය ක්‍රමය. ඒ කියන්නේ ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරනවා, ඒ සම්බන්ධව මොනවා හෝ අනුමැතියක් ගන්නවා, ඊට පස්සේ ඉඩම තමන්ගේ අයිතියේ තබා ගෙන ඉන්නවා, මොනම ව්‍යාපෘතියක්වත් ඒවායේ කරන්නේ නැහැ. සමහර වෙලාවට වෙන කෙනෙකුට බදු දෙනවා, වෙන කෙනෙකුට විකුණනවා, ඉඩම කොටස්වලට කඩනවා. ගොඩක් ඒවාට ඔය වාගේ දේවල් කරලා තිබෙනවා. මහවැලි අධිකාරියේ විතරක් නොවෙයි, LRC එකේ රජයේ ඉඩම්වල හැම තැනම ඔය වාගේ කරලා තිබෙනවා. මහවැලි අධිකාරිය යටතේ තිබෙන මේ වාගේ දීර්ඝ කාලීන බදු පදනම මත ව්‍යාපෘති සඳහා ලබා දුන්නු ඉඩම් සම්බන්ධයෙන් විස්තර අපි මේ දවස්වල කලාප වශයෙන් එකතු කරමින් ඉන්නවා. ඒ ලබා දුන් ඉඩම් ඒ අදාළ කර්තව්‍යයට යොදාගෙන තිබෙනවාද, නිසි පරිදි බදු ගෙවා තිබෙනවාද කියන එක සම්බන්ධයෙන් අපි විස්තර එකතු කරමින් ඉන්නවා. ඒ අනුව අපි කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. බදු ගෙවලා නැත්නම්, ඒ ඉඩම් අපට ලබා ගන්න පුළුවන්. ඒ අදාළ කර්තව්‍යය වෙනුවෙන් යොදා ගන්නේ නැත්නම්, ඒ ඉඩම් නැවත අපට ලබා ගන්න පුළුවන්, ඒ බදු ගිවිසුම් අනුව. ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් ඉන්නේ, ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஏ.எம்.எம்.எம். ரத்வத்தே)
(The Hon. (Mrs.) A.M.M.M. Rathwaththe)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දෙහිඅත්තකණ්ඩිය කලාපයේ දුරකථන කුලුනු 16ක් ස්ථාපනය කරලා තිබෙනවාය කිව්වා. එයින්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය]

එකක් තමයි නවමැදගම තිබෙන කුලුන. නමුත් ඒ සම්බන්ධයෙන් තවමත් නිශ්චිත බදු අනුමැතියක් නැහැ කියලා කියනවා. ඒක 2011 වර්ෂයේදී තමයි ඩයලොග් සමාගමට නිදහස් කරලා තිබෙන්නේ. ලැබෙන තොරතුරු අනුව බදු අනුමැතිය නොලැබුණත්, අදාළ ආයතනයෙන් මාසිකව ලැබෙන මුදල් යම් පුද්ගලයෙකුගේ සාක්කුවට චක්‍රාකාරව යනවාය කියලා තොරතුරු තිබෙනවා. ඉතින් ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ ස්ථාවරය මොකක්ද? මොකද, 2011 ඉඳලා ආණ්ඩුවට ඒ බදු මුදල් අහිමි වෙලා තිබෙනවා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

නවමැදගම කුලුන සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් මේ වෙලාවේ කියන්න බැහැ, ගරු මන්ත්‍රීතුමියනි. මේ පිළිතුරේ "මැදගම ඩයලොග් කුලුන" යනුවෙන් තිබෙන්නේ මම හිතන විධියට ඒක වෙන්න ඕනෑ. "අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ලද ආවරණ අනුමැතිය මත රජයේ ඉඩම් ආඥාපනත යටතේ බැහැර කර ඇත" කියලා තමයි පිළිතුරේ සඳහන් වෙන්නේ. ඒ සම්බන්ධයෙන් මම නිශ්චිත වශයෙන් විස්තර හොයලා බලන්නම්, ගරු මන්ත්‍රීතුමියනි. ගරු කථානායකතුමනි, පොදුවේ ගත්තාම රට පුරාම ඒ වාගේ දුරකථන කුලුනු සිය ගණනක් ඉදිකරලා තිබෙනවා. ඒ ඉදිකිරීම් සඳහා බදු ලබා ගැනීමේ ලොකු ගැටලුවක් තිබෙනවා. සංවර්ධනය වෙනුවෙන්, සන්නිවේදන තාක්ෂණය ප්‍රචලිත කරන්න කුලුනු ඉදිකරන්න ඕනෑ තමයි. හැබැයි ඒවා ඉඩමක නේ ඉදිකරන්න වෙන්නේ, කොහොමටත්. සමහර ඒවා පෞද්ගලික ඉඩම්වල තමයි ඉදිකරන්නේ. ඒ වුණාට ඒ සමහර ඒවා බදු දෙන්න පුළුවන් ඒවා නොවෙයි. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දීපු ඉඩමක සමාගමක් විසින් කුලුනක් හැදුවාම ඒක බදු දෙන්න බැහැ. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ තිබෙන ඉඩම්වල හදන ඒවා බදු දෙන්න බැහැ. රජයේ ඉඩමක තිබෙන එකක් නම්, නිශ්චිත බදු ක්‍රමවේද යටතේ බදු දෙන්න පුළුවන්. ඒ නිසා මොනයම් හෝ කටයුත්තක් සඳහා වුණත්, බදු දෙන ක්‍රමවේදයේ තිබෙන සංකීර්ණ බව නිසා, සමහර ඒවා බදු දෙන්න නොහැකි ඉඩම්වල සවි කර තිබෙන නිසා, සමහර විට ඒ කුලුනු කඩිනමින් ඉදිකරන්න ඕනෑ විම නිසා වාගේ සංකීර්ණ තත්ත්වයන් නිසා ඒවායින් නිසි පරිදි බදු අය වීමේ ප්‍රමාදයන් තිබෙනවා; ගැටලු තිබෙනවා. නමුත් එතැනදී සමාගම් කියන්නේ, ඔවුන් බදු ගෙවන්න ලැහැස්තියි, ඒ ක්‍රමවේදය අනුව ඔවුන්ට බදු දෙන්න කියලායි.

එම නිසා අපි මේ ගැටලුව සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් කාර්යාලයේදීත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමන්ලා මේ සම්බන්ධයෙන් අපට කරුණු වාර්තා කර තිබෙනවා; ගැටලු ඉදිරිපත් කර තිබෙනවා. මේක විධිමත් කරන්න ඕනෑ. ඒ සම්බන්ධ ක්‍රියාවලිය අපි දැන් ආරම්භ කර තිබෙනවා. මේක ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට විතරක් සීමා වෙච්ච ප්‍රශ්නයක් නොවෙයි. රට පුරා තිබෙන දුරකථන කුලුනු ඉදි කරපු ඉඩම් සඳහා බදු මුදල් අය කර ගැනීමේ ගැටලුවක් තිබෙනවා, ගරු කථානායකතුමනි. අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරමින් ඉන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1321/2025- (1), ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## ආබාධිත සිසුන් සඳහා ඇති විශේෂ පාසල් සහ ඒකක: විස්තර
மாற்றுத்திறனாளி மாணவர்களுக்கான விசேட பாடசாலைகள் மற்றும் அலகுகள்: விபரம்
SPECIAL SCHOOLS AND UNITS FOR DISABLED STUDENTS: DETAILS

1321/2025

**10.ගරු ගයාන් ජනක මහතා (ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා වෙනුවට)**
(மாண்புமிகு கயான் ஜனக - மாண்புமிகு சுகத் வசந்த த சில்வா சார்பாக)
(The Hon. Gayan Janaka on behalf of the Hon. Sugath Wasantha de Silva)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ආබාධ සහිත සිසුන් ඉගෙනුම ලබන විශේෂ පාසැල් සංඛ්‍යාව;

(ii) ඒවායේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ආබාධිතභාවය අනුව වෙන් වෙන් වශයෙන්;

(iii) එම විශේෂ පාසැල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(iv) ඒවායේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(v) ශ්‍රී ලංකාවේ ඇති විශේෂ අධ්‍යාපන ඒකක සංඛ්‍යාව;

(vi) ඒවායේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ආබාධිතභාවය අනුව වෙන් වෙන් වශයෙන්;

(vii) එම ඒකකවල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(viii) ඒවායේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ආ) (i) විශේෂ අධ්‍යාපන ගුරු පත්වීම් ලැබ වෙනත් විෂයයන් උගන්වන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන් විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේම සේවා නියුක්ත කරවීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) විශේෂ අධ්‍යාපන ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන්නේද;

(iv) ඒවා පවත්වනු ලබන ආයතන කවරේද;

(v) විශේෂ අධ්‍යාපනයට අදාළ පනත් යාවත්කාලීන කිරීමට ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(vi) විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් ගනු ලබන ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්තිමය තීරණ කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மாற்றுத்திறனாளி மாணவர்கள் கல்வி பயிலும் விசேட பாடசாலைகளின் எண்ணிக்கை;

(ii) அங்கு கல்வி பயிலும் மாணவ, மாணவிகளின் எண்ணிக்கை அவர்களது மாற்றுத்திறனின் அடிப்படையில் வெவ்வேறாக;

(iii) மேற்படி விசேட பாடசாலைகளில் பணியாற்றும் ஆசிரியர்களின் எண்ணிக்கை;

(iv) அவற்றில் நிலவும் ஆசிரிய வெற்றிடங்களின் எண்ணிக்கை;

(v) இலங்கையிலுள்ள விசேட கல்வி அலகுகளின் எண்ணிக்கை;

(vi) அவற்றில் கல்வி பயிலும் மாணவ, மாணவிகளின் எண்ணிக்கை அவர்களது மாற்றுத்திறனின் அடிப்படையில் வெவ்வேறாக;

(vii) அவ்வலகுகளில் பணியாற்றும் ஆசிரியர்களின் எண்ணிக்கை;

(viii) அவற்றில் நிலவும் ஆசிரிய வெற்றிடங்களின் எண்ணிக்கை;

எத்தனை என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) விசேட கல்விக்கான ஆசிரிய நியமனம் பெற்று வேறு பாடங்களைக் கற்பிக்கும் ஆசிரியர்களின் எண்ணிக்கை எத்தனை;

(ii) மேற்படி ஆசிரியர்களை விசேட கல்வித் துறையினுள்ளேயே சேவையில் ஈடுபடுத்துவதற்கு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

(iii) விசேட கல்வி ஆசிரியர்களுக்காகப் பயிற்சி நிகழ்ச்சித் திட்டங்கள் நடத்தப்படுகின்றதா;

(iv) அவற்றை நடத்தும் நிறுவனங்கள் யாவை;

(v) விசேட கல்விக்குரியதான சட்டங்களை இற்றைப்படுத்துவதற்கு எடுக்கும் நடவடிக்கைகள் யாவை;

(vi) முன்மொழியப்பட்டுள்ள புதிய கல்விச் சீர்திருத்தத்தில் விசேட கல்வி தொடர்பாக மேற்கொள்ளப்படவுள்ள நடவடிக்கைகள் மற்றும் கொள்கை ரீதியான தீர்மானங்கள் யாவை;

என்பதையும் அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she state the number of -

(i) special schools where students with disabilities study;

(ii) male and female students studying in them, separately by their disability;

(iii) teachers serving in the said special schools;

(iv) existing vacancies for teachers in them;

(v) special education units in Sri Lanka;

(vi) male and female students studying in those units, separately by their disability;

(vii) teachers serving in these units; and

(viii) existing vacancies for teachers in these units?

(b) Will she also state -

(i) the number of teachers who, despite having been appointed for special education, are currently teaching other subjects;

(ii) the measures that will be taken to ensure that these teachers are employed in special education;

(iii) whether training programmes are conducted for teachers of special education;

(iv) the names of the institutes that conduct them;

(v) the measures that will be taken to update the Acts relating to special education; and

(vi) the measures and policy decisions that will be taken regarding special education through the proposed new education reforms?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) උපකෘත විශේෂ පාසල් - 27

(ii) ඒවායේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ආබාධිතභාවය අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම 01**** මගින් ඉදිරිපත් කර ඇත.

(iii) එම විශේෂ පාසල්වල සේවය කරන,

ස්ථිර ගුරුවරුන් සංඛ්‍යාව - 356

ස්වේච්ඡා ගුරුවරුන් සංඛ්‍යාව - 42

(iv) ඒවායේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව - 49

(v) විශේෂ අධ්‍යාපන ඒකක සහිත ජාතික පාසල් සංඛ්‍යාව - 114

විශේෂ අධ්‍යාපන ඒකක සහිත පළාත් පාසල් සංඛ්‍යාව - 765

(vi) ඒවායේ ඉගෙනුම ලබන ශිෂ්‍යයන් හා ශිෂ්‍යාවන් සංඛ්‍යාව ආබාධිතභාවය අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම 02**** මගින් ඉදිරිපත් කර ඇත.

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

(vii) විශේෂ අධ්‍යාපන ඒකකවල උගන්වන මුළු ගුරුවරුන් සංඛ්‍යාව - 1,456

(viii) ජාතික පාසල් ගුරු පුරප්පාඩු - 17

පළාත් පාසල් ගුරු පුරප්පාඩු - 308

(ආ) (i) දැනට වාර්තා වී ඇති තොරතුරු අනුව සේවයේ නොයෙදෙන ගුරුවරුන් - 108

(ii) විශේෂ අධ්‍යාපනය විෂයක් ලෙස පත්වීම් ලැබ වෙනත් විෂයන් උගන්වන ගුරුවරුන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 42/2012 මඟින් සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන ලේකම්වරුන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත. එමෙන්ම ED/9/18/8/1 අංකය දරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, ගාල්ල වෙත 2024.08.26 දිනැති ලිපිය හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, දකුණ වෙත 2024.08.05 දිනැති ලිපි මඟින් ද දැනුවත් කර ඇත. ඒ අනුව මේ වන විට ගුරුවරුන් නැවත සේවයේ යොදවා ඇත. එසේම විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නොයෙදෙන ගුරුවරුන් පිළිබඳ තොරතුරු පළාත් විෂය අධ්‍යක්ෂවරුන්ගෙන් ලබා ගත් අතර, එම ගුරුවරුන් වහාම නිදහස් කර විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේම සේවයේ යොදවන ලෙස දන්වා ED/9/18/8/1 අංකය දරන 2025.07.14 දිනැති අධ්‍යාපන ලේකම්තුමාගේ අත්සනින් යුතු ලිපිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත. ED/9/18/8/1 අංකය දරන 2025.08.27 දිනැති ලිපිය මඟින් විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නොයෙදෙන ගුරුවරුන් සඳහා පාසලක් නිර්දේශ කර එවන ලෙස දන්වා සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත ලිපියක් ද යොමු කර ඇත.

(iii) ඔව්.

(iv) ජාතික අධ්‍යාපන ආයතනය - NIE, විවෘත විශ්වවිද්‍යාලය - OUSL, අධ්‍යාපන අමාත්‍යාංශයේ නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, කලාප අධ්‍යාපන කාර්යාල

(v)
- 2020.12.03 දිනැති අංක 37/2020 දරන චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය
- 2022.09.08 දිනැති අංක 33/2022 දරන විශේෂ අධ්‍යාපන තක්සේරුකරණය පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය
- 2024.01.31 දිනැති අංක 02/2024 දරන පාසල් යටිතල පහසුකම් සහ පාරිසරික සැකැස්ම පිළිබඳ චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය
- අධ්‍යාපනය සඳහා සාධාරණ ඉඩහසරක් අන්තර්කරණ අධ්‍යාපන මාර්ගෝපදේශය
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් හඳුනා ගැනීම සහ අධ්‍යාපනික මැදිහත්වීම
- අන්තර්කරණ අධ්‍යාපනය කරා ගුරු මාර්ගෝපදේශය ii.
- 2025.07.30 දිනැති අංක 01/2025 දරන චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය

(vi)
- අදාළ විෂයන් විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ට සුදුසු පරිදි අනුවර්තිතව සකස් කිරීම සහ ඊට අදාළව ගුරුවරුන් පුහුණු කිරීම සිදු කරමින් පවතී.
- ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලා ප්‍රතිසංස්කරණ සඳහා අන්තර්කරණ අධ්‍යාපනය හඳුන්වා දීම මෙවර සිදු කරමින් පවතී. විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට විශේෂයෙන් අවධානය යොමු කරමින් පාඩම් ප්‍රවේශ හඳුන්වා දෙමින් විශේෂයෙන් අවධානය යොමු කළ යුතු තැන් පිළිබඳව ගුරුවරයාව දැනුවත් කිරීම අලුත් ප්‍රතිසංස්කරණයට එකතු වීමට නියමිත වේ. එමෙන්ම පුහුණු වැඩමුළුවලදී සිංහල භාෂාව, ගණිතය, විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය, ප්‍රාථමික අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍රයන්ට මෙවර අන්තර්කරණ ප්‍රවේශය හඳුන්වා දීමට නියමිත වේ. UDL - Universal Design for Learning - ක්‍රමවේදය තුළින් ළමයාට වඩාත් පහසුවෙන් ක්‍රියාකාරකම් හඳුන්වා දීමට මැදිහත්වීම මෙහි අරමුණ වේ.
- පාසලේ ප්‍රවේශ පහසුකම් විධිමත් කිරීම, පන්ති කාමර සැලසුම් ළමයාට සුබදායක අයුරින් සැකසීම මෙන්ම වාචිකව පිළිතුරු සැපයීම වැනි අවස්ථා හඳුන්වාදීමත් බලාපොරොත්තු වේ.
- සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පුහුණු වැඩමුළු 54, සම්පත් දායකයින් ISA, ADE, Principal and Teachers 2800 පුහුණු කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට පුහුණු වැඩමුළු 20කට අන්තර්කරණය හඳුන්වා දී ඇත. ඔක්තෝබර් අවසානයේ සියලු පුහුණු කටයුතු අවසන් කිරීමට නියමිතයි.
- Curriculum Guideline යනුවෙන් විෂය මාලාව හඳුන්වා දීමට අත්වැලක් සහිත පොතක් නිර්මාණය කර ආයතන සභාවට ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත.
- පවතින මොඩියුල් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දීම අන්තර්කරණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරනු ලබයි.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ නාරිවේද ඒකකය ක්‍රියාත්මක කිරීම
### கிளிநொச்சி மாவட்ட பொது வைத்தியசாலையின் பெண் நோயியல் அலகை இயக்குதல்
### OPERATIONALIZATION OF GYNAECOLOGY UNIT AT KILINOCHCHI DISTRICT GENERAL HOSPITAL

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27(2)இன்கீழ் சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சர் மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

வடக்கு மாகாண சுகாதார அமைச்சும் நெதர்லாந்து அரசாங்கமும் இணைந்து மத்திய சுகாதார அமைச்சின் அனுசரணையுடன் கிளிநொச்சி மாவட்ட பொது வைத்திய சாலையில் வடக்கு மாகாண பெண் நோயியல் சிறப்பு மருத்துவ அலகொன்றை அமைத்தது. அது 2024ஆம் ஆண்டின் இறுதியில் அப்போதைய சனாதிபதியால் திறந்துவைக்கப் பட்டது. நவீன வசதிகள்கொண்ட கட்டடங்கள் அமைக்கப் பட்டு, நவீன மருத்துவ உபகரணங்கள் நெதர்லாந்து அரசால் தருவிக்கப்பட்டும் கடந்த மூன்று ஆண்டுகளுக்கும் மேலாக அது இயங்க முடியாமல் இருக்கின்றது அல்லது இயங்க விடாமல் தடுக்கப்பட்டு இருக்கின்றது.

சரியான திட்டமிடல் இன்மை, போதிய மற்றும் பொருத்தமான ஆளணிகள் நியமிக்கப்படாமை, நவீன மருத்துவ உபகரணங்களை இயக்குவதற்கான தொழில்நுட்ப

உத்தியோகத்தர்கள் நியமிக்கப்படாமை, அதற்கான பயிற்சிகள் வழங்கப்படாமையால் கிளிநொச்சி மாவட்ட மருத்துவத் துறைக்கான பாரிய நிதியீட்டமும் மருத்துவ வசதியும் முடக்கப்பட்டுள்ளது. இதனால், வடக்கு மாகாணத்தின் மையப்பகுதியில் உள்ள கிளிநொச்சி மாவட்டப் பொது வைத்தியசாலை தன்னிலை இழந்து நிற்கின்றது.

01. முல்லைத்தீவு, புதுக்குடியிருப்பு, மல்லாவி, மன்னார், மாங்குளம், தர்மபுரம், பச்சிலைப்பள்ளி, பூநகரி, முழங்காவில், வேரவில், அக்கராயன், உருத்திரபுரம், வட்டக்கச்சி ஆகிய பிரதேச வைத்தியசாலைகளுக்கான மையப்பகுதியைக் கொண்டிருக்கும் கிளிநொச்சி மாவட்ட பொது வைத்தியசாலையில் அவசர விபத்துப் பிரிவு இன்மை, கண், காது, மூக்கு, பல், தாடைப் பகுதிகளுக்கான நிரந்தர சிகிச்சைப் பிரிவு இன்மை, மகப்பேறு உள்ளிட்ட பெண் நோயியல் சார் மருத்துவ நிபுணர்களின் பற்றாக்குறை, இயன்மருத்துவர்கள், தாதியர்கள், தொழில்நுட்ப உத்தியோகத்தர்கள் உள்ளிட்ட அனைத்து தர நிலைகளுக்குமான ஆளணி வெற்றிடங்கள் நிரப்பப்படாமை உள்ளிட்ட காரணங் களால் கிளிநொச்சி மாவட்ட பொது வைத்திய சாலையின் தரமும் செயற்பாடும் முடங்கிய நிலையில் உள்ளது. அத்துடன், நெதர்லாந்து நாட்டின் நிதி உதவியுடன் உருவாக்கப்பட்ட பெண் நோயியல் சிறப்பு மருத்துவ அலகும் இயங்குவதற்கான ஏதுநிலையை இழந்துள்ளது. அங்கிருக்கும் நவீன மருத்துவ உபகரணங்களை வேறு வைத்தியசாலை களுக்கு மாற்றும் முயற்சிகள் நடைபெறுவதாகவும் குற்றச்சாட்டுகள் முன்வைக்கப்படுகின்றன. எனவே, மிக முக்கியத்துவம் வாய்ந்த கிளிநொச்சி மாவட்ட பொது வைத்தியசாலையின் இயங்குநிலையை உறுதிப்படுத்தும் வகையில் தங்களால் தரப்படும் உத்தரவாதம் என்ன என்பதை இச்சபையில் அறிவிக்க முடியுமா?

02. கிளிநொச்சி மாவட்டப் பொது வைத்தியசாலையில் பெண் நோயியல் சிறப்பு மருத்துவ அலகுக்கான கட்டட நிர்மாணம் மற்றும் மருத்துவ உபகரணங்கள் என்பவற்றுக்காக நெதர்லாந்து அரசால் வழங்கப்பட்ட நிதியீட்டம் இலங்கை ரூபாயில் எத்தனை மில்லியன் என்பதையும், குறித்த நிதி எத்தனையாம் ஆண்டு ஒதுக்கப்பட்டது என்பதையும் அமைச்சர் அறிவிப்பாரா?

03. குறித்த அலகை இயக்குவதற்கான வைத்தியர்கள், தாதியர்கள், கதிரியக்கவியலாளர்கள், உத்தியோகத் தர்கள் உள்ளிட்ட மொத்த ஆளணித் தேவைப்பாடு என்ன? குறித்த ஆளணியினர் எப்போது நியமிக்கப் படுவார்கள்?

04. மேற்குறித்த மருத்துவ அலகுக்கென வழங்கப்பட்ட நவீன மருத்துவ உபகரணங்களை வேறு வைத்திய சாலைகளுக்கு வழங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்படுகின்றதா? அவ்வாறெனில், அதற் கான காரணம் என்ன என்பதையும் இந்த அலகு மூடப்படுமா என்பதையும் அமைச்சர் தெளிவு படுத்துவாரா?

05. இங்குள்ள பெண் நோயியல் அலகை இயங்க வைப்பதற்கும், அதற்கான ஆளணி நியமனம் மேற்கொள்ளப்படுவதற்கும் எவ்வளவு காலம் தேவைப்படும் என்பதையும் குறித்த அலகின் முழுமை யான இயங்குநிலை எப்போது ஆரம்பிக்கப்படும் என்பதையும் அமைச்சர் இச்சபையில் அறிவிப்பாரா?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අසන ලද ප්‍රශ්නයට සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පිළිතුරු ලබා දෙනවා.

01. කිලිනොච්චි රෝහලේ අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී අතර, උපකරණ වෙනත් රෝහල් සඳහා මාරු කිරීම සිදු කරනු නොලැබේ.

02. නෙදර්ලන්ත මූල්‍ය අනුග්‍රහය යටතේ උතුරු පළාත තුළ සෞඛ්‍ය සේවා සැපයීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - DRIVE - මඟින් කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලෙහි විශේෂිත නාරිවේද වෛද්‍ය ඒකකයක් ඉදි කරන ලදී. එහි ඉදිකිරීම් 2019 වසරේදී අරඹන ලද අතර 2024 අගෝස්තු 08වන දින එම ඒකකය රෝහල වෙත භාර දීමට කටයුතු කර ඇත. එහි ඉදිකිරීම් වෙනුවෙන් යූරෝ මිලියන 7.2ක් වෙන් කරන ලද අතර, උපකරණ වෙනුවෙන් යූරෝ මිලියන 8ක් වෙන් කරන ලදී. එය, ආසන්න වශයෙන් ශ්‍රී ලාංකික රුපියල් මිලියන 3,800කි. මෙම මූල්‍ය ආයෝජනය 2019 සිට 2024 දක්වා උපයෝජනය කර ඇති අතර එයින් සියයට 65ක් ණය හා සියයට 35ක් ප්‍රදාන වේ.

03. කිලිනොච්චි රෝහලේ කාර්ය මණ්ඩලය පුළුල් කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින අතර, ඊට අදාළ අනුමැතීන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

ඒ අනුව හඳුනාගනු ලැබූ තනතුරු සංඛ්‍යාව ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල උතුරු පළාත් සභාව යටතේ පාලනය වන රෝහලකි. එක් එක් තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී සේවා අවශ්‍යතාව සලකා බලමින් පළාත් සභාවලටද අනුයුක්ත කිරීම සිදු කරනු ලැබේ. ඉන් උතුරු පළාත් සභාවට අනුයුක්ත කරනු ලබන නිලධාරීන් අතුරින් කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල වෙතද නිලධාරීන් අනුයුක්ත කිරීම පළාත් සභාව වෙතින් සිදු කරනු ලැබේ.

04. එවැනි තීරණයක් ගෙන නොමැත.

ඒ කියන්නේ, වෛද්‍ය උපකරණ වෙනත් රෝහල්වලට ලබා දීමට තීරණයක් අරගෙන නැහැ.

05. කාර්ය මණ්ඩලය අනුමත වූ පසු අදාළ බඳවා ගැනීම් නොපමාව සිදු කරනු ලැබේ.

කිලිනොච්චි දිස්ත්‍රික් මහ රෝහලේ නාරිවේද විශේෂ වෛද්‍ය ඒකකයේ සේවාවන් ලබා දීම දැනටමත් ආරම්භ කර ඇති අතර, ඉදිරි කාලයේදී තවදුරටත් මෙම සේවා ලබා දීමේ කටයුතු පුළුල් කරනු ලැබේ.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் சொன்ன இந்த விடயங்களுக்கு அப்பால், கிளிநொச்சி வைத்திய சாலையில் இருக்கின்ற நெதர்லாந்து அரசு வழங்கிய நவீன உபகரணங்களை தங்கள் வைத்தியசாலைகளுக்கு வழங்குமாறு ஏற்கனவே சில வைத்தியசாலைகளிலிருந்து கடிதங்கள் அனுப்பப்பட்டு இருக்கின்றன. அந்தக் கடிதங்கள் சமூக

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

வலைத்தளங்களிலும் வெளிவந்து இருக்கின்றன. இந்த அலகு 2024ஆம் ஆண்டில் ஆரம்பிக்கப்பட்டு இருந்தாலும், இன்று வரை எந்தவிதமான செயற்பாடுகளும் முன்னெடுக்கப் படவில்லை. அதுமாத்திரமல்ல, அதற்குரிய ஆளணியும் நியமிக்கப்படவில்லை. அதனால் அங்கிருக்கின்ற உபகரணங்கள் வேறு வைத்தியசாலைகளுக்கு இடமாற்றப் படப்போவதை எதிர்த்து அங்குள்ளவர்கள் ஒரு போராட் டத்தையும் செய்திருந்தார்கள். இந்த அலகுக்குப் பொறுப்பாக வுள்ள வைத்திய அதிகாரியையும் நான் சந்தித்திருந்தேன். எனவே, இந்த அலகு எப்போது சரியாக இயங்கும் என்பதை உங்களால் கூற முடியுமா?

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)

ගරු කථානායකතුමනි, ඇත්තටම මම අද උදේත් ඒ අදාළ අධ්‍යක්ෂවරයාත් එක්ක කථා කළා. ඒ අනුව දැනට එහෙම කිසිදු උපකරණයක් වෙනත් රෝහලකට ලබා දීමක් සිදු වෙලා නැහැ. ඒ වාගේම සාමාන්‍යයෙන් රෝහලකට පරිත්‍යාග විධියට ලැබුණු කිසිම උපකරණයක් අපි වෙනත් තැනකට ලබා දෙන්නේත් නැහැ. එම නිසා අපි සහතික වෙනවා, ඔය කිසිම උපකරණයක් වෙනත් කිසිදු ආයතනයකට ලබා දීමක් සිදු නොකරන බවට.

ඒ වාගේම එතැන තනතුරු අනුමත කර ගැනීමේ ප්‍රශ්නයකුත් තිබෙනවා. අපි මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර තිබෙනවා, ඒ අදාළ වෛද්‍යවරුන්ගේ, හෙදියන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩලවල cadre එක අනුමත කර දෙන්න කියලා. එම cadre එක අනුමත වීමෙන් පසුව තමයි ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා දෙන්න පුළුවන් වන්නේ. විශේෂයෙන්ම ඒ රෝහල ඉදි කරනු ලැබුවේ මදසරුභාවය සම්බන්ධයෙන් වූ විශේෂිත පරීක්ෂණ සඳහා සහ විශේෂිත වූ ප්‍රතිකාර ලබා දීම සඳහායි. ඇත්තටම එවැනි ප්‍රතිකාර ක්‍රම කොළඹ තිබෙන රාජ්‍ය අංශයේ රෝහල්වලවත් නැහැ. එවැනි දියුණු, නවීන පහසුකම්වලින් යුත් වාට්ටු සංකීර්ණයක් තමයි එතැන තිබෙන්නේ. එතැනට අවශ්‍ය සේවක සංඛ්‍යාව අනුමත කර දුන්නාම, අපේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කළ යුතු කටයුතු වේගවත් කරන්න අපට පුළුවන්. අපි සහතික වෙනවා, එම රෝහලේ පවතින උපකරණ කිසිසේත් වෙනත් තැනකට ගලවාගෙන යන්නේ නැහැ කියලා.

## II

## විවාහ ලියාපදිංචි කිරීමේ නීතියේ ඇති නොගැළපීම් නිසා මුස්ලිම්වරුන් මුහුණ දෙන ගැටලු

### திருமணப் பதிவு தொடர்பான சட்டங்களிலுள்ள முரண்பாடுகளால் முஸ்லிம்கள் எதிர்நோக்கும் பிரச்சினைகள்

### ISSUES FACED BY MUSLIMS DUE TO INCONSISTENCIES IN MARRIAGE REGISTRATION LAWS

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித் ததற்கு நன்றி!

இலங்கையில் திருமணப் பதிவு தொடர்பான சட்டங்கள் மற்றும் நிருவாகச் சுற்றறிக்கைகளில் உள்ள முரண்பாடுகளால் முஸ்லிம் பிரஜைகள் மற்றும் வெளிநாட்டுப் பிரஜைகள் எதிர்நோக்கும் பிரச்சினைகள் தொடர்பான பின்வரும் வினாக்களைக் கேட்க விரும்புகின்றேன்.

1. பொதுத் திருமணக் கட்டளைச் சட்டம், கண்டிய திருமண, மண நீக்கச் சட்டம், முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டம் என்ற மூன்று சட்டக் கட்டமைப்புகளின்கீழ் மட்டுமே இலங்கைச் சட்டத்தின் ஊடாக திருமணங்களைப் பதிவுசெய்ய முடியும் என்பதை கௌரவ அமைச்சர் அறிவாரா?

2. பொதுத் திருமணக் கட்டளைச் சட்டத்தின்கீழ் வெளியிடப்பட்ட சுற்றறிக்கையின்படி, இரு தரப்பினரும் முஸ்லிம்கள் எனில், அவர்களது திருமணம் முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டத்தின்கீழ் பதிவு செய்யப்பட வேண்டும் என்பதை அமைச்சர் அறிவாரா?

3. மாறாக, முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டத்தின்கீழ் வெளியிடப்பட்ட சுற்றறிக்கையின்படி, தரப்பினரில் ஒருவர் இலங்கைப் பிரஜை அல்லாதபட்சத்தில், அத்தகைய திருமணத்தை அந்தச் சட்டத்தின்கீழ் பதிவுசெய்ய முடியாது என்பதையும், அதற்குப் பதிலாக அதனைப் பொதுத் திருமணக் கட்டளைச் சட்டத்துடன் தொடர்புபடுத்த வேண்டும் என்பதையும் அமைச்சர் அறிவாரா?

4. திருமணத்தில் இலங்கை முஸ்லிம் மற்றும் வெளிநாட்டு முஸ்லிம் சம்பந்தப்பட்டு இருந்தால், தற்போதுள்ள மூன்று சட்ட வகைகளில் எதன்கீழும் குறித்த திருமணத்தைச் சரியாகப் பதிவுசெய்ய முடியாத சூழ்நிலையை உருவாக்கும் வகையில் இந்த முரண்பாடு சட்டரீதியான மற்றும் நிருவாக வெற்றிடத்தை உருவாக்கியுள்ளது என்பதை அமைச்சர் ஏற்றுக்கொள்வாரா?

5. இதன் விளைவாக, முஸ்லிம் பிரஜைகள் தங்கள் திருமணத்தை பொதுத் திருமணக் கட்டளைச் சட்டத்தின்கீழ் பதிவுசெய்வதற்காக அவர்கள் முஸ்லிம் அல்லாதவர்கள் என்று அறிவிக்குமாறு தலைமை பதிவாளர் திணைக்களத்தின் சில அதிகாரிகளால் அழுத்தம் கொடுக்கப்படுவதாகக் கூறப்படுவதை அமைச்சர் அறிவாரா?

6. அமைச்சரால்,

   - இந்தச் சட்ட முரண்பாட்டைத் தீர்க்க,
   - இலங்கை முஸ்லிம்கள் மற்றும் வெளிநாட்டு முஸ்லிம்கள் பாரபட்சமின்றி தங்கள் திருமணங் களைச் சட்டப்படி பதிவுசெய்ய முடியும் என்பதை உறுதிசெய்ய, மற்றும்
   - சட்ட உரிமைகளைப் பெறுவதற்காக முஸ்லிம் நபர்கள் தங்கள் இறை நம்பிக்கையை நிராகரிக் குமாறு அதிகாரிகளால் கட்டாயப்படுத்துவதைத் தடுக்க

   அரசாங்கம் எடுக்கவுள்ள நடவடிக்கைகளை விவரிக்க முடியுமா?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඔව්.
2. එවැනි පනතක් යටතේ චක්‍රලේඛයක් නිකුත් කර නොමැත.
3. එම පනත යටතේ චක්‍රලේඛයක් නිකුත් කර නැත.
4. එවැනි විවාහයකට පවතින නීතිය යටතේ ප්‍රතිපාදන නැත.
5. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් එවැනි පීඩාවකට පත් කිරීමක් සිදු කර නොමැති අතර, දැනට ක්‍රියාත්මක නීතිමය ප්‍රතිපාදන පිළිබඳව මුස්ලිම් පුරවැසියන් දැනුවත් කිරීමක් සිදු කර ඇත.
6. සමාජයීය, සංස්කෘතික, නීතිමය හා අදාළ අනෙකුත් කරුණු සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාවේ පදිංචි මුස්ලිම් ප්‍රජාවට පමණක් නොව ශ්‍රී ලංකාවේ පදිංචි නොවන මුස්ලිම්වරුන්ට වුවද අදාළ වන පරිදි මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ දෙවැනි වගන්තිය සංශෝධනය කිරීම පිළිබඳව සලකා බැලිය යුතුව ඇත. එය ඉතා සංවේදී කරුණක් නිසා යම් පියවරක් ගැනීමේදී හෝ නීතිමය සංශෝධනයක් කිරීමේදී සියලු පාර්ශ්වවල අදහස් ලබාගෙන එම සංශෝධනය කළ යුතුව ඇත.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

கௌரவ அமைச்சர் அவர்களே, நன்றி! இவ்விடயம் தொடர்பில் தெளிவைப் பெறுவதற்காகவே நான் இந்த வினாவைக் கேட்டிருந்தேன்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

2025.06.20 වන දින ගරු රවි කරුණානායක මහතා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයට පිළිතුරු දීමට පිවිසෙන්න කලින් තවත් නිවේදනයක් කරන්න තිබෙනවා. පළමුව ඊට අවසර ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පරමාධිපත්‍ය බලය ජනතාව වෙත පිහිටා ඇති අතර එයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ඇතුළත් වේ. ජනතා පරමාධිපත්‍යය ක්‍රියාත්මක වන ප්‍රධානම යන්ත්‍රණය මැතිවරණයයි. සර්වජන ඡන්ද බලය හිමි වූ ලෝකයේ දෙවන රට ලෙස ඉතිහාසගතව ශ්‍රී ලංකාවේ ජනතාවගේ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 1931 වර්ෂයේ සිට ඡන්ද විමසීම් පවත්වා ඇත.

මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ. (1) ව්‍යවස්ථාවට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණවල කාර්යය සඳහා ඡන්දහිමි නාමලේඛන සැකසීම හා ප්‍රතිශෝධනය කිරීම, එම ඡන්ද විමසීම් පැවැත්වීම එකී බලතලවලට, කාර්යයවලට සහ කර්තව්‍යවලට ඇතුළත් නමුත් ඒවාට පමණක් සීමා නොවන්නේ ය. ඒ අනුව ඡන්ද විමසීම් පැවැත්වීමට අදාළ සියලු නීති බලාත්මක කිරීම ද, දේශපාලන පක්ෂ පිළිගැනීම ද මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන කාර්යයට, කර්තව්‍යයට ඇතුළත් වේ. මේ කටයුතු සඳහා 1955 වර්ෂයේදී මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද අතර පුළුල් ජනතා අපේක්ෂාවන් ඉටු කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේදී මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී. සහභාගිත්ව උපාය මාර්ග සැලැස්මකට අනුව ස්වකීය කාර්යයන් හා කර්තව්‍යයන් මෙහෙයවමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සුවිශාල වැඩ කොටසක් ඉටු කොට තිබේ. ඒ අනුව පවත්වන ලද සියලු මැතිවරණ නිදහස් හා සාධාරණ අයුරින් පැවැත්වීම සඳහා ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය කිරීම, දේශපාලන පක්ෂ පිළිගැනීම, මැතිවරණ නීති බලාත්මක කිරීම, මැතිවරණ පරිපාලන ව්‍යුහය ශක්තිමත් කිරීම හා නව තාක්ෂණය උපරිම අයුරින් යොදා ගෙන තිබීම අප සැමගේ අගය කිරීමට ලක් විය යුතුයි.

පාර්ලිමේන්තු අධ්‍යයනය සඳහා වූ අන්තර්ජාතික ආයතනය - ICPS - සහ බොට්ස්වානා ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව එක්ව සංවිධානය කරන ලද 2025 ඔක්තෝබර් මස 03වන දින පැවැති එහි 21වන අන්තර්ජාතික සම්මන්ත්‍රණයේදී ලෝකයේ සියලුම මැතිවරණ කළමනාකරණ ආයතන අතරින් යහපත් පුරවැසියන්ගෙන් සමන්විත ප්‍රජාවක් නිර්මාණය කිරීම, මැතිවරණ ක්ෂේත්‍රයේ භාවිතාවන් නිවැරදිව හඳුනා ගැනීම, සාක්ෂි මත පදනම් වූ පර්යේෂණ හා ප්‍රතිපත්ති එළිදැක්වීම යන කරුණු මූලිකව පදනම් කරගත් විශේෂ සමීක්ෂණයක ප්‍රතිඵල මත ලෝකයේ හොඳම මැතිවරණ කොමිෂන් සභාව ලෙස ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සම්මානයට පාත්‍ර වී තිබීම අප සැමගේ ඇගයුමට ලක් විය යුතුයි. මෙම සුවිශේෂී ජයග්‍රහණය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාවට සහ එහි සියලු පාර්ශ්වකරුවන් වෙත රජයේ හා ජනතාවගේ ප්‍රශංසාව හිමි විය යුතු බව ප්‍රකාශ කරමි.

## ස්වාධීන කොමිෂන් සභාවල පරිපාලන රාමුව සහ වගවීම: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය
## சுயாதீன ஆணைக்குழுக்களின் நிருவாகக் கட்டமைப்பு மற்றும் பொறுப்புக்கூறல்: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று
## ADMINISTRATIVE FRAMEWORK AND ACCOUNTABILITY OF INDEPENDENT COMMISSIONS: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා විසින් 2025.06.20වන දින ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

1. සපයා ඇති කොමිෂන් සභා ලැයිස්තුව නිවැරදි නොවේ.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) වගන්තිය යටතේ පිහිටුවන ලද කොමිෂන් සභා ඇතුළුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්වාධීන කොමිෂන් සභා 09ක් ස්ථාපිත කර ඇත. දැන් තව එකක් එකතු වෙලා තිබෙනවා. ජාතික කාන්තා කොමිසමක් පත් කර තිබෙනවා. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව - PUCSL - ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Prime Minister, -

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Yes?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
The Independent Women's Commission has not been set up yet, is it?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
It had been set up and members had also been appointed. That happened about two to three weeks ago.

ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස නොසැලකේ. PUCSL යනු ව්‍යවස්ථාපිත ආඥා පනතක් මඟින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි.

2. ඇතැම් ස්වාධීන කොමිෂන් සභා විධිමත් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි - SOPs - අනුගමනය කර ඇති අතර, එසේ නොවන අනෙකුත් කොමිෂන් සභා විසින් අභ්‍යන්තර පරිපාලන මාර්ගෝපදේශ භාවිත කරනු ලැබේ.

3. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සම්මත ක්‍රියා පටිපාටි සඳහා තම නිල වෙබ් අඩවිය මඟින් මහජනතාව වෙත ප්‍රවේශය සපයා ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41(ආ) වගන්තිය යටතේ ස්ථාපිත කර ඇති සියලුම කොමිෂන් සභා ස්වාධීන වන අතර, කොමිෂන් සභාවට අදාළව පවරා ඇති කාර්යභාරය අනුව ස්වකීය අධීක්ෂණ යන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය අදාළ කොමිෂන් සභාව සතුය.

4. ස්වාධීන කොමිෂන් සභා සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි - SOPs - අනුගමනය කිරීම හෝ නොකිරීම සම්බන්ධයෙන් අධිකාරිය එකී කොමිෂන් සභා සතුය.

සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි විධිමත්ව සකස් කොට ක්‍රියාත්මක කිරීම අනිවාර්ය අවශ්‍යතාවක් නොවන බැවින්, එය ස්වාධීන කොමිෂන් සභා අනුව වෙනස් වේ. තවද, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව එකී කොමිෂන් සභා ස්වාධීන වන බැවින් රජයට එවැනි දිනයක් නිශ්චිතව ලබා දිය නොහැකිය.

කාල රාමුවක් පිළිබඳවයි එම ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, ගරු කථානායකතුමනි.

5. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සම්බන්ධව දැනට නෛතික වශයෙන් බැඳීමක් නොමැති අතර මේ සඳහා ව්‍යවස්ථාමය ප්‍රතිපාදන සලසා නොමැති බැවින් එක් එක් කොමිෂන් සභාව විසින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි පාර්ලිමේන්තුවේ සභාගත කිරීම රජය විසින් අවශ්‍යතාව පරිදි සලකා බලනු ඇත.

ස්තුතියි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, එම පිළිතුර ලබා දීම පිළිබඳව ගරු අගමැතිතුමියට ස්තුතිවන්ත වෙනවා. ස්වාධීන කොමිෂන් සභා 9ට දැන් තවත් එකක් අලුතින් එකතු වෙලා තිබෙනවා කිව්වා. මම මේ අවස්ථාවේදී අහනවා, මහ බැංකුව කොයි තැනකටද වැටෙන්නේ කියලා. මොකද, ඒක ස්වාධීන වාගේ තිබුණාට කා තුළටවත් ඒකේ වගකීමක් පැවරෙන්නේ නැහැ. මේ මොහොතේ කිව්වා, සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය කොමිෂන් සභා තුළම තිබෙනවා කියලා. ඒක භාර දීලා තිබෙන්නේ එම ස්වාධීන කොමිෂන්වලටමයි. එතකොට ඒ අය කරන දේවල් අනුව තමයි ආණ්ඩුවේ වගකීම තුළ ඒක හරිද, නැද්ද කියලා කියන්නේ.

ඔබතුමිය කිව්වා, මැතිවරණ කොමිෂන් සභාව, හොඳම කොමිෂන් සභාව ලෙස අපේ ප්‍රදේශයටම ගෞරවයක් ගෙනැල්ලා දීලා තිබෙනවා කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரிணி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ප්‍රදේශයට නොවෙයි, ලෝකයේම හොඳම Election Commission එක හැටියට තමයි අපේ මැතිවරණ කොමිෂන් සභාව නම් කරලා තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු අගමැතිතුමියනි, පළාත් සභා මැතිවරණය කවදාද පවත්වන්නේ කියන එකත් ඒ කොමිසම තුළින්ම නිර්දේශ කරනවා නම් බොහොම හොඳයි. ඒක ලෝකයේ හොඳම කොමිසම නම්, පළාත් සභා මැතිවරණය අවුරුදු 18ක් තිස්සේ නොපැවැත්වීම ගැනත් ඒ කොමිසමටම ගිහින් තිබෙනවා. මම ඒ සම්බන්ධවයි අහන්නේ. අපට අවශ්‍ය වන්නේ ස්වාධීනත්වය. අපේ ජනතාවට ඒකෙන් ප්‍රතිලාභයක් ලබා ගන්නවා මිසක්, ඒ කොමිසමට හොඳ නාමයක් ලබා ගැනීම නොවෙයි සිදු විය යුත්තේ.

ඊළඟට, මම ආණ්ඩුවෙන් මේ ප්‍රශ්නය අහන්නේ, අපටත් මේක කාලයක් තිස්සේ බලපාන කරුණක් නිසායි. මහ බැංකුවේ ස්වාධීනත්වය කොයි ආකාරයෙන්ද පවතින්නේ? කවුද ඒකේ සම්මත මෙහෙයුම් ක්‍රියාවලිය ඇති කරන්නේ? ආණ්ඩුව හිතුවොත්, පොලී අනුපාතය අඩු කරන්න ඕනෑ කියලා, ඒ වාගේම මහ බැංකුවේ අයට හිතුණොත්, "නැහැ, මට ඕනෑ කාර් ටික, මට ඕනෑ වෙන්නේ පඩි වැඩි කර ගන්න, මට ඕනෑ වෙන්නේ ඒ ස්වාධීන ආණ්ඩුවට වුවමනා පොලී අනුපාතය අඩු කිරීමට වැඩිය වැඩි කරන්න" කියලා, ආණ්ඩුව තුළින් ඒක පරිපාලනය වන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, මේක බොහොම සංකීර්ණ ප්‍රශ්නයක්. ගරු කථානායකතුමාගෙන් මම අහනවා, මේ ප්‍රශ්නයට ලැබෙන උත්තරයෙන් නැවත ප්‍රශ්නයක් අහන්න පුළුවන් ද කියලා. නමුත් ඔබතුමාගේ ක්‍රියාදාමය තුළ මට එහෙම අහන්න භයයි. මොකද, ඔබතුමා ඊට පස්සේ රජයේ වැඩ කටයුතු කරන්න කියලා ඕනෑ කියලා ඉදිරියට යනවා නේ. ඒ නිසා මට උත්තරයක් දුන්නොත්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට අදාළ ප්‍රශ්නය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කර ගැනීමක් විතරයි කරගන්න පුළුවන්. නැවත නැවත කරුණු පැහැදිලි කර ගැනීමට ඉඩක් නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පැහැදිලි කර ගැනීමක් තමයි මේ කරන්නේ, ගරු කථානායකතුමනි. උත්තරය දෙන විධිය; ඒ හිනාවෙලා දෙන උත්තරය තුළ අපි ඔක්කොම හිරවෙනවා. අපට පෙනෙනවා, ඊජිප්තුවෙන් පටන් ගත්ත එක ලංකාවට ඇවිල්ලා ඊට පස්සේ නේපාලයට ගිහිල්ලා, මැඩගස්කරයට ගිහිල්ලා, ඉන්දුනීසියාවෙන්, පිලිපීනයෙන්,- මේකෙන් ඉතා භයානක තත්ත්වයක් ඇති වෙනවා. අපේ ඇමති ලාල් කාන්ත මැතිතුමාත් අලුතෙන් හිතන ඇමතිවරයෙක්. මේ ස්වාධීන කොමිෂන් තුළින් ඔබේ ආණ්ඩුව ඉදිරි ගමනක් යන්නේ කොහොමද කියන එකයි මම අගමැතිතුමියගෙන් අහන්නේ.

මම මැතිවරණ කොමිසම ගැන අහනවා. ඊළඟට, මහ බැංකුව තුළ ඇති කරන ස්වාධීනත්වය. ඇයි, අපට තරුණ කොමිසමකුත් එකතු කරන්න බැරිද? මට මතකයි, 1987න් පසුව රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ "තරුණ අසහන කොමිසම" ගෙනැල්ලා ඒකෙන් ලොකු වෙනසක් ඇති වුණා. කාන්තාවන් වෙනුවෙන් කොමිසමක් පත් කළා නම්, තරුණයන් වෙනුවෙනුත් කොමිසමක් පත් කරන්නේ නැත්තේ ඇයි කියලාත් මම අගමැතිනියගෙන් අහනවා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, මම මුලින්ම කාරණයක් කියන්න ඕනෑ. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාව ලෝකයේ හොඳම මැතිවරණ කොමිෂන් සභාව හැටියට නම් කරලා තිබෙනවා. අපි ඒකට ගරුත්වය දිය යුතුයි. මොකද, ඒක මේ රටේ තරුණයින් ඉල්ලන ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන ප්‍රධාන ආයතනයක්. ඒක සුළුපටු දෙයක් නොවෙයි. එම කොමිෂන් සභාව ලෝකයේම ඇගයීමට ලක් වෙලා තිබෙනවා. ඒක එක කාරණයක්.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. පළාත් සභා මැතිවරණය පිළිබඳව ඇති වෙලා තිබෙන අර්බුදය කොමිෂන් සභාවේ ප්‍රශ්නයක් නිසා ඇති වුණු එකක් නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ ඇති වෙච්ච ක්‍රියාවලියක් නිසා තමයි එම මැතිවරණය කල් ගිහිල්ලා තිබෙන්නේ. එහෙම නැතිව, ඒක මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රශ්නයක් නිසා නොවෙයි සිදු වෙලා තිබෙන්නේ. ඒක මැතිවරණ කොමිෂන් සභාවේ වැරැද්දක් හැටියට දකින්න එපා, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයේ සිටි කාලයේ කරපු දේවල් නිසා තමයි ඒක කල් ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ ආණ්ඩු වැරැදි නිසා නේ ඔබතුමියලාව ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ඒක නිවැරදි කරන්න තමයි අපි ඒ ක්‍රියාවලිය තුළ කටයුතු කරන්නේ. ඒ නිසා ඒක කොමිෂන් සභාවේ ප්‍රශ්නයක් නොවෙයි කියන එක මම නැවත වතාවක් අවධාරණය කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]* නැහැ. අපි කවදාවත් මැතිවරණවලින් පැනලා ගිහිල්ලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපේ කාලයේ තමයි මැතිවරණ තුනක් පැවැත්වූයේ. අපේ කාලයේ තමයි කල් දමපු මැතිවරණ නැවත පැවැත්වුවේ. කිසිම පැකිළීමකින් තොරව, ඉතාම සාමකාමීව මැතිවරණ පවත්වපු නිසා තමයි අපේ කාලයේම මැතිවරණ කොමිෂන් සභාවත් ලෝකයේම ගෞරවයට පාත්‍ර වෙලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, Central Bank එකට ස්වාධීනත්වය ලබා දීලා තිබෙන්නේ පනතකින්. ඒ පනත සම්මත වුණෙත් ළඟදි නොවෙයි. පසුගිය ආණ්ඩුව කාලයේ තමයි Central Bank එකේ ස්වාධීනත්වය පිළිබඳ පනත සම්මත වෙලා තිබෙන්නේ. ඔබතුමාට ඒ පනත පිළිබඳව මොනවා හරි යෝජනා තිබෙනවා නම්, එහෙම නැත්නම් Youth Commission එකක් පත් කිරීම සඳහා යෝජනා තිබෙනවා නම් ඒවා ඉදිරිපත් කරන්න. අපි ඒවා පිළිබඳව සාකච්ඡා කරමු. කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය ගරු විජිත හේරත් මැතිතුමා.

## එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ 60වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සම්මත කරගත් යෝජනාව: විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## ஐ.நா. மனித உரிமைகள் பேரவையின் 60ஆவது கூட்டத்தொடரில் நிறைவேற்றப்பட்ட இலங்கை தொடர்பான பிரேரணை: வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரினது கூற்று
## RESOLUTION ON SRI LANKA ADOPTED AT 60TH SESSION OF UNITED NATIONS HUMAN RIGHTS COUNCIL: STATEMENT BY MINISTER OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
ගරු කථානායකතුමනි, පසුගිය මාසයේ පැවති මානව හිමිකම් කවුන්සලයේ 60වන සැසිවාරය සහ එය අවසානයේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සම්මත වූ යෝජනාව ගැන අදහස් කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

ප්‍රථමයෙන් මා කිව යුතුයි, ශ්‍රී ලංකාව පිළිබඳව මානව හිමිකම් කවුන්සලයේ යෝජනාවලියක් සම්මත වූ පළමු අවස්ථාව මෙය නොවන බව. 1980 දශකයේත්, 2009දී යුද්ධය අවසන් වූ පසුවත් වර්තමාන මානව හිමිකම් කවුන්සලය සහ එහි පැරණි ව්‍යුහය වූ මානව හිමිකම් කොමිසම මඟින් ශ්‍රී ලංකාවේ යුද්ධයට සම්බන්ධ

[ගරු විජිත හේරත් මහතා]

සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ගැන යෝජනාවලි ගණනාවක් සම්මත වී තිබෙනවා. ඒ අනුව 2009 සිට පමණක් ගතහොත්, මේ වන විට ශ්‍රී ලංකාව ගැන සම්මත වී තිබෙන යෝජනා ගණන 11ක්. ඒ, 2009, 2012, 2013, 2014, 2015, 2017, 2019, 2021, 2022, 2024දී සහ මෙවර සම්මත වූ යෝජනාවලිය. මෙම යෝජනා සඳහා ඒ ඒ කාලවල සිටි රජයන් විවිධ ප්‍රතිපත්ති අනුගමනය කර තිබෙනවා. ඇතැම් විටක එම රජයන් එම යෝජනාවලටට සහාය පළ කර ඒවායේ හවුල්කරුවන් ද වී තිබෙනවා. ඒ, 2015දී, 2017දී සහ 2019දී. තවත් අවස්ථාවල එවකට පැවති රජයන් යෝජනාවලිය සම්බන්ධයෙන් ඡන්ද විමසුම්වලට ගොස් තිබෙනවා. ඒ, 2012දී, 2013දී, 2014දී, 2021දී සහ 2022දී. තවත් අවස්ථාවල ශ්‍රී ලංකා රජය විසින්ම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. උදාහරණයක් ගත්තොත්, 2009දී. තවත් අවස්ථාවල එවකට පැවති රජයන් ඡන්ද විමසුම්වලට නොගොස් යෝජනාවලියේ ඇති ඇතැම් පරිච්ඡේදවලට පමණක් විරෝධය පළ කර තිබෙනවා.

කෙසේ වෙතත් මෙම සියලුම යෝජනාවලින් ගම්‍ය වන පොදු කරුණු දෙකක් තිබෙනවා. ඉන් පළමුවැන්න තමයි, ජිනීවාවල සිදුවන මෙම ක්‍රියාදාමයට පාදක වන ජාතික ප්‍රශ්න මීට පෙර පැවති කිසිදු රජයක් විසින් නිසි ලෙස කළමනාකරණය නොකිරීම. මෙම යෝජනාවලි අවුරුදු 16කට අධික කාලයක් තිස්සේ මානව හිමිකම් කවුන්සලයේ සම්මත වන්නට ප්‍රධාන හේතුව එයයි. ලෝකයේ ඕනෑම රටක ඇති වන යුද ගැටුම්වලදී මානව හිමිකම් පිළිබඳ ගැටලු පැන නඟින බව අප සියලුදෙනා දන්නවා. නමුත්, එම බොහෝ රටවල මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් තමන්ගේම දේශීය ආයතන මඟින් කටයුතු කර ඒවා විසඳා ගන්නවා, ජාතික සමගිය තව තවත් ප්‍රවර්ධනය කර ගන්නවා. එහෙත් අපේ රටේ පැවති පසුගිය රජයන් විසින් සිදු කළේ මොකක්ද? මානව හිමිකම් ගැටලු දේශීය වශයෙන් විසඳා සමගිය ගොඩ නඟනවා වෙනුවට ඔවුන් කළේ ජාතිවාදී, වර්ගවාදී සහ ආගම්වාදී දේශපාලනයේ නිරත වෙමින් රට භේදභින්න කරමින් සියලු ජාතීන්වල, ආගම්වල ජනතාවගේ අයිතීන් තව තවත් සීමා කරමින් සහ උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වශයෙන් පිළි නොගන්නා රටක් බවට පත් කිරීමයි. ජිනීවා යෝජනාවල විකාශනය බැලුවොත් මෙය පැහැදිලි වෙනවා.

2009දී ජිනීවාවල සම්මත වූ යෝජනාවේ ප්‍රධාන ඉල්ලීම වූයේ, එවකට බලයේ සිටි ජනාධිපතිවරයා එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් වෙත පොරොන්දු වූ පරිදි සියලුම ජන කොටස්වල ගැටලු ආමන්ත්‍රණය කරන තිරසාර ජාතික විසඳුමක් ක්‍රියාත්මක කිරීමයි. නමුත්, එය එසේ සිදු වුණාද? නැහැ. අවුරුදු තුනකට පසුවත් එම ක්‍රියාවලිය සිදු නොවූ පසු රටවල් කිහිපයක් එකතු වී ශ්‍රී ලංකාව පිළිබඳව තවත් යෝජනාවලියක් සම්මත කර ගත්තා, 2012දී. මෙම 2012 යෝජනාවේ ප්‍රධාන වශයෙන් සඳහන් වූයේ එවකට පැවති රජය විසින්ම පත් කළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ - LLRC එකේ - නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලීමයි. නමුත්, එම නිර්දේශ අදාළ රජය විසින් ක්‍රියාත්මක කළාද? නැහැ. එසේ නොවූ තැන කවුන්සලයේදී 2013දී යෝජනාවලියක් සම්මත වුණා, LLRC නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස නැවතත් ඉල්ලමින් සහ සත්‍ය සහ ප්‍රතිසන්ධාන සඳහා වූ ජාතික කොමිසමක් හරහා ගැටලු නිරාකරණය කර ගන්නා ලෙස ඉල්ලමින්. මේ දේවල් සිදු වුණාද? ඒත් නැහැ. තමන්ම පත් කළ LLRC එකේ නිර්දේශ ක්‍රියාත්මක කර ජාතික සමගිය ප්‍රවර්ධනය කරනවා වෙනුවට එවකට පැවති ආණ්ඩු සිදු කළේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් මෙම ජාතික ප්‍රශ්න සහ ජිනීවා ක්‍රියාවලිය පාවිච්චි කිරීමයි. මානව හිමිකම් භීතිකාවක් ඇති කර 2013දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේ තමන්ගේ ඇමතිවරුන් මඟින් මහ කොමසාරිස්තුමියට විවාහ යෝජනා පවා ඉදිරිපත් කළ බව ඔබට මතක ඇති. එහෙම ඉතිහාසයකුත් තිබුණා.

දිගින් දිගටම ජනතාවගේ ප්‍රශ්න මේ විධියට දේශපාලන පාපන්දුවක් බවට පත් කර ගනිමින් මෙම රජයන් විසින් ජාත්‍යන්තරව ශ්‍රී ලංකාව වෙත ඇති විශ්වසනීයත්වය නැති කර ගැනීමේ ප්‍රතිඵලය කුමක්ද? එහි ප්‍රතිඵලය තමයි, ශ්‍රී ලංකාවට තමන්ගේම ජාතික ආයතන මඟින් මානව හිමිකම් ගැටලු විසඳා ගැනීමට නොහැකිය යන මතය ඇතිවීම. මේ නිසා 2021 වසර වන විට මානව හිමිකම් කොමසාරිස්වරයාගේ කාර්යාලය විසින් ශ්‍රී ලංකාවේ සිදුවූයේ යැයි කියන උල්ලංඝනයන් සම්බන්ධයෙන් සාක්ෂි එකතු කිරීම සඳහා විශේෂ ඒකකයක් පිහිටුවනවා. අපේ කියමනක් තිබෙනවා නේ, නියපොත්තෙන් කඩන්න පුළුවන් දේ පොරොවෙන් කපනකම් ඉන්න එපා කියලා. ඒ වාගේ තමයි මේ ප්‍රශ්නයත්. යුද්ධය අවසන් වූ වහාම ජාතික ක්‍රමවේදයක් මඟින් ලෙහෙසියෙන් විසඳාගත හැකිව තිබූ මෙම ජිනීවා ප්‍රශ්නය පටු දේශපාලනික අරමුණු සහ අදූරදර්ශී නායකත්වය නිසා 2021 වසර වන විට ජාත්‍යන්තරීකරණය වෙලා අවසන්.

2024 සැප්තැම්බර් මාසයේදී අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා සහ 2024 ඔක්තෝබර් මාසයේදී අපේ රජය රට භාර ගන්නා විට මෙම පරිහානිය සිදුවී අවසන්. දිළිඳුකම තුරන් කිරීම, දූෂණය පිටුදැකීම සහ එකමුතු රටක් ගොඩනැඟීම සඳහා පසුගිය වසරේ මේ රටේ සියලු ප්‍රදේශවල සහ සියලු ජාතීන්ට, ආගම්වලට අයත් ජනතාව විශාල ජන වරමක් අපට ලබා දුන්නා. මේ ජන වරම ක්‍රියාත්මක කරමින් සියලු ජන කොටස්වලට අයත් අපගේ ජනතාවගේ අයිතීන් තහවුරු කරමින් මෙතෙක් ජාත්‍යන්තරීකරණය වී ඇති මානව හිමිකම් ක්‍රියාවලිය ජාතික තලයට කෙසේ හෝ රැගෙනවිත් ශක්තිමත් සහ ස්වාධීන දේශීය ආයතන මඟින් ප්‍රශ්න විසඳීමයි අපේ අරමුණ. ඒ සඳහා වැදගත් පියවර කිහිපයක්ම අපි දැනටමත් අරගෙන තිබෙනවා.

දෙවැනි කාරණය, මානව හිමිකම් කවුන්සලයේ පවතින ව්‍යුහය සහ සංයුතියට අනුව ශ්‍රී ලංකාව වැනි රටකට ඡන්දයක් ජයග්‍රහණය කිරීමට ඇති අභියෝගයයි. නිව්යෝර්ක්වල තිබෙන එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සෑම ස්වෛරී රාජ්‍යයකටම එක් ඡන්දයක් හිමි වෙනවා. නමුත් ජිනීවාවල තිබෙන මානව හිමිකම් කවුන්සලය එසේ නොවේ. 193ක් වන එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් අතරින් මෙම කවුන්සලයේ එක්වරකට සාමාජිකයන් විය හැක්කේ රටවල් 47කට, අවුරුදු 3ක කාලයක් සඳහා පමණයි. එම සාමාජිකත්වය ලැබෙන්නේත් කලාපීය පදනම මත. ඒ, ආසියා පැසිෆික් කලාපයට 13ක්, අප්‍රිකාවට 13ක්, ලතින් ඇමෙරිකාවට 8ක්, බටහිර යුරෝපයට 7ක් සහ නැඟෙනහිර යුරෝපයට 6ක් වශයෙන්. සමහර කලාපීය කණ්ඩායම් - උදාහරණයක් වශයෙන් යුරෝපය - සාමූහික වශයෙන් එක් මතයක සිටින බැවින් මානව හිමිකම් කවුන්සලයට ඉදිරිපත් කරන යෝජනාවක් පරාජයට පත්වීම ඉතා විරලයි. ශ්‍රී ලංකාව පැත්තෙන් බැලුවහොත්, අපේ රට සම්බන්ධ යෝජනාවක් ජයග්‍රහණය කළේ එක් අවස්ථාවක පමණයි. ඒ 2009 වසරේදී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අපේ රජයම ගෙන ආ යෝජනාවලිය. ඉන් පසු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ සියලු යෝජනා ඡන්ද විමසුම්වලට යොමු කළ අවස්ථාවල රජයේ මතය පරාජය වුණා. ඒ වාගේම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ලැබෙන කුඩා ඡන්ද ප්‍රමාණයද ක්‍රම ක්‍රමයෙන් අඩුවී තිබෙන අතර, ස්ථාවරයක් නොගන්නා රටවල් ගණන වැඩිවීමක් සිදුවී ඇති බව පෙනෙනවා. 2012දී අපි වෙනුවෙන් ලැබුණේ ඡන්ද 47න් 15යි; 2013දී ඡන්ද 13යි; 2014දී ඡන්ද 12යි; 2021දී ඡන්ද 11යි; 2022දී ඡන්ද 7යි. නමුත්, විමතියට කරුණ වන්නේ එවකට සිටි රජයන් පරාජය වන බව දැන දැනත් මෙම ඡන්ද ව්‍යාපාර සඳහා මහජන මුදල් මිලියන ගණන් වැය කිරීමයි.

මැති ඇමතිවරුන් සහ නිලධාරින් මානව හිමිකම් කවුන්සලයේ සාමාජික රටවල සංචාරය කළා. එම ඡන්ද ලබා ගැනීමට අදාළ රටවලට විවිධාකාරයෙන් උදව් පදව් කළා. ජිනීවාවල සැසිය පැවැත්වෙන දිනවලට මැති ඇමතිවරුන් විශාල පිරිසක් සහ නිලධාරින් කණ්ඩායම් දවස් ගණන් ස්විට්සර්ලන්තයේ සිටිමින් කාලය සහ මහජන මුදල් වැය කළා. මේ සියල්ල ඔවුන් කළේ ඡන්දය පරාජය වනවා කියන යථාර්ථය දැන දැනම හුදු මාධ්‍ය සන්දර්ශන මඟින් රටේ ජනතාව නොමඟ යැවීමට පමණයි. මීටත් වඩා ලොකුම ගැටලුව වන්නේ මෙයයි. ඡන්දයක් ඉල්ලමින් අපි ගැටුම්කාරී ආකල්පයකින් කටයුතු කිරීමෙන් සිදු වන්නේ දැනට ජාත්‍යන්තරීකරණය වී ඇති මෙම ප්‍රශ්නය දේශීය තලයට ගෙනැවිත් විසඳීමේ අවකාශය අහුරා දැමීමක් සිදුවීමයි.

ගරු කථානායකතුමනි, දැන් මම කැමැතියි, මෙවර ජිනීවාවල පැවති 60වන මානව හිමිකම් සැසිවාරය වෙත යොමු වන්න. 2024 ඔක්තෝබර් මාසයේදී අපගේ රජය පිහිටුවීමෙන් පසුව මෙම වසරේ මාර්තු මාසයේදී පැවැත්වූ මානව හිමිකම් කවුන්සලයේ සැසිය මම ඇමතුවා. මා විසින්, සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික සහ දේශපාලන අයිතීන් රකිමින් වර්ගවාදී, ආගම්වාදී දේශපාලනය ප්‍රතික්ෂේප කරමින් ජාතික සමගිය හා සංහිඳියාව ගොඩනැඟීම සඳහා අපේම ජාතික යන්ත්‍රණ මඟින් ගන්නා පියවර පිළිබඳව කවුන්සලයේ රටවල් දැනුවත් කළා. ඉන් පසුව මෙම වසරේ ජූනි මාසයේදී මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් වොල්කර් ටර්ක් මහතා ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වුණා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරයෙක් මෙසේ ශ්‍රී ලංකාවට පැමිණියේ අවුරුදු 9කට පසුවයි. ඒ වාගේම, අපි රජය භාරගෙන අවුරුද්දක්වත් යන්නට පෙරයි රජයේ ආරාධනයට ඔහු ශ්‍රී ලංකාවට පැමිණියේ. මෙම සංචාරය අතරතුරේදී ජනාධිපතිතුමා හා රජය, ආගමික නායකයන්, මහජනතාව, සිවිල් සමාජය, දේශපාලන පක්ෂ ඇතුළු සමාජ කොටස් ගණනාවක් සමඟ ඔහු විවෘතව සාකච්ඡා කළා. ශ්‍රී ලංකාවේ සැබෑ තත්ත්වය පිළිබඳව ඔහු සියැසින්ම දැක ගත්තා. මෙම සංචාරයෙන් අනතුරුව මහ කොමසාරිස්තුමා ශ්‍රී ලංකාව පිළිබඳව ඉතා ධනාත්මක නිරීක්ෂණ සිදු කළා. ප්‍රගතිශීලී වෙනසක් පිළිබඳව ශ්‍රී ලංකා සමාජය පුරා ඇති ප්‍රවණතාව, ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකා රජයේ ඇති අව්‍යාජ විවෘතභාවය සහ දේශීය ක්‍රමවේද මඟින් ගැටලු විසඳා ගැනීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ආරම්භය ඔහු පැසසුමට ලක් කළා. පසුගිය සැප්තැම්බර් මාසයේ මහ කොමසාරිස්වරයා කවුන්සලයේ 60වන සැසිවාරයට ඉදිරිපත් කළ වාර්තාවේද මෙම ධනාත්මක අදහස් ඔහු ප්‍රකාශ කර තිබුණා. ශක්තිමත් දේශීය යන්ත්‍රණ මඟින් මානව හිමිකම් ගැටලු විසඳා ගැනීමට මෙම ඓතිහාසික අවස්ථාව භාවිත කරන මෙන් ඔහු ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියා. මෙම වාර්තාව සහ ශ්‍රී ලංකා රජය විසින් එයට සපයන ලද පිළිතුර මා මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඒවා පරිශීලනය කරන ලෙස මම ඔබට ආරාධනා කරනවා. ජිනීවා යෝජනාවලිය සම්මත වීමට පෙර නිව්යෝර්ක්වල පැවැති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල සැසිවාරය අතරතුරේදී ද මානව හිමිකම් කොමසාරිස්වරයා ගරු ජනාධිපතිතුමා සහ මා මුණගැසී සාධනීය සාකච්ඡා සිදු කළා.

ගරු කථානායකතුමනි, මා කලින් පැවසූ පරිදි, ජාතික ගැටලු සහ ජනතාවගේ මානව හිමිකම්, දේශපාලන අවස්ථාවාදී අරමුණුවලට අවුරුදු ගණනාවක් තිස්සේ යට කිරීම හේතුවෙන් 2021 වනවිට ශ්‍රී ලංකාව සම්බන්ධ ජිනීවා යෝජනාවලිය ජාත්‍යන්තරීකරණය වෙලා තිබුණා. 2021දී සම්මත වූ 46/1 යෝජනාවලිය මඟින් ශ්‍රී ලංකාවේ සිදු වූවා යැයි කියන උල්ලංඝනයන් සම්බන්ධයෙන් සාක්ෂි එකතු කිරීමට මහ කොමසාරිස් කාර්යාලයේ Sri Lanka Accountability Project නමින් අංශයක් පිහිටුවනු ලැබුවා. දේශීය නොවන මෙවැනි යන්ත්‍රණ ශ්‍රී ලංකාව පිළිනොගන්නා බව මාර්තු මාසයේදීත්, සැප්තැම්බර් මාසයේදීත් විදේශ කටයුතු ඇමති වශයෙන් මම සහ අපගේ ජිනීවා නිත්‍ය නියෝජිතවරිය ඉතා පැහැදිලිවම කවුන්සලයේදී ප්‍රකාශ කළා. එසේ ජාත්‍යන්තර යන්ත්‍රණ ප්‍රතික්ෂේප කරන අතරතුර අපගේ ප්‍රයත්නය වන්නේ දේශපාලනීකරණය නිසා ජාත්‍යන්තරීකරණයට ලක් වූ මෙම ගැටලු අපේම රටේ ස්වාධීන ක්‍රියාවලි සහ ආයතන මඟින් විසඳා ගැනීම සඳහා සියලුදෙනාගේ සහාය ලබා ගැනීමයි. මෙය අවුරුද්දක් වැනි කෙටි කාලයකින් නිමා කළ හැකි කාර්යයක් නොවේ. නමුත් ඒ සඳහා අඩිතාලම අපි දමමින් සිටිනවා. ඒ සඳහා අපගේ ඇති කැපවීම මානව හිමිකම් කවුන්සලයත් පිළිගෙන තිබෙනවා. මානව හිමිකම්වලට වැදගත් වන, නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අපගේ අධිකරණ පද්ධතිය අපි ශක්තිමත් හා ස්වාධීන කරමින් සිටිනවා. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය, හානිපූරණය පිළිබඳ කාර්යාලය, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කාර්යාලය ස්වාධීන හා ශක්තිමත් කරමින් පවතිනවා. රටේ හදිසි අවස්ථා සඳහා පමණක් සම්මත කර ගත්තත් යුද්ධය නිමාවී අවුරුදු 16කින් පසුවත් ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කර ජාත්‍යන්තරව පිළිගත් සම්මුතීන්වලට අනුකූලව මානව හිමිකම් සුරකිමින් ත්‍රස්තවාදය මැඩ පවත්වන පනතක් අපි ළඟදීම ගෙන එනවා. මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනතට මානව හිමිකම් සුරකින සංශෝධන ගෙන ඒමට අපි අපේක්ෂා කරනවා.

ගරු කථානායකතුමනි, 2009දී යුද්ධය නිම වූ වහාම ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අපි යෝජනා කළා, ඒ හා සම්බන්ධ මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් සත්‍ය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිසමක් ස්ථාපනය කරන ලෙස. යුද්ධය අවසන් වෙලා හරියටම සතියකින් අපි එම යෝජනාව ඉදිරිපත් කළේ. මෙම ජාතික කොමිසම පිහිටුවා එහි නිර්දේශ ක්‍රියාත්මක කළා නම් අද ජිනීවා යෝජනාවලියක් එන්නේ නැහැ. ඔබ හෝ මම ඒ ගැන විවාද පවත්වන්නේත් නැහැ. අවුරුදු 16කට පසු අප බලයට පැමිණෙන මොහොතේදීත් එය සිදුවී තිබුණේ නැහැ. ඒ නිසා ළඟදීම සත්‍ය හා ප්‍රතිසන්ධානය පිළිබඳ පනත මෙම පාර්ලිමේන්තුවේ සම්මත කර එම කොමිසමේ කටයුතු ආරම්භ කිරීමට ඉඩ සලසා දීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ස්වාධීන මහජන අභිචෝදක කාර්යාලයක් පිහිටුවීමට රජය බලාපොරොත්තු වෙනවා. මෙම ප්‍රගතිශීලී පියවර අපි ගන්නේ ජිනීවාවලට පෙන්වීම සඳහා නොවේ. ඒ, වසර ගණනාවක් තිස්සේ රාජ්‍ය මර්දනයට සහ මානව හිමිකම් උල්ලංඝනවලට ලක්වූ දේශපාලන ව්‍යාපාරයක් ලෙස අපට මානව හිමිකම් පිළිබඳ ඇති සැබෑ කැපවීම සහ සියලුම ජන කොටස්වල වින්දිතයන් වෙනුවෙන් ඇති සැබෑ සහකම්පනය නිසායි.

තවද, අප මෙම පියවර ගන්නේ යුද්ධය නිමා කළ හමුදා නිලධාරින් හෝ වෙනත් කිසිදු ජන කොටසක් ඉලක්ක කිරීමට නොවන බව මා පැහැදිලිව ප්‍රකාශ කිරීමට කැමැතියි. අපේ රටේ ජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම, නීතියේ ආධිපත්‍යය සහතික කිරීම, සමගිය ගොඩනැඟීම සහ නැවත බිහිසුණු ගැටුම් ඇති වීම වළක්වා ගැනීම ඔබ, අප සැමගේම වගකීමක්; මෙය අපට තනියෙන් ළඟා කර ගත හැකි අරමුණක් නොවෙයි.

මම දැක්කා සමහර මාධ්‍යවල පළවෙලා තිබෙනවා, පසුගිය 06වැනි දා ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාව මානව හිමිකම් කවුන්සලයේ ඡන්දයකින් තොරව සම්මත වුණා කියලා. මගේ කථාවේ මුලදීම පැහැදිලි කළ පරිදි මානව හිමිකම් කවුන්සලයේ

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු විජිත හේරත් මහතා]

ඡන්දයක් ඉල්ලා සිටීම ඇත්තටම ගත්තොත් ප්‍රශ්නකාරී තත්ත්වයක් මතුවීමක්. පසුගිය රජයන් මහජන මුදල් හා කාලය අවභාවිත කරමින් ඡන්දය පරාජය වන බව දැන දැනම සිදු කළ එම ක්‍රියාවෙන් මහජන විරෝධී සන්දර්ශනවල යෙදීම අපගේ රජයේ ප්‍රතිපත්තිය නොවෙයි. ඔක්තෝබර් 06වැනි දා මෙම යෝජනාවලිය ඉදිරිපත් කළ අවස්ථාවේදී අපගේ නිත්‍ය නියෝජිතවරිය මේ යෝජනාවලිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාවරය පැහැදිලිව ඉදිරිපත් කළා. සැප්තැම්බර් 08වැනි දා ශ්‍රී ලංකාව පිළිබඳ සංවාදයේදී මා විසින් කළ කථාව සහ ඔක්තෝබර් 06වැනි දා ජිනීවා නිත්‍ය නියෝජිතවරිය යෝජනාවලිය ගැන සිදු කළ ප්‍රකාශයත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ඔක්තෝබර් 06වැනි දා ඉදිරිපත් කළ යෝජනාවලියේ මීට පෙර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් වූ යෝජනාවලියන් සමඟ සසඳන විට ධනාත්මක ලක්ෂණ ගණනාවක් තිබුණා. ශ්‍රී ලංකාවේ සිදුවී ඇති ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තනය, ආර්ථික අර්බුදය විසඳා ගැනීමට ගෙන ඇති පියවර, දූෂණය පිටුදැකීම හා මානව හිමිකම් සුරැකීම මෙන්ම සංහිඳියාව සඳහා ආරම්භ කර ඇති ජාතික වැඩ පිළිවෙළ එහි ප්‍රශංසාවට ලක් කර තිබෙනවා. දේශීය ආයතන මඟින් ගැටලු විසඳා ගැනීමට එහි අවකාශය ලබා දී තිබෙනවා. ඒ වාගේම, මෙම යෝජනාව 2021 යෝජනාවේ දිගුවක් වන නිසා එහි අවසන් පරිච්ඡේදය මඟින් Sri Lanka Accountability Project එකේ කාර්යය පවත්වාගෙන යෑමට අනුමැතිය ලැබී තිබෙනවා. පසුගිය සැප්තැම්බර් මාසයේ ඉදිරිපත් වෙච්ච යෝජනාව, 2021දී ඉදිරිපත් වෙච්ච යෝජනාවේ දිගුවක්, ගරු කථානායකතුමනි. මා කලින් සඳහන් කළ ආකාරයට මෙම Accountability Project එක දේශීය යන්ත්‍රණයක් නොවන බැවින් අපේ රජය එය ප්‍රතික්ෂේප කරනවා. මේ බව ඉතා තදින් අපි ඔක්තෝබර් 06වැනි දා මෙම යෝජනාව සාකච්ඡා කරන අවස්ථාවේදී කළ ප්‍රකාශයෙන් අවධාරණය කළා. එමඟින් සිදු වන්නේ බෙදීම් තීව්‍ර වීම සහ රජය ආරම්භ කර ඇති වැඩ පිළිවෙළ අඩාළ වීම බව අපි පෙන්වා දුන්නා.

රජය ආරම්භ කර තිබෙන දේශීය වැඩ පිළිවෙළ සහ ඒ සඳහා මානව හිමිකම් කවුන්සලයේ රටවල්වල ඇති වෙමින් තිබෙන විශ්වසනීයත්වය පදනම් කරගෙන 2021දී ස්ථාපිත කළ මෙම Accountability Project එක අවසන් කර අපේ ප්‍රශ්න අපටම විසඳා ගත හැකි තත්ත්වයක් නුදුරේදීම ඇති කර ගත හැකි බව අපි තරයේ විශ්වාස කරනවා. ඔක්තෝබර් 06වැනි දා පැවති සාකච්ඡාවේදී යෝජනාව ඉදිරිපත් කළ රටවල් කණ්ඩායම වෙනුවෙන් අදහස් දැක්වූ එක්සත් රාජධානිය සිදු කළ ප්‍රකාශයෙන් ද, රජය විසින් අත් කරගෙන තිබෙන දැවැන්ත ප්‍රගතිය පිළිබඳව ප්‍රශංසාවට ලක් කිරීමෙන් මෙය පැහැදිලි වෙනවා. එම කණ්ඩායමට අමතරව ලෝකයේ විවිධ කලාප නියෝජනය කරමින් චීනය, බංග්ලාදේශය, මාලදිවයින, කියුබාව, ජපානය, දකුණු කොරියාව, යුරෝපා සංගමය, ඉතියෝපියාව, කොස්ටරිකා රාජ්‍යය ඇතුළු කවුන්සලයේ සාමාජිකත්වය දරන රටවල් ගණනාවක් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ ප්‍රගතිය පසසමින් ප්‍රකාශ සිදු කළා. තවද, සැප්තැම්බර් 08වැනි දා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පැවැත්වූ සංවාදයේදී රටවල් 43ක් පමණ අදහස් ප්‍රකාශ කළ අතර, ඔවුන් සියල්ලන්ම පාහේ දේශීය ක්‍රියාවලිය තුළින් රජය ගෙන ඇති පියවර අගය කළා. අපේ රජයේ අරමුණ වන්නේ අපේම ජනතාවගේ මානව හිමිකම් දේශපාලනීකරණය කරමින් ජිනීවා යක්ෂයෙක් හෝ ජිනීවා දෙවියෙක් මවාපාමින් පටු දේශපාලන අරමුණු ඉටු කර ගැනීම නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමනි, අපේම ජනතාවගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම අපි මෙම ගරු සභාවේ විවාදයට ලක් කළ යුතු දෙයක් නොවේ. එම අයිතීන් සුරක්ෂිත කිරීම මහජන නියෝජිතයන් වන අපගේ පරම යුතුකම හා වගකීමයි. එයට ඔබ සියලුදෙනා එකඟ වනු ඇතැයි මම හිතනවා. ගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කර ඇති ආකාරයට සියලුම ශ්‍රී ලාංකිකයන් එකමුතුව නිදහසේ ජීවත් වන සාමකාමී සෞභාග්‍යවත් රටක් පිළිබඳ අපට සිහිනයක් තිබෙනවා. සියලුම පාර්ශ්වකරුවන් සහ ජාත්‍යන්තර ප්‍රජාව ද සමඟ සාධනීය ලෙස ගනුදෙනු කරමින් අපගේ අනාගත පරපුර වෙනුවෙන් මෙම සිහිනය යථාර්ථයක් කර ගැනීමේ ගමන යෑමට අපි ඇප කැපවී සිටිනවා. මෙම ජාතික ප්‍රයත්නය සඳහා සහයෝගය ලබා දීම අප සැමදෙනාගේ වගකීමක් බව සිහිපත් කරමින් මෙම කථාව මම අවසන් කරනවා. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඇති සියලුම ලේඛන වාගේම මේ කථාවේ ඉංග්‍රීසි පිටපතත් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟ අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කිරීමට, ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
கௌரவ சபாநாயகர் அவர்களே, 11.09.2025 அன்று நிலையியற் கட்டளை 27(2)இன்கீழ் மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா அவர்களால் கேட்கப்பட்ட வினாவுக்கு - *[இடையீடு]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Hon. Speaker, I rise to a point of Order. I want to get something clarified.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, නිවේදනය clarify කර ගන්න බැහැ. එම නිසා point of Order එකක් මෙතැන නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, විදේශ කටයුතු ඇමතිතුමා ලබා දුන් ඒ පිළිතුර මා අගය කරනවා. ඒ වාගේම තමයි මේ අවස්ථාවේදී මා අගය කරනවා, ඒ දුන් උත්තරය තුළ කියැවුණු පරිදි අපේ UN Permanent Representative, හිමාලි අරුණතිලක මැතිනිය කළ ප්‍රකාශය. නමුත් මේ සම්බන්ධයෙන් අපිට තිබෙන ප්‍රශ්නය ඒකට ඡන්දයක් ඉල්ලුවේ නැත්තේ ඇයි කියන එකයි. ඒ ප්‍රකාශය බොහොම හොඳයි. ඒක අනුගමනය කරන්න තිබුණා, ඒකට ඡන්දයක් පවත්වලා. එතකොට ලෝකය අපිට සහයෝගය දෙනවා කියලා ඔප්පු කරන්න තිබුණා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු විජිත හේරත් ඇමතිතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු කථානායකතුමනි, මගේ කථාව තුළ ඊට හේතු ඉතා පැහැදිලිව, විස්තරාත්මකව ඉදිරිපත් කළා. ගරු මන්ත්‍රීතුමනි, ඒක හරියට තේරුණේ නැතුව තමයි ඔබතුමා ඔය ප්‍රශ්නය අහන්නේ. ඡන්දයක් ඉල්ලුවේ නැත්තේ ඇයි කියන එකට පැහැදිලි පිළිතුර ඉතා විස්තරාත්මකව, ඡේද ගණනාවකින් මම පැහැදිලි කළා. ඒක තමයි පිළිතුර.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දන්නේ නැති නිසායි මම ඇහුවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, කරුණාකරලා මට පැහැදිලි කිරීමක් කරගන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක් ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම පැහැදිලි කිරීමක් කරගන්නයි මේ අවස්ථාව ලබා ගන්නේ, ගරු කථානායකතුමනි. මම ජනතා ඡන්දයෙන් මේ පාර්ලිමේන්තුවට ආවේ මා නියෝජනය කරන ජනතාව නියෝජනය කරන්න මිස පාර්ලිමේන්තුවේ මීයෝ, පූසෝ අල්ලන්න නොවෙයි. විදේශ කටයුතු ඇමතිතුමා වැදගත් ප්‍රකාශයක් කරලා තිබෙනවා, මා නියෝජනය කරන පක්ෂය සහ මේ රට පිළිබඳව. ඒක නිසා මට ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කිරීමක් කරගන්න කරුණාකරලා අවස්ථාව දෙන්න. ඒකට අයිතියක් තිබෙන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ. ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, ඔබතුමාගේ පැහැදිලි කිරීම අතරේ ගොඩක් කාරණා තිබෙනවා මට පැහැදිලි කරගන්න. මම ඒවා පසුව වෙලාවක පැහැදිලි කර ගන්නම්. මට දැන් කාරණා දෙකක් ගැන පැහැදිලි කරගන්න ඕනෑ. ගරු විදේශ කටයුතු ඇමතිතුමනි, පළමුවැනි කාරණය මෙයයි. Why are you deceiving the world? You have not said a word about the Provincial Council Elections in your Statement.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මට කථා කරන්න දෙන්න, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, ඔබතුමා ජිනීවා අගනුවර ගිහිල්ලා කියලා තිබෙනවා, delimitation process එක අවසන් කරලා පළාත් සභා මැතිවරණය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ධීවර අමාත්‍යතුමානී, ඔබතුමාගේ අමාත්‍යාංශ නිවේදනය ඉදිරිපත් කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் - *[இடையீடு]*

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විදේශ කටයුතු ඇමතිතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
When I was in Geneva, I made a Statement. In that Statement, I clearly stated our stand on the Provinical Councils Election. - *[Interruption.]*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Hon. Minister, I just seek two simple clarifications. In Geneva, you mentioned your stand about the Provincial Councils Election and also mentioned that a delimitation process will take place. So, we want to know the status and the timeline of that. That is number one.

Number two is regarding the Office for Reparations. You have mentioned that it will be independent and unbiased. Just out of curiosity, I would like to know whether, currently, the membership of the Office for Reparations has only ex-servicemen. Or does it include others also and are you in the process of getting more members? Those two are my questions.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
As far as the delimitation process is concerned, I think Parliament has a duty. Once it is processed, we will conclude it.

Then, with regard to the next question on the Office for Reparations, there is a separate body for that. I will refer your question to that body. Then, you can get a final answer.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
What is the timeline for the Provincial Councils Election?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Next year.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Next year?

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
Yes. There will be the Provincial Councils Election next year, following proper discussion on the delimitation process and what the election system should be, whether we hold it under the previous system or under a new system. We, Parliament, can decide that. - *[Interruption.]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මේකයි. ඡන්දවලට බය වෙන්න නරකයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. අපි ඡන්දයකට-*[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාත් මේක දන්නවා, GSP Plus සම්බන්ධව-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේක විවාදයක් කරගන්න එපා. ඔය කාරණය point of Order එකක් නොවෙයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
GSP Plus සම්බන්ධව අපි Brusselsවලදී ඡන්දයක් ඉල්ලුවා. ඡන්දයක් ඉල්ලලා අපිට පක්ෂව ඡන්ද හාරසිය ගණනකුත්, විරුද්ධව ඡන්ද එකසිය ගණනකුත් වශයෙන් අපි දින්නා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක point of Order එකක් නොවෙයි. ඡන්දවලට බයයි, අනං මනං කථා නේ කියන්නේ. *[බාධා කිරීම්]* ඡන්දයක් ගැන කථා කරන්නේ. කරුණාකරලා ඉඳගන්න, ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීම්]* කරුණාකරලා වාඩිවෙන්න.

ගරු ධීවර අමාත්‍යතුමා.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ சபாநாயகர் அவர்களே, நிலையியற் கட்டளை 27 (2)இன்கீழ் கௌரவ இராமநாதன் அர்ச்சுனா அவர்களால் கேட்கப்பட்ட வினாவுக்கான விடையை -*[இடையீடு]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point එක මොකක්ද? *[බාධා කිරීම්]*

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු ඇමතිතුමා කළ ප්‍රකාශය සඳහා අපි විවාදයක් බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඊළඟ වතාවේ ඒක කරමු. *[බාධා කිරීමක්]*

ගරු විජිත හේරත් ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු කථානායකතුමනි, එක පැහැදිලි කර ගැනීමක් කරගන්න අවස්ථාව දෙන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා යෝජනා කළා, ජිනීවා යෝජනාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ විවාදයක් කරන්න කියලා. බොහොම හොඳයි. අපිත් ඒකට කැමැතියි. ගරු මන්ත්‍රීතුමනි, අපි එහෙම විවාදයක් කරමු. ඒ විවාදයේදී ඔය කියන අදහස් සහ කරුණු සියල්ල මතු කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා.

## ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයට එරෙහි චෝදනා: ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சுக்கெதிரான குற்றச்சாட்டுகள்: கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரினது கூற்று
## ALLEGATIONS AGAINST MINISTRY OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES: STATEMENT BY MINISTER OF FISHERIES, AQUATIC AND OCEAN RESOURCES

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා විසින් 2025.09.11 වන දින ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත හා රෙගුලාසි උල්ලංඝණය කරමින් ශ්‍රී ලංකාවේ දේශීය හා මහ මුහුදේ සිදුවන නීතිවිරෝධී ධීවර කටයුතු සම්බන්ධයෙන් එම පනතේ 46 වන වගන්තිය ප්‍රකාරව බලයලත් නිලධාරීන් ලෙස නම් කර ඇති ධීවර පරීක්ෂක නිලධාරීන්, නාවික හමුදාවේ සහ වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අදාළ පරීක්ෂා කිරීම්/ වැටලීම් සිදු කර නීත්‍යානුකූලව කටයුතු සිදු කරනු ලබයි.

ඒ අනුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් උතුරු හා නැගෙනහිර දිස්ත්‍රික්කයන්ට අදාළව 2024 වර්ෂයේ සහ 2025 වර්ෂයේ අගෝස්තු මසඅවසානය දක්වා ගොනු කරන ලද නඩු ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| # | දිස්ත්‍රික්කය | 2024 | 2025 (අගෝස්තු මස අවසානය දක්වා) |
|---|---|---|---|
| 01 | යාපනය | 256 | 60 |
| 02 | මුලතිව් | 55 | 103 |
| 03 | මන්නාරම | 70 | 41 |
| 04 | ත්‍රිකුණාමලය | 154 | 97 |
| 05 | මඩකලපුව | 06 | 33 |
| 06 | කිලිනොච්චි | 23 | 26 |
| 07 | කල්මුණේ | 04 | 02 |
| | එකතුව | 568 | 362 |

(ඇමුණුම . මඟින් වැඩිදුර තොතුරු ඇතුලත් කර ඇත)

ඇමුණුම .

නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - යාපනය ධීවර දිස්ත්‍රික්කය

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න භාවිතකර මසුන් මැරීම | 01 | - |
| තහනම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ ළඟතබා ගැනීම | 05 | 01 |
| කෘතිම පහන් ආලෝක මඟින් මසුන් මැරීම | 106 | 13 |
| අනවසර ඉන්දීය ධීවර මෙහෙයුම් | 55 | 07 |
| වලංගු බලපත්‍රයක් රහිතව ධීවර මෙහෙයුම් කිරීම | 23 | 08 |
| අනෙකුත් නීති විරෝධී ක්‍රියා | 66 | 31 |
| එකතුව | 256 | 60 |

නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - මඩකලපුව ධීවර දිස්ත්‍රික්කය

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න භාවිතකර මසුන් මැරීම | 05 | 24 |
| තහනම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ ළඟතබා ගැනීම | - | 01 |
| පුපුරණ ද්‍රව්‍ය භාවිතකර මසුන් මැරීම | | 01 |
| රාත්‍රී කිමිදුම මඟින් මසුන් මැරීම | - | 07 |
| අනෙකුත් නීති විරෝධී ක්‍රියා | 01 | |
| එකතුව | 06 | 33 |

නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - කිලිනොච්චි ධීවර දිස්ත්‍රික්කය

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න භාවිතකර මසුන් මැරීම | 14 | 13 |
| අනවසර ඉන්දීය ධීවර මෙහෙයුම් | - | 07 |
| රාත්‍රී කිමිදුම මඟින් මසුන් මැරීම | 09 | 03 |
| වලංගු බලපත්‍රයක් රහිතව ධීවර මෙහෙයුම් කිරීම | - | 03 |
| එකතුව | 23 | 26 |

නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - මන්නාරම ධීවර දිස්ත්‍රික්කය

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න භාවිතකර මසුන් මැරීම | 21 | 07 |
| තහනම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ ළඟතබා ගැනීම | 01 | 01 |
| පුපුරණ ද්‍රව්‍ය භාවිතකර මසුන් මැරීම | 03 | 02 |
| කෘතිම පහන් ආලෝක මඟින් මසුන් මැරීම | 01 | - |
| රාත්‍රී කිමිදුම මඟින් මසුන් මැරීම | 25 | 11 |
| අනවසර ඉන්දීය ධීවර මෙහෙයුම් | 11 | 14 |
| අනෙකුත් නීති විරෝධී ක්‍රියා | 08 | 06 |
| එකතුව | 70 | 41 |

නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - ත්‍රිකුණාමලය ධීවර දිස්ත්‍රික්කය

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න භාවිතකර මසුන් මැරීම | 11 | 17 |
| තහනම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ ළඟතබා ගැනීම | 01 | - |
| පුපුරණ ද්‍රව්‍ය භාවිතකර මසුන් මැරීම | 19 | 13 |
| කෘතිම පහන් ආලෝක මඟින් මසුන් මැරීම | 23 | 14 |
| රාත්‍රී කිමිදුම මඟින් මසුන් මැරීම | 05 | 09 |
| අනවසර ඉන්දීය ධීවර මෙහෙයුම් | - | - |
| අනෙකුත් නීති විරෝධී ක්‍රියා | 95 | 44 |
| එකතුව | 154 | 97 |

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර මහතා]

**නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - කල්මුණේ ධීවර දිස්ත්‍රික්කය**

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න ළඟ තබාගැනීම හා භාවිතකර මසුන් මැරීම | 01 | - |
| තහනම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ ළඟතබා ගැනීම | 03 | 02 |
| එකතුව | 04 | 02 |

**නීති විරෝධී ක්‍රියාවන් සඳහා ගොනු කරන ලද නඩු - මුලතිව් ධීවර දිස්ත්‍රික්කය**

| වරද | 2024 | 2025 |
|---|---|---|
| තහනම් ආම්පන්න භාවිතකර මසුන් මැරීම | 19 | 78 |
| තහනම් මත්ස්‍ය විශේෂ ඇල්ලීම සහ ළඟතබා ගැනීම | 04 | - |
| පුපුරණ ද්‍රව්‍ය භාවිතකර මසුන් මැරීම | - | 01 |
| කෘතිම පහන් ආලෝක මගින් මසුන් මැරීම | 32 | 23 |
| අනෙකුත් නීති විරෝධී ක්‍රියා | - | 01 |
| එකතුව | 55 | 103 |

2. ➢ නීති විරෝධී ධීවර කටයුතු සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි සහ වාර්තා සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මගින් අදාළ දිස්ත්‍රික් භාර නිලධාරීන් දැනුවත් කර ඇති අතර, පවතින අවම මානව හා භෞතික සම්පත් උපරිම වශයෙන් යොදා ගනිමින් දිස්ත්‍රික් ධීවර කාර්යාල මගින් එම නීතිවිරෝධී ක්‍රියා මැඩලීම සඳහා වැටලීම් සහ නීත්‍යානුකූල පියවර ගැනීම සිදු කරයි. එසේම නිරන්තරයෙන් ධීවර කාර්මිකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් මත්ස්‍ය සම්පතට වන හානිය පිළිබඳව දැනුවත්කිරීම් තුළින් මෙවැනි ක්‍රියා වලක්වා ගැනීම සඳහා කටයුතු කරයි.

➢ ඒ අනුව 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත සහ එහි නියෝග උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් මෙම වසරේ අගෝස්තු 31 න් අවසන් වූ මාස අටක කාලසීමාව තුළ පමණක්, උතුරු නැගෙනහිර දිස්ත්‍රික්කයන්හි, ධීවර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් වැටලීම් 362 ක් සිදුකර ඇති අතර, ඒ සඳහා විධිමත් පරිදි ගරු අධිකරණයන්හි නඩු පැවරීමට කටයුතු කර ඇත.

➢ එසේම මෙම වසරේ මේ දක්වා කාලය තුළ 2018 අංක 1 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු පනත) (සංශෝධන) පනත යටතේ අනවසර ඉන්දීය ධීවර මෙහෙයුම්වලට එරෙහිව නඩු පැවරීම් 30 ක් සිදු කර ඇති අතර, ඒ අතුරින් ඉන්දීය ට්‍රෝලර් යාත්‍රා 15ක නඩු කටයුතු අවසන් කර රාජසන්තක කිරීමට කටයුතු කර ඇත.

3. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය මුහුදු කුඩැල්ලන් වගාව සිදු කිරීමට සුදුසු ස්ථාන හඳුනාගනිමින් එම ස්ථානයන්හි ශක්‍යතා අධ්‍යනයක් සිදු කරනු ලබයි. පසුව එම ස්ථාන ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය එක්ව ඒකාබද්ධ පරීක්ෂාවක් සිදු කර සුදුසු වගාකරුවන් සඳහා පමණක් මුහුදු කුඩැල්ලන් වගාව සඳහා අවසර ලබා දීමට නිර්දේශ කිරීම අනුගමනය කරන ක්‍රමවේදයයි. එබැවින් ගොවිපළ සඳහා දූෂණ සිදුවන බව පිළිගත නොහැකිය.

4. ➢ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ තාක්ෂණික තනතුරු වල විශාල ප්‍රමාණයක් පුරප්පාඩු පවතින අතර එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අවසර අනුමැතිය නොලැබුණු අතර නව රජය බලයට පත්වීමෙන් පසු ඒ සඳහා අනුමැතිය ලැබී ඇත.

➢ ඒ අනුව, අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/25/0399/802/004-II හා 2025.03.10 දිනැතිව නාවික ඉංජිනේරු සහකාර තනතුරු සඳහා විවෘත පදනමින් 10ක් ද, අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/25/0305/802/004-I හා 2025.02.19 දිනැතිව තනතුරු 64කට සහ අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/0855/802/004-IV හා දිනැතිව තනතුරු 51ක්ද වශයෙන් ධීවර නිලධාරී III ශ්‍රේණිය සඳහා විවෘත පදනමින් 115ක් ද, අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/25/0305/802/004-I හා 2025.02.19 දිනැතිව ගුවන් විදුලි නිලධාරී 27ක් ද බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලැබුණු අතර, එම පුරප්පාඩු තනතුරු සඳහා විවෘත පදනමින් තරඟ විභාග 2025 වසරේ ඔක්තොම්බර් මස 08 , 18 හා 19 යන දින පැවැත්වීමට කටයුතු යොදා ඇත.

➢ එමෙන්ම සහකාර අධ්‍යක්ෂ තනතුරු 12ක් පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/23/1355/605/012-VI හා 2023.07.31 සහ අමාත්‍ය මණ්ඩල තීරණ අංක: අමප/23/1172/605/012-V හා 2023.07.11 දිනැතිව සහකාර අධ්‍යක්ෂ තනතුරු 12ක් සඳහා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව තරඟ විභාග පවත්වා සම්මුඛ පරීක්ෂණ ද පවත්වා අවසන් කර ඇත. කෙසේ වුවද මෙම බඳවා ගැනීම් සිදුකර අවසන් කිරීම තව දුරටත් සිදුවන බැවින් දිස්ත්‍රික් ධීවර කාර්යාල වල රාජකාරී ඉටු කිරීම හා රාජකාරී ආවරණය කරන සහකාර අධ්‍යක්ෂවරුන් වෙනුවට නව නිලධාරීන් පත් කිරීම ප්‍රමාද වී ඇත.

➢ එබැවින් 2025 වසරේ සේවා අවශ්‍යතාවය මත සහකාර අධ්‍යක්ෂවරුන් වාර්ෂික ස්ථාන මාරු සිදු කිරීමට 2025.01.30 දින අයදුම්පත් කැඳවූ අතර, ඒ අනුව සේවා අවශ්‍යතාව මත සහ වසර 05කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් දිස්ත්‍රික් ධීවර කාර්යාල අතර, මාරු කිරීම සිදු කරන ලදී. එහි පළමු අදියර ලෙස, පහත පරිදි ස්ථාන මාරු කරන ලදී.

| අනු අංකය | නම | පෙර සේවා ස්ථානය | වර්තමාන සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | එම්.එම්.ආරියරත්න මහතා | මෙහෙයුම් | විමර්ශන හා පුහුණු |
| 02 | ටී.එම්.ඩී.ටී.පීරිස් මහතා | මීගමුව | මෙහෙයුම් |
| 03 | එන්.ශ්‍රීරන්ජන් මහතා | කල්මුණේ | මඩකලපුව |
| 04 | ආර්.සී.කෘෂ් මහතා (රා.ආ.) | මඩකලපුව | කල්මුණේ |
| 05 | ජේ.සුදාගරන් මහතා | යාපනය | මුලතිව් |
| 06 | වී.කැලිස්ටන් මහතා | මන්නාරම | කිළිනොච්චිය |
| 07 | බී.රමේෂ්ඨන්නා මහතා (රා.ආ.) | කිළිනොච්චිය | මන්නාරම |

➢ ඊට අතිරේකව II වන අදියර ලෙස කොළඹ, කළුතර, ගාල්ල, මාතර, තංගල්ල, පුත්තලම සහ මහවැව යන දිස්ත්‍රික් ධීවර කාර්යාලවලද ස්ථාන මාරු සිදු කිරීමට නියමිතයි.

➢ ඒ අනුව, 2025.07.30 දිනැතිව යාපනය දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ මුලතිව් දිස්ත්‍රික් ධීවර කාර්යාලය වෙත ස්ථාන මාරු කර ඇත. මුලතිව් දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ආවරණය කළ සහකාර අධ්‍යක්ෂවරයා ඔහු මුලින් සිටි තනතුරට මුදාහැරි අතර, ඔහු එම තනතුරේ රාජකාරී කටයුතු කළ කිළිනොච්චි දිස්ත්‍රික්කයටම මුදා හැරීම සිදු කරන ලදී. ඔහුගේ ස්ථිර පදිංචිය කිළිනොච්චි දිස්ත්‍රික්කයටම ආසන්න බව වැඩිදුරටත් සඳහන් කරමි.

5. සංස්කරණය කරන ලද වීඩියෝවක් සැරිසරන බව පිළිගනී.

6. හැකිය.

➢ කුරිකට්ටුවාන්වලට අදාළව මේ වන විට මෙම අමාත්‍යාංශය යටතේ සංවර්ධන ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් සිදු නොකරනු ලබන බව කාරුණිකව දන්වමි.

➢ මයිලිඩ්ඩි ධීවර වරායට අදාළව මෙම අමාත්‍යාංශය යටතේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

- පොදු පහසුකම් හා වෙරළ ආශ්‍රිත යටිතල පහසුකම් ආදී ක්ෂේත්‍ර ඔස්සේ ව්‍යාපෘතිය අදියර 4 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, අදියර I, II හා III සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

| ව්‍යාපෘතිය | කාල වකවානුව | යෝජිත / සිදු කර ඇති සංවර්ධන කටයුතු |
|---|---|---|
| මයිලිඩ්ඩි අදියර I | 2018 ජුනි 22 - 2019 මැයි 13 | 1. ප්‍රවේශ ඇළ මාර්ගය ඇතුළු වරාය ද්‍රෝණියෙහි මඩ කැණීම – 1.37 හෙක්ටයාර්<br>2. ජැටි ඉදිකිරීම – දිග 50m<br>3. ඉන්ධන කාර්යාල ගොඩනැගිල්ල<br>4. ඩීසල් හා භූමිතෙල් ටැංකි ඉදිකිරීම<br>5. ඉන්ධන බෙදාහැරීමේ ඒකක ඉදිකිරීම |
| මයිලිඩ්ඩි අදියර II | 2021 ඔක්තෝබර් 29 - 2024 පෙබරවාරි 09 | 1. ප්‍රධාන දියඩනය ප්‍රතිසංස්කරණය කිරීම – 260m<br>2. දෙවන දියඩනය ප්‍රතිසංස්කරණය කිරීම<br>3. Navigation light සවි කිරීම<br>4. ජැටි ඉදිකිරීම |
| මයිලිඩ්ඩි අදියර III | 2025 - 2026 (ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී) | 1. වෙන්දේසි ශාලාව ඉදිකිරීම<br>2. වෙරළ ආරක්ෂක කාර්යාලය සහ නවාතැන් ගොඩනැගිල්ල ඉදිකිරීම<br>3. වැසිකිළි ගොඩනැගිල්ල ඉදිකිරීම<br>4. පරිපාලන ගොඩනැගිල්ල සහ ආරක්ෂක කාර්යාලය ඉදිකිරීම<br>5. කළමණාකරුගේ නිලනිවස ඉදිකිරීම<br>6. තනිකඩ නේවාසිකාගාරය ඉදිකිරීම<br>7. පාලම් තරාදිය, අභ්‍යන්තර මාර්ග, මායිම් තාප්පය ඉදිකිරීම , වීථි ලාම්පු සවිකිරීම, ඇතුලු භූමි අලංකරණය |
| මයිලිඩ්ඩි අදියර IV | 2027 - 2029 | ජැටිය දීර්ඝ කිරීම හා වරාය බෙසම ගැඹුරු කිරීම *(ශක්‍යතා අධ්‍යයනය සිදු කර සැලසුම් සකස් කළ යුතුය)* |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: 2025.10.08 දින ගරු අග්‍රාමාත්‍යතුමියට ඉදිරිපත් කරන ලද ප්‍රශ්නය හරහා පැහැදිලි කිරීමක් ලබා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වීම
## சிறப்புரிமை: 2025.10.08ஆம் திகதி மாண்புமிகு பிரதம அமைச்சரிடம் விடுக்கப்பட்ட வினாமூலம் விளக்கம் பெறும் வாய்ப்பை இழத்தல்
## PRIVILEGE: LOSS OF OPPORTUNITY TO SEEK CLARIFICATION THROUGH QUESTION POSED TO HON. PRIME MINISTER ON 08.10.2025

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි. Point of Order එකක් නැතත් වරප්‍රසාද ප්‍රශ්නය හරි මතු කරන්න ඔබතුමා ඉඩ දීලා තිබෙනවා. ඉස්සෙල්ලාම ඔබතුමාට ඒකට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මම මේ වරප්‍රසාද ප්‍රශ්නය මතු කරන්නේ ඊයේ දවසේ මේ පාර්ලිමේන්තුවේ වුණු සිදුවීමක් පිළිබඳවයි.

2025.10.08 දිනට නියමිත ගරු අගමැතිතුමියගෙන් අසනු ලබන ප්‍රශ්න යටතේ මා විසින් 2025.10.02 දින ප්‍රශ්නයක් ඉදිරිපත්

කරන ලදී. එහෙත් එය සංශෝධනය කරන ලෙස මා වෙත දන්වා තිබූ අතර -ගරු කථානායකතුමනි, මම මේ යවපු ප්‍රශ්න ටික සංශෝධනය කරන්න කියලා මට කථා කරලා කිව්වා- ඒ අනුව සංශෝධිත ප්‍රශ්නය මා විසින් 2025.10.03 දින -ගිය සතියේ සිකුරාදා- ඉදිරිපත් කරන ලදී. එහෙත් නැවත එහි කරුණු කිහිපයක් අන්තර්ගත වී තිබෙන බව පවසා එය ප්‍රතික්ෂේප කර ඇත. එබැවින් මා විසින් එම ප්‍රශ්නය දෙවන වරටත් සංශෝධනය කර එදිනම නැවත ඉදිරිපත් කරන ලදී. දැන් මේක Leader of the Houseගේ Office එකට ගිහිල්ලා තිබෙන්නේ. එතකොට, මේ පාර්ලිමේන්තුව තුළ ගරු අග්‍රාමාත්‍යතුමියව නොමඟ යවලා තිබෙනවා. මම දන්නේ නැහැ, ඒක ආණ්ඩුවෙන්මද කළේ, කවුද කළේ කියලා. එහෙත් 2025.10.08 දින මා විසින් අවසන් වරට සංශෝධනය කරන ලද ප්‍රශ්නය ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත ඉදිරිපත් කළද, එතුමිය විසින් එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට සති දෙකක කාලයක් ලබා ගන්නා ලද අතර - ගරු කථානායකතුමනි, සති දෙකක කාලයක් ගත්තාට ප්‍රශ්නයක් නැහැ. අග්‍රාමාත්‍යතුමිය සති දෙකක් නොවෙයි, මාසයක් කල් ඉල්ලුවත් මම "හා" කියනවා. හැබැයි, අග්‍රාමාත්‍යතුමියට මේ පාර්ලිමේන්තුවේ බොරු කියවන්න සැලැස්සුවා. අග්‍රාමාත්‍යතුමියගේ කටින් බොරුවක් කියෙව්වා, ආණ්ඩුවේ කට්ටිය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ලබා දී තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මම කියවන්නම්.

එතුමිය වෙත එම ප්‍රශ්නය ලැබුණේ 2025.10.07 දින බව පවසන ලදී. පව්! එතුමියට දුන්නේ කවදාද දන්නේ නැහැ. මම ඒ ගැන ප්‍රශ්න කරන්නේ නැහැ. එතුමිය, ප්‍රතික්ෂේප කළ ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දීමට සූදානම්ව සිටි බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ඊයේ ප්‍රශ්නයට අද උත්තර නොදුන්නේ ගරු කථානායකතුමනි, අද ගරු විජිත හේරත් ඇමතිතුමා මේක කියන නිසා. Politburo එකේ එකඟතාව යටතේ අග්‍රාමාත්‍යතුමිය කියන්නේ නැහැ. ගරු විජිත හේරත් ඇමතිතුමා කියයි. එතුමා ගාණට, අනවශ්‍ය ටික කියන්නේ නැතිව කියයි කියලා එකඟතාව යන්න ඇති.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ කියවනවා, ගරු කථානායකතුමනි.

ඉහත සංසිද්ධියෙන් මාහට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරයාගේ වර්තාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට සහ පැහැදිලි කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වීම මාගේ වරප්‍රසාද කඩවීමක් ලෙස මාහට හැඟී යයි.

දැන් දැක්කා නේ. මට තිබෙන ප්‍රශ්නය අහන්න දෙන්නේ නැහැ, ඔබතුමා. මගේ වරප්‍රසාද කඩ වනවා. ඊයේ මම ඇහුවා අග්‍රාමාත්‍යතුමියගෙන්. එතුමිය-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මේ දීලා තිබෙන ප්‍රශ්නය කියවන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
දැන් එහෙම නම් අහන්න තිබෙන ප්‍රශ්නය අහන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කියවන්න.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මේ කියවනවා.

ඉහත සංසිද්ධියෙන් මාහට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරයාගේ වර්තාව සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට සහ පැහැදිලි කර ගැනීමට තිබුණු අවස්ථාව අහිමි වීම මාගේ වරප්‍රසාද කඩවීමක් ලෙස මාහට හැඟී යයි. එබැවින් මෙම වරප්‍රසාද කඩවීම වරප්‍රසාද පිළිබඳ කමිටුවට ඉදිරිපත් කරන ලෙස මා විසින් කාරුණිකව ඉල්ලා සිටිමි. එමෙන්ම, ප්‍රතික්ෂේප කළ ප්‍රශ්න සඳහා පිළිතුරු සූදානම්ව පැමිණ පිළිතුරු ලබා දීමට නියමිතව තිබූ ප්‍රශ්නයට පිළිතුරු ලබා නොදීමේ ගැටලුවට හේතුව වූයේ අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රමාදයක් හේතුවෙන්ද, සභානායක කාර්යාලයේ ප්‍රමාදයක් හේතුවෙන්ද, පාර්ලිමේන්තුවේ මහ ලේකම් කාර්යාලයේ ප්‍රමාදයක් හේතුවෙන්ද යන්න ගැන විමර්ශනයක් කරන මෙන්ද වැඩිදුරටත් ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, මම පළාත් සභා-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රකාශය සිදු කර අවසන්.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අග්‍රාමාත්‍යතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඉතාම කෙටියෙන් මම එතුමාට පිළිතුරක් දෙන්නම්.

සංශෝධනයක් ඉල්ලා තිබෙනවාද කියලා මම දැන් check කළා. සභානායක කාර්යාලයෙන් ඉල්ලා තිබෙන්නේ, වචන ප්‍රමාණය අඩු කරන්න කියලා. වචන ප්‍රමාණයේ සීමාවක් තිබෙනවා. වචන 150යි. එම වචන සීමාවට අනුකූලව ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කියලා තමයි තිබුණේ. ඒ වාගේම මගේ කාර්යාලයට පෙරේදා දහවල් 12ට පමණ තමයි අලුත් ප්‍රශ්නය ලැබුණේ. ඒ අලුත් ප්‍රශ්නය පෙර ප්‍රශ්නයට වඩා හාත්පසින්ම

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

වෙනස්. ඒකට මම උත්තර දෙන්න බැහැ කිව්වෙත් නැහැ. ඒකටත් උත්තර ලබා දෙන්න මම සති දෙකක කාලයක් ඉල්ලුවා. අනෙක් ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ලැහැස්ති වෙලා තිබුණු බව ඇත්ත. පෙරේදා දහවල් 12ට පමණ ලැබුණු ප්‍රශ්නයට මට එකපාර පිළිතුරු සපයන්න නොහැකි නිසා තමයි සති දෙකක කාලයක් ඉල්ලුවේ. එහෙම නැතුව ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දීම පිළිබඳව මෙතැන කිසිම කුමන්ත්‍රණයක් නැති බවත් මතක් කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව මම සොයා බලන්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මගේ ප්‍රශ්නය ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුවට යවනවාද, නැද්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ පිළිබඳව හොයලා බලන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
හොයලා බලනවා නොවෙයි-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එය මගේ අභිමතය. ඒ ගැන හොයලා බලන්නම්.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත් කෙටුම්පත
### சமூகப் பாதுகாப்பு உதவுதொகை அறவீடு (திருத்தம்) சட்டமூலம்
### SOCIAL SECURITY CONTRIBUTION LEVY (AMENDMENT) BILL

"Bill to amend the Social Security Contribution Levy Act, No. 25 of 2022."

***පිළිගන්වන ලද්දේ අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය විසිනි.***

***2025 ඔක්තෝබර් 23වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமான மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2025 ஒக்ரோபர் 23, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப் பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் அரசாங்க நிதி பற்றிய குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளை யிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Harini Amarasuriya, Prime Minister and Minister of Education, Higher Education and Vocational Education; to be read a Second time upon Thursday, 23rd October, 2025 and to be printed; and to be referred to the Committee on Public Finance.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. පූ.භා. 11.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2025.07.17 දින කෝප් කමිටුවේදී කරන ලද චෝදනාව
### 2025.07.17ஆம் திகதி 'கோப்' குழுவில் முன்வைக்கப்பட்ட குற்றச்சாட்டு
### ALLEGATION MADE AT COPE HELD ON 17.07. 2025

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රිනි ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 ජූලි 22 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා.

## "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාවට නැංවීම
## "வளமான நாடு - அழகான வாழ்க்கை" கொள்கைப் பிரகடனத்தை நடைமுறைப்படுத்தல்
## IMPLEMENTATION OF MANIFESTO "A THRIVING NATION, A BEAUTIFUL LIFE"

[පූ.භා. 11.47]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ජාතික ජන බලවේගය ජනතාව වෙත ඉදිරිපත් කළ 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් ජනතාවට ලබා දුන් පොරොන්දු අතර සඳහන් වූ රටේ ආර්ථික කළමනාකරණය, ජනතාවගේ ජීවන වියදම ඉටු කරලීම සඳහා වූ භාණ්ඩ හා සේවා මත වූ බදු බර ඉවත් කිරීම සහ VAT බදු ඉවත් කිරීම, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා නිෂ්පාදන ආර්ථිකයක් සඳහා වූ වැඩ පිළිවෙළක් ශක්තිමත් කිරීම, යහපත් ආණ්ඩුකරණයක් සඳහා නීතියේ ආධිපත්‍යය ආරක්ෂා කිරීම, ස්වාධීන කොමිෂන් සභා ස්වාධීන ලෙස ක්‍රියාත්මක වීම තවදුරටත් ශක්තිමත් කිරීම, ජනතා පරමාධිපත්‍යය වඩාත් ශක්තිමත් කිරීම සඳහා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම, පළාත් සභා මැතිවරණය වහාම පැවැත්වීම, රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවන් ශක්තිමත් කරන්නා වූ විදේශ පිළිවෙතකට මඟ පෙන්වීම සහ ක්‍රියාත්මක වීම වැනි ක්ෂේත්‍ර තුළ ගෙවී ගිය වසර තුළ සාධනීය හෝ ජනතාවාදී වැඩ පිළිවෙළක් දියත් කිරීමට අපොහොසත් වී ඇති බව පැහැදිලිය.
>
> මැතිවරණයකින් බලය ලබා ගන්නා ආණ්ඩුවක ක්‍රියාකාරීත්වයේ වැදගත්ම කාලය ලෙස ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ අර්ථ නිරූපණය කොට ඇත්තේ මුල් දින 100 තුළ ක්‍රියාත්මක වන ආකාරයයි. එහෙත් පුනරුද ආණ්ඩුව මුල් දින 100 තුළ ක්‍රියාත්මක කොට ඇත්තේ තමා විසින් සංශෝධනය කිරීමට හෝ අහෝසි කිරීමට ප්‍රතිඥා දුන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ජනතාව පීඩනයට ලක්වන ආකාරයට ක්‍රියාවට නැංවීමත් ඉලක්කගත සැලසුමක් නොමැතිව IMF කොන්දේසි මත රාජ්‍ය ආයතන බරපතළ ගැටලුකාරී තත්ත්වයන්ට පත් කිරීමක් පමණි. එබැවින්, පුනරුද ආණ්ඩුව ජනතාවට 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' නමින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාවට නංවන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුව අද බොහොම වන්දනීය, පූජනීය ලෙස සලකන ලෝක බැංකුව මේ ආණ්ඩුව පිළිබඳව දක්වා තිබෙන වාර්තා කිහිපයකින් මම මේ කථාව පටන් ගන්නවා.

ඊයේ "ලංකාදීප" පුවත් පතේ මෙසේ සඳහන් වෙනවා:

> "ලංකාවේ පවුල්වලින් හතරෙන් එකක් දුප්පත්. තව සියයට 10 ක් දැඩි අවදානමේ"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකෙන් කියැවෙන්නේ රටේ ජනතාවගෙන් සියයට 25ක් දුප්පත් බවට පත් වෙලා තිබෙන බව සහ තවත් සියයට 10ක් ඒ අවදානම් කලාපයේ -ඒ අවදානම් සීමාවේ- ඉන්නවා කියන එකයි. කලින් කී සියයට 25ට තවත් සියයට 10ක් එකතු කළාම සියයට 35ක් වෙනවා. එහෙම නම්, අපේ රටේ ජනතාවගෙන් තුනෙන් එකකට වැඩි පිරිසක් අද දුප්පත් ගොඩට වැටිලා දුප්පත් ජනතාව බවට පත් වෙලා සිටිනවා. ලෝක බැංකුවේ වාර්තාත් එක්ක බැලුවාම, ඔබතුමන්ලාගේ මේ අවුරුද්දේ කාර්යසාධනය ගැන ආයෙත් අලුතින් කථා කරන්න දෙයක් නැහැ. "ලංකාදීප" පුවත් පතේ විතරක් නොවෙයි, ඊයේ "දිවයින" පුවත් පතේ සඳහන් කර තිබෙනවා, "දුප්පත්කම ඉහවහා ගිහින්" කියලා. "2024 දී දරිද්‍රතා අනුපාතය සියයට 24.9 ට නැඟලා. තවත් සියයට 10ක් දරිද්‍රතා රේඛාවට ඉතා ආසන්නයේ" කියලා "දිවයින" පුවත් පතේත් තියනවා. ලෝක බැංකුව කියන එක තමයි මේ උපුටා දක්වා තිබෙන්නේ. මේ විධියට දුප්පත්කම වැඩි වෙන්න හේතු වුණු කාරණා මොනවාද?

ඔබතුමන්ලාගේ පුනරුද ආණ්ඩුව ආවා. ඔබතුමන්ලා මොනවාද කිව්වේ? ආචාර්ය හර්ෂ ද සිල්වා මහත්මයාලා ඒ දවස්වල විවාද කරද්දී ඔබතුමන්ලා කිව්වා, අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවා තිබෙන බදු ටික අයින් කරනවා කියලා. ඒවා අයින් කළාද? මාස හයෙන් ජීවන බර අඩු කරනවා කිව්වා. ආණ්ඩුව එහෙම කිව්වා. ජනාධිපතිතුමා නොවෙයි, "ඒකේඩී" එහෙම කිව්වා. ජනාධිපතිතුමා දැන් ඒවා කියන්නේ නැහැ නේ. "ඒකේඩී" එහෙම කියපු බව අපට මතකයි. ඒ වාගේම අපට මතකයි, පාසල් උපකරණ මත පනවා තිබෙන VAT එක අයින් කරනවා කිව්වා. දරිද්‍රතාවට මේවා බලපානවා. එවිට පවුලේ වියදම් කිරීමේ හැකියාව අඩු වෙනවා. මොකද, දරුවන්ට කන්න නොදුන්නත් පාසලට අවශ්‍ය වියදම් ටික, අධ්‍යාපනයට අවශ්‍ය වියදම් ටික දෙමවුපියන් දරනවා. ඒවාට අධික මුදලක් වියදම් කළාම තුන් වේල කන්න පුළුවන්ද? ගරු දිගම්බරම් මන්ත්‍රීතුමනි, අද වතු ජනතාව තුන් වේල කනවාද? අද දුප්පත් මිනිස්සු තුන් වේල කනවාද? නැහැ. එහෙම නම්, අද දරිද්‍රතාව වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මන්දපෝෂණය වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන් දරුවන්ගේ මන්දපෝෂණය අද ඉතාම ඉහළ අගයකට ඇවිත් තිබෙනවා. ඒකට හේතු වෙලා තිබෙනවා, ඔබතුමන්ලා ඍජු හා

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

වක්‍ර බදු IMF එක කියන කියන පළියට, කියන කියන විධියට වැඩි කර තිබීම. ඒ වාගේම, ජනතාවගේ ආදායම අඩු වෙලා තිබෙනවා; වියදම් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා "ලස්සන ජීවිතයක්" වෙනුවට බොහොම දුෂ්කර ජීවිතයක් තමයි මේ ආණ්ඩුව වසරක් ඇතුළත අපේ රටේ ජනතාවට හිමි කර දීලා තිබෙන්නේ. 76 වසරක සාපය ගැන කියලා තමයි ඔබතුමන්ලා පටන් ගත්තේ. අද 76 වසරක සාපයට එහා ගිහිල්ලා, 77වැනි වසර රටේ ජනතාවගේ දුප්පත්කම වැඩි කරපු, දුප්පත් ජනතාව වැඩි කරපු වසරක් බවට පත් වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මේ ලෝක බැංකු වාර්තාව අනුවම කියනවා, රාජ්‍ය සේවක වැටුප් ක්‍රමය වෙනස් කරන්න කියලා. එය වෙනස් කරන්න කියන එකෙන් මොකක්ද කියවෙන්නේ කියන එක පිළිබඳ අපට හොඳ අවබෝධයක් තිබෙනවා. අපි දන්නවා, එදා මැතිවරණ ව්‍යාපාරයේදී "ජේකේඩී" දුන්නු පොරොන්දු රාජ්‍ය සේවකයන් විශ්වාස කළ බව. එදා මොනවාද කිව්වේ? මාස හයෙන් හයට වැටුප් වැඩි කරනවා කිව්වා. ආයේ ඒ ගැන කිය කියා ඉන්න ඕනෑ නැහැ කිව්වා. Automatically වැඩි වෙන්න සූත්‍රයක් හදනවා කිව්වා, ලාල් කාන්ත ඇමතිතුමා. ඒ ගැන ගරු අගමැතිතුමියටත් මතක ඇති. මාස හයෙන් හයට වැටුප් වැඩි කරනවා කිව්වා.

"ජේකේඩී" එහෙම කිව්වාට ජනාධිපතිතුමා අද ඊට පරස්පරව තමයි කටයුතු කරමින් ඉන්නේ. "ජේකේඩී" සහ ජනාධිපතිතුමා කියන්නේ දෙදෙනෙක්ද කියලා බරපතළ ප්‍රශ්නය දැන් අපට ඉස්මතු වෙලා තිබෙනවා. රාජ්‍ය සේවකයින් තැපැලෙන් ඔබතුමන්ලාට තොගයට ඡන්දය දුන්නේ. රාජ්‍ය සේවකයින් සියයට 90කට ආසන්න පිරිසක් මාලිමාවට තැපැල් ඡන්දය පාවිච්චි කළා. දැන් මොකද වෙලා තිබෙන්නේ? දැන් රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිකිරීම් ගැන, වැටුප් විෂමතා ගැන කථා කරන්නේ නැහැ. ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ගැන කථා කරන්න පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ කවුරුවත් දැන් නැහැ. නමුත්, මා හිතන විධියට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ගුරුවරු විසි ගණනක් ඉන්නවා. මමත්, තවත් කිහිප දෙනෙකුත් පමණයි ගුරුවරුන් ලෙස කටයුතු කරපු අය හැටියට විපක්ෂයේ ඉන්නේ. ගුරුවරුන් ගැන කථා කරන්න ආණ්ඩුවේ ඒ කියපු විසිගණන අද නැහැ. දැන් අපට තමයි ගුරුවරුන් ගැන කථා කරන්න වෙලා තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි දැක්කා, ඊයේ රුපියල් බිලියන 36ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කළ බව. මේ ආණ්ඩුවේ අසාර්ථකභාවය කියන්න ඒ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කරපු එකම ඇති. සංවර්ධනය සඳහා වෙන් කරපු රුපියල් බිලියන 36ක් තමයි ණය ගෙවන්න ඊයේ දිනයේ සම්මත කර ගත්තේ. ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා නිෂ්පාදන ආර්ථිකයක් ගැනයි කිව්වේ. නිෂ්පාදන ආර්ථිකයක් ගැන කියලා අය වැයෙන් වෙන් කරපු රුපියල් බිලියන 36 වියදම් කරගන්න බැරුව ඒක පරිවර්තනය කරලා තිබෙනවා ණය ගෙවන්න. මා දන්නා විධියට, බලෙන් ණය ගෙවන්නයි, ඒ. ඉතින්, මේකද ආර්ථික කළමනාකරණය?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පරිපූරක ඇස්තමේන්තු ගේන්නේ නැහැ කියලා -

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
පරිපූරක ඇස්තමේන්තු ගේන්නේ නැහැ කියලා ලූ කිව්වේ. විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ගයන්ත කරුණාතිලක මැතිතුමායි මේ කියන්නේ. පරිපූරක ඇස්තමේන්තු ගේන්නේ නැහැ කියපු අය අනේ රුපියල් බිලියන 36ක් වියදම් කරගන්න බැරුව, ඒ මුදල් සංවර්ධනයට යොදවන්න බැරුව, යටිතල පහසුකම්වලට වියදම් කරන්න බැරුව පරිපූරක මුදල් පිළිබඳ යෝජනාවක් සම්මත කරගෙන, කලින් කියපු කථා reverse කරගෙන කටයුතු කරනවා. යටිතල පහසුකම් සංවර්ධනය කරන්නේ නැතිව නිෂ්පාදන ආර්ථිකයකට අපේ රට ගෙන යන්නේ කොහොමද? මෙතුමන්ලා කිව්වා, විදුලි බිල තුනෙන් එකකින් -සියයට 33කින්- අඩු කරනවා කියලා. කළාද? වසරක් ගෙවිලා ගියා නේ. අපි පළමුවැනි මාසයේ, දෙකේ, තුනේ, අවුරුද්දක් විතර මේවා ගැන වැඩිය කථා කළේ නැහැ. ටිකයි කථා කළේ. අපි අවුරුද්දක් කල් දුන්නා. එළඹෙන සතියේ, තව දින කිහිපයකින්, නොබෝ දිනකින් -ලබන 14 වෙනි දා- විදුලි බිල සියයට 6.8කින් වැඩි කරන්න යනවා. මේක සුභ ආරංචියක්ද? මිනිස්සු බලාගෙන හිටියේ 1/3කින් විදුලි බිල අඩු කරයි කියලා. රුපියල් 9000 බිල 6000 කරනවා කිව්වා, 3000 බිල 2000 කරනවා කිව්වා. නමුත්, දැන් මෙහෙම වෙනකොට කොහොමද මේ රටේ ආර්ථිකයට ශක්තියක් ලැබෙන්නේ? අපේ නිෂ්පාදන ආර්ථිකය වැඩි වෙනවාද? අපේ අපනයන ආර්ථිකය වැඩි වෙනවාද? තිබෙන කර්මාන්තශාලා ටිකත් වහගෙන යනවා. ආයෝජන ගැන කථා කරනවා. හැබැයි, ආයෝජකයන් රටට එනවාද ලෝකයේ වැඩිම විදුලි බිල ලංකාවේ තිබෙද්දී? ඒ නිසා මේ වසරේ ප්‍රගතිය දිහා බලපුවාම අපට කිසිසේත්ම සතුටු වෙන්න බැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ මහත්තයා "ලංකාදීප" පුවත්පතට ලිපියක් ලියලා තිබෙනවා, "හිතකර ආයෝජන පරිසරයක කාලීන අවශ්‍යතාව" කියලා. ඒකේ බොහොම පැහැදිලිව සඳහන් වෙනවා, පසුගිය සතියේ ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ ආයෝජන පරිසරය පිළිබඳ නිකුත් කළ වාර්තාවේ ඉතා අහිතකර තත්ත්ව ගණනාවක් පිළිබඳව. එහි බොහොම පැහැදිලි විශ්ලේෂණයක් කරනවා. මම මේ පුවත්පත් වාර්තාව **සභාගත*** කරනවා.

අපේ රටේ ආයෝජන පරිසරය පිළිබඳව ඉතා අහිතකර තත්ත්වයක් නම් තිබෙන්නේ, අපේ රට ගැන ආයෝජකයෙකුට ආකර්ෂණයක් තිබෙනවාද? ජනාධිපතිතුමා පටන් ගත්තේ ආයෝජන කලාප 10ක් හදනවා කියලා. ඔය ගූගල් එකෙන් පොඩ්ඩක් හොයලා බලන්න, "What is the biggest export processing zone in Sri Lanka?" කියලා. ඒ බිංගිරිය කියලා සඳහන් වෙන්නේ. බිංගිරිය කියන්නේ, 2018 මම හදපු අපනයන සැකසුම් කලාපය. එතැනට එක ආයෝජනයක් මේ අවුරුද්දේ ගේන්න බැරිව ගියා. එතැන අක්කර 1,000ක් තිබෙනවා. අලුතින් කලාප 10ක් හදන්නයි කථා කළේ. නමුත් තවම එක ආයෝජනයක් ගේන්න බැරි වෙලා තිබෙනවා. මොනවාද වෙන්නේ රට තුළ? මේ අවුරුද්දේ එක ආයෝජනයක් ආවේ නැහැ. මේවා බොරු නොවේ ඇත්ත. මේ අවුරුද්දේ එක ආයෝජනයක් ආවේ නැහැ, බිංගිරියට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඉක්මනින් අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ නිසා අපට බොහොම පැහැදිලියි. මේ රටේ ආර්ථිකය ඉබි ගමනේවත් නොවෙයි යන්නේ. එකතැන නතර වෙච්ච, පල් වෙච්ච ආර්ථිකයක් තමයි තිබෙන්නේ. රටේ ආර්ථිකය එක තැන පල් වෙනවා. රට දුවන්නේ නැහැ. රටේ money circulation නැහැ. මිනිස්සුන්ගේ අතට සල්ලි එන්නේ නැහැ, දුප්පත්කම වැඩි වෙලා. ඒ නිසා වසරක් ඇතුළත,-

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
සියඹලා ගෙනැල්ලාම නැද්ද?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සියඹලා ගෙනැල්ලාම නැහැ. මේකට හොඳම කථාවක් කිව්වා නලින් හේවගේ මහත්තයා. එතුමා කිව්වා, ආණ්ඩුව බලයට පත් කළාම, අපි ගමට ගිහිල්ලා සතියකට සැරයක් සර්කස් මඩුවක් පවත්වනවා කිව්වා, ජහුටා පොළක් පවත්වනවා කිව්වා, නාඩගමක් පවත්වනවා කිව්වා, පැදුරු සාජ්ජයක් පවත්වනවා කිව්වා. අන්න ඒක නම් මේ ආණ්ඩුව හැම සතියකට සැරයක්ම කරනවා. මොකක් හරි ජහුටා පොළක් පවත්වනවා, සර්කස් එකක් පෙන්වනවා, නාට්‍යයක් පෙන්වනවා, සංදර්ශනයක් පෙන්වනවා, විගඩමක් නටනවා, බයිලයක් කියනවා. අන්න ඒවා විතරයි මේ අවුරුද්ද තුළ සතිය ගාණේ වුණේ කියමින් මගේ කථාව නවත්වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Amila Prasad. You have 10 minutes to second that Motion.

[පූ.භා. 11.59]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඇත්තටම, දුන් පොරොන්දු ඉටු නොකිරීම කියන යෝජනාව මම ස්ථිර කරනවා. සියඹලා ගෙනැල්ලාම නැද්ද කියලා දැන් ඇහුවා. දැන් මේ විවාදයට සම්බන්ධ වෙන ගමන් අද දවස පුරා ඔබතුමන්ලාට පුළුවන් සියඹලා ගෙනාපු විධියේ ඉඳන් ඔබතුමන්ලා කරපු ටික කියන්න. විපක්ෂයේ කාර්යභාරය ලෙස අපි කරන්නේ, මේ රටට ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරපු පොරොන්දු සහ යෝජනා ක්‍රියාත්මක නොවීම පිළිබඳව අපේ අදහස් ඉදිරිපත් කරන එක. ඒක නේ විපක්ෂයේ කාර්යභාරය. ඔබතුමන්ලාට පුළුවන්, අද දවස පුරා ඔබතුමන්ලා කරපු දේවල්වලින් රටට ලැබිච්ච යහපත, සේවය ගැන කථා කරන්න.

ඔබතුමන්ලා මුලින්ම කථාව පටන් ගත්තේ, මේ රටේ හොරකම, වංචාව, දූෂණය කියන තැනින්. විගණකාධිපතිතුමාත් කිව්වා, මෙන්න මේ වගේ සල්ලි ප්‍රමාණයක් නැති වෙලා තිබෙනවා, හොරකම් කර තිබෙනවා කියලා. නමුත් අවුරුද්දක් ගියා. විගණන පරීක්ෂාවක් කරලා ඒ කියපු ක්ෂේත්‍රවල අවුරුද්දක් පුරාවට කරපු විගණන පරීක්ෂා කෝ? අධ්‍යාපන අමාත්‍යාංශය වෙන්න පුළුවන්, කම්කරු අමාත්‍යාංශය වෙන්න පුළුවන්, ඒ එක එක අමාත්‍යාංශවල මෙන්න හොරකම් වෙච්ච ප්‍රමාණය, මෙන්න නාස්ති වෙච්ච ප්‍රමාණය, මෙන්න අපි විසින් නතර කරලා තිබෙන වංචා දූෂණ ප්‍රමාණය කියලා ලිඛිත වාර්තාවක් මේ අවුරුද්ද පුරාවට ඉදිරිපත් කරන්න පුළුවන් වුණාද? අන්න එතැනින් තමයි පටන් ගන්න ඕනෑ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන්න සහ නාස්තිය, දූෂණය නවත්වන්න. ආණ්ඩුව බලයට ආ ප්‍රධාන යෝජනාව, ප්‍රධාන අදහස පවා තවමත් සාර්ථකව සමාජයට ඒත්තු ගන්වන්න බැරි වෙලා තිබෙනවා. තවම හොරකමක් ගැන කියවනවා විතරයි. හැබැයි, අද වෙනකම් ඒ පිළිබඳව නිශ්චිත ගණනය කිරීමක් සහිත වාර්තාවක් ඉදිරිපත් කරන්න බැරි වෙලා තිබෙනවා.

ඊළඟ කාරණාව තමයි, පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් ඔබතුමන්ලා ඉදිරිපත් කරපු යෝජනා. අවුරුද්දක කාල සීමාවක් තුළ පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ සඳහන් කරනවා. හැබැයි, අවුරුද්දක් අවසාන වන තැන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් එහාට ගිහිල්ලා ඔබතුමන්ලා දැන් කියනවා, සීමා නිර්ණය කිරීම සහ පරණ ඡන්ද ක්‍රමයට යනවාද අලුත් ඡන්ද ක්‍රමයට යනවාද කියලා තීරණය කරන්න ඕනෑ කියලා. එහෙම කියන්න දෙයක් නැහැ. සරල බහුතරයක අනුමැතියකින් පරණ ඡන්ද ක්‍රමයට ගියා - මැතිවරණය පවත්වනවා. මැතිවරණ ජයග්‍රහණ පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නමුත් අවශ්‍ය වෙන්නේ මැතිවරණය පැවැත්වීමයි. ඒ ඒ පළාත්වලට මධ්‍යම රජයෙන් -මේ මම කලින් කියපු කථාවම තමයි - සම්මත කරන මුදල් ඇයි රට තුළ සංසරණය නොවෙන්නේ?

ප්‍රාදේශීය සභා ටික, පළාත් සභා ටික නිසි ආකාරයෙන් ක්‍රියාත්මක වුණොත්, ඒ හරහා ඒ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න පුළුවන්. එහෙම නම් පළාත් සභා මැතිවරණය වුවමනා කරන්නේ ජයග්‍රාහකයා, පරාජිතයා තෝරන්න නොවෙයි. ඒක හරහා මේ රටේ ප්‍රාග්ධනයට වෙන් කරන මුදල් ටික රට පුරා බෙදා හරින්න පුළුවන්කම ලැබෙනවා. එතකොට ඒ යාන්ත්‍රණ ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා. පළාත් සභා මැතිවරණයක අවශ්‍යතාව පැන නඟින්නේ ඒ නිසායි. ඒ නිසා පළාත් සභා මැතිවරණය තවදුරටත් ප්‍රමාද නොකර, ඔබතුමන්ලා දීපු පොරොන්දු ඉෂ්ට කරන්න කියන එක තමයි අපි කියන්නේ. එහෙම නම් ඒ දීපු පොරොන්දුවත් අසාර්ථකයි, කලින් පොරොන්දුවත් අසාර්ථකයි.

තුන්වැනි කාරණාව තමයි, සහල් ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල අඩු කිරීම. අපි කථාව ආරම්භ කළේම එතැනින්. ප්‍රධාන වශයෙන් ගත්තාම ඉන්ධන මිල අඩු කරනවා කිව්වා. කලින් හිටපු ඇමතිවරයාගේ ඉඳලා කොමිස් ගන්නවා, අපි ආවාම ඉන්ධන මිල රුපියල් 50කින් අඩු කළ හැකියි, බද්ද ඉවත් කරනවා කිව්වා. ඒ කිසි දෙයක් නොවුණු වාතාවරණයක ආණ්ඩුවට ඉන්ධන මිල පහත හෙළන්න බැරි වෙලා තිබෙනවා.

ඊළඟ කාරණාව තමයි, අත්‍යවශ්‍ය සහල්. දැන් වෙළෙඳ ඇමතිවරයාත් මේ සභාවේ ඉන්නවා නේ. සතොස සහල් ව්‍යාපාරයට ඇතුළු වුණා. ඒ හරහා ලංකාවේ සහල් මිල සැලකිය යුතු ප්‍රමාණයකින් පහළ ගියාද? පහළ ගියා නම් ඔබේ ව්‍යායාමය සාර්ථකයි, පහළ ගියේ නැත්නම් අසාර්ථකයි. නමුත් තවමත් සහල් වෙළෙඳ පොළේ ගැටලුවක් තිබෙන නිසා විපක්ෂය ලෙස අපට ඒ කාරණය මතු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. එහෙම නැතුව අපි ඔබතුමන්ලා ගැන අමනාපයකින් මේ කරුණු මතු කරනවා නොවෙයි. ඔබතුමන්ලාට පුළුවන් ඔබතුමන්ලාගේ සාර්ථකත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරන්න. සතොස මැදිහත් වෙන්න කලින් සහල් මිල මේ විධියට තිබුණේ, දැන් තිබෙන්නේ මේ විධියට කියලා කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. අන්න එතකොට ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ සාර්ථකත්වය පෙන්නුම් කරන්න පුළුවන්.

ඊළඟ කාරණය තමයි, විදුලි බිල. විදුලි බිල අඩු කරන්නට ගත්ත සාධනීය පියවර මොනවාද? බලශක්ති ඇමතිවරයාත් මෙතැන ඉන්නවා නේ. ඔබතුමා විසින් මේ කාලසීමාව තුළ විදුලි

[ගරු අමිල ප්‍රසාද් මහතා]

බිල අඩු කරන්න ගත්ත ක්‍රියා මාර්ගය මොකක්ද? මම දැක්කා, මේ සතිය තුළ යළිත් වතාවක් විදුලි බිල වැඩි කරන්න උත්සාහ කරන අදහස් හා යෝජනා ක්‍රියාත්මක වෙනවා. දැන් කියැවෙන දේ තමයි, අවුරුද්දක කාලසීමාව තුළ දූෂණය, වංචාව හා නාස්තිය නැවැත්වූවා කියන එක. හැබැයි, ඒ වුණාට විදුලි බිල අඩු වෙලා නැහැ. එහෙම නම් ඔබතුමන්ලා විදුලි බිල අඩු කිරීම අතින් අසාර්ථකයි, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල අඩු කිරීම අතින් අසාර්ථකයි, ඉන්ධන මිල අඩු කිරීම අතින් අසාර්ථකයි. ඒ අනුව ඔබතුමන්ලා ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පොරොන්දු ඉෂ්ට කරලා නැහැ.

ඊළඟට කාරණය තමයි, ඔබතුමන්ලා කියපු දේශපාලන පත්වීම්. ලංකාවේ රාජ්‍ය සේවයේ, විදේශ සේවයේ තිබෙන ප්‍රධාන අර්බුදයක් තමයි දේශපාලන පත්වීම් කියන්නේ කියලා ඔබතුමන්ලා කිව්වා. දේශපාලන පත්වීම් ඔබතුමන්ලා ආවාම නවත්වනවා කිව්වා. නමුත් මම කියනවා දේශපාලන පත්වීම් නවත්වන්න වුවමනාවක් නැහැ කියලා. ඒකට හේතුව තමයි, රාජ්‍ය පවත්වා ගෙන යන්න, තමන්ගේ පදනම පවත්වා ගෙන යන්න, තමන්ට විශ්වාසදායක නිලධාරින් පත් කර ගැනීම යහපතක් වන නිසා. ඒකේ වැරැද්දක් නැහැ. හැබැයි, ඔබතුමන්ලා කිව්වා මේ රටේ දේශපාලන පත්වීම් නවත්වනවා, මේ රට විනාශ වුණේ දේශපාලන පත්වීම් නිසා කියලා. හැබැයි, තවම ඔබතුමන්ලා දේශපාලන පත්වීම් කරගෙන යනවා. ඔබතුමන්ලා ආණ්ඩුව ලබා ගන්න කලින්, මේ රටේ මිනිස්සුන්ට ලබා දුන්නු පොරොන්දු කඩවීම ගැන තමයි අද සභාව කල් තැබීමේ යෝජනාවෙන් කියන්නේ. CID එකට දේශපාලන පත්වීම් කරලා තිබෙනවා. ඊට අමතරව සිවිල් සේවයට පිටස්තරව අමාත්‍යාංශ ලේකම්වරු පත් කළා. විදේශ සේවයටත් පත් කරලා තිබෙනවා. මේ සියල්ල ඇතුළේ ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරපු යෝජනා සහ පොරොන්දු මේ අවුරුද්දක කාලසීමාව තුළ කඩ කරලා තිබෙනවා.

ඊළඟ ප්‍රධාන කාරණාව තමයි, ටෙන්ඩර් මගඩිය. අදටත් මම කියනවා, මේ රටේ ප්‍රධාන අර්බුදයක් තමයි ටෙන්ඩර් ප්‍රශ්නය කියන එක. අපි ටෙන්ඩර්වලදී online system එකට යන්නේ කවදාද? මේ අවුරුද්දක කාල සීමාව තුළ ටෙන්ඩර් පිළිබඳව ඔබතුමන්ලා කියපු කථා මොනවාද? අපි පොඩිම තැනින් පටන් ගත්තොත්, ප්‍රාදේශීය සභාවල හිටපු මන්ත්‍රීවරුන්ට වැඩියෙන්ම එල්ල වෙච්ච චෝදනාව තමයි, පාරවලින් හොරකම් කරනවා කියන එක. දැන් ඔබේ ආණ්ඩුව විසින් ප්‍රාදේශීය සභා බලප්‍රදේශවල පාරවල්වල සහ අනෙකුත් වැඩ කරද්දී මොකක්ද අලුතින් නිර්මාණය කරපු ටෙන්ඩර් පටිපාටිය? තවමත් යන්නේ පරණ ක්‍රමයටම නම්, ඒකෙනුත් ඔබතුමන්ලා අසාර්ථකයි. ඔබතුමන්ලා ඒකට අලුත් ක්‍රමයක් හඳුන්වා දුන්නාද කියලා ආණ්ඩුව පැත්තෙන් කියන්න අවස්ථාව තිබෙනවා.

ඊළඟ කාරණාව මෙකයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල digitalization සඳහා plug system එකක් සවි කරන්න ආයතනයකට භාර දුන්නා. අන්න ඒ ආයතනයට ලබා දීමේදී ඒ මිල වැඩිවීම අවුලක් නැහැ, ඒකේ ප්‍රශ්නයක් නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා. හැබැයි, මහජනතාව විසින්, දේශපාලන ව්‍යාපාර විසින් තෙරපුමක් ආපු ගමන් ඒක ඉවත් කර ගත්තා; ටෙන්ඩර් මගඩියක් වෙන්න ගිහිල්ලා නවත්වා ගත්තා.

වෙළෙඳ ඇමතිතුමාත් මෙතැන ඉන්නවා. ඊළඟට කාරණය මෙකයි. වී අලෙවි මණ්ඩලය ලබා ගත්ත වී, සහල් බවට පත් කිරීමට යැමේදී, තෝරා ගත්ත සහල් නිෂ්පාදකයන්ට පමණක් ඒකට ඇතුළත් විය හැකි පරිදි ටෙන්ඩර් පටිපාටියක් නිර්මාණය කරලා තිබෙනවා. තෝරා ගත්ත අයට පමණක් ඇතුළු විය හැකි පරිදි ටෙන්ඩර් පටිපාටියක් නිර්මාණය කරලා තිබෙනවා කියලා සමාජය තුළ කතිකාවක් ගියා. නමුත් මම දැක්කා, ඒක තාවකාලිකව නවත්වලා තිබෙනවා කියලා. මම දන්නේ නැහැ ඒක පිළිබඳව. අපි ඉදිරිපත් කරන්නේ මේ රටේ මහජනතාව අපට ලබා දෙන තොරතුරු.

ඊළඟ කාරණය ගත්තොත්, ඊයේ මෙට්‍රෝ බස් සමාගම ආරම්භ කළා. බස් ගෙන ඒම පිළිබඳව එහි සඳහනක් තිබෙනවා. ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම කියන්නේ, ලංකාවේ ආණ්ඩුව සියයට 42ක කොටස් අයිතිය තිබෙන සමාගමක්. රාජ්‍ය ව්‍යාපාර හොඳයි කියන ඔබතුමන්ලා, රාජ්‍යයට කොටස් තිබෙන ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම මඟහැර වෙනත් සමාගමකින් බස් ගෙන්වන්න සැලසුම් කරලා තිබෙනවා. ඒකෙන් කියැවෙන්නේ මොකක්ද? ඒකෙන් කියැවෙන්නේ ඔබතුමන්ලාගේ දෙබිඩි ප්‍රතිපත්තිය. එක පැත්තකින් ඔබතුමන්ලා කියනවා, රාජ්‍ය ව්‍යාපාර ශක්තිමත් කළ යුතුයි කියලා. හැබැයි, ලංකාවට ඕනෑ කරන බස් ටික වෙනත් සමාගමකින්, වෙන රටකින් වෙන විධියකට ගෙනෙනවා. එතැනදී පවා වෙනත් සමාගම්වලට ඉදිරිපත් වෙන්න බැරි වෙන්න කොන්දේසි ගණනාවක් ඉදිරිපත් කළා. මොනවාද, කොන්දේසි? අවුරුද්දකට බස් 750ක් හදලා තිබෙන්න ඕනෑ. බස් 50ක් රටවල් 5කට යවලා තිබෙන්න ඕනෑ. අශෝක් ලේලන්ඩ් ඇතුළු අනෙකුත් සමාගම්වලට එන්න බැරි වෙන්න conditions දමලා, ඊළඟට මොකද කරන්නේ? තමන් තෝරා ගත්ත සමාගමට එන්න ඉඩ දෙනවා. එක පැත්තකින් අර මම කියපු විධියට, සහල් ව්‍යාපාරයේදී තමන්ට ඕනෑ කෙනාට ටෙන්ඩරය දෙන්න යනවා. බස් ගෙන්වනකොට එතැන ටෙන්ටරය තමන්ට ඕනෑ කෙනාට දෙන්න යනවා. රාජ්‍ය ව්‍යාපාර ශක්තිමත් කරන්න ඕනෑය කිය කියා රාජ්‍ය ව්‍යාපාර අත්හැරලා අනෙක් අයට ටෙන්ඩරය ලබා දෙනවා. මේවා තමයි අපට අහන්න තිබෙන ප්‍රශ්න.

ඊළඟට, ඊටත් වඩා බරපතළ කාරණාව තමයි ගල් අඟුරු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය. මේ, සමාජයෙන් මට එවන ප්‍රශ්න. එහෙම නැතුව මේවා මගේ පෞද්ගලික ප්‍රශ්න නොවෙයි. ඒ නිසා මා එක්ක පෞද්ගලිකව අමනාප වෙන්න දෙයක් නැහැ; මා එක්ක පෞද්ගලිකව ප්‍රශ්න ඇති කර ගන්න ඕනෑ නැහැ. මොකක්ද, දැන් ගල් අඟුරු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය? සාමාන්‍යයෙන් මාර්තු මාසයේදී තමයි ලංකාවට ගල් අඟුරු ඉල්ලුම් කරන්න ඕනෑ. හැබැයි මේ අවුරුද්දේ ඉල්ලුම් කරන්නේ සැප්තැම්බර් මාසයේදී, හදිසි මිලදී ගැනීම් සඳහා. ඊළඟට, ඒ ටෙන්ඩරය ලබා දීමේදී තිබුණු conditions අඩු කළා. බස් ගෙනෙනකොට conditions වැඩි කරනවා, තමන්ට ඕනෑ රටට දෙන්න. ගල් අඟුරු ගෙනෙනකොට conditions සියයට 90කින් අඩු කළා. ඇමතිතුමා සභාවේ ඉන්නවා නේ, උත්තර දෙන්න පුළුවන්. බොරු නම්, "බොරු" කියලා කියන්න. මේ, මට ලැබුණු තොරතුරු. ඊළඟට, ඒක දුන් සමාගම මොකක්ද? ලංකාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරපු සමාගමකට -සහල් ගෙන ඒමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරපු සමාගමට- ඒක දුන්නාය කියලා තොරතුරක් ඇවිල්ලා තිබෙනවා. එහෙම නම් ටෙන්ඩර් පටිපාටිය ඇතුළේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අරගෙනද මේ conditions අඩු කළේ, එහෙම නැත්නම් ප්‍රසම්පාදන කොමිසමෙන් අවසර අරගෙනද අඩු කළේ කියලා කියන්න, ඇමතිවරයාට වගකීමක් තිබෙනවා. මා නැවත කියනවා, මොන උත්තරය දුන්නත් කරුණාකරලා ටෙන්ඩර් පටිපාටිය online system එකකට ගෙන එන්න, අනෙක් අයට බලන්න පුළුවන් තත්ත්වයට පත් කරන්න කියලා. ඒක තමයි යෝජනාව.

ඊළඟ කාරණය, පාස්කු ප්‍රහාරය. මේ ආණ්ඩුව පාස්කු ප්‍රහාරය පිළිබඳව ආන්දෝලනාත්මක ප්‍රකාශ ගණනාවක් සිදු කරලා බලයට ආපු ආණ්ඩුවක්. බලයට ආපු ගමන් ඒ සම්බන්ධයෙන් සියලු දේවල් කරනවාය කියලා කතෝලික ජනතාවට කිව්වා. ඊයේත්

එක ප්‍රවෘත්තියක් ගියා මම දැක්කා, කොහෙන්ද ඒක ගියේ කියලා මම දන්නේ නැහැ. පාස්කු ප්‍රහාරයේ මහ මොළකරුවා හොයා ගත්තාය කියන කාරණාව පිළිබඳව ප්‍රවෘත්තියක් ගියා. මම දැක්කා ජනාධිපතිවරයාත් කිව්වා, "මාසයකින් හොයා ගන්නවා, හමුදා නිලධාරින් දෙදෙනෙක් අත්අඩංගුවට ගන්න යනවා" කියලා. පාස්කු ප්‍රහාරය පිළිබඳ කථාව අවසන් කරන්න පරීක්ෂණ කරලා දඬුවම් ලබා දෙනවා වෙනුවට ඒක පාපන්දුවක් බවට පත් කරගෙන, ඒ මිනිසුන්ගේ වේදනාව, දුක තවදුරටත් දේශපාලනිකව භාවිත කරන්නේ ඇයි? පොරොන්දු ඉෂ්ට කරලා නැහැ කියන එක තමයි එතැනදීත් කියන්න තිබෙන්නේ. ඒක ඉෂ්ට කරන්න අවුරුද්දක කාල සීමාවක් පුරාවට ඔබට බැරි වෙලා තිබෙනවා.

ඊළඟට මම කැමැතියි, රාජ්‍ය සේවයේ උසස්වීම් ගැන කථා කරන්න. මට ඒ සම්බන්ධයෙන් තොරතුරු එවා තිබෙනවා. දීර්ඝ කාලයක් උසස්වීම් නොලැබීමේ කාණ්ඩය යටතේ විශේෂ කාර්ය බලකායේ - 170දෙනෙක් බඳවා ගන්න පුළුවන්; පුරප්පාඩු තිබෙනවා. හැබැයි මේ කාල සීමාව තුළ ඒ අයව අරගෙන නැහැ. ඒ අයගේ සැලකිය යුතු පිරිසක් ඉන්නවා. ඒ අය අත්හැරලා, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Amila Prasad, your time is up now. Would you please wind up?

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඒ පුරප්පාඩු ටික පුරවලා නැහැ කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

ඊළඟ කාරණය, රාජ්‍ය ව්‍යාපාරවල ලාභය. ඊයේ නියෝජ්‍ය ඇමති කෙනෙක් මෙන්න මෙහෙම ලොකු කථාවක් කිව්වා, මම දැක්කා. "ව්‍යාපාර කරන්න නොදන්නා අය හා හොරකම ජීවිකාව වුණු අය රාජ්‍ය ව්‍යාපාර කළාම ඒවා විනාශ වෙනවා" කියලා එතුමා කිව්වා. ඊළඟට, මේ අවුරුද්දේ පළමුවැනි මාස හයේ ජනාධිපතිතුමා යටතේ තිබෙන ආයතනවල ලාභය සියයට 17.5කින් අඩු වෙලාය, ලාභාංශ සියයට 21.8කින් අඩු වෙලාය කියලා සඳහන් කර තිබෙන ආර්ථික විද්‍යාව පිළිබඳ ලිපියක් මම සොයා ගත්තා. දැන් මේකෙන් කියැවෙන්නේ මොකක්ද?

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හොරෙක් කියලා කියනවා, මේ නියෝජ්‍ය ඇමතිතුමා. තාත්තාගේ පුතා; චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. පියා හරි එයට උත්තර දුන්නාට කමක් නැහැ. එතුමා කියනවා, "ඔබේ නායකයා හොරෙක්. ව්‍යාපාර කරන්න නොදන්නා අය හා හොරකම ජීවිකාව වුණු අය රාජ්‍ය ව්‍යාපාර කළාම විනාශ වෙනවා" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up now.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඊළඟට බලන්න, ජනාධිපතිතුමා යටතේ තිබෙන ආයතනවල ලාභාංශ සහ ලාභය අඩුවෙලා. එහෙම නම් ආයෙත් මගේ ප්‍රශ්නය එන්නේ එතැනට. ඔබතුමන්ලා රාජ්‍ය ව්‍යාපාර කරන්න ආපු අය. ව්‍යාපාර වර්ධනය කරන එක හොඳයි. එක පැත්තකින් අශෝක් ලේලන්ඩ් එක අයින් කරනවා, මේ පැත්තෙන් රාජ්‍ය ව්‍යාපාරවල ලාභය අඩු වෙනවා. ටෙන්ඩර් මගඩිය ඇතුළු විශාල ප්‍රමාණයක අර්බුද තිබෙනවා. අපි විපක්ෂය ලෙස මේ ප්‍රශ්න මතු කරමින් ඉන්නේ, රටේ මිනිස්සු විපක්ෂය සඳහා ලබා දුන් කාර්යභාරය ඉටු කිරීම සඳහා මිසක් ඔබ එක්ක පෞද්ගලික අමනාපයක් නිසා නොවෙයි. ඔබතුමන්ලාට පුළුවන් මෙතැනින් පස්සේ ඔබේ කණ්ඩායම්, social media teams දමලා අපි කරන කථාවට අදාළව දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරන්න. ඒකේ ප්‍රශ්නයක් නැහැ. මොකද, අපට ඕනෑත් ඒක. අපට ඡන්දය නොදුන්, ඔබට ඡන්දය දුන් අය - social mediaවල අයිතිකාරයාත් ඇවිල්ලා ඉන්නවා නේ - අපේ කථාව අහන එක තමයි අපේ වුවමනාව. කමෙන්ට්ස් බලකායන්, ඒ සියලු දේවල් දමලා මේ කථාවලට විරුද්ධව අදහස් ඉදිරිපත් කරන්න. හේතුව, ඔබ මොන අදහස ඉදිරිපත් කළත් අපි විපක්ෂයේ කාර්යභාරය අපට හැකි උපරිමයෙන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Prime Minister. You have 16 minutes.

[අ.භා. 12.11]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය අපි සම්පාදනය කරන කොට - සැලසුම් කරනකොට - කරුණු ගණනාවක් ඒකට අඩංගු කර ගත්තා. ඒකට පදනම් වෙච්ච කාරණා ගණනාවක් තිබුණා. ඒකේ පොදු අදහස වුණේ මොකක්ද? අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ප්‍රමුඛතා ගණනාවක් අපි යෝජනා කර තිබුණා. ඒකට පදනම් වුණු කාරණා කිව්වොත්, දිළිඳුකම පිටුදැකීම, රට තුළ ඩිජිටල්කරණය හඳුන්වා දීම, නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම, නීතිය ඉදිරියේ සියලුදෙනාම සමානයන් ලෙස සැලකීම, මත්ද්‍රව්‍ය උවදුර මේ රටෙන් තුරන් කිරීම කියන ඒවා. මොකද, මත්ද්‍රව්‍ය මේ රටට ව්‍යසනයක් ඇති කරලා තිබුණා. ඒ උවදුර නැති කරන්න විශේෂ අවධානයක් යොමු කිරීම, ජාතික සමගිය ඇති කිරීම, ජාතීන් බෙදා වෙන් කර දේශපාලනය කරනවා වෙනුවට සියලු ජාතීන් එකතු කරගෙන යන ගමනක් ආදිය ගැන අපි කථා කළා. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම වැනි කාරණා ගණනාවක් පදනම් කරගෙන තමයි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ක්‍රියාකාරකම් සහ ප්‍රමුඛතා හඳුන්වා දී තිබෙන්නේ. ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ ක්‍රියාකාරකම් ගණනාවක් ඇතුළත්ව තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ආණ්ඩුවක් භාර ගත්ත මොහොතේ ඒ ඇති වෙලා තිබෙන තත්ත්වය මත ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ක්‍රියාකාරකම් ප්‍රමුඛතා කරගෙන ඒ මොහොතේ අපි ක්‍රියාත්මක විය යුත්තේ කොතැනින්ද කියන එක තෝරා ගැනීමක් කරන්න වෙනවා. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු සියලු දේ එක සැරේටම කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒවා ප්‍රමුඛතාගත කරන්න ඕනෑ. ඒ ප්‍රමුඛතා තෝරා ගැනීම ඒ මොහොතේ රටේ, සමාජයේ

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය ]

තිබෙන තත්ත්වය හරියට හඳුනාගෙන, තේරුම් අරගෙන කරන්න ඕනෑ. අපි රට භාර ගන්නකොට, මේ ආණ්ඩු මාරුව සිද්ධ වනකොට රටේ තිබුණු තත්ත්වය ගැන අපට නැවත නැවත කථා කරන්න අවශ්‍යත් නැහැ, නැවත මතක් කර දිය යුත්තෙත් නැහැ. ඔබ දන්නවා, ඒක වෙන ආණ්ඩු මාරුවක් සිද්ධ වුණා වාගේ දෙයක් නොවෙයි කියන එක. අපි භාර ගත්තේ අතරමග නවත්වා තිබුණු රටක්; ආර්ථික ක්‍රියාකාරම් අත්හිටුවා තිබුණු රටක්; ණය දීම නැවතිලා තිබුණු රටක්; සංවර්ධන ව්‍යාපෘති සියල්ලම නැවතිලා තිබුණු රටක්. මේ රටේ දිළිඳුකම ඇති වුණේ පසුගිය අවුරුද්ද තුළ නොවෙයි නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කාලයක් තිස්සේ ඉඳලා තමයි මේ රට තුළ දිළිඳුකම ඇති වෙලා තිබුණේ. කාලයක් තිස්සේ ඉඳලා තමයි දිළිඳුකම පෝෂණය වෙලා තිබුණේ. පසුගිය අවුරුද්ද තුළ නොවෙයි දිළිඳුකම ඇති වුණේ. අලුත් රජයක් හැටියට එවන් රටක් තමයි අපි භාර ගත්තේ. මීට පෙර කවදාකවත් මේ රටේ ආණ්ඩුවකට පත් නොවුණු පිරිසක් තමයි මේ රට භාර ගත්තේ.

විශේෂයෙන්ම මැතිවරණ කාලය තුළ විපක්ෂයේ දේශපාලන පක්ෂ අපි ගැන රූපයක් මවලා තිබුණා. ජනතාව ඒවා ප්‍රතික්ෂේප කරලා අපිව බලයට පත් කළා. අපි ආණ්ඩුව භාර ගන්නකොට සමාජය තුළ විශාල බියක් ඇති කරලා තිබුණා. විපක්ෂයේ සමහර පුද්ගලයන් විශේෂයෙන්ම ජාත්‍යන්තරය තුළ අදටත් මේ මතය ප්‍රවර්ධනය කරන්න උත්සාහ කරනවා. අපි භයානකයි, අපට ආර්ථිකය හරියට කළමනාකරණය කරන්න බැහැ, අපි බලයට ආවාම ආර්ථිකය කඩාගෙන වැටෙනවා යනාදී මේ සියලු මත සමාජගත වෙලා තිබුණු මොහොතක තමයි අපි රට භාර ගත්තේ. ඒ වෙලාවේ අපේ ආණ්ඩුවට තිබුණු ප්‍රමුඛ කාරණයක් තමයි, රට තුළ ස්ථාවරත්වය තහවුරු කිරීම. ජන ජීවිතය අඛණ්ඩව පවත්වාගෙන යාමට අදාළ වන කොන්දේසි රට තුළ හරියට ක්‍රියාත්මක කිරීම. ජනතාවගේ, ව්‍යාපාරික ප්‍රජාවගේ සහ ජාත්‍යන්තරයේ විශ්වාසය ඇති වන විධියටත්, රට පිළිබඳ විශ්වාසයක් ඇති වන විධියටත්, අලුත් ආණ්ඩුව පිළිබඳ විශ්වාසය තහවුරු වන විධියටත් ක්‍රියා කිරීම අපගේ ප්‍රමුඛ කාර්යයක් වුණා. ඒ මොහොතේ රටේ තිබුණු තත්ත්වයත් එක්ක අපට ගන්න සිද්ධ වුණු තීරණ අනුව තමයි පළමුවැනි අවුරුද්ද තුළ අපේ ක්‍රියාමාර්ග, අපේ ප්‍රමුඛතා, අපේ ක්‍රියාකාරකම් අපි තෝරා ගත්තේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව පසුගිය අවුරුද්ද දිහා බලනකොට අපට ඒ ගැන කථා කරන්න මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඇත්තටම මම විපක්ෂයට ස්තුතිවන්ත වෙනවා. අමාත්‍යාංශ පැත්තෙන් පසුගිය අවුරුද්ද තුළ අපි කරපු දේවල් ගැන කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන ඇත්තටම මම විපක්ෂයට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය අවුරුද්ද තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු වීමට බලපෑ කටයුතු ගණනාවක් අපේ ආණ්ඩුව තුළින් සිද්ධ වුණා; it is under our watch that elections තුනක්, මැතිවරණ තුනක් ඉතාම සාමකාමී විධියට තියන්න පුළුවන් වුණේ. අවසාන වරට පැවැත් වූ මැතිවරණයෙන් පස්සේ අඩුම තරමින් එක පැයකටවත් curfew දාන්න අපට අවශ්‍ය වුණේ නැහැ, කිසිම සිද්ධියක් ඇති වුණේ නැහැ. මේ තත්ත්වය සුළුපටු දෙයක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙනි වතාවටයි අපි එවැනි නිදහස්, සාමකාමී වාතාවරණයක් තුළ මැතිවරණ පවත්වා තිබෙන්නේ. මේ අවුරුද්ද තුළ මැතිවරණ තුනක් පැවැත්වුවා කියන එකත් පොඩි දෙයක් නොවෙයි. විපක්ෂය කියනවා, පළාත් සභා මැතිවරණයත් පවත්වන්න කියලා. ඔව්, ඒකත් අපි තියනවා. ඒක ගැන කිසිම සැකයක් තියාගන්න ඕනෑ නැහැ. අපේ විදේශ කටයුතු ඇමතිතුමාත් ඒක ප්‍රකාශයට පත් කළා. මොකද අපට කිසිම අවශ්‍යතාවක් නැහැ, මැතිවරණවලින් පැනලා යන්න. අපි ඒක ඔප්පු කරලා තිබෙනවා, මේ අවුරුද්ද තුළ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාලය තුළ ස්වාධීන කොමිෂන් සභා ගණනාවකට නිදහසේ ක්‍රියාත්මක වෙන්න පුළුවන් වාතාවරණයක් ඇති වෙලා තිබෙනවා. ඒ වාතාවරණය තුළ, අපේ ආණ්ඩු කාලය තුළ තමයි මම කලින් කිව්ව පරිදි අපේ මැතිවරණ කොමිසම ලෝකයේ හොඳම මැතිවරණ කොමිසම බවට මේ ඔක්තෝබර් මාසයේදී පත් වෙලා තිබෙන්නේ. ඉතින් අපි ඒක අගය කළ යුතුයි.

පනත් සම්මත වෙලාත් කාලයක් තිස්සේ පත් නොවුණු කොමිෂන් සභා පත් කරන්න අපේ කාලය තුළ හැකියාව ලැබුණා. උදාහරණයක් හැටියට ජාතික කාන්තා කොමිසම අපි දැන් ස්ථාපිත කරලා, නියෝජිතයනුත් පත් කරලා තිබෙනවා. ඉතාම ඉක්මනින් ඒ අයගේ වැඩ ආරම්භ කරන්න නියමිතයි. ඒ වාගේම තමයි, කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොවුණු Sri Lanka National Commission for UNESCO එකට නියෝජිතයන් පත් කරලා, ඒකේ වැඩත් අපි ආරම්භ කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පවතින කොමිෂන් සභාවලට නිදහසේ වැඩ කරගෙන යන්න පුළුවන් වාතාවරණයක් ඇති කළා පමණක් නොවෙයි, අලුත් කොමිෂන් සභා ක්‍රියාත්මක කරන්නත්, ඒවාට සාමාජිකයන් හරියට පත් කර ගන්නත් අපි මැදිහත් වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව ආරම්භයේදීම මැතිවරණ පවත්වපු විධිය තුළින්ම ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේක අවස්ථාවක් කර ගන්නවා, මේ අවුරුද්ද තුළ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක කළ කාරණා කිහිපයකුත් ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරන්න. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි අධ්‍යාපනය සම්බන්ධයෙන් පොරොන්දු වුණේ මොකක්ද, අපි ජනතාවත් එක්ක කථා කළේ මොනවාද? පවතින අධ්‍යාපන ක්‍රමය තුළ තිබෙන අසමානතා, පාසල් අතර තිබෙන අසමානතා අඩු කරන්න මැදිහත් වෙන බවටත් අපි පොරොන්දු වුණා. මේ පවතින අධ්‍යාපන ක්‍රමය තුළ දරුවන්ට, ගුරුවරුන්ට, දෙමව්පියන්ට තිබෙන බර අඩු කරන්නත් අපි පොරොන්දු වුණා. උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කරන්නත් අපි පොරොන්දු වුණා. ඒ අනුව ඒ සියල්ල වෙනුවෙන් අපි දැන් මැදිහත් වෙමින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදාහරණයක් හැටියට ගත්තොත්, කාලයක් තිස්සේ සාකච්ඡා වෙමින් තිබුණු, නමුත් ක්‍රියාත්මක නොවුණු, සියලුදෙනාම ඉල්ලා සිටින අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග, ඒ අවශ්‍ය සාකච්ඡා, ඒ අවශ්‍ය සංවාද කරමින් 2026 අවුරුද්ද තුළ පළමුවන ශ්‍රේණියටත්, හයවන ශ්‍රේණියටත් ක්‍රියාත්මක වන පරිදි, විශේෂයෙන්ම සාමාන්‍ය අධ්‍යාපනය තුළ ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න අපි පටන් අරගෙන තිබෙනවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ අපි තවදුරටත් පොරොන්දු වුණා, ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී අධ්‍යාපන කවුන්සලයක් පිහිටුවීමට. ඒ කියන්නේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන සේවාව තුළ ඉන්න සියලු වෘත්තිකයන්ගේ අයිතිවාසිකම් රැක දෙන, ඔවුන්ගේ වෘත්තීයභාවය දියුණු කරන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අධ්‍යාපන කවුන්සලය පත් කිරීමේ වැඩ කටයුතු අපි දැන් ආරම්භ කරලා තිබෙනවා. අපි ඒ සඳහා කමිටු දෙකක් පත් කළා. ඒ කියන්නේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවකුත්, නිලධාරින්ගෙන් සමන්විත කමිටුවකුත්. නිලධාරින්ගෙන් සමන්විත කමිටුවේ වාර්තාව අපට ඉතාම ඉක්මනින් ලැබෙන්න

නියමිතයි. ඒ අනුව එම අධ්‍යාපන කවුන්සලය තුළින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිටින සියලුදෙනාගේම වෘත්තියභාවය රැකෙන ක්‍රියාවලියකට අවශ්‍ය මැදිහත් වීමේ කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ තිබෙන අසමානතා අඩු කිරීම සඳහා අපි විශාල වශයෙන් මැදිහත් වෙලා තිබෙනවා. ළමයින්ට අවශ්‍ය stationery ගන්න අපි රුපියල් 6,000ක වවුචරයක් දීලා තිබෙනවා, සපත්තු ගන්න වවුචරයක් දීලා තිබෙනවා. සියලුම ගැහැනු දරුවන්ට සනීපාරක්ෂක තුවා ලබා දීලා තිබෙනවා. ඒ වාගේම uniformsවලට අවශ්‍ය රෙදි ලබා දීලා තිබෙනවා. පාසල් ළමුන්ට ලබා දෙන දිවා ආහාර වේල සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය අපි වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, digital infrastructure වැඩි කිරීම සඳහා මේ වෙනකොට අපි පාසල් හයදහස් දෙසීය ගණනක් හඳුනාගෙන තිබෙනවා වාගේම මේ අවුරුද්ද අවසන් වෙනකොට ඒ සියලුම පාසල්වලට Fibre connections ලබා දෙන්න සැලසුම් කරලා තිබෙනවා. ඒ වාගේම පාසල්වලට අවශ්‍ය යටිතල පහසුකම් - infrastructure - ලබා දීමේ කටයුතු අපි මේ අවුරුද්ද අවසන් වෙනකොට ආරම්භ කරනවා. පාසල් පද්ධතියට විතරක් නොවෙයි, අධ්‍යාපන කලාපවලටත් අපි මේ පහසුකම් ලබා දෙන්න කටයුතු කරමිනුයි ඉන්නේ. කාලයක් තිස්සේ කිසිම අවධානයක් නොලැබුණු විද්‍යාපීඨවලට මේ අවුරුද්දේ මුදල් වෙන් කරලා ඒවා දියුණු කරන්න අවශ්‍ය මැදිහත් වීමේ කටයුතුත් අපි ආරම්භ කරලා තිබෙනවා. එම විද්‍යාපීඨවල යටිතල පහසුකම් විතරක් නොවෙයි, ඒවායේ විෂයමාලා නිවැරදි කරන්නත්, අලුත් කරන්නත් අපි මැදිහත් වෙමිනුයි ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රට භාර ගන්නකොට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආරම්භ කරලා අත්හිටුවා තිබුණු විශාල ව්‍යාපෘති ගණනාවක් තිබුණා. 2016 වසරේ සිට "ළඟම පාසල - හොඳම පාසල" කියලා ව්‍යාපෘතියක් ආරම්භ කරලා තිබුණා. අදටත් එම ව්‍යාපෘතිය අවසන් වෙලා නැහැ. ඒ වෙනුවෙන් අපි විශාල මැදිහත් වීමක් කරලා තිබෙනවා.

මම මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

උසස් අධ්‍යාපන ආයතන තුළ - විශ්වවිද්‍යාලවල - ව්‍යාපෘති ගණනාවක් හිරවෙලා තිබුණා. ඇත්තවශයෙන්ම අලුතින් ආරම්භ වුණු විශ්වවිද්‍යාලවල නවත්වා තිබුණු ව්‍යාපෘති 26ක වැඩකටයුතු මේ අවුරුද්ද අවසානයේ නැවත ආරම්භ කරන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා දරුවන් සංඛ්‍යාව වැඩි කරලා තිබුණත්, ඒ දරුවන්ට ලැබිය යුතු පහසුකම් කිසිවක් ගැන පසුගිය රජයන් හිතලා තිබුණේ නැහැ. උදාහරණයක් හැටියට hostel පහසුකම් ඉතාම බරපතළ තත්ත්වයකයි තිබෙන්නේ. අපි මේ වෙනකොට අලුත් hostels ආරම්භ කරන්නත්, තිබෙන hostelsවල යටිතල පහසුකම් වැඩිදියුණු කරන්නත් අවුරුදු 5ක සැලැස්මක් සකස් කරලා, එය මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම රාජ්‍ය සේවය පිළිබඳවත් මෙතැන කථා කළා. පසුගිය වසර 5 තුළ රාජ්‍ය සේවයේ පුරප්පාඩු හරියට පුරවලා තිබුණේ නැහැ. ඒ වාගේම රාජ්‍ය සේවයට අලුතින් බඳවාගෙන තිබුණේත් නැහැ. විශේෂයෙන්ම ඒක අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපෑ විශාල ප්‍රශ්නයක්. ඔබ දන්නවා, උසස් අධ්‍යාපන ආයතන තුළ - විශ්වවිද්‍යාල පද්ධතිය තුළ - vacancies ගණනාවක් තිබෙනවා විතරක් නොවෙයි, පසුගිය ආණ්ඩු යටතේ ඇතිවෙලා තිබුණු අර්බුද සහ ආර්ථික අර්බුද නිසාත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සේවය කළ බොහෝදෙනෙක් පිට රට ගිහිල්ලා තිබුණු බව. මේ සියල්ල නිසාත් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රශ්න ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ වනකොට මේ අවුරුද්ද තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 1,284ක් බඳවා ගන්න අපි අනුමැතිය ලබා දීලා තිබෙනවා. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 1,868ක් බඳවා ගන්න අපි අනුමැතිය ලබා දීලා, ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියට මේ අවුරුද්ද තුළ පමණක් 3,150ක් බඳවා ගන්න අනුමැතිය ලබා දීලා තිබෙනවා. ඒ වාගේම තමයි, විශ්වවිද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන නව කාර්ය මණ්ඩල තනතුරු 307ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලයක් තිස්සේ හිර වෙලා තිබුණු ප්‍රශ්න වන යටිතල පහසුකම් දියුණු කිරීම, පුරප්පාඩු පිරවීම වෙනුවෙන් මේ රජය හැම අමාත්‍යාංශයක් තුළම මැදිහත් වෙමිනුයි සිටින්නේ. මම මේ කිව්වේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ අපි ආරම්භ කරලා තිබෙන, අප කරගෙන යන වැඩවලින් කිහිපයක් පමණයි. ඇත්තවශයෙන්ම මේ වෙනකොට "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන වෙනුවෙන් රුපියල් මිලියන 1,670ක් වෙන් කරලා තිබෙනවා. අපි බලාපොරොත්තු වනවා, මේ අවුරුද්ද ඉවර වනකොටවත් 2016 සිට ක්‍රියාත්මක වන පරිදි මේ කටයුතු ආරම්භ කරන්න. මොකද, නවත්වලා තිබුණු වැඩ කටයුතු නැවත අපි පටන් ගන්නවා. පාසල්වල ඉතාම අනාරක්ෂිත තත්ත්වයන් මේ බිල්ඩින් ව්‍යාපෘති නිසා නිර්මාණය වෙලා තිබුණා. මේ සියල්ල වෙනුවෙනුත් මැදිහත් වෙන්න අපි මුදල් වෙන් කරලා තිබෙනවා. ඒවාත් මේ අවුරුද්ද අවසන් වනකොට අවසන් කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. ඔබතුමන්ලාට මතක ඇති, මම කලිනුත් කිව්වා අපේ පාසල් පද්ධතිය තුළ තවම හරියට ජලය, sanitary facilities නැති පාසල් ගණනාවක් තිබෙනවාය කියලා. ඒවා සඳහාත් අපි මුදල් වෙන් කරලා, ඒ වෙනුවෙන් මැදිහත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නැවත වතාවක් විපක්ෂයට ස්තුතිවන්ත වෙනවා, අපට මේවා කියන්න අවස්ථාව ලබා දීම ගැන. අපි රට භාර ගත් තැන සහ අද රට තිබෙන තැන ගැන විපක්ෂය කියන කථාවලට වඩා අපට හමු වන ජනතාව කියන කථාවලට අපි ඇහුම්කන් දෙන්න ඕනෑ. මත්ද්‍රව්‍ය උවදුරට එරෙහිව මේ කරන ව්‍යාපාරය මේ රටේ අම්මලාට මොන තරම් සැනසීමක් ලබා දුන්නාද කියන එක ගැන අපි හොඳින් දන්නවා. පාසල්වල කොච්චර එවැනි සිදුවීම් වෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරනවා. අපි දේශපාලනය කරනකොට එකිනෙකාට චෝදනා එල්ල කරගන්න පුළුවන්; එකිනෙකාව විවේචනය කරන්න පුළුවන්. ඒක දේශපාලනය තුළ සිදු වන දෙයක්. ඒකට අපි මුහුණ දෙන්නත්, එය භාර ගන්නත් සූදානම්. නමුත් මම එක ඉල්ලීමක් කරනවා, දරුවන් මේකට ගාවා ගන්න එපා කියලා. අභිංසක ළමයින්ව පාදක කරගෙන බොරු චෝදනා කරමින්, ඒ දරුවන්ගේ ජීවිතවලට අපහාස වන විධියට දේශපාලනය පාවිච්චි කරන්න එපා කියාත් මම ඉල්ලා සිටිනවා. මේ පාර්ලිමේන්තුවේ තිබෙන නිදහස පාවිච්චි කරලා, අවුරුදු 14, 15 දරුවන්ව ඉලක්ක කරගෙන බොරු චෝදනා ගෙනෙන එක නින්දිතයි. කථා කරනවා නම් වැදගත් දෙයක් කථා කරමු. වැඩිහිටියන් හැටියට අපි එකිනෙකාව විවේචනය කරමු. දරුවන්ට ඒවාට උත්තර දෙන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක නිසා මම විපක්ෂයෙන් මේ ඉල්ලීම කරනවා. විවේචන ගෙනෙන්න. නමුත් ඒ තුළ වුණත් අවම සදාචාරයක් තියාගෙන අපි ඒ දේ කරමු. දරුවන්ව මේකට ඉලක්ක නොකරන ලෙසත් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.*

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gnanamuththu Srineshan. You have seven minutes.

[பி.ப. 1.00]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற விவாதமானது, கொள்கைப் பிரகடனத்தில் கூறிய விடயங்களை அரசாங்கம் நடைமுறைப்படுத்தி இருக்கின்றதா என்பதை ஒரு வருடத்தின் பின்னர் ஆய்வு செய்கின்ற வகையிலேயே அமைந்திருக்கிறது. "வளமான நாடு - அழகான வாழ்க்கை" என்பது இந்த அரசாங்கத்தின் மகுட வாசகமாகக் காணப்படுகின்றது. இதன்கீழ் பல விடயங்கள் இருக்கின்றன. சமத்துவம், நல்லிணக்கம், நல்லாட்சி, சட்டவாட்சி, ஜனநாயகப் பண்புகள், பொருளாதார ஜனநாயகம், சமூக நீதி, மக்கள் சார்ந்த ஆட்சி போன்ற விடயங்கள் உப பிரிவுகளில் காணப்படுகின்றன. "வளமான நாடு - அழகான வாழ்க்கை"ஐக் காண்பதற்கு மக்களும் தயாராக இருக்கின்றார்கள்; பல்வேறு கட்சிகளும் தயாராக இருக்கின்றன. எங்களுடைய நாடு வளமான நாடுதான். ஆனால், எமக்கு அழகான வாழ்க்கை அமைந்திருக்கிறதா? என்பதை நாங்கள் சுதந்திரம் அடைந்த காலத்திலிருந்து பார்க்க வேண்டும்.

எமது நாட்டை 1948ஆம் ஆண்டிலிருந்து இன்றுவரை பல அரசாங்கங்கள் ஆண்டிருக்கின்றன. அந்த அரசாங்கங்கள் கடைப்பிடித்து வந்த இனவாத, மதவாத, அடிப்படைவாதக் கொள்கைகளால் இந்த நாட்டில் அழகான வாழ்க்கையைப் பெறுவது கடினமாக அமைந்திருக்கின்றது. எனவே, புதிதாக ஆட்சி அமைத்திருக்கின்ற இந்த அரசாங்கம் ஓர் அழகான வாழ்க்கையை அமைத்துக்கொள்ள விழைகின்றது. அழகான வாழ்க்கையை அமைப்பதற்கு உணவு, உடை, உறையுள் என்ற மூன்று விடயங்களும் அத்தியாவசியமானது. இன்று மக்களுக்குத் தேவையான உணவு நியாய விலையில் கிடைக்கின்றதா? அவர்களுக்கு உறையுள் என்று சொல்லப்படுகின்ற வீடுகள் முறையாக அமைக்கப்பட்டு இருக்கின்றதா? அவர்கள் தங்களுக்குத் தேவையான உடைகளை நியாயமான விலையில் பெறக்கூடியதாக இருக்கின்றதா? எனப் பல கேள்விகள் எழுகின்றன. ஆட்சிக்கு வந்து ஒரு வருடம் கடந்திருக்கின்ற இந்த நேரத்தில், இந்த அரசாங்கம் இவற்றை எல்லாம் நிறைவேற்றி இருக்க வேண்டுமென நாங்கள் சொல்லவில்லை. ஆனால், இதற்கான அடித்தளத்தை அல்லது ஆரம்பப் புள்ளியை இட்டிருக்கின்றதா என்பதை நாங்கள் பார்க்க வேண்டும்.

நல்ல விடயங்களை நல்லதென்றே நாங்கள் சொல்ல வேண்டும். அந்த வகையில், இந்த நாட்டைச் சுத்தமாக்க வேண்டுமென்ற அடிப்படையில் மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகளை குறிப்பாக, போதைவஸ்துப் பாவனையைக் கட்டுப்படுத்தல், பாதாள உலகக் குழு உறுப்பினர்களைக் கைதுசெய்து அவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுத்தல், ஊழல் மற்றும் மோசடிகளில் ஈடுபட்டவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுத்தல் போன்ற விடயங்களைப் பாராட்டுகின்றோம். இவை நல்ல விடயங்கள்! இந்த நாட்டில் கறுப்பு இராச்சியம் இருப்பதாக மாண்புமிகு சனாதிபதி அவர்கள் குறிப்பிட்டு இருக்கிறார்.

இந்த நாட்டில் சட்டவிரோதமான ஒரு கறுப்பு இராச்சியம் இயங்குகின்றது. இதில் வெள்ளாடை அணிந்தவர்களும் இருக்கிறார்கள் என்பது தெரிகின்றது. அண்மையில் போதைப் பொருளுடன் சம்பந்தப்பட்ட எமது நாட்டைச் சேர்ந்தவர்கள் இந்தோனேசியாவில் இருந்து நாட்டுக்கு அழைத்து வரப்பட்டார்கள். அதைத் தொடர்ந்து உள்நாட்டிலும் போதைப் பொருளுடன் சம்பந்தப்பட்டவர்கள் கைது செய்யப்பட்டார்கள். இந்தப் பாதாள உலகக் குழுக்களை இயக்குபவர்கள் யார்? 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் சூத்திரதாரி யார்? என்பதை நாங்கள் கண்டுபிடிக்க வேண்டும். கால்களைப் பிடிப்பதால், வால்களைப் பிடிப்பதால் சில விடயங்களை முற்றாக நிறுத்திவிட முடியாது. இவற்றை இயக்குகின்றவர்கள் இருக்கின்றார்கள். அவர்கள் இரட்டை முகத்தைக் கொண்டிருக்கின்றார்கள். அவர்கள் ஒரு பக்கம் சட்டரீதியான முகத்தையும், இன்னொரு பக்கம் சட்டவிரோத முகத்தையும் கொண்டிருக்கின்றார்கள். அத்தகையவர்கள் கைதுசெய்யப் பட்டு, சட்டத்தின் அடிப்படையில் அவர்கள்மீது உரிய நடவடிக்கை எடுக்கப்பட்டால்தான் நீங்கள் கூறுகின்ற அழகான வாழ்க்கையை ஏற்படுத்த முடியும்.

இந்த நாட்டில் போதைவஸ்து தயாரிப்புக்கென ஒரு தொழிற்சாலையை அமைத்திருக்கிறார்கள் என்பது மித்தெனியவில் கண்டெடுக்கப்பட்ட போதைப்பொருட்கள் மூலம் அறியக்கூடியதாக இருக்கின்றது. இந்த நாடு சுத்தப்படுத்தப்பட வேண்டுமாக இருந்தால், நிச்சயமாக போதைவஸ்துடன் சம்பந்தப்பட்டவர்கள், போதைவஸ்து வியாபாரம் செய்கின்றவர்கள் மற்றும் பாதாள உலகக் கோஷ்டியினர் கைது செய்யப்பட வேண்டும். இதை நாங்கள் வரவேற்கின்றோம்; ஏற்றுக் கொள்கின்றோம். அதேநேரத்தில், ஊழல், மோசடியோடு சம்பந்தப்பட்டவர்களும் இருக்கின் றார்கள். ஊழல், மோசடியுடன் சம்பந்தப்பட்ட மற்றும் கறுப்பு இராச்சியத்தில் இருக்கின்றவர்கள் முழுமையாக இந்த அரசாங்கத்திலிருந்து களையப்பட்டு இருக்கின்றார்களா? என்பதைப் பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். பல்வேறு நிறுவனங்களில் ஊழல், மோசடி மூலம் கோடிக்கணக்கான நிதியைத் திரட்டிய அரசியல்வாதிகள் கடந்த தேர்தலில் மக்களால் நிராகரிக்கப்பட்டு இருக்கலாம். ஆனால், அவ்வாறான அதிகாரிகள் சிலர் தற்போதும் ஒட்டிக் கொண்டுதான் இருக்கிறார்கள். எனவே, ஊழல், மோசடியுடன் சம்பந்தப்பட்ட அதிகாரிகளும் கைது செய்யப்பட வேண்டும். இப்போது விசாரணைகள் நடைபெறுகின்றன; அறிக்கைகள் கிடைக்கப்பெறுகின்றன. ஆனாலும், அந்த அறிக்கை களிலுள்ள விடயங்களை நடைமுறைப்படுத்தாமல் அவர்களைப் பாதுகாக்கின்ற செயற்பாடுகளில் சிலர் ஈடுபட்டுக்கொண்டு இருக்கின்றார்கள்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Srineshan, you have only two more minutes.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
I had eight minutes, Sir.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
It has been reduced to seven minutes. So, you have two more minutes.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Okay.

ஊழல், மோசடியோடு சம்பந்தப்பட்ட அதிகாரிகள் இப்போதும் இந்த அரசாங்கத்தில் இரட்டை முகத்தோடு இருக்கிறார்கள். அவர்கள் உங்களுக்கு நல்ல முகத்தைக் காட்டிக்கொண்டு, சட்டவிரோதமாக உழைத்த பணத்தைப் பாதுகாப்பதற்காகச் சட்டத்தரணிகளை நாடுகின்றார்கள். நீங்கள் நேர்முகப் பரீட்சையை நடாத்தி புதியவர்களைத் தெரிவு செய்யலாம். ஆனால், அவர்கள் தப்பித்துக் கொள்வதற்காக வழக்குத் தாக்கல் செய்கிறார்கள். அதாவது, நீங்கள் RDAஇல் இரண்டு தடவை நேர்முகப் பரீட்சை நடாத்தி இருக்கின்றீர்கள். அதன்மூலம் தெரிவுசெய்து நீங்கள் புதியவர்களை நியமிக்கும் போது, அவர்கள் வழக்குத் தாக்கல் செய்து, அந்த நியமனங்களை எல்லாம் இரத்துச் செய்கின்றார்கள். இப்படிப் பட்டவர்கள் சம்பந்தமாக audit query நடாத்தப்பட்டு, அவர்கள் பற்றிய விளக்க அறிக்கை Ministryக்கு அனுப்பப்பட்டு இருக்கின்றது. ஆனால், அதற்கு எதிராக நடவடிக்கை எடுக்கப்பட்டதாகத் தெரியவில்லை. கடந்த அரசாங்கத்தில் இருந்த இப்படியான ஊழல் மோசடிக்காரர்கள் இந்த அரசாங்கத்திலும் இருந்துகொண்டு தப்பித்துக் கொள்வதற்கான வாய்ப்பு இருக்கின்றது. எனவே, அவர்களுக்கு எதிராக முறையான நடவடிக்கைகளை எடுக்க வேண்டும். கடந்த அரசாங்கத்தில் ஒதுங்கிக் கொண்டவர்கள் இப்போது யாருக்குப் பின்னால் ஒதுங்கலாமென சிந்தித்துக்கொண்டு இருப்பதோடு, ஒதுக்குப்புறங்களையும் தேடிக்கொண்டு இருக்கிறார்கள் என்பதை நான் இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இந்த நாட்டில் புரையோடிப்போயுள்ள இனப் பிரச்சினை இருக்கின்றது. காணாமல் ஆக்கப்பட்டவர்களுடைய உரிமை சார்ந்த பிரச்சினைகள் இருக்கின்றன. காணாமல் ஆக்கப் பட்டவர்களின் உறவுகள் பல வருடங்களாகப் போராடிக் கொண்டு இருக்கின்றார்கள்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Srineshan, your time is up.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Give me one more minute, Sir.

அவர்களுக்கு நியாயமானதொரு தீர்வை வழங்கினால்தான் ஓர் அழகான வாழ்க்கையை அமைக்க முடியும். அதுமாத்திர மல்ல, இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினையும் இருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்கள் ஐக்கிய நாடுகள் பொதுச் சபையில் பலஸ்தீனை அங்கீகரிப்பது தொடர்பாகப் பேசி இருக்கின்றார். உள்நாட்டில் இருக்கின்ற இனப் பிரச்சினையானது, கிட்டத்தட்ட சுதந்திரம் அடைந்த காலத்தில் ஆரம்பித்து இருக்கின்றது. இந்தப் பிரச்சினையை எவ்வாறு தீர்ப்பது? சகோதர இன மக்களுக்கு நீதியை, நியாயத்தை, சமூக நீதியை எவ்வாறு பெற்றுக்கொடுப்பது? என்பது பற்றிய கருத்துகள் அங்கு பரிமாறப்படவில்லை. நான் இந்த விடயத்தை இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

கஷ்டப் பிரதேசம், சௌகரியமான பிரதேசம் என்றில்லாமல், எல்லா இடங்களிலுமுள்ள மக்களும் சௌகரியமாக வாழ வேண்டுமாக இருந்தால், கஷ்டப் பிரதேசங்களில் இருக்கின்ற பிரச்சினைகள் தீர்க்கப்பட வேண்டும். எங்களது மட்டக்களப்பு மாவட்டத்தில் படுவான்கரை, எழுவான்கரை என்று இரண்டு பிரதேசங்கள் இருக்கின்றன. இவற்றை இணைப்பதற்கான பாலம் அமைக்கப்படவில்லை. அண்மையில் மகிழவெட்டுவான் பாலம் உடைந்ததால் அங்குள்ள கிராம மக்கள் போக்குவரத்துச் செய்ய முடியாமல் இருக்கின்றார்கள். அந்தப் பாலத்துக்குரிய formal testing முடிந்துவிட்டது. ஆனாலும், அதற்கான கட்டுமான வேலைகள் நடைபெறவில்லை. RDA அதிகாரிகளுக்கு அந்த report அனுப்பப்பட்டு இருக்கின்றது. அவர்கள் அதற்குரிய அனுமதியை வழங்கினால்தான் அதனைச் செய்யக்கூடியதாக இருக்கும் என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். இறுதியாக, அழகான வாழ்க்கையை அமைப்பதற்குப் போதைப்பொருள் சார்ந்த விடயங்களை முற்றாக இல்லாதொழிப்பதோடு, ஊழல், மோசடிகளோடு சம்பந்தப்பட்டவர்களுக்கு எதிராக உடனடியாகச் சட்ட நடவடிக்கை எடுத்து, உரிய தண்டனையையும் வழங்க வேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவுசெய்கின்றேன். நன்றி!

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Dayasiri Jayasekara?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි. මම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ Member කෙනෙකු විධියට කටයුතු කරනවා. ඊයේ රවි සෙනෙවිරත්න මැතිතුමා එම කමිටුවට ආවා. ඒ කමිටුවට ඇවිල්ලා, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු හඳුනාගෙන තිබෙනවාද කියලා නිසාම් කාරියප්පර් මැතිතුමා අහපු ප්‍රශ්නයට එතුමා උත්තරයක් දුන්නා. අද ඔක්කෝම පුවත් පත්වලින් කථා කරලා අපෙන් අහනවා, මේ මොකක්ද කියන්නේ කියලා. මේ වෙනකොට පොලිස් මාධ්‍ය කොට්ඨාසයෙන් නිවේදනයක් නිකුත් කර තිබෙනවා, එය පිටුපස ඉන්දියාව සිටි බවට එතුමා කිව්වේ නැහැ කියලා. අපට මතක හැටියටත් එතුමා ඒ වාගේ ප්‍රකාශයක් කළේ නැහැ. නමුත් මම කියන්න කැමැතියි, මේ සම්බන්ධව යම්කිසි clarification එකක් කරන්න කියලා. මොකද, උසස් නිලතල පිළිබඳ කාරක සභාවට ඇවිල්ලා ඒ ගැන කියන්න ඕනෑ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වහාම අධිකරණයට

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

ගිහිල්ලා කියන්න ඕනෑ, කවුද ඒ මහ මොළකරු කියලා. මොකද, websitesවල- *[බාධා කිරීමක්]* ඒ හැම එකකින්ම අපට කථා කරලා අහනවා, මේ ක්‍රියාවලිය පිළිබඳව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Member, your point is taken.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒ නිසා මම කියන්න කැමැතියි, එක්කෝ පොලීසිය භාර ඇමතිතුමා හෝ නියෝජ්‍ය ඇමතිතුමා හෝ කවුරුන් හෝ මේ සම්බන්ධව වගකීමක් ඇති කෙනෙක් මේ ගැන ප්‍රකාශයක් කරන්න කියලා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Minister of Justice and National Integration is on his feet. Yes, Hon. Minister?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කරුණු සම්බන්ධයෙන් විමර්ශන සිද්ධ වෙනවා. ඒ කාරක සභාවේදී අසන ලද ප්‍රශ්නවලට ඔහු උත්තර දුන්නා. එහෙම නැතුව ඔහු ඇවිල්ලා ඒක ස්වේච්ඡාවෙන් කිව්වේ නැහැ. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් එතැන සිටියා. අසන ලද ප්‍රශ්නවලට උත්තර දීමක් ඔහු කළේ. එහෙම නැතුව, ඒක මාධ්‍යයට කිව්වා නොවෙයි.

ඒ වාගේම තමයි, එම කරුණු disclose කරන්න කියලා මෙම පාර්ලිමේන්තුව විසින්වත් නියෝග කළ යුතුයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, ඒවා part of the investigation. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යංග්‍යාර්ථයෙන්, වෙනත් මාර්ගවලින් එම විමර්ශන කඩාකප්පල් කරන්න උත්සාහ කරන පුද්ගලයන්ට ඉඩ දෙන්න එපා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Wasantha Samarasinghe. You have 14 minutes.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Dayasiri Jayasekara, let us not turn this into a point of debate. The Hon. Minister of Justice and National Integration has explained it. - [*Interruption.*]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඒ ගැන ඇහුවේ, ගරු ඇමතිතුමා,- *[බාධා කිරීමක්]* මට තත්පර කිහිපයක් ලබා දෙන්න. මම මේ කිව්වේ- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I gave you time, Hon. Dayasiri Jayasekara. You have made your point and the Hon. Minister of Justice and National Integration replied to that.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, this is very important.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
We cannot go for a debate on that. Today's Debate is on a different topic.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, give me a few minutes.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I will give you ten seconds.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, මේක tweet කර තිබෙන්නේ අපේ නිසාම් කාරියප්පර් මැතිතුමා. අලුත් මන්ත්‍රීවරයෙකු විධියට- *[බාධා කිරීමක්]* එතුමා ඒක කරපු එක වැරැදියි. මොකද, උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ හෝ කිසියම් කාරක සභාවක කථා කරන එකක් අපි කවදාවත් tweet කරන්නේ නැහැ; ඒ කථා කරන දේවල් එහෙම දමන්නේ නැහැ. නමුත් එහෙම කිරීමත් එක්ක- *[බාධා කිරීමක්]* එතුමා මේක දමා තිබෙන්නේ අද උදේ. නමුත් ඊයේ හවස් වෙනකොට මේ පණිවුඩය හැම තැනකටම ගියා. මට තිබෙන ප්‍රශ්නය ඒකයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I think you have made your point clear.

Hon. Wasantha Samarasinghe, you may please start your speech and your time starts now.

[අ.භා. 1.12]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙක තමයි ප්‍රශ්නය. අපි කථා කරන්න ඕනෑ දේයි, ඒක කථා කරන්න ඕනෑ තැනයි -ප්‍රකාශ කරන්න ඕනෑ තැනයි- පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් මේ තිබෙන්නේ. උසස් නිලතල පිළිබඳ කාරක සභාවට ඒ නිලධාරින් කැඳවන්නේ වගකීමකින්. එය පාර්ලිමේන්තුවේ තිබෙන ප්‍රධාන කාරක සභාවක්. අගමැතිතුමියයි එහි කැඳවීම කරන්නේ. එම කාරක සභාවට රජයේ පත් කිරීම් පිළිබඳව ස්ථාවරත්වයක් තිබෙනවා. එම පත්වීම් ස්ථිර කිරීමට කැඳවන නිලධාරින් එම කාරක සභාව විශ්වාස කරලා එහිදී අසන ප්‍රශ්නවලට දෙන උත්තර එම කාරක සභාවේ සාමාජිකයින් tweet කරනවා කියන්නේ, කොහේහරි තමන්ගේ පෞද්ගලික ගිණුම්වල වාර්තා කරනවා කියන්නේ බරපතළ වැරැද්දක්. ඔවුන්ට විරුද්ධවයි පරීක්ෂණ පවත්වන්න ඕනෑ. අධිකරණ ඇමතිතුමා කිව්වා වාගේ ඒවා disclose කරන ලෙසට උපදෙස් දෙන්න කියලා මේ පාර්ලිමේන්තුවට කීම තවත් කුමන්ත්‍රණයක්. ඒක තවදුරටත් යන පරීක්ෂණවල වාර්තා එළියට දමන්න කියලා කියන කථාවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන් අදාළ කාරක සභාවල කාර්යභාරය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කළ යුතුයි. විශේෂයෙන්ම උසස් නිලතල පිළිබඳ කාරක සභාව වාගේ කාරක සභාවකදී අසන ලද ප්‍රශ්නවලට නිලධාරින් විසින් දෙන පිළිතුරු එම කාරක සභාවේ සාමාජිකයන් එළියට ඇවිත් කියන හෝ සමාජ මාධ්‍යවල ලියන මේ පුරුද්ද නැති කරන්න, එහෙම නැත්නම් ඒක නවත්වන්න කියලා උපදෙසක් දෙන්න. ඒක තමයි අත්‍යවශ්‍ය වන කරුණ. *[බාධා කිරීමක්]* අද දවසේ මේ වෙලා තිබෙන දේ පිළිබඳව- *[බාධා කිරීමක්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

කවදාවත් ඕවා එළියට දෙන්න යන්නේ නැහැ. එහෙම නේද, ඇමතිතුමා?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඒක තමයි මන්ත්‍රීතුමා, ඔබතුමන්ලා කියන්න ඕනෑ. මේ වැරැද්දයි නිවැරැදි කරන්න ඕනෑ. දැන් ඔබතුමාගේ යෝජනාව වෙලා තිබෙන්නේ ගිහිල්ලා ඒවා මාධ්‍යයට කියන්න කියන එක නේ. මාධ්‍යයට කියන එක නොවෙයි, අද කරන්න තිබෙන්නේ. ඒ මන්ත්‍රීවරයා උසස් නිලතල පිළිබඳ කාරක සභාව ඉස්සරහට ගෙන්නලා අවවාද කරන්න කියලායි කියන්න ඕනෑ. මේ කරපු වැරැද්දට හරි නම් එතුමා කාරක සභාවෙන් නෙරපන්නයි ඕනෑ. මොකද, මේක බරපතළ ප්‍රශ්නයක් නේ. මේක, රටේ තිබෙන විශේෂ සංවේදී කරුණක් නේ. මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමාත් මේ ගැන කථා කළා. මේ ප්‍රශ්නය බරපතළ ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ විපක්ෂය විසින් සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව, අපේ ආණ්ඩුවේ ගමන් මඟ පිළිබඳ යෝජනාවක්; පසු ගිය වසරකට ආසන්න කාලයක් තුළ අප ආපු ගමන් මඟ පිළිබඳ කථාවක්. විපක්ෂය වෙනුවෙන් අදහස් ඉදිරිපත් කරන්න මැදිහත් වෙච්ච මන්ත්‍රීවරුන් අතරින් කිහිප දෙනෙක් විපක්ෂයේ කාර්යභාරය මොකක්ද කියන එක කිව්වා. විපක්ෂය ආණ්ඩුව විවේචනය කරනවා. ඒක හරි. ඒක නේ විපක්ෂයේ කාර්යභාරය. ආණ්ඩුව හැටියට අපි ආණ්ඩුව කරපු වැඩ ටික කියනවා; කරන්න ඉන්න වැඩ ටික කියනවා. රට තිබුණු තැන ඉඳන් මෙතැනට ගෙන එන්න ගත වුණු වසරේ සිට අප සිදු කරමින් සිටින කාර්යභාරය, ඒ කාර්යභාරය තුළ ලබා තිබෙන ප්‍රගතිය, ජනතාව භුක්ති විඳිමින් ඉන්න අයිතිවාසිකම් හා වරප්‍රසාද ගැන තමයි අප මේ ප්‍රකාශ කරමින් ඉන්නේ. ඒක, විපක්ෂය දකින්නේ "බින්දුව" විධියට වෙන්න පුළුවන්, එහෙම නැත්නම් "1" විධියට වෙන්න පුළුවන්. ඒක තමතමන්ට දැනෙන ලෙස, තමතමන්ට අවශ්‍ය ලෙස, ගෝචර ලෙස විග්‍රහ කර ගන්න පුළුවන්. නමුත් ආණ්ඩුවක් ලෙස අපි මේ කාරණා කියන්න ඕනෑ.

ඊළඟට, වංචා, දූෂණ සම්බන්ධයෙන් සිදු වෙලා තිබෙන්නේ මොකක්ද කියලා ඇහුවා. සමහර ආයතන audit කරලා නැහැ කිව්වා. ඔව්, සමහර ආයතන audit කරලා නැහැ. සමහර ආයතනවල ගිණුම් හදලා නැහැ. අපි ඒවා හදනවා. උදාහරණයක් ගත්තොත්, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ලංකා සතොස ආයතනය අවුරුදු 4ක් ගිණුම් හදලා තිබුණේ නැහැ. අපි දැන් ඒ ගිණුම් හැදීමේ කටයුතු අවසන් කරමින් යන්නේ. ඒ, සතොස ආයතනය, CWE එක ගැන. සමුපකාර තොග වෙළඳ සංස්ථාව වහලා තිබුණේ. අඩුම ගණනේ ඒක ඇවර කරන්නත් බැහැ, ගිණුම් හදලා නැති නිසා. අපි දැන් ඒ ගිණුම් හැදීමේ කටයුතු අවසන් කරමින් ඉන්නේ. ඒ වාගේ රාජ්‍ය ආයතන ගණනාවක් තිබෙනවා. ඒවායේ ගිණුම් හදලා අපි නැවත ඒ ආයතන ස්ථාපිත කරනවා. ඒ ගැන කථා කරපු මන්ත්‍රීතුමාම කිව්වා, රාජ්‍ය ආයතන පාඩු ලබනවා, අක්‍රිය වෙලා කියලා. නැහැ, සමහර ආයතන බොරු ගිණුම් හදලා තිබුණේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපි මේ රාජ්‍යය ස්ථාවර කර ගැනීම සඳහා, රාජ්‍යය ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය කරන ස්ථාවරයන් තමයි සකස් කරමින් ආවේ. ඒකට අවශ්‍ය කරන රාජ්‍ය යන්ත්‍රණය ශක්තිමත් කරන්න යනකොට තමයි අපට රාජ්‍ය සේවය වැදගත් වන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

රාජ්‍ය සේවය වැදගත් වෙනකොට රාජ්‍ය සේවයේ ඉහළ සිට පහළට ඉන්න රාජ්‍ය සේවකයා අපට වැදගත් වනවා. ඒ නිසා තමයි ඒ රාජ්‍ය සේවකයාගේ සංතෘප්තිය පිණිස කටයුතු කළේ. පළමුවැනි කාරණය මේකයි. දැනට සිටින රාජ්‍ය සේවකයා අපෙන් අපේක්ෂා කළා, වැටුප් වැඩි කිරීමක්. අන්න අපි රාජ්‍ය සේවාවේ වැටුප් වැඩි කිරීම කළා. රාජ්‍ය සේවාවේ වැටුප් වැඩි කිරීම් වෙනුවෙන් අපි 2025, 2026 සහ 2027 කියන අවුරුදු තුනට රුපියල් බිලියන 330කට ආසන්න මුදලක් වෙන් කළා. පළමුවැනි අවුරුද්ද හැටියට අපි මේ අවුරුද්දට විතරක් රුපියල් බිලියන 310කට ආසන්න මුදලක් වෙන් කරලා තිබෙනවා, රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩි කරන්න. *[බාධා කිරීමක්]* නැහැ. ලබන අවුරුද්දටත් ඒ වාගේම වෙන් කරලා තිබෙනවා. හැබැයි, දැන් විපක්ෂය කියනවා, රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩි කිරීම් කරලා නැහැ වාගේ කථාවක්. කොහේ හරි තිබෙන වාර්තාවක් ගෙනැල්ලා කියනවා, රාජ්‍ය සේවක වැටුප් ගැන හිතා බලන්න කිව්වා කියලා. නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා එහෙම කිව්වා. දැන් එතුමා මෙතැන හිටියා නම් නැඟිටිනවා. එතුමා මෙතැන නැති නිසායි නම කිව්වේ. හිටියා නම් වෙලාව ගන්නවා නේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මම උත්තර දෙන්නම්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

නැහැ, ඔබතුමා කලබල වෙන්න එපා, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොහේ හරි තිබෙන වාර්තාවක් ගෙනැල්ලා කියනවා, රාජ්‍ය සේවයේ වැටුප් ගැන සලකා බලන්න කියලා එහි තිබෙනවා කියා. නැහැ, ඒ කවුරුවත් කියලා නොවෙයි, ආණ්ඩුවම ඒ ගැන සලකා බැලුවා.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

2016 සිට රාජ්‍ය සේවයේ වැටුප් හැදුවේ නැහැ. ඒ නිසා අපි 2016 සිට රාජ්‍ය සේවයේ වැටුප් හදලා අවම වැටුප රුපියල් 40,000ක් කළා. ජීවන අංක දීමනාවත් එක්ක රුපියල් 57,800කට රාජ්‍ය සේවයේ වැටුප ගෙන ආවා. ඒ තමයි රාජ්‍ය සේවකයාට සැලකූ විධිය. ඒ විතරක් නොවෙයි, අපි විශ්‍රාමිකයාගේත් වැටුප් හැදුවා. ඒ විතරක් ද නොවෙයි. වැටුප් වර්ධකත් හැදුවා. පෞද්ගලික අංශයේ සේවකයාගේත් වැටුප් හැදුවා. ඒ නිසා මේක රටේ වැඩ කරන ජනතාව පිළිබඳව බලපු ආණ්ඩුවක්. විපක්ෂය කියලා නොවෙයි එහෙම කළේ. ඒක, මේ ආණ්ඩුවට ජන වරම දීපු ජනතාවගේ අපේක්ෂාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද රාජ්‍ය සේවකයින් වැටුප් වැඩි කරන්න කියලා ඉල්ලමින් කොහේ හරි සටන් කරනවා දැක්කාද? එහෙම නැහැ.

වතු සේවකයින්ගේ ප්‍රශ්නයක් තිබුණා. වතු සේවකයින්ගේ වැටුප් ගැටලුව පිළිබඳව අපි තවදුරටත් සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ අයගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා වැඩි කිරීමේ සාකච්ඡා යනවා. වැටුප් ගිවිසුමේ පරිදි රුපියල් 1,350ක් තිබෙනවා. තවත් රුපියල් 350ක් kilo rate එක අනුව ගෙවනවා. දවසකට දලු කිලෝ 7ක් කැඩුවොත් රුපියල් 350ක් ලබා ගැනීම සඳහා හැකියාව තිබෙනවා. එක එක වත්ත අනුව ඒක වෙනස් වෙලා තිබෙනවා. සියයට සියයක් නැති වුණත් වතු සේවකයාට ඒ වැටුප් වැඩිවීම ලබා ගැනීමේ සියයට 80ක හැකියාවක් -possibility එකක් - තිබෙනවා. ඒ රුපියල් 1,700 වැටුප ලබා ගැනීමේ හැකියාව අපි හදන්න ඕනෑ. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියනවා, ඒ තවත් සාකච්ඡාවක් ඉස්සරහට තිබෙනවා කියලා. ඒක බැරි නම් අපි ආණ්ඩුව පැත්තෙනුත් සලකා බලමින් තිබෙනවා, තවත් මොනවාද කරන්න පුළුවන් කියලා. එහෙම නම්, මේක ජනතාව ගැන හිතමින් වැඩ කරන ආණ්ඩුවක්. අපි මේ අවුරුද්ද ඇතුළත කළා, කවදාවත්ම කරන්න බැරි දේවල්. තව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේගොල්ලන්ට අමතක වෙලා තිබෙනවා රාජ්‍ය සේවකයාගේ විශ්‍රාම වැටුප නැවැත්වුයේ 2016දී කියලා. දැන් සද්ද නැතිව ඉන්නවා. ඒ ගැන දන්නේ නැහැ වාගේ ඉන්නේ. 2016 වසරේදී තමයි රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප නැවැත්වූයේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කවුද, අපි?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්, නැත්නම් කවුද? අපිද? *[බාධා කිරීමක්]* එහෙම නම් කවුද නැවැත්තුවේ? ආ, මතක නැතිව ඉන්නේ නේද? රාජ්‍ය සේවක විශ්‍රාම වැටුප 2016දී නැවැත්වූයේ. රාජ්‍ය සේවකයන් බඳවා ගැනීමත් නැවැත්තුවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you can speak after the Hon. Minister's speech.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථා කරලා ඉවර වුණාට පස්සේ එතුමාට කථා කරන්න පුළුවන්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට කිව්ව නිසා,-

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමාට කිව්වේ නැහැ, මම. ඔබතුමාට කිව්වේ නැහැ. කලබල වෙන්න එපා. වාඩි වෙලා ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් පිළිබඳව කිව්වොත්, අපි බලයට එනකොට රාජ්‍ය සේවයේ පුරප්පාඩු 280,000ක් තිබුණා. ඒ 280,000ම එකවර බඳවා ගන්න බැහැ. ජනාධිපතිතුමා කිව්වා, අපේ අය වැය යෝජනාව ඇතුළේ උපාධිධාරින් 30,000ක් බඳවා ගන්න අපි මේ අවුරුද්දේ සැලසුම් කරනවා, කටයුතු කරනවා කියලා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කළා. ඒ මුදල් වෙන් කිරීමත් එක්ක රාජ්‍ය සේවයට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ගැනීමේ කටයුතු අපි පටන් ගත්තා. අගමැතිතුමිය කිව්වා, රාජ්‍ය සේවයට 65,000ක් බඳවා ගැනීමට මේ වනකොට කැබිනට් මණ්ඩලය අනුමැතිය දී ඇති බව. අපේ රටේ රාජ්‍ය සේවය ඇතුළු අනෙකුත් සේවාවලට බඳවා ගැනීම් සඳහා දැන් අනුමැතිය දීලා තිබෙනවා. මේ තමයි රට ඇතුළේ රස්සාවලට බඳවා ගැනීමට කටයුතු කිරීමේ තත්ත්වය.

ඒ විතරක් නොවෙයි, බඩු මිල ගැනත් අද කථා කළා. බඩු මිල ගැන කථා කරද්දී, බඩු මිල අඩු වෙලා නැහැ, ජීවත් වෙන්න බැහැ කියන කාරණය කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජීවන වියදම වැඩි වීම පිළිබඳ සාකච්ඡා වෙනකොට මේ රටේ Cost of Living Index එක පිළිබඳව අපි හැමදාම සාකච්ඡා කරනවා. කොළඹ කොටස් වෙළඳ පොළ වාගේ නොවෙයි මේක. කොළඹ පාරිභෝගික මිල දර්ශකය කියලා එකක් තිබෙනවා. ජාතික පාරිභෝගික මිල දර්ශකය කියලා තව එකක් තිබෙනවා. රටේ මිනිස්සු මේ දෙකේ වැඩි වීම -කොහොමද මිල වැඩි වෙන්නේ කියලා- පිළිබඳව සාමාන්‍ය විධියට දන්නවා.

මම මේ කියන්නේ 2024 සැප්තැම්බර් මාසයේ සිට 2025 සැප්තැම්බර් මාසය දක්වා අපේ රටේ බඩු මිල පිළිබඳ තොරතුරු. මේ ඔක්තෝබර් මාසයේ මුල නිසා මම ගත්තේ සැප්තැම්බර් මාසය වනතුරු දත්ත. ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම කියන්නම්, භාණ්ඩ ගණනාවක බඩු මිල කොහොමද තිබුණේ කියලා. බඩු මිලෙහි විශාල අඩුවීමක් තිබෙනවා. ඒ අතර භාණ්ඩ වර්ග 40කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ භාණ්ඩ වර්ග 40හි මිල අඩු වීම සියයට 20කට වැඩියි. සමහර භාණ්ඩ තිබෙනවා සියයට 40කින් මිල අඩු වෙලා තිබෙන. තවත් භාණ්ඩ ටිකක් -භාණ්ඩ වර්ග 15කට ආසන්න ප්‍රමාණයක්- තිබෙනවා, සියයට 9කට ආසන්න ප්‍රමාණයකින් මිල වැඩි වෙලා තිබෙන. මේ භාණ්ඩ පැස ගත්තේ මේ නිසායි. මේ භාණ්ඩ වර්ග 60 තමයි අපේ රටේ ලංකා සතොස ආයතනය ඇතුළේ වැඩියෙන්ම අලෙවි වන භාණ්ඩ වර්ග ටික. බඩු මිල වැඩි වීම ගැන කිව්වාට, බඩු මිල අඩු වුණා කියන කාරණය ජනතාවට දැනිලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද වනකොට අපේ රටේ අල කිලෝව රුපියල් 250යි, ලොකු ලූනු කිලෝව රුපියල් 150යි, රතු ලූනු කිලෝව රුපියල් 295යි. අපි මේ විධියට මිලදී ගන්නවා. ලංකා සතොස ඇතුළු පෞද්ගලික

අංශයේ ආයතනත් ඒකාබද්ධව අපි මිලදී ගැනීම් කරනවා. අපි ලංකා සතොස ආයතනය මඟින් හාල් කිලෝව රුපියල් 230ට විකුණන්න පටන් අරගෙන තිබෙනවා. අපි හාල් නිෂ්පාදනය කරලා සතොස හරහා ලබා දෙනවා. මේ කටයුතු තුළින් රාජ්‍ය ආයතන පද්ධතිය ශක්තිමත් කරනවා වාගේම, රජයේ ආයතන තුළ සිදු වන ක්‍රියාවලියත් අපි ශක්තිමත් කරමින් යනවා. ආණ්ඩුව පැත්තෙන් මෙවැනි ක්‍රියාවලියක් කර ගෙන යනකොට කියනවා, ආණ්ඩුවේ ආයතන ශක්තිමත් වෙන්නෙත් නැහැ, ආණ්ඩුවත් දුර්වල වෙලා තිබෙන්නේ, ආණ්ඩුවට ශක්තිමත් වැඩ පිළිවෙළක් නැහැ කියලා. එහෙම කියන ගමන් පළාත් සභා ඡන්දය ගැනත් එක පාරටම මතක් කරනවා. හිටපු ගමන් අහනවා ආපහු පළාත් සභා නැද්ද කියලා. පළාත් සභා තිබෙනවා. නමුත්, අවුරුදු ගණනාවක් තිස්සේ පළාත් සභා ඡන්දය තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළාත් සභා ඡන්දය ලබන අවුරුද්දේ තියන්න තමයි ආණ්ඩුව පැත්තෙන් දැන් යෝජනා ඉදිරිපත් කරන්නේ. විජිත හේරත් ඇමතිතුමා ජිනීවා ගිහිල්ලා මානව හිමිකම් කවුන්සලයේදීත් මේ ගැන කිව්වා. පළාත් සභා නැති වුණාට ප්‍රාදේශීය සභා ටික වැඩ කරන්න පටන් අරගෙන මාස තුනක් වෙනවා. දැන් ගමේ පාරවල් ටික හදනවා. පිට්ටනි ටික සුද්ද කරනවා. ළදරු පාසල් ටික පිළිසකර කරනවා. සුසාන භූමි ටික සුද්ද කරන්න පටන් අරගෙන තිබෙනවා. දැන් ගම ආපහු සක්‍රිය වෙන්න පටන් අරගෙන තිබෙන්නේ. පසුගිය වසර ගණනාවක් තිස්සේ සක්‍රිය නොවුණු ගම දැන් සක්‍රිය වෙන්න පටන් අරගෙනයි තිබෙන්නේ; දැන් ඒ වැඩ ටික පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා දැන් ගම ඇතුළේ ආර්ථිකය සක්‍රිය වෙන්න පටන් අරගෙන තිබෙන්නේ. ආර්ථිකය සක්‍රිය වෙන්න පටන් ගත්ත නිසා තමයි ලෝක බැංකුව කියන්නේ, ලෝකයේ ආර්ථිකය වැටිච්ච, ආර්ථිකය දුර්වල වෙච්ච රටවල් 82ක් අතරින් වේගයෙන්ම ප්‍රකෘතියට පත් වෙච්ච රටක් තමයි ලංකාව කියලා. ඒගොල්ලෝ ඒක කියනවා. එහෙම කියන්නේ නිකම් නොවෙයි. රටක් හැටියට අපේ ආර්ථිකය ශක්තිමත් වෙමින් තිබෙනවා.

ඒ අතර අපට කියනවා, online tenders - e-tenders - ක්‍රමය තවම ක්‍රියාත්මක කරන්න බැරි වුණා කියලා. අපි අපේ රටේ ආර්ථිකය සකස් කරද්දී, දූෂණය නැති කිරීම අපේ එක ප්‍රධාන අරමුණක්. ජනාධිපතිතුමාත් මේ ගැන ඉතාම පැහැදිලිව කිව්වා. ඒ වාගේම digitalization එකත් අපේ තව අරමුණක්. අපේ රාජ්‍ය යන්ත්‍රණයට ඩිජිටල්කරණය වේගයෙන් එක් කර ගන්න ඕනෑ. රාජ්‍ය යන්ත්‍රණය ඩිජිටල්කරණයට එක් කර ගැනීම වෙනුවෙන් කටයුතු කරගෙන යනකොට අපේ රාජ්‍ය යන්ත්‍රණය, රාජ්‍ය ආයතන පද්ධතිය විශාල ලෙස අපට ප්‍රතිසංවිධානය කර ගන්න වෙනවා. මේ ආයතන, මේ කාර්ය මණ්ඩල, ඒ අයගේ පුහුණුව, ඒවාට අවශ්‍ය උපකරණ යනාදී මේ සියල්ල අවශ්‍යයි. දැන් තිබෙන ආයතනයක් සක්‍රිය කර ගන්න තිබෙන මේ process එක ගත්තාම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට ඒ වෙනුවෙන් විශාල කාර්යභාරයක් තිබෙනවා. ඒ ටික කර ගන්න යන සමහර ක්‍රියාමාර්ගවලදී මේ tender procedures ගත්තාම, සමහර ඒවා අමාරුයි. මොකද, සමහර tender procedures ගත්තාම, ඒ procedures අනුව ටෙන්ඩර්ස් දැම්මාම පෞද්ගලික අංශයත් එක්කයි රජයට තරග කරන්න වෙලා තිබෙන්නේ. ඒක තමයි ක්‍රියාවලිය. ඉතින් ඒ ක්‍රියාවලිය යනකොට ඔන්න අපට මේ දවස් ටිකේ කියන්න ගත්තා, සහල් පිළිබඳ ප්‍රශ්නය, ගල් අඟුරු ටෙන්ඩර් ගැන, බස් ටෙන්ඩර් ගැන, තෙල් ටෙන්ඩර් ගැන. මේ සියලු ටෙන්ඩර්වලදී රජයේ tender procedures අනුව තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා මේ කිසි ටෙන්ඩරයක් tender proceduresවලට පිටින් ආලා නැහැ. නමුත් මේ ක්‍රියාවලිය යනකොට කියන්න ගත්තා, සහල් ප්‍රශ්නයක් තිබෙනවා කියලා. සහල් ප්‍රශ්නයක් මතු වෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි ඒ කිසිවක් නිසා නොවෙයි. අපේ රටේ සහල් වෙළඳපොළ ගත්තොත්, අද පාරිභෝගිකයාට අවශ්‍ය සහල් අපේ රටේ ගොවියා නිෂ්පාදනය කරනවා. අපේ රටේ ප්‍රධාන සහල් වර්ග හතරක් පරිභෝජනයට ගන්නවා. ඒ තමයි නාඩු, කැකුළු, සම්බා සහ කීරි සම්බා. කීරි සම්බා සහ සම්බා සියයට 18ක විතර තමයි අපේ පරිභෝජනයට ගන්නේ. හැබැයි, නිෂ්පාදනය තිබෙන්නේ සියයට 16කටත් අඩුවෙන්. සියයට 15කටත් අඩුවෙන් තමයි නිෂ්පාදනය තිබෙන්නේ. එතකොට සියයට 4ක විතර අඩුවක් මේ සහල්වල තිබෙනවා. මේ සියයට 4 අඩුව නිසා වෙළඳපොළේ ඇති වන හිඟය පාවිච්චි කරලා මහ මෝල් හිමියන්, එහෙම නැත්නම් මේ වී තොග රැස් කරන්නන් කිහිප දෙනෙක් විසින් වෙළඳපොළ තුළ පාලනයක් කරන්න උත්සාහ කරනවා සහ මිල වැඩි කිරීමක් කරනවා. ඒ නිසා මෙකට අපට උත්තරයක් ඕනෑ. ඒ උත්තරය හදන්න අපට කෘෂිකර්ම අමාත්‍යාංශය උපදෙස් දීලා තිබෙනවා, ඒ වී වගාව වැඩි කරන්න. ඒ සඳහා මහා ව්‍යාපාරවල කීරි සම්බා සහ සම්බා වගා කිරීමේ ක්‍රියාවලිය වැඩි කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ හිඟය අපට දිගටම පවත්වාගෙන යන්න වෙනවා. නමුත් මෙයට කෙටි කාලීන උත්තරයක් ලෙස යම් ප්‍රමාණයකට කීරි සම්බා ආදේශන සහල් ප්‍රමාණයක් ආනයනය කරන්න වුණොත්, අපට ඒ සහල් ආනයනය කරන්න වෙනවා. එහෙම ආනයනය කරන්න වෙන්නේ රටේ සහල් මදි නිසා නොවෙයි. එම සහල් පරිභෝජනය කරන පාරිභෝගිකයන්ට යම් හිඟයක් ඇති වන නිසා. එහෙම නැත්නම් මේ වෙනකොට රටේ අවශ්‍යතාව සහල් මෙට්‍රික්ටොන් මිලියන 2.7යි. හැබැයි, මෙට්‍රික්ටොන් මිලියන 3.4ක සහල් අපි හදලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Minister, you get five more minutes from the Hon. K.D. Lal Kantha's time.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එහෙම සහල් ප්‍රමාණයක් අපි හදනවා. අපි ඒක කරන්න යනකොට පසුගිය මහ කන්නය ආවා. පසුගිය මහ කන්නයේ වී මෙට්‍රික්ටොන් 4,000යි අපි මිලදී ගත්තේ. හැබැයි, යල් කන්නයේ මිලදී ගත්තා, වී මෙට්‍රික්ටොන් 50,000ක්. මේ 50,000 මිලදී ගන්නකොට අපට ටෙන්ඩර් දාන්න වුණා. මොකද, වී අළෙවි මණ්ඩලයත් සතොසත් වී මිලදී ගන්නවා. ඒ වී ටික කොටලා ගුණත්වයෙන් යුතු සහල් දෙන්න ඕනෑ පාරිභෝගිකයාට. අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියෝ ඉන්නවා. ඒ වාගේම මහා පරිමාණ මෝල් හිමියෝ ඉන්නවා. වෙළඳ පොළ තුළ සහල් අඛණ්ඩව පවත්වා ගෙන යෑමේ වුවමනාවකුත් අපට තිබෙනවා. ඒ සඳහා අපි සතු වී තොග කොටලා පාරිභෝගිකයාට දෙන්න ඕනෑ. අපි ඒ වෙනුවෙන් මොකද කළේ? රජයේ ප්‍රතිපත්තිමය ටෙන්ඩර් පාටිපාටිය අනුව, වී මෙට්‍රික්ටොන් 20,000ක් කොටලා දෙන සේවාව සපයන ටෙන්ඩර් එක දැම්මා. සේවාව සපයන ටෙන්ඩර් එක තමයි අපි දැම්මේ. සේවාව සපයන ටෙන්ඩරය. ඒ අනුව වී මෙට්‍රික්ටොන් 20,000ක සේවාව සපයන ටෙන්ඩර් එක අපි ඊයේ විවෘත කළා. ඊයේ විවෘත කරනකොට ටෙන්ඩර්කරුවන් 4 දෙනෙක් තමයි ඇවිල්ලා හිටියේ. ඒ හතරදෙනාගේ ටෙන්ඩර් පත් විවෘත කරලා තිබෙනවා. දැන් ඒක Technical Evaluation Committee එකට ආලා තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියෝත් ඉල්ලනවා, ඒ අයටත් වී කොටන්න දෙන්න කියලා. වී මෙට්‍රික්ටොන් 50,000න් මෙට්‍රික්ටොන් 20,000කට තමයි ටෙන්ඩර් එක දැම්මේ. හැබැයි, මෙට්‍රික්ටොන් 20,000ට ටෙන්ඩර් එක දැම්මාම එළියේ කතාව හදනවා, මෙට්‍රික් ටොන් 50,000ක් දෙන්න හදනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කොහොමද දෙන්නේ? වී මෙට්‍රික්ටොන් 20,000ට 50,000ක් දෙන්නේ කොහොමද? ඒ ගැන බොරු කිය කියා යනවා. විපක්ෂයේ සමහර අයත් ඒ බොරුව පස්සේ දුවනවා. ඒ විතරක් නොවෙයි, අපි සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්ටත් වී මෙට්‍රික්ටොන් 20,000ක් ලබා දෙන්න යම් ක්‍රමයක් හදලා, ඒකට ඒ ගොල්ලන්ගේ මිල ගණන් කැඳවමින් තිබුණේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මම මේ තොරතුරු **සභාගත*** කරනවා. මෙතැන ඒ විස්තර තිබෙනවා තිබෙනවා දිනත් එක්ක. කුරුණෑගල සීමාසහිත මහව සමුපකාර සංවර්ධන කොට්ඨාසයේ සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිතිය අපට මිල ගණන් ඉදිරිපත් කළා. කවදාද ඒ දිනය? 2025.09.17වන දා.

මේ තිබෙන්නේ ඒ අය අපේ වී ටික කොටලා අපට සහල් දෙන මිල. අපේ වී අලෙවි මණ්ඩලයේ වී ටික අපි ඒගොල්ලන්ට දෙනවා, ඒගොල්ලන් අපට සහල් දෙනවා. හැබැයි, අපි ඒගොල්ලන්ට එක් කොන්දේසියක් දැමුවා. මේ වී අලෙවි මණ්ඩලයේ වී දෙනකොට අපේ ඉතිහාස කථාව හරිම අමිහිරියි. ඒ නිසා අපි එකඟතාවකට ආවා, "ඔයගොල්ලන් ඉස්සරවෙලා ඔයගොල්ලන් ළඟ තිබෙන සහල් ප්‍රමාණයක් අපට දෙන්න ඕනෑ, ඒ සහල් ප්‍රමාණයට වටිනාකම සහිත වී අපි ඔයගොල්ලන්ට දෙනවා, ඔයගොල්ලන් ආපසු ඒ සහල් ගෙනැත් දෙන්න, අපි ඔයගොල්ලන්ට වී ලබා දෙනවා, ඒ අනුව, rotation එකට වී මෙට්‍රික්ටොන් 20,000ක් දෙන්නම්" කියලා. ඊට අමතරව මට දුන්නා තව quotation එකක්. ඒ quotation එක මට දීලා තිබෙන්නේ උතුරු මැද පළාත් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගේ සංගමය. මේ දෙකම මා ළඟ තිබෙනවා. මේ quotations දෙකම මට දීලා දැන් මාසයකට ආසන්න කාලයක් වෙනවා. ටෙන්ඩර් එක අවසන් කළේ ඊයේ. මේ ටෙන්ඩර් එක මෙහෙම යනවා. මේක තිබෙන්නේ වී මෙට්‍රික්ටොන් 20,000කට. තව වී මෙට්‍රික්ටොන් 30,000ක් තිබෙනවා. ඒකෙන් 20,000ක් තමයි මේගොල්ලන්ට දෙන්න දැන් කල්පනා කරන්නේ. ඒගොල්ලන් අපට සහල් දුන්නාම ඒ වටිනාකමට අපි ඒගොල්ලන්ට වී ලබා දෙනවා. වී දුන්නාම ඒගොල්ලන්ට කොටලා දෙන්න පුළුවන්. අපි කිව්වා, ඔයගොල්ලන්ට දෙන්න පුළුවන් ගාණ අපට දෙන්න කියලා. තම්බපු සහල් කිලෝ එකක් අපේ ගබඩාවට ගෙනැත් දෙන්න පුළුවන් ගාණ කියන්න, කැකුළු හාල් කිලෝ එකක් අපේ ගබඩාවට ගෙනැත් දෙන්න පුළුවන් ගාණ කියන්න කියලා කිව්වා. ටෙන්ඩරයෙන් දැන් අපට ඇවිල්ලා තිබෙනවා, ගාණක්. අපි දන්නවා, දැන් වී කිලෝ එකක ගණන කීයද කියලා. ඒගොල්ලන් අපට ටෙන්ඩරය දැම්මාම, ටෙන්ඩරයේ ගාණ තිබෙනවා. රටේම තිබෙන සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන්, සමුපකාර සංගම්වලට අපි දැනුම් දීමක් කරලා තිබෙනවා. ඒ ඒ දිස්ත්‍රික්කවල වී අලෙවි මණ්ඩලයේ සමුපකාර ගබඩා තිබෙනවා, වී තොග තිබෙනවා. ඒ තැන්වලින් වී මෙට්‍රික්ටොන් 20,000ක් නිදහස් කරන්න නම්, ඒ අයට යම් ප්‍රමාණයක් සහිතව තමන්ගේ වී ටික කොටලා අපේ ගබඩාවට සහල් දුන්නාම, ඒ වටිනාකමට වී නිදහස් කරනවා. ඒ නිසා අපි ක්‍රමයක් අනුව කථා කරගෙන යනවා, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ටත් තමන්ගේ කර්මාන්තය කරගෙන යන ගමන් පාරිභෝගිකයාට ගුණාත්මක සහල් ප්‍රමාණයක් ලබා දීමට අවශ්‍ය කරන සහයෝගය දෙන්න. රජයක් හැටියට අපි ඒ කටයුත්ත කරනවා.

---

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

ඒ වාගේම, මේ මාස කිහිපය තුළ වී කොටලා වෙළෙඳ පොළට ගුණාත්මක සහල් දමන්න, අප සතු වී තොග කොටන්න කටයුතු කරනවා. මේ ටෙන්ඩරය දමනකොට සමහරු අපට කියන්න ගත්තා, මේ ටෙන්ඩරය දාලා තිබෙන්නේ ලොකු කට්ටියට දෙන්න කියලා. නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පැයට වී කිලෝ 15,000යි කියන්නේ දවසට ටොන් 15යි. සාමාන්‍යයෙන් පැය 20ක් වැඩ කළොත් ටොන් 15යි. මාසයම වැඩ කළත් මාසයකට කොටන්න පුළුවන් වී ටොන් 7,500යි. වී ටොන් 20,000ක් කොටන්න නම්, මාස 3ක් වැඩ කරන්න ඕනෑ. අපි තනි මෝල් හිමියෙක් තෝරා ගත්තොත්, ඔහුට සහල් ටොන් 20,000ක් ගන්න නම්, මාස 3ක් වී කොටන්න ඕනෑ. ටොන් 20,000 කොටන්න ඔහුට මාස 3ක් යනවා. අපේ capacity එක දෙන්න නම් ඔහුට මාස 3ක් අඩුම ගණනේ පැයට වී කිලෝ 15,000ක් කොටන්න පුළුවන් වෙන්න ඕනෑ, ඔහුගේ මෝලේ. එහෙම නැත්නම් ඔහුට ටෙන්ඩර් එක දෙන්න බැහැ. අන්න එහෙම තමයි අපි මේ කටයුත්තේදී මේ වැඩේ කරගෙන යනවා කියලා කිව්වේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ටෙන්ඩර් ක්‍රියාවලිය යන්නේ රජයේ පටිපාටි සහ ඒ අදාළ criteria අනුව. ඒ නිසා ඒවාට apply නොකර කැලේ පැනලා හරියන්නේ නැහැ නේ. තමන්ට අඩුවට දෙන්න පුළුවන් නම් දෙන්න ඕනෑ. ඔන්න, දැන් අපි සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ටත් මේ වැඩේ දෙන්න plan කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කථාවත් කියන්න ඕනෑ. මොකද, මම දැක්කා ඊයේ මේ කථාව කියලා තිබුණා. ජිනීවාවල තිබෙන ලෝක වෙළෙඳ සංවිධානයේ අවුරුදු 5න් 5ට පවත්වන වෙළෙඳ ප්‍රතිපත්ති සමාලෝචන - Trade Policy Reviews - සාකච්ඡාව ලබන 14වැනි දා සිට 17වැනි දා දක්වා දවස් 3ක් පැවැත්වෙනවා. ඒ 14වැනි දා සිට 17වැනි දා දක්වා වන දවස් 3 තුළ පවත්වන මේ වෙළෙඳ ප්‍රතිපත්ති සාකච්ඡාවට වෙළඳ අමාත්‍යාංශය යටතේ තිබෙන වාණිජ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, මහ බැංකුව, Sri Lanka Customs, BoI ඇතුළු ආයතන ගණනාවක් සහභාගි වෙනවා. ඒ සහභාගි වෙන්නේ වෙළෙඳ ප්‍රතිපත්ති සාකච්ඡාවට. එහෙම නැතුව ඒක සංචාරයක් නොවෙයි. ඒ සාකච්ඡාවට යන්න කලින්ම ලංකාව අනුගමනය කරපු වෙළඳ ප්‍රතිපත්ති මත ඇති වෙච්ච ගැටලු පිළිබඳ ප්‍රශ්න 245ක් මේ වෙනකොට එවලා තිබෙනවා. මේ ප්‍රශ්න 245ටම ඒ දවස් තුනේදී උත්තර දෙන්න ඕනෑ, ඒ යන නිලධාරින්. ඒ විතරක් නොවෙයි. ප්‍රශ්නවලට උත්තර දෙන ගමන් ලංකාවේ focal point එකක්, point of contact එකක් තබා යන්නට ඕනෑ, සාකච්ඡාව යන අතරතුර. මේවා technical discussions; තාක්ෂණික සාකච්ඡා. තාක්ෂණික සාකච්ඡා යන අතරතුර අපි දෙන උත්තරයෙන් සෑහීමකට පත් වෙන්නේ නැතිව ඒගොල්ලන් අපි එක්ක සාකච්ඡා කරලා ප්‍රශ්න අහනවා, ආපසු ලංකාව එක්ක කථා කරලා නැවත උත්තර දෙන්න.

ඉතින්, එවැනි සාකච්ඡාවක් පිළිබඳව අවබෝධයක් නැතිව ඉතාම පහත් මට්ටමින් කථා කරන එක වැරදියි. ඉස්කෝලේ නොගියා කියලා කියන්න යන්නේ නැහැ මම. ඒ කථාව මම කියන්න යන්නේ නැහැ. විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු මේ කථාව පිළිබඳව මතු කරන ලද අදහස් විපක්ෂයේ සමහර සමාජ මාධ්‍යවලට යවලා තිබෙනවා. ඒ පිළිබඳව අපි නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා. මොකද, මේ කථාව ඇතුළේ උත්සාහ කරනවා, ආණ්ඩුවේ ක්‍රියාමාර්ග ඉතාම ලාභ, ඉතාම බාල තත්ත්වයේ ඒවා විධියට පෙන්වන්න. ආණ්ඩුවේ ක්‍රියාමාර්ග එවැනි ලාභ, බාල තත්ත්වයේ ඒවා නොවෙයි. අපි මේ රට ඇතුළේත්, රට නියෝජනය කරමින් ජාත්‍යන්තරයේත් ඒ අවශ්‍ය කටයුතු ටික අපි කරනවා. ඒ කටයුත්ත කරගෙන ආණ්ඩුව තමන්ගේ ගමන යනකොට, විපක්ෂයේ අයට ටිකක් අමාරු ඇති. ඒක එහෙම තමයි. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා කිව්වා, අපේ වැඩේ මේක තමයි කියලා. ඒක හොඳයි. *[බාධා කිරීමක්]* එළියට ආවාම මම කියලා

දෙන්නම්. *[බාධා කිරීමක්]* ගියේ නැත්නම්, ගියේ නැත්තේ කවුද කියලා දන්නවා. ඒකයි වැඩේ. ගියේ නැති උදවිය කවුද කියලා විස්තර සොයා බලා ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා, මේ ආණ්ඩුව පිළිබඳව ආපහු හැරිලා බලන්න මේක හොඳ අවස්ථාවක්.

මේක අපි ආණ්ඩුව භාර අරගෙන අවුරුද්දකට පස්සේ විපක්ෂය විසින් ගෙනාපු යෝජනාවක්. එම නිසා පසුගිය අවුරුද්ද ඇතුළත ආණ්ඩුව කළේ මොනවාද කියලා විපක්ෂයට මතක් කරලා දෙන්න මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම අපි මේ දේවල් පිළිසකර කර ගනිමින්, මේ ගත කරපු කාලය ඇතුළේ අපි බොහෝ දේවල් සිදු කරමින්, ඒ වෙනුවෙන් දැනුත් සූදානම් වෙමින් ක්‍රියාත්මක වෙමින් සිටිනවා. ඒ වාගේම, ඉදිරි වසර කිහිපයත් ඉතාම සාර්ථකව අපි ජනතාවත් එක්ක මේ ගමන යනවා. ජනතාවට සතුටින් ජීවත් වෙන්න පුළුවන් රටක් හදන්න අපි ගෙනයන ගමනට ලෝකය පුරා මිනිස්සු අත්වැල් බැඳගෙන එකතු වෙමින් තිබෙනවා. විපක්ෂයටත් මතක් වෙලා අද මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා. නැවත මේ දේවල් මතක් කරන්න ගත්ත උත්සාහය ගැන අපි සතුටු වෙනවා. ඒ වෙනුවෙන් කාලය ලබා දීම ගැන නැවතත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Rohitha Abeygunawardhana. You have ten minutes.

[අ.භා. 1.36]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අද දවසේ සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කර තිබෙන විපක්ෂයේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දැක්වීමට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට වසරකට පෙර අපේ රටේ ආණ්ඩු මාරුවක් සිද්ධ වුණා. අපේ රට පාලනය කරන වත්මන් ආණ්ඩුවේ ප්‍රධාන පාඨය වෙලා තිබුණේ, "පොහොසත් රටක් -ලස්සන ජීවිතයක්" කියන එක. අපේ රටේ මිනිසුන්ට පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කරන්න අවශ්‍ය පරිසරය හදන්න තමයි ඔවුන් බලයට ආවේ. මුළු රටේම ජීවත් වන සියලු ජාතීන්, ආගම් නියෝජනය කරන හැම කෙනෙක්ම කැමතියි, පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කරන්න. ඒ වෙනකොට තිබිච්ච ආණ්ඩුව ඒ දේ කරන්න අසමත් වෙලා තිබුණු නිසා අපේ රටේ ජනතාව මීට අවුරුද්දකට පෙර අලුත් ජනාධිපතිවරයෙක් තෝරා පත් කර ගත්තා. පසුගිය වසර ඇතුළත අපේ රටේ අලුත් ජනාධිපතිවරයෙක් පත් කරගෙන, පාර්ලිමේන්තුවටත් මන්ත්‍රීවරු 159දෙනෙක් තෝරා පත් කර එවා තිබෙනවා. ඊට පස්සේ පැවති පළාත් පාලන මැතිවරණයේදී අපේ රටේ මිනිස්සු මේ ආණ්ඩුවට පළාත් පාලන ආයතනවලත් බහුතර බලයක් දුන්නා. අපේ රටේ ජනතාව එවැනි බලයක් මේ ආණ්ඩුවට දුන්නේ මොකටද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ මිනිස්සු මේ ආණ්ඩුවට ඡන්දය දුන්නේ පොහොසත් රටේ ලස්සනට ජීවත් වෙන්නයි. දැන් පොහොසත් රටේ ලස්සනට ජීවත් වෙන්න හම්බ වෙනවාද, නැද්ද? මේක නේ ප්‍රශ්නය.

අපි විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු. ඒ නිසා මේ රටේ ජනතාව ඔවුන්ගේ ප්‍රශ්න අපට කියනවා. තමුන්නාන්සේලා ආණ්ඩු පක්ෂයේ. තමුන්නාන්සේලා පසුගිය අවුරුද්ද ඇතුළත අපේ රටේ ජනතාව වෙනුවෙන් කරපු දේවල් කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවුරුදු ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් හිටපු කෙනෙක්. අපි ආණ්ඩුවේ සිටිද්දි වැඩිපුරම කරන්නේ අමාත්‍යාංශවල වැඩ; රජයේ වැඩ. අපි ගමේ යනවා අඩුයි. අපට ගමත් එක්ක සම්බන්ධ වෙන්න වෙලාවක් නැහැ. ආණ්ඩුවේ සිටියදී අපිට සතියේ දින හතේම අමාත්‍යාංශයේ වැඩ තිබුණා; රජයේ වැඩ ගොඩක් තිබුණා. වැඩ වැඩි වෙනකොට අපි ගමට එන්නේ නැහැ. දැන් අපි කොහේද ඉන්නේ? අපි අද ඉන්නේ විපක්ෂයේ. අපි දැන් ගමේ ඉන්නේ. අපි ගමේ ඉන්නේ. අපි ගමේ තිබෙන මඟුල් ගෙදරට, මළගෙදරට, තොවිල් ගෙදරට, බණ ගෙදරට, ඔක්කෝටම ගියාම අන්න ගම ඇතුළෙන් අපට තොරතුරු එනවා. අපිත් එක්ක මිනිස්සු කථා කරනවා. අන්න ඒ තොරතුරු එක්ක තමයි අද අපි අහන්නේ, පොහොසත් රටක් හැදුවා ද, ලස්සන ජීවිතයක් හැදුවා ද කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රට ඒ විධියට හැදුවාය කියලා ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු, මන්ත්‍රීවරු කියනවා නම්, ඇත්තටම රට ඒ විධියට හැදිලා ද කියලා අපි බලමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දවසේ පුවත් පතක තිබෙනවා, ශ්‍රී ලංකාවේ පවුල්වලින් හතරෙන් එකක් දුප්පත් කියලා. මේක කියලා තිබෙන්නේ World Bank එක; ලෝක බැංකුව තමයි මේක කියන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අල්ලපු ගෙදර සිමියොන් අයියාවත්, කමලාවතී අක්කාවත් කියපු එකක් නොවෙයි. අපේ මිත්‍ර ගරු ලාල්කාන්ත ඇමතිතුමනි, මේක World Bank එක තමයි කියලා තිබෙන්නේ. ඔබතුමා ඒ කාලයේ විපක්ෂයේ සිටියදී කිව්වේ එහෙම නේ. අපි දැන් අහන්නේ මෙන්න මේකයි. පොහොසත් රටක සියයට 25ක් දුප්පතුන් වෙන්න බැහැ. එහෙනම් ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. ණය බර ගත්තාම, 2020 අවුරුද්ද වෙනකොට ණය බර රුපියල් ට්‍රිලියන 29ට ආසන්නයි. දැන් රුපියල් ට්‍රිලියන 30කට ආසන්නයි. මේ අවුරුද්ද ඇතුළත රුපියල් ට්‍රිලියනයක ණය අරගෙන තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒ දවස්වල වේදිකාවේදී ඇහුවා, ආණ්ඩු ඕනෑද ණය ගන්න නම් කියලා. හැකියාව තිබෙන නායකයෝ ඉන්නවා නම් මොකටද ණය ගන්නේ? අන්න මිනිස්සු බලාපොරොත්තු වුණා, බලයට පත් කරගන්න නම් මෙන්න මරු ආණ්ඩුව කියලා. මොකද, ණය ගන්නේ නැහැ කිව්වා. නමුත් දැන් රුපියල් ට්‍රිලියනයක ණය අරන් තිබෙනවා. රුපියල් ට්‍රිලියනයක් කියන්නේ රුපියල් බිලියන 1,000ක්. එහෙනම් පොහොසත් රට හැදුණාද? පොහොසත් රට හැදිලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැදිලා නැහැ කියන්නේ රටේ තත්ත්වය පොළොව මට්ටමෙන් හැදිලා නැති නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ජනතාව බලාපොරොත්තු වෙන්නේ මොනවාද? ජනතාව තුන් වතාවක් ඡන්දය දීලා බලාපොරොත්තු වෙන්නේ මොනවාද? ජනතාව බලාපොරොත්තු වෙනවා, තෙල් මිල පහත දමාගන්න. මොකද, ඒක බලාපොරොත්තුවකට වඩා පොරොන්දුවක් නේ. හිටපු ඇමතිවරයා වෙන්න පුළුවන්, ආණ්ඩුව වෙන්න පුළුවන්, තෙල්වලින් රුපියල් 150ක් ගසා කනවා කිව්වා. ඒ හින්දා දැන් තෙල්වලින් ඒ රුපියල් 150 අඩු කරන තෙක් ජනතාව බලාගෙන ඉන්නවා. අර මොකක්ද වැටෙනකම් බලන් ඉන්නවා වාගේ තවම බලන් ඉන්නවා, රුපියල් 150ක් අඩු වෙනකම්. හැබැයි, වැටෙන්නේ නැහැ; තෙල් මිල අඩු වෙන්නේ නැහැ. විදුලි බිල ගත්තාම, තව දින ගණනක් යනකොට විදුලි බිලට කණ කොකා හඬනවා. අර කියපු අඩු කිරීම කෙසේ වෙතත් විදුලි බිල වැඩි කරන බවට නම් දැන් ඉඟියක් ලැබිලා තිබෙනවා. එතකොට ඒක වෙලාත් නැහැ. මේ ඡන්දේ දීපු හේතු, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

ඊළඟට VAT එක ගනිමු. විශේෂයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ අත්‍යවශ්‍ය භාණ්ඩ තමයි ප්‍රබල වශයෙන් මේ රටේ මිනිස්සුන්ට බලපාන කාරණා. අධ්‍යාපනයට, සෞඛ්‍ය සේවයට, අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩවලට අය කරන VAT එක අඩු වෙලාද? නැහැ. අඩු වෙලා නැහැ. මැතිවරණ වේදිකාවල මේවා කියනකොට මිනිස්සු අත්පුඩි ගැහිල්ලක් ගැහුවා, මගේ අම්මේ! රම්පෙට පොරි හැලෙන්න අත්පුඩි ගැහුවා. එහෙම අත්පුඩි ගහලා තමයි ඡන්දය දුන්නේ. ඡන්දය දීලා ජනතාව බලාපොරොත්තු වුණා, මේක ඉටු කරගන්න. නමුත් ඉටු වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඊළඟට ජනතාව මොනවාද බලාපොරොත්තු වුණේ? ගොවීන්ගේ නිෂ්පාදනවලට හොඳ මිලක් ලබාගන්න. ඒක වී වෙන්න පුළුවන්, එළවලු වෙන්න පුළුවන්, වෙන භෝගයක් වෙන්න පුළුවන්. ඒ නිෂ්පාදනවලට හොඳ මිලක් ලබාගන්න ගොවීන් බලාපොරොත්තු වුණා. ධීවර ක්ෂේත්‍රයේ මිනිස්සුත් නොයෙකුත් දේවල් බලාපොරොත්තු වුණා. අද ඒවායෙන් මොනවාද ලැබුණේ කියන එක ගැන ප්‍රශ්නාර්ථයක් තිබෙනවා. ඊළඟට මිනිස්සු බලාපොරොත්තු වුණේ මොනවාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? විට්ස් කාර් එකක් රුපියල් ලක්ෂ 12කට ගන්න මිනිස්සු කොච්චර බලාපොරොත්තුවෙන් හිටියාද? එයින් කාර් එකක් ගන්න පුළුවන් නම් හොඳයි. මිනිස්සු බලාපොරොත්තු වුණා, රුපියල් ලක්ෂ 12ට විට්ස් කාර් එකක් අරගෙන ඒකේ යන්න. දැන් ත්‍රී වීලර් එකකුත් රුපියල් ලක්ෂ 24යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ, ඔබතුමන්ලා කියපු දේවල්. ඒ කියපු දේවල් ගැන නැවත සිහිපත් කිරීමකුයි මේ කරන්නේ.

තව මොනවාද බලාපොරොත්තු වුණේ? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් තාරුණ්‍යය තව දේවල් බලාපොරොත්තු වුණා. මේ රටේ තරුණයන්ට බැංකුවකට ගිහිල්ලා ණයක් ගන්න බැහැ. එක්කෝ ගෙදර ඔප්පුව ඉල්ලනවා. එක්කෝ ඇපකරයක් ඉල්ලනවා. හැබැයි ඒ කියන සියලු දේවල් දෙන්න බැරි වෙනකොට එදා මැතිවරණ වේදිකාවේදී ඒකටත් පොරොන්දුවක් දුන්නා. එදා මොකක්ද කිව්වේ? මැතිවරණ වේදිකාවේදි නොව ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළත් තිබෙනවා, ඇපකර නැතුව රාජ්‍ය බැංකුවලින් ණය ලබා දීමේ ක්‍රමයක් පිළිබඳව. මේක හොඳ ක්‍රමයක්. ගම්වල ඉන්න අහිංසක තරුණ තරුණියන්ට මොනවා හරි ව්‍යාපාරයක් කරගන්න කැමැත්ත තිබෙනවා. නමුත් ඒක කරගන්න විධියක් නැහැ. ඒ අය පළමුවැනි ඡන්දය හැටියට ඡන්දයක් පාවිච්චි කළා. අවුරුදු 18 පිරිච්ච ගමන්ම ගිහිල්ලා මාලිමාවට කතිරය ගැහුවා, මටත් ණයක් ලබාගන්න පුළුවන් වෙයි කියලා. ණය ලැබුණාද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? නැත. මම දැනුවත්ව නම් කාටවත් ණය හම්බ වෙලා නැහැ. කාට හරි හම්බ වුණා නම් අන්න ඔහුව අල්ලාගෙන අහනවා, "පුතේ, කොහොමද ණය හම්බ වුණේ?" කියලා. මොකද, අපේ ගම්වලත් ඉන්නවා නේ, ඒ ණය මුදල් බලාපොරොත්තුවෙන් ඉන්න අය. ඒ අයට ණය අරන් දෙන්න ඕනෑ. නමුත් එහෙම ණය දීලා නැහැ. මම අහන්නේ, ජනතාවට ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් සහ මැතිවරණ වේදිකාවේ දුන් පොරොන්දු ඉටු වුණාද කියලායි.

දැන් මේක මනින්නේ කොහොමද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේක මනින විධිය බලමු. මේක මනින්න තිබෙන්නේ එකම ක්‍රමයයි. ලංකා දේශපාලන ඉතිහාසයේ ආණ්ඩුවක් තමන්ගේ ජනතාවත් එක්ක බැඳී ඉන්නවාද, ජනතාව ආණ්ඩුවට කැමතිද, නැද්ද කියන එක තීන්දු කරන්න තිබෙන ක්‍රමය මොකක්ද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? ඒ ක්‍රමය තමයි, ජනතා මතය විමසීම; මතය අහන එක. අපි දෙගොල්ලන් ගත්තාම, ඒ පැත්ත මේ පැත්තට බණිනවා, මේ පැත්ත ඒ පැත්තට බණිනවා. ඒක තමයි මේ කරන්නේ. හැබැයි, මේ මොකක් කළත් අවසානයේ අපට ගිහිල්ලා අහන්න වෙන්නේ ජනතාවගෙන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාවගෙන් අහන්න නම් දැන් තිබෙනවා අවස්ථාවක්. අපේ ගරු අගමැතිතුමිය අද ප්‍රකාශයකුත් කළා, 2026 වර්ෂයේදී පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා. ඒක බොහොම හොඳ වැඩක්. මොකද, පළාත් සභා මැතිවරණය හැංගිලා තිබෙන්නේ; හංගලා තිබෙන්නේ. කොහෙන් එය වුණාද කියන එක නොවෙයි ප්‍රශ්නය. හැබැයි, හැංගිච්ච දේ හොයන්න නේ මේ ආණ්ඩුව ආවේ. එහෙම නම් දැන් හොඳම දේ තමයි, පළාත් සභා මැතිවරණය පුළුවන් තරම් ඉක්මනට පවත්වන එක. අන්න එතකොට ජනතාව තීන්දු කරනවා, මේ ආණ්ඩුව හොඳට වැඩ කරලා ද, නරකට වැඩ කරලා ද කියලා. ජනතාව ඒ තීන්දුව දෙයි. මම එය කියන්නේ නැහැ, බොහොම ඍණාත්මකව. මම ධනාත්මකව කියන්නේ. වැඩ කරලා තිබෙනවා නම් අද මෙතැන කථා කරන ආණ්ඩුව විධියට අනිවාර්යයෙන් ඔබට පුළුවන් වෙයි, ඉහළ ප්‍රතිශතයකින් දිනන්න. හැබැයි වැඩ කරලා නැත්නම් ආණ්ඩුව කඩා වැටීමේ ආරම්භයක් බවට පත් වෙයි, එම මැතිවරණ ප්‍රතිඵලය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩ කරගෙන යනකොට වෙන වැඩත් වනවා නේ. දැන් බලන්න, මේ වනකොට ආණ්ඩුවට හරියටම අවුරුද්දයි දින 18ක් වනවා. අපි සති වශයෙන් ගත්තොත්, සති 51ක් වනවා. දැන් වැඩ කරනවා වෙනුවට මොකක්ද කරන්නේ? වැඩ කරන්න ඉස්සෙල්ලා ආණ්ඩුවක් හැටියට මොනවාද කරන්නේ? සතියකට මොකක් හරි මාතෘකාවක් දානවා. පළමුවැනි සතිය ගන්න. මුලින්ම පටන් ගත්තේ බාර් සතිය. මතකද, ගරු නියෝජ්‍ය කථානායකතුමාට? මොකක්ද බාර් සතිය? ගරු ලාල් කාන්ත ඇමතිතුමනි, පසුගිය ආණ්ඩුවෙන් බාර් ලයිසන් ගත්ත අයගේ නාම ලේඛනය එළියට දැම්මා. ඔන්න ඒ සතිය දිව්වා, බාර් මාතෘකාව එක්ක. අපිත් බලාගෙන හිටියා, මොකද වෙන්නේ කියලා. එක්කෝ ඒ බාර් ලයිසන් ටික cancel කරන්න ඕනෑ. එක්කෝ බාර් ලයිසන් දුන්න මිනිහා හොයාගන්න ඕනෑ. ඒ මොකුත් නැහැ. බාර් සතිය ඉවරයි.

ඊට පස්සේ මොකක්ද ආ සතිය? බටලන්ද සතිය. බලාගෙන හිටියා, බටලන්ද වධකාගාරයේ සිද්ධියට හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාව අල්ලගෙන ගිහිල්ලා ඇතුළට දායි කියලා. එතුමාව ඇතුළට දැම්මේ මොකකටද? ඇමෙරිකාවට ගිහින් එන ගමන් එංගලන්තයෙන් බැස්ස එකට. එතකොට ඒ කාරණය අල්ලගෙන ඒ සතිය දිව්වා. ඊට පස්සේ මොනවාද ආවේ? ඊට පස්සේ අයිස් සතිය. ඒක අයිස්. තනිකරම අයිස් තමයි. අයිස් සතියේ ඉන්න වුණේ සීතලේ. ඊට පස්සේ ආවා, කජ්ජගෙ සතිය. ඒකට නාමල් මන්ත්‍රීතුමාව සම්බන්ධ කරගෙන හැම වෙලාවේම කජ්ජා ගැන කිව්වා. ඒ, කජ්ජගේ සතිය. හැබැයි, ඊළඟ සතියේ ආවේ නැහැ, පුහුලම. කජ්ජගෙ සතිය ගියාම පුහුලම එන්න එපායැ? පුහුලම ආවේ නැහැ. *[බාධා කිරීමක්]* නාමල් සතිය දිගටම එනවා. කජ්ජගෙ සතිය ආවාට පුහුලම ආවේ නැහැ. පුහුලම එන්නේ නැතුව දැන් මොකක්ද ආවේ? අද ආවා, අලුත්ම මාතෘකාවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකක්ද ඒ? "පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු හඳුනා ගත්තා. මහජන ආරක්ෂක ලේකම් පාර්ලිමේන්තු කමිටුවට කියයි" කියලා ප්‍රවෘත්තියක් ගියා. මේ, "හිරු" නාළිකාවේ ප්‍රවෘත්තියක්. මේ දැන් අපේ දුරකථනයට මේ පණිවුඩය ආවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සතිය මහ මොළකරුගේ සතිය. මේ සතිය යන්නේ එහෙම. මේ සතිය යන්නේ, පාස්කු ප්‍රහාරයේ මහ මොළකරු සම්බන්ධව. ඒක ඉවර වනකොට තව සතියකට නාට්‍ය ජවනිකාවක් එනවා. ඉතින්, මම ආණ්ඩුවට කියන්නේ මේකයි.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
සතියෙන් සතිය.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

සතියෙන් සතිය, හරියට හරි. ඇත්ත කියන්නයි බිම ඉඳ ගන්නයි බය වෙන්න ඕනෑ නැහැ කියනවා වාගේ මොනවා වුණත් ගරු ලාල් කාන්ත ඇමතිතුමා ඇත්ත කියනවා. අනිවාර්යයෙන්ම සතියෙන් සතිය මාතෘකා එනවා. සතියෙන් සතිය මාතෘකා හදනවා වෙනුවට ඔබ විසින් රටේ ජනතාවට දීපු පොරොන්දු ටික ඉටු කරන්න. ඔබ විසින් රටේ ජනතාව බලාපොරොත්තු වුණු දේ ඉටු කරන්න. ජනතාව බලාපොරොත්තු වුණු දේ ඉටු කළොත් ඔබ සමත් වෙයි. ඔබට එය ඉටු කරන්න බැරි වුණොත් ප්‍රශ්නයක් වෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා මම අවසාන වශයෙන් මේ දේ කියනවා. මේ, අවුරුද්දක් ඇතුළත ප්‍රගතිය. දවස ගණනේ වෙන්නේ ජනතා ප්‍රශ්න වැඩි වීමයි. එම නිසා ආණ්ඩුව හැටියට නිවැරදි මාවතකට යන්න ඔබට පුළුවන්. මම එය කියන්නේ බොහොම නිර්ලෝභීව. නිවැරදි මාවතකට යන්න කියන එක ආණ්ඩුවට මතක් කරමින්, වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Anura Karunathilaka. You have 13 minutes.

[අ.භා. 1.48]

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development,Construction and Housing)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉස්සෙල්ලා මම කැමැතියි, සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ ගරු මන්ත්‍රීතුමාට ආණ්ඩු පක්ෂය හැටියට අපේ විශේෂ ස්තුතිය පිරිනමන්න. ඒ, ඇයි? එතුමාගේ යෝජනාවේ මෙසේ කියනවා:

> "…. එබැවින්, පුනරුද ආණ්ඩුව ජනතාවට 'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' නමින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාවට නංවන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි."

ඒ ගරු මන්ත්‍රීතුමාම දන්නවා, ජාතික ජන බලවේගය විසින් ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැඹුරින් හදාරා, ප්‍රතිපත්ති සහ මූලධර්ම මත පදනම් වෙලා පිහිටුවපු ප්‍රතිපත්ති ප්‍රකාශනයක් බව. එතුමා එය පිළිගන්නවා විතරක් නොවෙයි. එතුමා දන්නවා, එතුමා නියෝජනය කරන දේශපාලන පක්ෂය - අපි කියමු, ඒකාබද්ධ විපක්ෂය කියලා - ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හෝ ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන ප්‍රතිපත්ති ප්‍රකාශනයක් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය කිට්ටුවටවත් ළං කරන්න බැහැ කියන එක. එහෙම නැත්නම් කියන්න තිබෙන්නේ, ඔයගොල්ලන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය මෙහෙම එකක්, වැඩක් නැහැ, පැත්තකට දාන්න, මෙන්න අපි ඉදිරිපත් කරනවා මරු එකක්, මේක ක්‍රියාත්මක කරන්න කියන එකයි. හැබැයි, අවාසනාවකට එහෙම දෙයක් ඉදිරිපත් කරන්න එතුමාට ධෛර්යයක් නැති නිසාත්, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිගන්න නිසාත් ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනයම ක්‍රියාත්මක කරන්න කියලා තමයි මේ යෝජනාව ගෙනෙන්නේ. ඒ වාගේම ඒ යෝජනාව ඉදිරිපත් කරමින් එතුමාම බොරු ගොඩාක් කිව්වා. එතුමා පත්තරයක් උපුටා දක්වමින් කථා කළා නේ. ශ්‍රී ලංකාවේ දුප්පත්කම සම්බන්ධයෙන් "දිවයින" පත්තරයේ පළ වූ ලෝක බැංකුවෙන් කරපු ප්‍රකාශයක් තමයි එතුමා උපුටා දැක්වූවේ. ඒ ප්‍රකාශයේ කියනවා, "2024 අවුරුද්දේ දුප්පත්කම වැඩි වෙලා තිබෙනවා" කියලා. ශ්‍යාම් නුවන් ගනේවත්ත තමයි, "දිවයින" පත්තරයට ඒ ලිපිය ලියා තිබෙන්නේ. හැබැයි, යම් කාරණයක් ඔහුට අමතක වුණා හෝ සැබවින්ම අමතක කළා. ඒ ලිපිය අවසානයේ කියා තිබෙනවා, "මේ දරිද්‍රතා අනුපාතය 2024දී පැවැති සියයට 24.9 සිට 2025දී සියයට 22.4 දක්වා අඩු වන බව පුරෝකථනය කොට ඇත" කියලා. මොකක්ද මේ කියන්නේ? දරිද්‍රතාව 2024දී වැඩි වුණා. හැබැයි, 2024දී සියයට 24.9ක්ව පැවති දරිද්‍රතාව ජාතික ජන බලවේගය ආණ්ඩුව යටතේ 2025 අවුරුද්දේදී සියයට 22.4 දක්වා අඩු වෙනවා කියලා ලෝක බැංකුව විසින් දැනටමත් පුරෝකථනය කරලා තිබෙන්නේ කියලා එම ලිපියේම සඳහන් වෙනවා. ඒ නිසා විපක්ෂයේ ගරු මහත්වරුනි, title එක විතරක් කියලා කරුණු ගෙනහැර දක්වන්න එපා. සම්පූර්ණ ලිපිය කියවන්න. තමන්ට වාසිදායක කොටස විතරක් උපුටා දක්වා කරුණු ගෙන හැර දක්වන්න එපා.

කොහොම වුණත් කමක් නැහැ, ඒ අතරේ දැන් සමහර වෙලාවට අපිට හිතෙනවා, ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉතා විශිෂ්ට එකක් කියලා. ඊට දෙගොල්ලන්ම එකඟයි. හැබැයි, ඒ අතරේදී මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් කරුණු මේ අවුරුද්ද තුළ කොයි තරම් ප්‍රමාණයක් ඉටු කළාද, ඒ දේවල් ඉටු කිරීමට ප්‍රවේශයක් අරගෙන තිබෙනවාද කියන එක ගැන අපිට සාකච්ඡාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නැහැ. මොකද, ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කරනකොට අපි දන්නවා, මේකේ මෙච්චර ප්‍රමාණයක් අපිට පළමු පියවරවල දී කරන්න පුළුවන්, ඉතුරු පියවරවල දී අපිට ඉතුරු ටික කරන්න පුළුවන් කියලා. ඒ බව දැනගෙන තමයි අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කළේ. හැබැයි, අපි එක කාරණයක් මතක් කරන්න කැමතියි. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට පටහැනි දෙයක් ජාතික ජන බලවේගය විසින් මේ අවුරුද්ද තුළ කළා කියලා කාට හෝ පෙන්වන්න පුළුවන් නම් අන්න ඒක තමයි වැදගත් වෙන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට එහෙම පෙන්වන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, මේ ප්‍රකාශනය තුළ තිබෙන සමහර දේවල් තවමත් සම්පූර්ණ වුණේ නැහැ කියලා නම් කියන්න පුළුවන්.

මම තවත් කාරණයක් කියන්න කැමතියි. සාමාන්‍යයෙන් ක්‍රිකට් මැච් ගහනකොට "සත්කාරක රටවල්" කියලා සමහර රටවල් ඉන්නවා. ඒගොල්ලන් අනෙක් කණ්ඩායමට දෙන්නම් බැටේ කියලා හිතාගෙන pitch එක හදනවා. හැබැයි, අන්තිමට මොකද වෙන්නේ? මැච් එක අවසන් වෙනකොට අනුන් දාන්න හදපු වළේ තමන් වැටිලා ප්‍රතිවිරුද්ධ කණ්ඩායම හිටපු නැති විධියට bat කරනවා. අද දවස අවසාන වනවිටත් මේ විපක්ෂය විසින් ගෙනා යෝජනාව සම්බන්ධයෙන් ඒ වාගේ දෙයක් වෙනවා කියන එක තමයි අපිට පෙනෙන්න තිබෙන්නේ.

දැන් අපි මේ ජාතික ජන බලවේගය ඉදිරිපත් කරපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කරුණු කිහිපයක් ගැන අවධානය යොමු කරමු. මේ ඉදිරිපත් කළ යෝජනාවේ ප්‍රධාන කාරණාවක් තිබෙනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් ඒගොල්ලන් හිතාගෙන කියනවා, අපි මේක අහෝසි කරනවා කියලා. එවැනි යෝජනාවක් තිබෙනවා. නමුත්, එහෙම කළේ නැහැ කියලා කියනවා. මේ මහත්තුරුන්ට මම ආරාධනා කරනවා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 105හි සඳහන් "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩසටහන" කියන කොටස කියවන්න කියලා. ඒකේ තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් සඳහන් වෙන්නේ. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 105හි "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩසටහන" යටතේ මෙසේ සඳහන් වනවා:

[ගරු අනුර කරුණාතිලක මහතා]

"දුප්පත් හා අසරණභාවයට පත් කොට ඇති ජනතාව එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා වඩාත් ශක්තිමත් හා නිවැරදි වැඩපිළිවෙළක අඩංගුව සහ එය ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ නැවත සාකච්ඡා කිරීම"

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ක්‍රියාත්මක කරන ලද, යෝජනා කරමින් සිටි දේවල් සම්බන්ධයෙන් එවකට පැවති ආණ්ඩුව විසින් කරන ලද සමහර කරුණු නිසා ජනතාව පීඩාවට ලක් වෙනවා කියලා අපි දැනගෙන හිටියා. ඒ නිසා අපි ඒ ගැන කල්පනා කරලා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළට ඇතුළත් කළා, ඒ අය සම්බන්ධයෙන් නැවත සොයා බලා විශේෂයෙන් පීඩාවට පත් වෙලා ඉන්න දුප්පත් හා අසරණ ජනතාවට සහන සැලසීම සඳහා කටයුතු කරනවාය කියලා. අපි මේ කාලය තුළ සහන ලබා දිය යුතු කණ්ඩායම් ඉලක්ක කරමින් විවිධ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න පියවර ගත්තා. මෙහිදී මම කරුණු කිහිපයක් විශේෂයෙන් මතක් කරන්න කැමතියි, දුප්පත් මිනිස්සු ඉලක්ක කරගෙන අපි මොනවාද කරලා තිබෙන්නේ කියලා. අපි දන්නවා, අස්වැසුම ප්‍රතිලාභ වැඩි කරපු විධිය. ඒ විතරක් නොවෙයි. ප්‍රධාන වශයෙන් highlight වෙන කරුණුවලට අමතරව සිසුන් සඳහා වාර ප්‍රවේශ පත්‍ර ලබා දීමට 2024දී රුපියල් බිලියන 10.5ක් වෙන් කළා. 2025 වසරේදී අපි ඒ මුදල රුපියල් බිලියන 11.5 දක්වා වැඩි කරන්න කටයුතු කළා.

ඒ වාගේම දුප්පත් දරුවන්ට සහනයක් ලෙස පාසල් උපකරණ ලබා දෙන්න රුපියල් 6,000ක් ලබා දුන්නා. ඒ සඳහා 2024දී රුපියල් බිලියන 6.6ක් වෙන් කළා. 2025 වසරේදී ඒ සඳහා තවත් රුපියල් බිලියන 2.8ක් වෙන් කරන්න කටයුතු කළා. ඒ විතරක් නොවෙයි. දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවන්න මහපොළ ශිෂ්‍යාධාර වැඩි කළා. ඒ අනුව රුපියල් 5,000 සිට රුපියල් 7,500 දක්වා සහ රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා ශිෂ්‍යාධාර වැඩි කළා. ඒ වාගේම සුරක්ෂා රක්ෂණ ක්‍රමය යටතේ 2024දී ලබා දුන් රුපියල් බිලියන 2ක මුදල, 2025දී රුපියල් බිලියන 2.5 දක්වා වැඩි කරන්නත් අපි කටයුතු කළා. එහෙම කළේ දරුවන් වෙනුවෙන්.

සමාජ සුබසාධනයේදී අස්වැසුම ප්‍රතිලාභ වැඩි කළා. 2024දී සමස්ත සුබසාධනය සඳහා දරන ලද සැබෑ වියදම වන රුපියල් බිලියන 945.7 අපි රුපියල් බිලියන 1,104 දක්වා වැඩි කරන්න කටයුතු කළා. අන්න ඒ වාගේ කරුණු ගණනාවක් මට ගෙනහැර දක්වන්න පුළුවන්. විශේෂයෙන් ආර්ථික අර්බුදය ක්‍රියාත්මක වීමත් එක්ක ඒ ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් හැටියට ආර්ථිකය හකුළුවමින් ගෙන ගිය සමහර ආර්ථික ප්‍රතිසංස්කරණවලින් අසරණභාවයට පත් වෙච්ච දුප්පත් ජනතාව ඉලක්ක කරමින් ජාතික ජන බලවේගය ආණ්ඩුව තමන්ගේ පළමුවැනි අවුරුද්ද තුළ කටයුතු කළේ කොහොමද කියන එක ඉන් එක කරුණක්.

ඒ විතරක් නොවෙයි. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 105හි සඳහන් "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ වැඩසටහන" යටතේ දෙවැනියට කියනවා, "බදු පරිපාලනය හා ආණ්ඩුවේ කළමනාකරණය පිළිබඳ නව යෝජනා ඉදිරිපත් කිරීම" කියන එක. එහෙනම් දැන් බලන්න ඕනෑ, ආණ්ඩුව විසින් ගත්ත මෙන්න මේ ක්‍රියාමාර්ග එක්ක ආණ්ඩුවේ බදු ආදායම වැඩි වෙලා තිබෙනවාද, ඒ වාගේම මූල්‍ය විනය පවත්වාගෙන යෑම නිසා ආණ්ඩුවේ ආදායම සහ වියදම අතර තිබෙන පරතරය අඩු කරන්න කටයුතු සිදු වෙලා තිබෙනවාද කියලා. ඒක නිකම් කියනවාට වඩා හොඳයි, සංඛ්‍යාලේඛන ඇතුව බලන එක.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2025 වසරේදී රැස් කළ ආදායම රුපියල් බිලියන 1,426 දක්වා සියයට 16කින් වැඩි වී ඇති අතර, එය ඇස්තමේන්තුවෙන් සියයට 65ක් වෙනවා. ඒ, දැනට මේ කාලය තුළ වැඩි වී ඇති ප්‍රමාණය. ඒ වාගේම රේගු ආදායම වාගේම මෝටර් රථ ආනයනය හේතුවෙන් රුපියල් බිලියන 1,456 දක්වා සියයට 51කින් වැඩි වී ඇති අතර, එය ඇස්තමේන්තුවෙන් සියයට 69ක්. ඒ විතරක් නොවෙයි. රාජ්‍ය ආදායම් ලබන ප්‍රධාන ආයතනයක් වන සුරාබදු දෙපාර්තමේන්තුව රැස් කරන ලද ආදායම රුපියල් බිලියන 147යි. මේ අනුව බැලුවාම පෙනෙනවා, එක පැත්තකින් අපි මූල්‍ය විනය පවත්වාගෙන යෑම සඳහා කටයුතු කර තිබෙන බව. ඒ වාගේම මූල්‍ය විනය පවත්වා ගෙන යෑමෙන් රටට ලැබිලා තිබෙන ප්‍රතිලාභය මහජනතාවට ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා.

ඊළඟට අපට තිබුණු ප්‍රධාන අභියෝගයක් තමයි, ආර්ථික ස්ථාවරත්වය පවත්වාගෙන යන්නේ කොහොමද කියන එක. ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගෙන යන්න නම්, විදේශ විනිමයෙන් එන ප්‍රභවයන් වර්ධනය කිරීම ප්‍රධාන වශයෙන් වැදගත් වෙනවා. අපි ආයෝජන අවස්ථා, අපනයන ආදායම, විදේශීය ප්‍රේෂණ, සංචාරක ව්‍යාපාර යන ක්ෂේත්‍රවලින් සැලකිය යුතු වර්ධනයක් අත්පත් කරගන්න කටයුතු කර තිබෙනවා. මට සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, කාලය සීමාවෙච්ච නිසා මම එතැනට යන්නේ නැහැ. මේ සියලු ක්ෂේත්‍ර ගත්තාම, සැලකිය යුතු වර්ධනයක් අත්පත් කරගන්න අපි කටයුතු කර තිබෙනවා. හැබැයි මම ඒකෙන් අදහස් කරන්නේ නැහැ, දැන් ලංකාව සුරපුරයක් වෙලා තිබෙනවා, කේතුමතී රාජ්‍යය පහළ වෙලා තිබෙනවා කියලා. අපි එහෙම කියන්නේ නැහැ. අපි ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගෙන ගිහින් තිබෙනවා. ආර්ථික අර්බුදයක් ඇතිවීම වළක්වා තිබෙනවා. අපි දන්නවා, ආර්ථික අර්බුදයක් ඇති වුණොත්, ඒක දේශපාලන අර්බුදයක් දක්වා දික්ගැස්සෙන්න පුළුවන් කියලා. හැබැයි, ඒ වාගේ ආර්ථික අර්බුදයක් පැන නැඟිලා, එය දේශපාලන අර්බුදයක් බවට පත් වෙලා රට අස්ථාවරභාවයට පත් වෙන එක වළක්වන්න අපි කටයුතු කරලා තිබෙනවා. එහෙම අවදානමක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අතරේදී එක් එක් පුද්ගලයන්ට තිබෙන සමහර ප්‍රශ්න ගත්තොත්, අපි දන්නවා, ඒවා සම්පූර්ණයෙන්ම විසඳිලා නැහැ කියලා. අපි මේ අවුරුද්ද තුළ රැකියා නියුක්තිය සියයට 2කින් වැඩි කළා. හැබැයි අපි දන්නවා, රැකියා අහිමි තරුණයන් තවමත් ඉන්නා බව. අපි රාජ්‍ය සේවකයට 70,000කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගත්තා. මම නියෝජනය කරපු විශ්වවිද්‍යාලය ගත්තොත්, 3,000කට ආසන්න ප්‍රමාණයක් බඳවා ගන්න අපි අනුමැතිය දුන්නා. හැබැයි, තවත් පිරිස් විශ්වවිද්‍යාලයට බඳවා ගත යුතුයි. ඒ වාගේම රැකියා නැති අය ඉන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවුරුද්ද තුළ මගේ අමාත්‍යාංශය විසින් ආධාර මත විතරක් ගෙවල් 3,846ක් හැදුවා. ඉන්දියානු ආධාර යටතේ, නාගරික පුනර්ජනනීය වැඩසටහන යටතේ මේ අවුරුද්ද තුළ ගෙවල් 1,600ක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මේ අවුරුදු තුන ඇතුළත නාගරික ජනතාව වෙනුවෙන් ගෙවල් 5,000ක් හදන්න අපි බලාපොරොත්තු වෙනවා. හැබැයි මෙහෙම කරලා රටේ නිවාස ප්‍රශ්නය සියයට 100ක් විසඳුවාද කියලා කවුරු හරි අපෙන් ඇහුවොත්, උත්තරය "නැහැ" කියන එකයි. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ජනතාවගේ නිවාස ප්‍රශ්නය විසඳන්න අපි ප්‍රවේශය අරගෙන තිබෙනවා. මිනිස්සුන්ට සෞඛ්‍යාරක්ෂිත, පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා අපි ප්‍රවේශය අරගෙන තිබෙනවා.

තව එක කරුණක් කියා මගේ කථාව නතර කරන්නම්. සමහර වෙලාවට ඒ පරණ ආර්ථික ක්‍රියාවලියේ, ආර්ථික අර්බුදයේ පව් කර ගහගෙන තමයි අපට ඉස්සරහට යන්න වෙලා තිබෙන්නේ.

අපි ව්‍යාපෘතියක් පටන් ගන්න යනකොට, නතර කර තිබෙන ව්‍යාපෘතියක් ආරම්භ කරන්න සැලසුම් සකස් කරනකොට අපට පළමුවෙන්ම පේන්නේ මොකක්ද? පරණ පවෙන් ඇති වෙලා තිබෙන මිල වැඩි වීම. සමහර වෙලාවට වැඩ කරලා තිබෙනවා, හැබැයි, කොන්ත්‍රාත්කරුවාට බිල ගෙවලා නැහැ. මම එක උදාහරණයක් විතරක් කියලා ඒ කථාව නතර කරන්නම්. අපි තීරණයක් ගත්තා මහනුවර උතුර - පාතදුම්බර ජල ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්න. මේක කාලයක් තිස්සේ නතර වෙච්ච ව්‍යාපෘතියක්. නමුත්, මේක පටන් ගන්න යනකොට අපට පෙනුණු දේ තමයි, කරපු වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවාට බිලියන 11.5ක් ගෙවන්න සිද්ධ වෙන එක. ඒ වාගේම ඉතිරි වැඩ ටික කරන්න අවශ්‍ය වෙනවා, බිලියන 3ක්. බිලියන 14.5ක් වාගේ ප්‍රමාණයක් අපි වෙන් කළා. එතැනින් වැඩි ප්‍රමාණයක් ගියේ කරපු වැඩවලට හිඟ වෙච්ච බිල ගෙවන්න. ඒ වාගේම ඩොලරයේ මිල උච්චාවචනය වීම ආදී විවිධ කරුණු නිසා අපට මෙන්න මේ මුදල වෙන් කරන්න වුණා. අර පරණ, කාලයක් තිස්සේ පැවැති ආර්ථික අර්බුදය විසින් ගොඩ නැඟිච්ච පවත් කර ගහගෙන තමයි අපට මේ කන්ද නඟින්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට යෝජනා ගේන්න පුළුවන්. ඒක හොඳයි. මම ස්තුතිවන්ත වෙනවා, මේ වාගේ අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන්. විපක්ෂයට ඉවසීමක් නැති වුණාට මේ රටේ ජනතාව හොඳින්ම තේරුම් ගෙන තිබෙනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව අවුරුද්දක් තුළ මෙන්න මේ ගත්ත ක්‍රියාමාර්ග තුළින් ආර්ථික අර්බුදය සමනය කරලා, ඒ ආර්ථික අර්බුදයත් එක්ක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගනිමින් ඒවායේ ප්‍රතිලාභ මිනිස්සුන්ට ලබා දීම සඳහා පියවර අනුගමනය කරමින් ඉන්නවා කියලා. එක මන්ත්‍රීතුමෙක් කිව්වා, ගමේ ඇවිදිනවා, ඒ අයට ප්‍රශ්නය දැනෙනවා කියලා. අපිත් ගම්වල වැඩ කරනවා. ගමේ පාරවල් ටික, වැව් අමුණු ටික, බෝක්කු පාලම් ටික හැදෙන විධිය ගමේ මිනිස්සු ඇස් දෙකෙන් දකිනවා. ඒ නිසා ගමේ මිනිස්සු අපට කියනවා, "අඩුම ගානේ තව අවුරුදු 10ක්, 15ක් මෙහෙම අල්ලා ගෙන යමු, සහෝදරයා" කියලා.

ඒ නිසා ජාතික ජන බලවේගය හැටියට අපිට සන්තෝෂයි අපි කරපු දේ ගැන. අපිට මීට වඩා යමක් කරන්න ඕනෑ. හැබැයි, ඒකට අපිට අවස්ථාව තිබෙනවා. ජනතාව වෙනුවෙන් "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" අත්පත් කර දීම සඳහා අපි දීපු පොරොන්දු ඉටු කරමින්, අපි අපේ ගමන යනවා කියන පොරොන්දුව දෙමින් මම නිහඬ වෙනවා.

බෙහෙවින්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Sajith Premadasa. You have nine minutes.

[අ.භා. 2.04]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපිට පෙන්වා දෙන්න කිව්වා, අඩුම ගණනේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ක්‍රියාත්මක නොකරපු එක දෙයක්. මම මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 105 පෙන්වා දෙන්න කැමැතියි. එහි පොරොන්දු වෙලා තිබෙනවා, අලුත් Debt Sustainability Analysis - DSA- එකක් යටතේ, අලුත් කොන්දේසි සහිත IMF ගිවිසුමක්. ඒක ක්‍රියාත්මක කළේ නැහැ. පසුගිය රජය ක්‍රියාත්මක කරපු Debt Sustainability Analysis එක යටතේ තමයි, අද මේ රජයත් ඉදිරියට යන්නේ. ඔන්න, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ක්‍රියාත්මක නොකරපු එක දෙයක්. අපිට අභියෝග කළේ අඩුම ගණනේ එක දෙයක් පෙන්වා දෙන්න කියලා. තව බොහෝ දේවල් තිබෙනවා.

මම කැමැතියි, දෙවැනි කාරණය හැටියට වර්තමාන ජනාධිපතිවරයා පුන පුනාම වේදිකාවේ කියපු කථාව නැවත වරක් ඉදිරිපත් කරන්න. විදුලි බිල සියයට 33කින් අඩු කරනවා කිව්වා. රුපියල් 9,000ක විදුලි බිල රුපියල් 6,000ක් කරනවා කිව්වා, රුපියල් 3,000ක විදුලි බිල රුපියල් 2,000ක් කරනවා කිව්වා, සියයට 33කින් විදුලි බිල අඩු කරලා සහන ලබා දෙනවා කිව්වා. එක්වරක් සියයට 15කින් විදුලි බිල වැඩි කරලා, හෙට අනිද්දාම සියයට 6.8කින් විදුලි බිල වැඩි කරන්න හදනවා. ඒ සියල්ලක්ම ක්‍රියාත්මක කරන්නේ නිසි පිරිවැය ගණනය කිරීමකින් තොරවයි. ඒ, ඉන්ධන සැපයුම් පිළිබඳව විනිවිදභාවයකින් යුක්ත වූ ගිවිසුම්වලින් තොරවයි. මම අහන්න කැමැතියි, මෙච්චර ජන වරමක් අරගෙන, මන්ත්‍රීවරුන් 159දෙනෙක් පාර්ලිමේන්තුවට පත් කර ගත්තේ IMF එක කියන කියන පදයට නටන්නද කියලා. අද මේ රජය IMF එකේ රූකඩයක් බවට පත් වෙලා. රටේ ජනතාව මේ රජය විශ්වාස කරලා විශාල ජන වරමක් ලබා දුන්නා. ඒ ජන වරම ලබා දුන්නේ IMF එක කියන කියන විධියට රඟපාන්න නොවෙයි. ජන වරම ලබා දුන්නේ IMF රාමුව තුළ වෙනසක් ඇති කර ගන්න.

2028 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 5ක -මිලියන 5,000ක - ණය ගෙවීම ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙනවා. ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව අපේ රටේ ආයෝජන පරිසරය පිළිබඳව කියන්නේ මොකක්ද? "2025 Investment Climate Statements: Sri Lanka"හි අඩු පාඩුකම් රැසක් පෙන්වා දෙනවා. මිශ්‍ර සංඥා ලැබෙනවා ලු, ප්‍රතිපත්ති ආපසු හැරවෙනවා ලු, ආයතනික සහ නිලධාරිවාදී අසාර්ථකත්වයන් තිබෙනවා ලු, නියාමන කටයුතු පිළිබඳ කල් තබා අනාවැකි පළ කිරීමේ නොහැකියාව තිබෙනවා ලු, විනිවිදභාවය සහ පාලනය පිළිබඳ ගැටලු තිබෙනවා ලු, ව්‍යුහාත්මක බාධක තිබෙනවා ලු, රාජ්‍ය ආයතනවලට අදාළ බර ලොකු ගැටලුවක් ලු. විශේෂයෙන්ම ආයෝජන හිතකර පරිසරයක් නිර්මාණ වීම සඳහා ගැටලු රැසක් තිබෙනවා කියන එක අපිට කියන්නේ, ඇමෙරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන්. අපේ රටේ ඇඟලුම් අපනයන ප්‍රමාණය ප්‍රතිශතාත්මකව බැලුවොත්, විශාලතම ගමනාන්තයක් වන ඇමෙරිකා එක්සත් ජනපදය අපට කියනවා, අපේ රටේ ආයෝජන සඳහා හිතකර පරිසරයක් නැහැයි කියන කාරණය.

ඊළඟට, ලෝක බැංකුව මොකක්ද කියන්නේ? ලෝක බැංකුව කියනවා, අපේ රටේ දරිද්‍රතාව ඉතාම ඉහළ මට්ටමක තිබෙනවා ලු. දරිද්‍රතා කම්පන සමාජයේ නිර්මාණය වෙලා තිබෙනවා ලු. සැබෑ වැටුප් සහ ශ්‍රම බලකා සහභාගිත්වය, 2019ත් එක්ක සංසන්දනය කරන කොට තිබෙන්නේ පහළ මට්ටමක ලු. ගෘහයක භාණ්ඩ හා සේවා මිල දී ගැනීමේ හැකියාව අර්බුදකාරී තත්ත්වයක තිබෙනවා ලු. ශ්‍රම වෙළෙඳ පොළ යථා තත්ත්වයට පත්වීමේ මන්දගාමීත්වයක් තිබෙනවා ලු. රැකියා උත්පාදනය දුර්වල මට්ටමක තිබෙනවා ලු. පෝෂණ ඌනතාව ඉහළ මට්ටමක තිබෙනවා ලු. ආහාර මිල ගණන් නොකඩවාම ඉහළ මට්ටමක පවතිනවා ලු. ධනවත් පවුල්වලට වඩා දුප්පත් අය තුන් ගුණයක් වැඩියෙන් ආහාර සඳහා වියදම් කරනවා ලු. සෞඛ්‍ය සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ උද්ධමනය වැඩි වෙලා තිබෙනවා ලු. ඒ වාගේම දරිද්‍රතා රේඛාව තුළ වාගේම අපේ රටේ තවත් විශාල පිරිසක් දරිද්‍රතා රේඛාව ආසන්නවත් සිටිනවා ලු. Centre for Poverty Analysis කියනවා, අපේ රටේ සියයට 50කට ආසන්න

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රමාණයක් දූප්පත්කමෙන් පෙළෙනවා කියලා. මෙන්න මේ වාගේ තත්ත්වයක් තුළ අපි හිතලා බලන්නට ඕනෑ, අපට සතුටු විය හැකි සෘජු විදේශ ආයෝජන අපේ රටට ලැබෙනවාද කියලා; අපේ රටේ අලුත් ව්‍යවසායකයන් බිහි වෙනවාද කියලා; විරැකියා පෝලිම අඩු වෙනවාද කියලා; ජනතාවගේ අතේ තිබෙන මුදල් ප්‍රමාණය වැඩි වෙනවාද කියලා; දූප්පත්කම තුරන් කිරීමේ නිසි වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා; අපනයන ප්‍රවර්ධනය ගැන අපට සතුටු වෙන්න පුළුවන්ද කියලා. මේ කරුණු කාරණා දිහා බැලුවාම ඉතාම පැහැදිලියි, මේ යන ආකාරයටම නම් යන්නේ, 2028දී ඇමෙරිකානු ඩොලර් මිලියන 5,000ක් -බිලියන 5ක්- ගෙවීමේ තත්ත්වය වාර්ෂිකව ක්‍රියාත්මක වෙනකොට අපට අභියෝග ගණනාවකට -අභියෝග රැසකට- මුහුණ දෙන්න සිදු වන බව.

විශේෂයෙන්ම අද දවසේ කරුණු කාරණා ඉදිරිපත් වුණා, ජිනීවා යෝජනාව පිළිබඳව. ජිනීවා යෝජනාව සම්බන්ධයෙන් කෙරුණු වාද විවාද, සාකච්ඡාවලදී අපට අහන්නට ලැබුණා, රටවල් 47කින් 43ක්ම අපේ රට පිළිබඳව, රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව බොහොම සුබවාදීව කථා කළා කියලා. ඉතින් අපට අහන්න තිබෙන්නේ, රටවල් 47න් 43ක් සුබවාදීව කථා කළා නම්, ජිනීවාවල ඉදිරිපත් කළ යෝජනාවට අප රටක් හැටියට විරුද්ධ වුණා නම්, ඇයි අපේ රට ගැන සුබවාදීව කථා කළ රටවල් 43 අපට පක්ෂපාතී ඡන්ද බවට පරිවර්තනය කර ගන්නට බැරි වුණේ? මොකද, මේ සභාවේදීම කිව්වා, රටවල් 47න් 43ක් අපේ රට ගැන, අපේ මාතෘ භූමිය ගැන -ශ්‍රී ලංකාව ගැන- හොඳට කථා කළා කියලා. හැබැයි, යෝජනාව පිළිබඳව ඡන්දයකට යන්න ක්‍රියා කළේ නැහැ. යෝජනාවට විරුද්ධයි කියලා ප්‍රකාශ කළා. ඇයි, අපේ රටට පක්ෂපාතීව කථා කළ රටවල් 43 ශ්‍රී ලංකාවට පක්ෂපාතී ඡන්ද 43ක් බවට පත් කර ගන්නට අපට බැරි වුණේ? මා ළඟ තිබෙනවා, ඒ රටවල් 47ක නම් ලැයිස්තුව. මම එය කියවන්නම්: Algeria, Benin, Burundi, Cote d'Ivoire, Democratic Republic of the Congo, Ethiopia, Gambia, Ghana, Kenya, Malawi, Morocco, South Africa, Sudan, Bangladesh, China, Indonesia, Japan, Kuwait, the Maldives, Marshall Islands, Qatar, Republic of Korea, Thailand, Vietnam, Kyrgyzstan, Albania, Bulgaria, Cyprus, Czechia, Georgia, North Macedonia, Bolivia, Brazil, Chile, Colombia, Costa Rica, Cuba, Dominican Republic, Mexico, Belgium, France, Germany, Iceland, Netherlands, Spain and Switzerland. ඒ රටවල් 47න් 43ක් අපට පක්ෂපාතීව කථා කළා නම් ඇයි ඒ රටවල් 43 අපට පක්ෂපාතී ඡන්ද බවට පත් කර ගන්න බැරි වුණේ? දැන් බලන්න, එතැනින්ම පෙනෙනවා, අපේ රාජ්‍ය තාන්ත්‍රික ප්‍රතිපත්තියේ තිබෙන බරපතළ දුර්වලතාව; බරපතළ දුබලතාව.

මම මේ ගරු සභාවේ අවධානය විශේෂ කාරණයක් කෙරෙහි යොමු කරවන්නට කැමැතියි. 2009 යුද ජයග්‍රහණයෙන් පසුව ශ්‍රී ලංකාවට පුළුවන්කම ලැබුණා, ඉදිරිපත් කළ යෝජනාව ජයග්‍රහණය කරන්න. ශ්‍රී ලංකාවට පක්ෂව ඡන්ද 29යි; විරුද්ධව ඡන්ද 12යි. මොකක්ද ඒ ජයග්‍රහණයට ප්‍රධානතම හේතුව? ඉතාම සාර්ථක, ශක්තිමත් රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම. විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, එවකට අපේ රටේ මානව හිමිකම් ක්ෂේත්‍රය භාරව කටයුතු කළ ආචාර්ය දයාන් ජයතිලක මැතිතුමා පිළිබඳව. ඒ තනි ශක්තිය තුළ අපේ රටට පක්ෂපාතීව ඡන්ද 29ක් ලබාගෙන ඒ යෝජනාව දිනාගන්නට අපට පුළුවන්කම ලැබුණා. එයට විරුද්ධව ඡන්ද 12යි ලැබුණේ. නමුත්, මේ පාර වුණේ මොකක්ද? මේක බරපතළ ප්‍රහේලිකාවක්, පුදුමාකාර දෙයක්. රටවල් 43ක් අපේ රට ගැන හොඳ කථා කළා ලු. හොඳ කථා කළා නම් ඉන් තවත් පියවර කිහිපයක් ඉදිරියට ගිහිල්ලා, 'රටක් හැටියට අපිත් මේ යෝජනාවට විරුද්ධයි' කියලා වාචිකව විතරක් කියන තත්ත්වයට පත් වන්නේ නැතිව ඒ රටවල් 43 අපේ රටට පක්ෂපාතී ඡන්ද බවට පරිවර්තනය කර ගන්න බැරි වුණේ ඇයි? මොකක්ද ඒකට හේතුව? ඒක බරපතළ ප්‍රශ්නයක්. ඒ නිසා අපි අඩුම තරමින් මේ මොහොතේදීවත් මේ අසාර්ථකභාවය පිළිබඳව පාඩම් ටිකක් ඉගෙන ගෙන රටක් හැටියට නිසි පරිදි සූදානම් වෙන්නට ඕනෑ. රට තුළ ජාති භේදය, ආගම් භේදය, වර්ග භේදය, වර්ණ භේදය, කුල ගෝත්‍ර භේදය, පන්ති පක්ෂ භේද ආදිය තුරන් කරලා, සත් ජාතිකත්වය, ශ්‍රී ලාංකිකත්වය, අපේ එකමුතුභාවය, අපේ සහෝදරත්වය අපේ ශක්තිය බවට පත් කරගෙන, පළමුවැනි පන්තියේ, දෙවැනි පන්තියේ, තුන්වැනි පන්තියේ පුරවැසියන් කියන හැඟීම අපේ රටේ විවිධ ජන කොට්ඨාසවල හදවත්වලින් ඉවත් කරලා, we are all together; අපි ඔක්කොම එකට ඉන්නේ, එක මවකගේ, එක පියෙකුගේ දූ දරුවන් හැටියටයි ඉන්නේ කියන හැඟීමෙන් යුතුව, සංහිඳියාව, අවබෝධතාව, සහෝදරත්වය, එකමුතුභාවය අපේ ශක්තිය කරගෙන "රටේ ප්‍රශ්න රට ඇතුළත විසඳමු" යන තේමාව තුළ විනිවිදභාවයෙන් යුක්තව මේ ප්‍රශ්නයට විසඳුම් ලබා ගැනීම අපහසු දෙයක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Leader of the Opposition, you have exhausted the time allotted to you.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අප රට අභ්‍යන්තරය තුළ මේ සංහිඳියා ක්‍රියාදාමය හරියට ක්‍රියාත්මක කළොත්, වාර්ෂිකව ජිනීවා මානව හිමිකම් කවුන්සලයට යන ඒ ප්‍රශ්නය අපේ එකමුතුභාවය මඟින් අනිවාර්යයෙන්ම විසඳා ගන්න අපට පුළුවන්. මම මේ අවස්ථාවේ රජයෙන් ඉල්ලා සිටිනවා, රටවල් 47න් 43ක්ම අපේ රට ගැන හොඳ කථා කළා නම් ඒ හොඳ කථා කරපු රටවල ඡන්ද 43 අපේ රටට පක්ෂපාතී ඡන්ද බවට පරිවර්තනය කර ගන්න පුළුවන්කම නොලැබුණේ ඇයි කියන එකට හේතුව මේ ගරු සභාවටත්, රටටත් ඉදිරිපත් කරන්න කියලා. ඒ වාගේම නැවත වරක් මතක් කරනවා, 2009දී ඉදිරිපත් කළ යෝජනාව ජයග්‍රහණය කළේ උසස් රාජ්‍ය තාන්ත්‍රික සේවාවක් ආචාර්ය දයාන් ජයතිලක මැතිතුමාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක වුණු නිසායි කියන කාරණය. අඩුම තරමින් එතුමාගෙන් හරි පාඩමක් ඉගෙනගෙන අපි රටක් හැටියට ඉදිරියට යමු.

ස්තුතියි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

Hon. Deputy Speaker, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. (Dr.) Kavinda Heshan Jayawardhana?

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

Sir, the "Daily Mirror"states, "...Secretary to the Ministry of Public Security Ravi Seneviratna has revealed that the main conspirator behind the Easter Sunday bomb..."- *[Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

That has already been brought to the notice of this House, Hon. Member.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

Hon. Deputy Speaker, as a Catholic Parliamentarian, I have been raising this issue; කතෝලික පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියටයි මා මේ ප්‍රශ්නය මතු කරන්නේ. රවි සෙනෙවිරත්න මහත්මයා කියනවා පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයේ මහ මොළකරු හඳුනාගෙන තිබෙනවා කියලා. එතකොට අපි දැනගන්න කැමැතියි කවුද ඒ මහ මොළකරු කියන එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුව පාර්ලිමේන්තුවට ඒ ගැන ප්‍රකාශයක් කරන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, the Hon. Dayasiri Jayasekara brought that to the notice of the House. The Hon. Minister of Justice also spoke about it.

Next, the Hon. (Mrs.) Samanmali Gunasingha. You have 12 minutes.

Order please! The Hon. Deputy Chairperson of Committees will now take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.*

[අ.භා. 2.19]

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට හිතෙනවා, මට කලින් කළ කථාවේදී ඒ මන්ත්‍රීතුමාගේ ක්‍රියාවලිය ගැන පැහැදිලි කිරීමක් කළා කියලා. මොකද, එතුමන්ලා පිළිගත්තා ශ්‍රී ලාංකික ජාතියක් විධියට අපේ රටේ සියලු ජාතීන් එක තැනකට ගේන්න, එක ධජයක් යටතට ගේන්න හිටපු දේශපාලනඥයන් අසාර්ථක වුණා, එහෙම නැත්නම් නොහැකි වුණා කියලා. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ වැඩ පිළිවෙළ තුළ අපට ඕනෑ වුණේම, සියලු ජාතිකයන් එක ධජයක් යටතට අරගෙන අපි ශ්‍රී ලාංකිකයන් කියන තැන ඉඳලා, නොබෙදුණු රටක ශ්‍රී ලාංකීය ජාතියක් විධියට සියලුදෙනා එකතු කරගෙන ආර්ථිකය සංවර්ධනය කරන්න සහ ඒ ආර්ථික ප්‍රතිලාභ ජනතාවට බෙදා දීමටයි. ඒ අරමුණ තමයි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ. අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය හැදුවේ 2024 - 2029 කාලයට. එහෙම නැතිව 2025ට පමණක් නොවෙයි. අද අපට මේ විවාදයේදී කරුණු දක්වන්න තිබෙන්නේම අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ජනතාවට දුන්නු පොරොන්දු මොන තරම් ප්‍රමාණයක් ඉෂ්ට කරලා තිබෙනවාද, ඒ සඳහා මුල පුරලා තිබෙනවාද, හොඳ ප්‍රවේශයක් අරගෙන තිබෙනවාද සහ අපට තව කොච්චර ගමනක් යන්න තිබෙනවාද කියන කරුණු කාරණා පිළිබඳවයි.

ඉතිහාසයේ ප්‍රථම වතාවට ප්‍රතිපත්ති ප්‍රකාශනයක් මේ විධියට ප්‍රශ්න කර ගැනීම හොඳයි, අඳුරේ අතපත ගාන්නේ නැතිව. අපි මේ කාලය තුළ ලබා තිබෙන ප්‍රගතිය හා අපේ ආරම්භය පිළිබඳවත් විපක්ෂයට සාකච්ඡා කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2025 මහ බැංකු වාර්තාවලට අනුව අගෝස්තු මාසය තුළ අපේ නිල සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.17යි, සැප්තැම්බර් මාසයේ ඇමෙරිකානු ඩොලර් බිලියන 6.24යි. එය සියයට 1.1ක වර්ධනයක් පෙන්නුම් කරනවා. අපි නිකම් හිටියේත් නැහැ. මේ වර්ධනය ලබා ගන්න අතිවිශාල ආර්ථික සහ සාමාජයීය වැඩසටහන් කිහිපයක් සියලුදෙනා මැදිහත් කරගෙන කරන්න සිද්ධ වුණා. ලාභ නොලබන ආයතන ලාභ ලබන මට්ටමට පත් කරමින්, කඩා වැටිලා විකුණන්න තිබුණු ආයතන පෞද්ගලික අංශයත් එකතු කරගෙන නැවත ශක්තිමත් කරමින් ව්‍යුහාත්මක වෙනසක් කිරීමේ ප්‍රතිඵලයක් විධියට තමයි මේ සංවර්ධනය ගැන අපට කථා කරන්න පුළුවන් වුණේ. අපි මේ සංවර්ධනය ගැන නිකම් නොවෙයි කථා කරන්නේ. අපි මේ නිල සංචිත ප්‍රමාණය ගැන මේ කථා කරන්නේ වාහනත් ගෙන්වලා. අපි වාහන නොගෙනාවා නොවෙයි. කලින් වාහන ගෙන්වන එක නවත්වලා තිබුණා. අපි නැවත වාහන ගෙන්නුවා. වාහනත් ගෙන්වලා තමයි අපි මේ ප්‍රතිශතය ගැන කථා කරන්නේ.

ඒ වාගේම අපට ගෙවන්න තිබුණු සමහර ණය අපි ගෙව්වා. ඒවා ගෙවමින් තමයි මේ ආර්ථික වර්ධනය ගැන කථා කරන්නේ. ඒ වාගේම, නවත්වලා තිබුණු මහා ව්‍යාපෘති රාශියක්ම නැවත ආරම්භ කරමින් තමයි මේ ආර්ථික වර්ධනය ගැන අපි කථා කරන්නේ. එහෙම නම් මෙතැන ලොකු වෙනසක් තිබෙනවා නේද? අපි වාහන ගෙන්නුවා, රජයේ සේවකයෝ බඳවා ගත්තා, නැවතී තිබුණු ව්‍යාපෘති ආරම්භ කළා, පාඩු ලබන ආයතන ලාභ ලබන තත්ත්වයට ගත්තා. මේ ආර්ථික වර්ධනය විපක්ෂයට දැනෙන්නේ නැත්නම් ලාදුරු වෙන්න ඇති. හැබැයි, ඒක ජනතාවට දැනෙනවානේ. ඒකනේ ජනතාව කියන්නේ තව අවුරුදු 4ක්, 5ක් නොවෙයි, අවුරුදු 10ක් දක්වා මේ ආරම්භය - මේ ප්‍රවේශය - හොඳයි කියලා. නිකමට නොවෙයි එහෙම කියන්නේ, මේවා දැනෙන නිසා. තමන්ගේ ගෙදරට වාහනයක් ගත්තාම ඒක දැනෙන්නේ නැද්ද? කඩාගෙන වැටිලා බංකොලොත් වුණු ආයතන ලාභ ලබද්දී ඒක දැනෙන්නේ නැද්ද? ඒවා දැනෙන්නේ නැත්නම් මම හිතන හැටියට ඒක වෙනම අසනීපයක් වෙන්න ඕනෑ.

2025-2026 මහ කන්නයේ පොහොර සහනාධාරය සඳහා මේ රජය නැවතත් රුපියල් බිලියන 5ක අමතර මුදලක් දුන්නා. එතකොට ඒ මුදල් යන්නේ කාටද? අපි ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙන්නේ ගොවීන්ට තවත් රුපියල් බිලියන 5ක් දෙන්න. එතකොට, ඒවා බිම් මට්ටමට නොවෙයිද යන්නේ? ඒක දැනෙන්නේ නැද්ද? ඒ නිසා ඉතාම හොඳ, කාලෝචිත යෝජනාවක් ගෙනැල්ලා ජනතාවට කථා කරන්න සහ ඇස් වහගෙන ඉන්න අයගේ ඇස් ඇරෙන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වන ගමන් මම තව කාරණයක් කියන්න කැමැතියි.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබඳව විවිධ ආයතන සමීක්ෂණ කරලා තිබෙනවා. ඒ සමීක්ෂණ වාර්තාවක් තමයි මම මේ ගෙනහැර දක්වන්නේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ගැන පැෆරල්

[ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය ]

සංවිධානය වාර්තාවක් එළිදක්වා තිබෙනවා. ඔවුන් කියනවා, 2024 -2029 කාලය තුළ ජාතික ජන බලවේග ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හඳුනාගත හැකි මුළු ප්‍රතිපත්ති, නැත්නම් පොරොන්දු 1,333ක් තිබෙනවා කියලා. ඒ අතරින් මුල් මාස 6 තුළ ගනු ලැබූ කැබිනට් තීරණ 216ක් හරහා ඉටු කිරීමට මුල පුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු 239ක් තිබෙනවා කියලා.

මෙම විශ්ලේෂණයට අනුව, රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරලා තිබෙනවා. අපි කැබිනට් තීරණ අරගෙන යම් ප්‍රවේශයක් අරගෙන තිබෙන නිසා මෙය ක්‍රියාත්මක කිරීමේ ප්‍රවණතාවක් තිබෙනවා කියලා ඔවුන්ගේ වාර්තාවේ සඳහන් කරනවා. ඒ වාගේම ජාතික ජන බලවේග රජයේ මුල් මාස 6 තුළ විධායක ජනාධිපතිවරයා හරහා ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 9ක් ඉටු කිරීම සඳහා මුල පුරලා තිබෙනවා කියලා සඳහන් වෙනවා. දැන් සමහර ඒවා ක්‍රියාත්මක කරලා ඉවරයි. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන ඒවායින් මොනවාද ක්‍රියාත්මක කළේ කියලා ඇහුවානේ. ඉතින්, මේක හොඳින් අහගත්තා නම් හොඳයි.

රජයේ මුල් මාස 6 තුළ නීති සම්පාදනයට, එහෙම නැත්නම් සංශෝධනය කිරීම්වලට, විවිධ ක්‍රියාමාර්ගවලට පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග ආරම්භ කරලා තිබෙනවා. එසේ ආරම්භ කළ පාර්ලිමේන්තු ක්‍රියාමාර්ග තුළින් ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු 8ක් ක්‍රියාත්මක කිරීම සඳහා මුල පුරලා තිබෙනවා. ඒ වාගේම රජයේ මුල් මාස 6 තුළ කැබිනට් තීරණ සහ 2025 ජාතික අය වැය හරහා ඉටු කිරීමට මුල පුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු 25ක් තිබෙනවා කියනවා. ඔවුන්ගේ ඒ සාධනීය විග්‍රහය තුළ 2025 ජාතික අය වැය හරහා ඉටු කිරීමට මුල පුරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු 133ක් පිළිබඳව සඳහන් කරනවා. මේවායින් අපට පෙනෙන දෙයක් තිබෙනවා.

ඉන් ඔබ්බට ගිහිල්ලා, ඔවුන්ගේ විධායක තීරණ කියලා ඒ වාර්තාව තුළම ඔවුන් මෙන්න මෙහෙම දැනුම් දෙනවා.

"ප්‍රතිපත්ති ප්‍රකාශන පොරොන්දු සහ ක්‍රියාකාරකම්" යටතේ ඔවුන් පෙන්වනවා, පොහොසත් රටක් - ලස්සන ජීවිතයක් ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබෙන -මට කියන්න පුළුවන් විපක්ෂයට ඕනෑ නම් එහි පිටු අංක 194 පෙරළගන්න කියලා- "විද්‍යාත්මකව වෙන් කරන ලද අමාත්‍යාංශ 25කට ඇමතිවරු 25දෙනෙක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරු පත් කිරීම හා රාජ්‍ය ඇමතිධුර අහෝසි කිරීම" කියන පොරොන්දුව.

මේක අපි දැන් ක්‍රියාත්මක කර ඇත. මේ, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන දේවල්.

"මන්ත්‍රීවරුන්ගේ තීරු බදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවත් කිරීම."

ඒ වෙනුවට වෙනත් ක්‍රමයක් ගේනවා කියලා තිබෙනවා. හැබැයි, තීරු බදු රහිත වාහන බලපත්‍ර ක්‍රමය ඉවත් කරලා තිබෙනවා. ඒ වාගේම, "ජනාධිපති නිල නිවාස 1ක් දක්වා අඩු කිරීම."

ජනාධිපති නිල නිවාස ප්‍රමාණය අඩු කරලා තිබෙනවා. නමුත් ඔවුන් යම් කාරණාවක් සඳහන් කරලා තිබෙනවා, මහනුවර සහ යාපනය යන ස්ථාන දෙකේ ජනාධිපති නිල නිවාස පිළිබඳව සාකච්ඡා මට්ටමේ තිබෙනවා කියලා. ඒක ඔවුන්ගේ නිර්දේශවල තිබෙනවා.

හැබැයි, අපි ඒ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඊළඟ එක තමයි, ‘‘විශ්‍රාමික ජනාධිපතිවරුන්ට හා ඔවුන්ගේ කලත්‍රයන්ට දී ඇති විශ්‍රාම වැටුප්, විශේෂ දීමනා හා වරප්‍රසාද අහෝසි කිරීම’’ කියන එක. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක 194 බලන්න. අපි ඒ සඳහා අවශ්‍ය පනත සම්මත කරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය. ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 226වන පිටුව බලන්න. එහි තිබෙනවා, "දූෂණය සහ මූල්‍ය අපරාධ මැඩලීමේ නීති සහ අනෙකුත් ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම" කියලා. ඒ අනුව, 2025 අංක 5 දරන අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත සම්මත කර තිබෙනවා. ඉතින්, අපි කියපු විධියට පොරොන්දු ඉෂ්ට කරලා තිබෙනවා.

ඊළඟට, "බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීම" කියන එක පිටු අංක 102හි තිබෙනවා. අපි ඒ සඳහා සංශෝධන ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම එම පනත් කෙටුම්පත 2025 අප්‍රේල් 11වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කළා. ඒ වාගේම උපයන විට බද්ද වෘත්තිකයන්ට අසාධාරණයක් නොවන පරිදි සංශෝධනය කිරීම සඳහා අපි සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. පැෆරල් සංවිධානය වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාවේ ඔවුන් පෙන්වා දෙනවා, "ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පොරොන්දු 1,333කින් විශාල ප්‍රවේශයක් අරගෙන තිබෙනවා. ඒ සමහර පොරොන්දු ඉටු කරලා තිබෙනවා. ඒක නිසා ධනාත්මක, හොඳ ප්‍රවේශයක් තිබෙන්නේ" කියලා. පිටු අංකවලින් අපි ඔබට ඒ කිව්වේ. අපි, අපේ රජය විශාල මුල පිරීමක් කරලා තිබෙනවා. සාධනීය ගමනක් ආරම්භ කරලා තිබෙනවා. ඒ වාගේම සමහර පොරොන්දු ඉෂ්ට කරලා තිබෙනවා.

මීට වසර එකහමාරකට පෙර කාලය ගත්තොත්, ඒ කියන්නේ බංකොලොත් ආර්ථිකයක් ගැන කථා කරන කාලයේදී IMF එක ශ්‍රී ලංකාව හැඳින්වූයේ කොහොමද? IMF එක ශ්‍රී ලංකාව පිළිබඳව ඉදිරිපත් කරපු වාර්තාවේ ඔවුන් කියනවා, මේ රට බංකොලොත් වීමට ප්‍රධාන හේතුව වංචාව හා දූෂණයයි කියලා. වංචාව හා දූෂණය ඉහවහා ගිය කාලයක තමන්ගේ හැන්ද තමන්ට තිබෙද්දී විපක්ෂයේ දේශපාලනඥයන් ඒ හැන්දෙන් තමන්ට ඕනෑ විධියට බෙදාගෙන රට බංකොලොත් කළා. එක මන්ත්‍රීවරයෙකු කිව්වා, ඒගොල්ලන්ගේ ආර්ථිකය තුළ ඒගොල්ලන් බලාගෙන හිටියා කියලා ඩොලර් නැවෙන් එනකල්. ඒ අය තමයි අපට දැන් උපදෙස් දෙන්න එන්නේ. ඩොලර් නැවෙන් ආවාට පස්සේ ආර්ථිකය හදන්න තමයි මේ උපදෙස් දෙන්නේ. ඩොලර් නැවෙන් එනකල් බලාගෙන හිටපු, ඒ ආර්ථිකය ගැන කථා කරන අයට අපි කියනවා, දූෂණ, වංචා නිසා තමයි මේ ආර්ථිකය බංකොලොත් වුණේ කියලා තමයි එදා IMF එක කථා කළේ කියන එක. ඒක නිසා ඒ පිළිබඳවත් නැවත සිහි කරන්න.

අද වෙද්දී ලෝක බැංකුව සහ IMF එක කියන්නේ මොකක්ද? ඔවුන් අද කියනවා, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසන්.

**ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சமன்மலீ குணசிங்ஹ)
(The Hon. (Mrs.) Samanmali Gunasingha)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ඔවුන් දැන් ප්‍රකාශ කරනවා, ලොව වේගයෙන්ම යථා තත්ත්වයට පත් වෙන රටවල් අතර ප්‍රමුඛව සිටින රටක් තමයි, ශ්‍රී ලංකාව කියලා. ආර්ථිකය ඉක්මනින් යථා තත්ත්වයට පත් වෙන රටවල් අතරින් ඉස්සරහින් සිටින රටක් තමයි ශ්‍රී ලංකාව කියලා ලෝක බැංකුවේ නවතම වාර්තාවකින් කියනවා. අපි හොඳ

ආරම්භයක් අරගෙන තිබෙනවා. හැබැයි, මේක ඉතාම අමාරු ගමනක්. ඒ අමාරු ගමන එහෙම එන ගමන්, අපි ජනතාවට දුන් පොරොන්දු පුළුවන් තරම් ඉෂ්ට කරනවා. ඒවා හෙටත් ඉෂ්ට කරනවා. ඉතිහාසගත වාර්ෂික වැටුප් වර්ධකයක් දෙමින් තමයි අපි මෙහෙම කළේ. එහෙම නම්, අපි ඒ ගැන ජනතාවට කියන්න ඕනෑ නැහැ. අපි විශ්වාස කරනවා, මේ ආර්ථික වර්ධනය ගලාගෙන යන්නේ ජනතාවට කියලා. එහෙම නැතුව, හොර පාරෙන් තමන්ට බෙදා ගැනීමක් මෙතැන නැහැ. ඒක නිසා ඉතාම සාධනීය ලෙස "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය දෙස බලන්න. ඒ සඳහා අපි ඔබට ආරාධනා කරනවා. ලස්සන රටක් හදා ගැනීම වෙනුවෙන් අපට තිබෙනවා, මාර්ගයක්. ඒ ගමන අපි යනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.34]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජයට අවුරුද්දක් ගත වෙච්ච වෙලාවේ, රජය ජනතාවට දුන් පොරොන්දු ඉෂ්ට කළාද කියලා අපට බලන්න වෙනවා. අපි අහගෙන හිටියා, වසන්ත සමරසිංහ ඇමතිතුමා කථා කරපු වෙලාවේ, රජයේ සේවකයන්ට කොහොමද සැලකුවේ කියලා කියපු ආකාරය. මට මතකයි, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා, මාස හයෙන් හයට රජයේ සේවකයන්ගේ වැටුප් සංශෝධනය කරනවා කියලා. පසුගිය සංශෝධනයේදී අපි දැක්කා, රජයේ සේවයේ අඩුම වැටුප ලබන පුද්ගලයාට රනිල් වික්‍රමසිංහ මැතිතුමා දුන් රුපියල් 5,000ත් එක්ක රුපියල් 6,800යි වැඩි වෙලා තිබෙන්නේ කියලා. ඒ කියන්නේ රුපියල් 1,800යි වැඩි වෙලා තිබෙන්නේ. මේකද තමුන්නාන්සේලා රජයේ සේවකයන්ට සලකපු විධිය? ඉහළට යනකොට තව පොඩ්ඩක් වැඩි වෙනවා. මම පැහැදිලිව කියනවා, යහ පාලන ආණ්ඩුව කාලයේ මේ රටේ රජයේ සේවකයෙකුගේ අවම වැටුප් වැඩි කිරීම සියයට 107ක් බව. රුපියල් 14,000ක් ලෙස තිබුණු මූලික වැටුප අපි රුපියල් 30,000ක් කළා. නමුත් තමුන්නාන්සේලා වැටුප වැඩිකර තිබෙන්නේ එක්දහස් ගණනකින් විතරයි. ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා රජයේ සේවකයින්ට ලොකු ඇන්දිල්ලක් කළේ, මූලික වැටුපට ඔක්කෝම එක්කාසු කළා කියලා. මූලික වැටුපට ඔක්කෝම එක්කාසු කළාය කිව්වාට, කවදාද ඒක ලැබෙන්නේ? ඒක ලැබෙන්නේ pension ගියාට පසුව. සාමාන්‍යයෙන් අවුරුද්දකට විශ්‍රාම - pension - යන්නේ 25,000ක් පමණ පිරිසක්. එහෙම නම් තමුන්නාන්සේලාගේ වැටුප් වැඩි කිරීමේ ප්‍රතිලාභය එක් වසරකදී ලැබෙන්නේ ලක්ෂ 14ක් පමණ වන රජයේ සේවකයන්ගෙන් 25,000කට පමණයි. අවුරුදු 5 ඉවර වෙනකොට අපට තමයි මේවා ගෙවන්න වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වසන්ත සමරසිංහ ඇමතිතුමා කිව්වා, යහ පාලන ආණ්ඩුවෙන් විශ්‍රාම වැටුප නැවැත්තුවා කියලා. එහෙම නැවැත්තුවේ නැහැ. අපි විශ්‍රාම වැටුප් ලබන අයට සියයට 43කින් විශ්‍රාම වැටුප වැඩි කළා. තමුන්නාන්සේලා ඒ හැමෝටම දීලා තිබෙන්නේ රුපියල් 3,500ක විශ්‍රාම වැටුප් දීමනාවක් විතරයි. තමුන්නාන්සේලා පොරොන්දු වුණා, 2016 ඉඳලා 2020 වෙනකම් විශ්‍රාම වැටුප් ගැළපීම බලයට ආපු ගමන් දෙනවා කියලා. නමුත් ඒක තමුන්නාන්සේලා දුන්නේ නැහැ.

අනෙක් කාරණය තමයි ජාතික ආරක්ෂාව. අද ජාතික ආරක්ෂාව සම්බන්ධව, පොලිස් සේවයේ තිබෙන ස්වාධීනත්වය පිළිබඳව ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මොකක්ද ප්‍රශ්නය? මට මතකයි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

මීට මාසයකට ඉස්සෙල්ලාත් පොලිස් කොමිසමට තර්ජනය කළා; පොලිස් කොමිසමේ ක්‍රියාකාරකම් විවේචනය කළා. අපිට ආරංචියි, ආණ්ඩුව තීන්දුවක් ගන්න යනවා කියලා පොලිස් කොමිසමේ බලතල - ස්ථාන මාරුවීම්, උසස්වීම් සිදු කරන්න - පොලිස්පතිවරයාට දෙන්න යනවා කියලා. මේ රටේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්, විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්වාධීන කොමිෂන් සභා පත් කළේ ඒවායේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්නයි. අපි දන්නවා, අතීතයේ සිටි දේශපාලනඥයන් පොලීසියේ OICගේ පුටුවේ වාඩි වෙලා කථා කළ හැටි. තමුන්නාන්සේලා මේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ජනතාවට පොරොන්දු වුණේ මේ රටේ තිබෙන වැරදි හදනවා කියලායි. මම හිතන විධියට, පොලිස් කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසුව කවදාවත් පොලිස් කොමිසමෙන් අවසරයක් නැතුව, අනුමැතියක් නැතුව උසස්වීම්, මාරුවීම් දීලා නැහැ. තමුන්නාන්සේලා අද ඒකත් වෙනස් කරන්න යනවා.

මේ වෙනකොට සමාජ මාධ්‍ය තුළ සංසරණය වෙනවා, පාස්කු ඉරිදා සිද්ධියට සම්බන්ධ මහ මොළකරු ගැන. මට මතකයි, පසුගිය අප්‍රේල් මාසයේ මුල ජනාධිපතිවරයා කිව්වා, පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ මහ මොළකරු අපි අප්‍රේල් 21වැනි දාට ඉස්සෙල්ලා ප්‍රකාශයට පත් කරනවා කියලා. තමුන්නාන්සේලා කතෝලික ජනතාවගෙන් ඡන්දය ගත්තේ පාස්කු ඉරිදා සිද්ධියට සාධාරණයක් ඉෂ්ට කරනවා කියලායි. දැන් අවුරුද්දක කාලයක් ගත වුණා. මොකක්ද, තමුන්නාන්සේලා ඉෂ්ට කරපු සාධාරණත්වය? ඔය මහ මොළකරු ගැන, ඉන්දියාව ගැන කථා කරද්දී මට මතක් වන තව කාරණයක් තිබෙනවා. මා ළඟ ඊට අදාළ වීඩියෝ පටයත් තිබෙනවා. නලින්ද ජයතිස්ස මැතිතුමා 2021දී කියා තිබෙනවා, ඉන්දියාවෙන් තමයි තොරතුරු එන්නේ, හැබැයි, ඉන්දියානු තානාපති කාර්යාලයවත්, ඉන්දියානු ආණ්ඩුවවත් අපේ ආණ්ඩුවෙන් එක දශමයක හෝ වැඩි ආරක්ෂාවක් ඉල්ලන්නේ නැහැ කියා. ඒ කියන්නේ ඒගොල්ලන්ට ෂුවර්, ඒගොල්ලන්ට ගහන්නේ නැහැ කියලා. "...දවස් 3-4කට ඉස්සෙල්ලා අප්‍රේල් 08වැනි දා..."- මේ, 2021 වර්ෂයේ කියන්නේ. "...ඉන්දියානු විදේශ ලේකම්වරයා ලංකාවට එනවා..." මේ කියා තිබෙන්නේ 2019 වර්ෂයේ ආපු එකක් ගැන. එහි කියනවා, සාරා ඉන්දියාවට පැන ගත් බව. සාරා පැන්නුවා ඉන්දියාවට. මේ ප්‍රහාරයේ ප්‍රබල සාක්ෂිකාරිය සාරා. හරි නම් දැන් සාරා අපට දෙන්න කියලා ආණ්ඩුව ඉල්ලන්න ඕනෑ. දැන් තමුන්නාන්සේලා නේ බලයේ ඉන්නේ. ඇයි, සාරා ඉල්ලන්නේ නැත්තේ? තමුන්නාන්සේලා මේ රටේ කතෝලික ජනතාව රවටා තිබෙනවා.

පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳව සෙවීමේ කටයුතු දැනට සිද්ධ වෙන්නේ නැහැ කියලා අපි කියනවා. එදා යහ පාලන ආණ්ඩුවෙන් 700 ගණනක් අත්අඩංගුවට ගත්තා. තමුන්නාන්සේලා පසුගිය අවුරුද්දක කාලය තිස්සේ මේ සම්බන්ධව පරීක්ෂණ කළා නම් ප්‍රතිඵල තිබෙන්න ඕනෑ. අපි බය නැතුව කියනවා, මෙච්චර ගත්තා කියලා. නමුත් ඒ සම්බන්ධව තමුන්නාන්සේලාගේ තිබෙන සාර්ථකත්වය මොකක්ද? මොකක්ද, එතැනින් ජනතාවට කියන්න

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

පුළුවන් වෙන්නේ? තමුන්නාන්සේලා අද මේ රටේ ජනතාව නොමඟ යවනවා. හර්ෂ ද සිල්වා මැතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. තමුන්නාන්සේලා කිව්වා, ණය ගන්නේ නැහැ කියලා. නමුත් පළමුවැනි මාස 6දී විතරක් තමුන්නාන්සේලා රුපියල් බිලියන 1,150ක් ණය අරගෙන තිබෙනවා. තමුන්නාන්සේලා බලයට ආ සැප්තැම්බර් මාසයට වඩා මේ වසරේ මාර්තු මාසය වෙනකොට ණය බර රුපියල් බිලියන 1,100කින් වැඩිවෙලා තිබෙනවා. තමුන්නාන්සේලා කියනවා, අපේ ආදායම වැඩිවෙලා තිබෙනවා, ආදායම් බදු වැඩිවෙලා තිබෙනවා, රේගු ආදායම වැඩි වෙලා තිබෙනවා, Excise Duty එකෙන් ලැබෙන ගණන වැඩිවෙලා තිබෙනවා කියලා. නමුත් අපට පෙනෙන්නේ නැහැ, ඒ මුදල් ජනතාව අතට ලැබෙන බවක්. තමුන්නාන්සේලා කාර් ගේන්න ඉඩ දුන්නා. නමුත් අද වාහන වෙළෙඳ පොළේ වාහන විකිණෙන්නේ නැහැ. මොකද, ජනතාවට මිලදී ගැනීමේ ශක්තියක් නැහැ. මේකෙන් පෙනෙන්නේ ආණ්ඩුව පොහොසත් වෙලා ජනතාව දුප්පත් වෙන බව තමයි. මේ රටේ අද සංවර්ධනයක් වෙන්නේ නැහැ. මට කියන්න බලන්න, මේ අවුරුද්දට පටන් ගත් එක් විශාල සංවර්ධන යෝජනා ක්‍රමයක් ගැන? පාරවල් හැදෙන්නේ නැහැ, බෝක්කු හැදෙන්නේ නැහැ.

සභාවේ ඉන්නවා, අපේ හිටපු වෘත්තීය සමිති නායකයා වන නියෝජ්‍ය ඇමතිතුමා. ගුරුවරුන් තමයි තමුන්නාන්සේලාට වැඩියෙන්ම උදවු කළේ. සුබෝධිනී කමිටු වාර්තාව අනුව ලැබිය යුතු වැටුපේ ඉතිරි තුනෙන් දෙක ගුරුවරුන්ට දෙනවා කිව්වා. අපි අහනවා, ඒක කවදාද දෙන්නේ කියලා. ඒක පළමුවැනි අවුරුද්දේ දෙනවා කිව්වා. මෙතුමා අපේ මිත්‍රයා නේ. තමුන්නාන්සේලා ලබා දුන් පොරොන්දු සියල්ලක්ම අද කඩලා තිබෙනවා. තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. නමුත් වෙලාව නැහැ. එම නිසා මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා විශ්‍රාම වැටුප් සම්බන්ධව කාරණාවක් මතු කළා. ඒක සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රකාශයක්. 2016.01.01 දින සිට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අදියර පහකින් වැටුප් වැඩි කරනකොට, විශ්‍රාම ගිය අයට 2020.01.01 දින සිට විශ්‍රාම වැටුප හදන්න තීරණය කළ බවත්, ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව ඒක නතර කළ බවත් තමයි වසන්ත සමරසිංහ ඇමතිතුමා ප්‍රකාශ කළේ. ඒක වැරැද්දක් කියලා තමයි එතුමා පෙන්වා දුන්නේ. එදා, විශ්‍රාම යනකොටම විශ්‍රාම වැටුප ගැළපුවා නම් ඒ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. ඒ නිසා තමයි වර්තමාන ආණ්ඩුව වශයෙන් අපි අදියර තුනකින් වැටුප් වැඩි කරනකොට ඒ අදියර තුනට අදාළ කාල සීමාව තුළ විශ්‍රාම යන අයට 2027.01.01 දිනට විශ්‍රාම වැටුප ගළපන්න තීරණය කළේ.

ඊළඟ කාරණය මේකයි. 2016 දී විශ්‍රාම ගිය අයට අපි අදියර තුනකින්, ඒ කියන්නේ මේ වසරේ 2025 ජූලිවලට 2018.01.01 දක්වාත්, 2026 ජූලිවලට 2019.01.01 දක්වාත්, 2027 ජූලිවලට 2020.01.01 දක්වාත් විශ්‍රාම වැටුප නිවැරදිව ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම ගුරු විදුහල්පති ප්‍රශ්නයට අදාළව අපි අධ්‍යාපන කවුන්සලයක් හදලා තිබෙනවා. අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් අපි හෙට උදේ 10.00ට රැස්වීමක් යොදාගෙන තිබෙනවා, මහාචාර්ය ඕ.ජී. දයාරත්න මහත්මයාගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද එම කමිටුවේ වාර්තාව ඉදිරිපත් කරන්න. දැනට අපි පියවරෙන් පියවර ඉදිරියට ගිහිල්ලා ගුරුවරයා වෘත්තිකයෙකු බවට පත් කරන්නත්, වැටුප් විෂමතා ඉවත් කරන්නත්, ගුරු සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නංවන්නත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටිනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

නමුත් අපි අහන්න කැමැතියි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේලා දුන් පොරොන්දු ඉටු කරන්නේ කවදාද කියා. වාර්තා ගොඩක් ඇති. 2016 දී වුණේ මේකයි. අපි වැඩි කරපු මුදල මූලික වැටුපට එකතු කළේ අදියර පහකින්. ඒ නිසා තමයි 2020 ජනවාරි ඉඳලා ඒ හිඟ විශ්‍රාම වැටුප දෙනවා කියලා අපි තීන්දු කළේ. වැරැද්ද කළේ අපේ ආණ්ඩුව නොවෙයි. වැරැද්ද කළේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ඔබතුමා මම කියපු දෙය තේරුම් ගත්තේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධව අපි පැටලෙන්න ඕනෑ නැහැ. එදා ඒ කරපු වැරැද්ද නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවට ඒ වැරැද්ද කරන්න ඉඩ ලැබුණේ. 2016 වැටුප් වැඩිවීම එම අවස්ථාවේ විශ්‍රාම යන අයට ඒ විශ්‍රාම වැටුපට ගැළපුවේ නැති නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවට ඒක අහෝසි කරන්න ඉඩකඩ ලැබුණේ. අපි අද ප්‍රතිපත්ති ගැන නේ කථා කරන්නේ. ගුරු විදුහල්පති සේවාවේ වැටුප් විෂමතාව ගැන ඉතාම පැහැදිලිව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර තිබෙනවා. අපි එහි 16වැනි පිටුවේ පැහැදිලිවම සඳහන් කරලා තිබෙනවා, ගුරු විදුහල්පති වැටුප් විෂමතාව ඉවත් කරනවා කියලා. ඒ සඳහා අපි ගුරු සභාවක් හදනවා. අද අපි ඒක අධ්‍යාපන සභාවක් බවට පරිවර්තනය කරලා තිබෙනවා. ඒ අධ්‍යාපන සභාව හදලා ඒ මඟින් ගුරු සේවාව, එහෙම නැත්නම් අධ්‍යාපන සේවාව වෘත්තික සේවාවක් බවට පත් කරන්නත්, ඉන් අනතුරුව මේ ගැටලු විසඳන්නත් කටයුතු කරනවා. කාල රාමුවක් ගැන ඒකේ අපි කියලා නැහැ. නමුත් අපි කඩිනමින් ඒ කටයුතු කරනවා. මාස දෙකහමාරක් වාගේ කාලයක් ඇතුළත අමාත්‍යාංශයෙන් පත් කරපු කමිටුවෙන් අපට වාර්තාවක් ලැබිලා තිබෙනවා. අපි ඉතාම කඩිනමින් මීට අවශ්‍ය නීති කෙටුම්පත් කරලා, මෙය නීතියක් බවට පත් කරලා, අධ්‍යාපන සභාව හදලා ඒ ඔස්සේ ගුරු සේවාවේ ගුණාත්මකභාවය වැඩි කරන්නත්, වැටුප් විෂමතා අවම කරන්නත් කටයුතු කරනවා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

මම ඔබතුමාගෙන් ඇහුවේ ඒ ප්‍රශ්නය නොවෙයි. මට ඔය ගොඩක් විස්තර ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* සුබෝධිනී වාර්තාවට අනුව තමුන්නාන්සේලා පොරොන්දු වෙච්ච තුනෙන් දෙකේ ඉතිරි වැටුප් කොටස කවදාද දෙන්නේ?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමන්ලා, අපි විවාදයකට නොයා ඉඳිමු. කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඉක්මනින් පිළිතුරු ලබා දෙන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඉස්සෙල්ලාම ඔබතුමා තුනෙන් දෙකක කොටස ගැන මට පැහැදිලි කරන්නකෝ. එතකොට මම උත්තරය දෙන්නම්. තුනෙන් දෙක මොකක්ද කියලා පැහැදිලි කරන්නකෝ. මේක ගැන අපි විවාදයකට යන්න අවශ්‍ය නැහැ. *[බාධා කිරීමක්]* මොකද, මේක දිග විවාදයක්. *[බාධා කිරීමක්]* මේක දිග විවාදයක්. *[බාධා කිරීම්]* හරි, ඒක නොවෙයි. තුනෙන් දෙක කියන එක විග්‍රහ කරන්නකෝ. එළියේ කවුරුත් කියන නිසා නිකම් තුනෙන් දෙක කියන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තවත් කථිකයන් රැසක් ඉන්නවා. කරුණාකරලා අපි විවාදයකට නොයා ඉඳිමු.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මේ අධ්‍යාපන කවුන්සලය හරහා අපි කරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමාට ඒක තේරුම් ගන්න බැරි වුණාට මට කරන්න දෙයක් නැහැ. [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ලාල් කාන්ත ඇමතිතුමා, ඔබතුමාට විනාඩි 14ක් ලැබෙනවා.

[අ.භා. 2.46]

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම ඉස්සෙල්ලාම පොඩි උපුටා දැක්වීමක් කරන්නයි හදන්නේ. ඒ උපුටා දැක්වීම මම කරන්නේ කල්‍යානන්ද තිරාණගම මැතිතුමාගේ "ද්විඝටනාත්මක භෞතිකවාදය" නැමති කෘතියෙන්. "ද්විඝටනාත්මක භෞතිකවාදය" කියන්නේ ප්‍රතිපක්ෂයෙන්ගේ ගැටුම් තුළින් ලෝකය ඉදිරියට යනවා කියන එක. විපක්ෂය අදත් අවස්ථාවක් හදලා තිබෙනවා, මෙතැන ප්‍රතිපක්ෂයන්ගේ ගැටුමක් හදන්න. ඒක හොඳයි. ඒ, ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය අතර ප්‍රතිපක්ෂයන්ගේ ගැටුම්. ඒකෙන් තමයි ඉස්සරහට යන්නේ. ඉතින්, අපේ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය ගැන සාකච්ඡා කරන ප්‍රතිපක්ෂයන්ගේ ගැටුමට මම කැමැතියි, අපේ ආණ්ඩුව කරගෙන යන කලාව පිළිබඳව පොඩ්ඩක් කියන්න.

අපි මැතිවරණයට කලින් ජනතාවට කිව්වා, අපේ රට ක්ෂේත්‍ර හතරක් ඔස්සේ කඩාගෙන වැටිලා තිබෙනවා කියලා. ඒ ක්ෂේත්‍ර හතර තුළ සියල්ල අන්තර්ගතයි. ඒ ක්ෂේත්‍ර හතර ගැන කථා කළාම කඩා වැටීම පිළිබඳ සාකච්ඡාව සම්පූර්ණ වෙනවා. ඉතින් අපි කථා කළා, දේශපාලන ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් තිබෙනවා කියලා. එය වෙනස් කරනවා කියලා අපි ජනතාවට පොරොන්දු වුණා. ඊළඟට අපි සාකච්ඡා කළා, ආර්ථික ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් තිබෙනවා කියලා. ඒ ගැන පැහැදිලි කරන්න දෙයක් තිබුණේ නැහැ. මොකද, ජනතාව ඒක අත්දැක්කා; අත්දකිමින් තිබුණා. ඊළඟට, අපි සමාජයේ කඩා වැටීම පිළිබඳව ලොකු සාකච්ඡාවක් කළා. අවසානයේ, සංස්කෘතියේ කඩා වැටීම පිළිබඳව සාකච්ඡාව කළා. ඉතින්, ඒ ක්ෂේත්‍ර හතර ඇතුළේ තමයි රට පවතින්නේ. දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික කියන ඒවායින් පිට මොකක්වත් නැහැ.

ඊළඟට අපි ජනතාවට මෙන්න මෙහෙම විග්‍රහයක් කළා. මේ ක්ෂේත්‍ර හතරේ කඩා වැටීම සඳහා වන ප්‍රධානම කාරණය, ප්‍රධානම හේතුව තමයි, දේශපාලනයේ කඩා වැටීම. ඒ නිසා පළමුවෙන්ම මේ රටේ දේශපාලනයේ කඩා වැටීම සකස් කළ යුතුයි කියන එක අපි සමාජයත් එක්ක දිගට කථා කළා. සමාජය ඒක පිළිගත්තා. මොකද, දේශපාලනයේ කඩා වැටීම නිවැරදි නොකර, ඒ තිබුණු කැත දේශපාලනය වන හොරකම, වංචාව, දූෂණය, නාස්තිය - තව වචන ගොඩකින් ඒ ගැන කියන්න පුළුවන් - රටේ පවත්වාගෙන යමින් ආර්ථිකයවත්, සමාජයවත්, සංස්කෘතියවත් ලස්සනට හදන්න බැහැ කියන එක තමයි ඒකේ තිබෙන මූලික මූලධර්මය. ඒක අපි පිළිගත් මූලධර්මය, අපි ජනතාවට ඉදිරිපත් කරපු කාරණය. ඒ මූලධර්මයට අනුව ද දැන් අපි වැඩ කරගෙන යන්නේ, රට කරගෙන යන්නේ? ඒ මූලධර්මයට අනුව වැඩ කරගෙන යමින් ද, අපි මේ රටේ මේ කරගෙන යන අනෙකුත් සියලු කටයුතු කරගෙන යන්නේ? ඒ කියන්නේ, ආර්ථික ක්ෂේත්‍රයේ, සමාජ ක්ෂේත්‍රයේ සහ සංස්කෘතික ක්ෂේත්‍රයේ අවශ්‍ය කරන වෙනස්කම් කරගෙන යන්නේ මේ කියන මූලධර්මයට අනුවද? ඔව්. පළමුවෙනි දේ හැටියට අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කරන්න හොඳ ආරම්භයක් ගත්තා. ඒ හොඳ ආරම්භයේ පළමුවෙනි එක හැටියට ජනාධිපතිවරණයෙන් පසුව ජාතික ජන බලවේගය ජයග්‍රහණය කරලා, මේ රටේ දේශපාලන සංස්කෘතියේ දැවැන්ත වෙනස්කමක් කළා. ඒ දැවැන්ත වෙනස්කම තමයි, රට තුළ සාමකාමී තත්ත්වයක් ඇති කරන එක. කිසිදු දේශපාලන ප්‍රතිපක්ෂයකට, ප්‍රතිවිරුද්ධ කෙනෙකුට කිසිදු දේශපාලන හානියක් නොවෙන පාලනයක් ලංකාවේ පළමුවෙනි වතාවට මේ අවුරුදු 76න් පසු බිහි කළා. ඒකම ඇති; ඒකම ප්‍රමාණවත්, මේ ගෙවුණු කාලය තුළ මේ රට ඉදිරියට ගෙනියන්න. ඒ විතරක් නොවෙයි.

ඊළඟට, පළාත් පාලන මැතිවරණය පැවැත්වුවා. බහුතරයක් අපි ජයග්‍රහණය කළා. ඒ දේශපාලන සංස්කෘතියම ඉදිරියට ගෙන යමින් පළාත් පාලන මැතිවරණය අවසන් වනකොටත් රට සම්පූර්ණයෙන්ම සාමකාමී රටක් බවට පත් කළා. ඒ, අපේ අර පොරොන්දුව; අපි යන පාර; මේ රට හදා ගෙන යන පාර, දේශපාලන, සංස්කෘතික සහ සමාජමය වශයෙන්.

අපේ රට ආර්ථික වශයෙන් කඩා වැටිච්ච රටක්. මේ රට තිබුණු තැන මතක් කරලා ඉන්න ඕනෑ, කරපු දේවල් ගැන කියන්න. ඒ සම්බන්ධයෙන් කරුණු තුනක් ගොඩනඟන්න නම් පළමුවෙනි කරුණ රටේ සාර්ථකව ස්ථාපිත කරන්න ඕනෑ. ඒ කරුණ තමයි, රටේ පාලනය. තව පැත්තකින් ගත්තාම දේශපාලන සංස්කෘතිය කියන්නේ පාලනය නේ. ඒ පාලනය හොඳින් නිවැරදි කර ගන්න ඕනෑ. ඒක නිවැරදි කරමින් තමයි ආර්ථිකයයි, සමාජයයි, සංස්කෘතියයි ගොඩනඟන්න වෙන්නේ. එහෙම නැත්නම් බැහැ. ඉතින් හොඳම ආරම්භය ගත්තා. නියෝජන ක්‍රමයක් යටතේ මහජන නියෝජිතයෝ තෝරා පත් කරලා මේ ආයතන ක්‍රියාවලිය ආරම්භ කළා. මේ රටේ ජනතාවට සාමකාමීව ජීවත් වෙන්න පුළුවන්, මැතිවරණ ප්‍රචණ්ඩත්වය zero කරපු පාලනයක් මීට කලින් ලංකාවේ බිහි වෙලා නැහැ. මොකද, මැතිවරණයෙන් පසුව දේශපාලන ප්‍රචණ්ඩත්වය මේ රටේ නිර්මාණය වුණා. එහෙම නම් මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච, ජනතාවට දීපු ප්‍රබලම පොරොන්දුවක් අපි ඉෂ්ට කරලා

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

තිබෙනවා. ඒක වැදගත්. එහෙම තමයි දැන් අපි මේ වෙනස් කිරීමේ මාවතේ ගමන් කරමින් සිටින්නේ.

මේ ද්විසටනාත්මක භෞතිකවාදය නැමති පොතේ කියමනක් තිබෙනවා, "මේ තාක් කල් සිටි සියලු දාර්ශනිකයෝ ලෝකය තේරුම් කළහ; -ඒ කියන්නේ විග්‍රහ කළා- එහෙත් අපේ කාර්යය වන්නේ ලෝකය විපර්යාස කිරීමයි; වෙනස් කිරීමයි" කියලා. ඒක කියලා තිබෙන්නේ කාල්මාක්ස්. අපේ කාර්යය වෙන්නේ ලෝකය වෙනස් කිරීම. මේක අපේ රටට ගැළපුවාම අපේ කාර්යය වෙන්නේ ජාතික ජන බලවේගයේ පාලනයක් යටතේ රට වෙනස් කිරීමයි. එහෙම නම් ඒ වෙනස් කිරීමට මුල්ගලක් අවශ්‍යයි; මූලික පදනම් අවශ්‍යයි. ඒ පදනම් වෙනුවෙන් තමයි ආණ්ඩුව මේ වෙනකොට කටයුතු කරගෙන යන්නේ. ඒ අනුව තමයි රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ මූලික පදනම දාලා තිබෙන්නේ. අපි ආවාට පසුව මේ ස්ථාවරය ගොඩනභා ගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳව හොඳම විග්‍රහයක් සහ කථාවක් -දේශනයක්- අපේ ජනාධිපති සහෝදරයා ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉන්න ශ්‍රී ලාංකිකයන් එකතු කරලා සිදු කළා. ඒ දේශනය බොහොම වැදගත්. අපේ රට ස්ථාවර කරලා තිබෙන්නේ කොහොමද, හෙට දවසේ රට ගොඩනඟන්න පුළුවන් ක්‍රමවේදය ස්ථාවර කරලා තිබෙන්නේ කොහොමද කියන එක එහිදී ලෝකයටම මැනවින් පැහැදිලි කළා. ඒ දේශනය තිබුණේ සැප්තැම්බර් මාසයේ 25වැනි දා. මම මේ සභාවේ හැමෝටමත්, මගේ කථාව එළියේ සිට අහන ජනතාවටත් ආරාධනා කරනවා, සැප්තැම්බර් 25වැනි දා අපේ අනුර කුමාර දිසානායක සහෝදරයා ඇමෙරිකාවේ සිටින ශ්‍රී ලාංකිකයන් අමතා කරපු ඒ ඇමෙරිකානු දේශනයට සවන් දෙන්න කියලා. මම හිතන විධියට විපක්ෂයේ අය ඒ දේශනයට සවන් දුන්නා නම් ඒ අයට ගොඩක් දේවල් නිරවුල් කරගන්න පුළුවන්කමක් ලැබෙනවා.

මේ ගෙවුණු කාලය තුළ ආර්ථිකය ගත්තොත්, මම මගේ අමාත්‍යාංශය පැත්තෙන් උත්තරයක්, දෙකක් දෙන්නම්. මොකද, ගොවි ජනතාව කියන්නේ අපේ රටේ දරිද්‍රතාවෙන් බැට කාලා හිටපු ජනතාවක් නිසා. දැන් 2024-2025 මාස් කන්නය අවසන් වෙලා, 2025 යල කන්නයත් අවසන් වෙලා තිබෙනවා. ඊළඟ මාස් කන්නය දැන් පටන් ගන්න නියමිතයි. ඒ අනුව මේ මාසයේ මැද වෙනකොට මාස් කන්නය ආරම්භ වෙනවා. මේ ගෙවුණු කාලය තුළ අපේ රටේ ගොවි ජනතාව මීට පෙර තිබුණු ගැටලු කිහිපයක් විසඳාගෙන තිබෙනවා. ඔක්කොම නොවෙයි, ගැටලු කිහිපයක් මේ අවුරුද්ද තුළ විසඳාගෙන තිබෙනවා. අවුරුද්දක් කියලා අපි කියමු. කන්න දෙකක් නේ, අවුරුද්දයි නේ. ගොවි ජනතාවට තිබුණු ප්‍රධානම ප්‍රශ්නයක් තමයි, තමන් දරන පිරිවැයට සරිලන මිලක් තමන්ගේ නිෂ්පාදනවලට නොලැබීම. මේක ගොවි ජනතාවට තිබුණු ප්‍රධාන ප්‍රශ්නයක්. ඕනෑම නිෂ්පාදනයකට එහෙමයි, පිරිවැයක් තිබෙනවා. ඒ පිරිවැයට අමතරව තව කොටසක් අවශ්‍යයි. ඔවුන්ට ලාභයක් අවශ්‍යයි. අපේ ගොවි ජනතාවට තිබුණු ප්‍රධානම ප්‍රශ්නය මේකයි. අපි කියන්න කැමැතියි, මේ ගෙවුණු අවුරුද්ද ඇතුළත විශේෂයෙන් වී වගා කරන ගොවීන්ගේ එම ගැටලුවට සාධාරණ උත්තරයක් ලබා දෙන්න මේ ආණ්ඩුවට පුළුවන් වුණු බව. සියලු ප්‍රශ්න විසඳිලා නැහැ තමයි.

අපේ සමන්මලී ගුණසිංහ මන්ත්‍රීතුමිය බොහොම හොඳ අදහසක් ඉදිරිපත් කළා. අපි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරලා තිබෙන්නේ 2029 දක්වා. එහෙම නැතුව අවුරුද්දකට නොවෙයි. අවුරුද්දක් තුළදී කළේ මොනවාද කියන එක තමයි මෙතැන දැන් අදාළ වෙන්නේ. නමුත්, කථා කරනකොට මුළු ප්‍රතිපත්ති ප්‍රකාශනයම අරගෙන මේක කරලා නැහැ නේ, මේක කරලා නැහැ නේ කිව්වාට ඒක එච්චර තර්කානුකූල නැහැ. විපක්ෂය එහෙම තමයි සාමාන්‍යයෙන් කරුණු ඉදිරිපත් කරන්නේ. ඒක විපක්ෂයේ රටාව. කොහොම හරි අද වෙනකොට ගොවි ජනතාවගේ උද්සෝෂණයක් තිබෙනවා නම් තිබෙන්නේ අල ගොවීන්ගේ උද්සෝෂණයක්. අල ගොවීන්ගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම බී ලූනු ගොවීන්ගේ ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා. එච්චරමයි. වෙන මොකක්වත් නැහැ. වී වගා කරන ගොවි ජනතාවගේ පැත්තෙන් -මේක විශාල ජන කණ්ඩායමක් නිසායි මම මේ කොටස ගැන කථා කරන්නේ. එක් කෙනෙක්, දෙදෙනෙක් නොවන නිසා.- ඒ අයගේ ප්‍රශ්නයට අපි මැදිහත් වෙලා, ඒගොල්ලන්ට සාධාරණ මිලක් ලබා දෙන්න පුළුවන් විධියේ ක්‍රමවේදයක් හදලා, ඒක සාර්ථක කළා. අද වෙනකොට වී වගා කරන ගොවීන්ගේ උද්සෝෂණ මොකක්වත් මේ රටේ නැහැ; මොකක්වත් නැහැ; කන්න දෙකේම නැහැ.

ඊළඟට, බී ලූනු ගොවීන්ගේ ප්‍රශ්නයටත් සතොස සම්බන්ධ කරගෙන ආහාර සුරක්ෂිතතා කමිටුව තුළ අපි ඒ ගැන පුළුල් ලෙස සාකච්ඡා කරලා, යම් බද්දකුත් වැඩි කරලා, ඊට අමතරව ඒකත් ප්‍රමාණවත් නොවනකොට සතොස මැදිහත් වෙලා බී ලූනු කිලෝවක් රුපියල් 130කට මිලදී ගැනීමේ වැඩසටහනක් මේ වෙනකොට ක්‍රියාත්මකයි. ඇත්තටම ඒකට සතොස විතරක් නොවෙයි මැදිහත් වුණේ. අපි සාකච්ඡා කළා, සුපර්මාර්කට් ජාලයත් එක්ක. නම කිව්වාට කමක් නැහැ, ඒගොල්ලන් මේකට ඇත්තටම සම්බන්ධ වෙච්ච නිසා. කාගිල්ස් වෙළෙඳ ජාලය මේකට සම්බන්ධ වුණා. ඒ වාගේම, කීල්ස් වෙළෙඳ ජාලයත් මේකට සම්බන්ධ වුණා. අපි එකඟතාවක් හදාගෙන රාජ්‍ය, පෞද්ගලික දෙපැත්තම සම්බන්ධ වෙලා ඒ බී ලූනු ගොවීන්ගේ ප්‍රශ්නයටත් විසඳුමක් හොයන්න කටයුතු කළා. තවමත් පොඩි පොඩි ප්‍රශ්න නැතුවා නොවෙයි. එහෙම නැහැ කියනවා නම් ඉතින් ඒක බොරුවක්. ඒ විධියට ප්‍රශ්න මතු වෙන ආකාරය දෙස බලා ඒවා සම්බන්ධයෙන් අපි කටයුතු කර තිබෙනවා. ඇත්තම කියනවා නම්, දැන් එක්තරා ආකාරයකට ගොවි ජනතාවට වගා කිරීම සම්බන්ධව බලාපොරොත්තුවක් නිර්මාණය වෙලා තිබෙනවා. අපි වගා කළොත් ඒකට සාධාරණ මිලක් ලැබෙයි, ඒ පැත්තට තමයි ආණ්ඩුව ගමන් කරමින් යන්නේ, අපිව අතරමං කරන එකක් නැහැ, අතරමං කළේ නැහැ, ආණ්ඩුව මැදිහත් වෙනවා කියන බලාපොරොත්තුව දැන් ඇති වෙලා තිබෙනවා. ඒක අපේ රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා මේ ගෙවුණු අවුරුද්දේදී කරගත්ත ප්‍රධානම දෙයක්. ගොවිතැන් අත් හරිමින් හිටියේ. ගොවිපළෙන් අයින් වෙමින් හිටියේ. ආර්ථිකයේ ඒ ක්ෂේත්‍රය කඩා වැටෙන නිසා තරුණ පරම්පරාව ඒ සඳහා ඉදිරිපත් වුණේ නැහැ.

වෙලාව සීමාසහිත වුණත් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපි දැන් ක්‍රියාත්මක කරනවා, "යාය 500" කියලා වැඩසටහනක්. ඒ කියන්නේ, යායවල් 500ක් තෝරාගෙන, ඒ යායවල් 500හි අපේ ගොවි බිම්වල වගා කරන නිෂ්පාදනයන්ගේ ඵලදායිතාව ඉහළ දමන්න කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්පූර්ණ පැකේජ් එකක් සහිතව කටයුතු කිරීම ආරම්භ කර තිබෙනවා. අපි ගහට, බෝගයට දෙන්න ඕනෑ නිසි ආහාර ප්‍රමාණය නිසි වෙලාවට දෙන්න ඕනෑ.

ඒවා සියල්ල සහිතව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද පැකේජ් එකක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනවා. ඒ පැකේජ් එකෙන් පිට කාටවත් යන්න බැහැ. ඒ පැකේජ් එක සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්න ඕනෑ. නිසි ප්‍රමාණයට වතුර, නිසි ප්‍රමාණයට හා නිසි වෙලාවට පොහොර, නිසි වෙලාවට අදාළ සියලු කටයුතු සිදු කරමින් යාය 500ක වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ගොවි ජනතාව ඉතාම ආදරයෙන් ඒක භාර අරගෙන තිබෙනවා.

තමුන්නාන්සේලා කිව්වා ජනතාව දැන් කලකිරීමෙන් ඉන්නේ කියලා. ගොවි ජනතාව අපට ඡන්දය දුන්නා නම්, ගොවි ජනතාව අපට දීපු ඡන්දයට වග කියපු ආණ්ඩුවක් බවට ජාතික ජන බලවේගයේ මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ඒක ගැන අපට

සතුටුයි. අද කොහේවත් උද්ඝෝෂණ නැහැ, අරගළ නැහැ. තමුන්නාන්සේලා කියන විධියේ ගැටලුවක් මේ රටේ තිබෙනවා නම් දැන් ජනතාව ඉන්න ඕනෑ මහ පාරේ. ඕනෑම ක්ෂේත්‍රයක අය ඉන්න ඕනෑ මහ පාරේ. දැන් ජනතාව මහ පාරේ නැහැ. ඒ කියන්නේ, ජනතාව සතුටින් ඉන්නවා; මේ ගෙන යන වැඩ පිළිවෙළ ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා. බලාපොරොත්තු තබාගෙන ඉන්නවා. තමුන්නාන්සේලා අපි ගැන කියපු කිසිවක් වුණේ නැහැ. තමුන්නාන්සේලා ඡන්දෙට කලින් අපි ගැන බොහෝ ජාති කිව්වා නේ. එතකොට දැන් බලන්න ඕනෑ, බොරු කිව්වේ අපිද, තමුන්නාන්සේලාද කියලා. තමුන්නාන්සේලා කිව්වා, තෙල් පෝලිම් ඇති වනවා කියලා. එහෙම මුකුත් නැහැ. රට ඉදිරියට යනවා හොඳට. පන්සල්වලට දානය නැතුව යනවා කිව්වා. බුදු අම්මෝ! කියපු පව. තවම මෙහෙම ඉන්න එක පුදුමයි, පොළොව පළාගෙන යන්නේ නැතුව. දේපළ පවර ගන්නවා කිව්වා. වාහන දෙකක් තිබ්බොත් එකක් ගන්නවා කිව්වා. නුවර පෙරහැර නවත්වනවා කිව්වා. ඇත්කඳ රජමහා විහාරයේ පෙරහැර නවත්වනවා කිව්වා. කියපු පව. ඇත්තටම තවම ඉන්න එක පුදුමයි. හැබැයි, ඉන්න ඕනෑ. මොකද දන්නවාද? නැත්නම් ප්‍රති පක්ෂයක් නැතුව යනවා. අපි විපක්ෂයට ගොඩක් ගරු කරනවා. මේ ඇවිල්ලා ඉන්නේ මහ ජනතාවගේ ඡන්දයෙන් බලයට ආපු මන්ත්‍රීවරු. ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය නැත්නම් මේ system එක ගෙන යන්න බැහැ. විපක්ෂ නායකතුමා හොඳින් කටයුතු කරන්න ඕනෑ. එතුමා අද හොඳ කරුණු ප්‍රමාණයක් ඇත්තටම ඉදිරිපත් කළා. අපේ මුදල් නියෝජ්‍ය ඇමතිතුමා දැන් ඒකට හොඳ උත්තරයක් දෙයි. අපිත් බෙදාගෙන නේ මේ කථා කරන්නේ. නේද?

ඊළඟට සතියෙන් සතිය මාතෘකා ගෙනෙන කථාවක් කිව්වා, පළාත් සභා ඡන්දය ගැන කථාවකුත් කිව්වා. ඡන්දෙ කථාවට පිළිතුර මෙහෙමයි. අපි ජනාධිපතිවරණයෙන් දිනුවාට පස්සේ මහ මැතිවරණය පැවැත්වූවා. මේ අවුරුද්දට ඡන්දයක් පැවැත්වූවා. ඒ, පළාත් පාලන ඡන්දය. ඉතින්, දැන් ජන මතය මොකක්ද කියලා බලා ගන්නය කියලා කථාවක් කිව්වා. අවුරුද්දට එක ඡන්දයක් තිබ්බාම ඇති. ළඟ ළඟ ඡන්ද තියලා ජන මතය බලන්න බැහැ. පළාත් පාලන ඡන්දය ඉවර වුණු ගමන් පළාත් සභා ඡන්දයක් තියලා ජන මතය බලන්න බැහැ. එතකොට අර මතයම තමයි. තමුන්නාන්සේලාටත් වාසියි, පොඩ්ඩක් කල් ගිහිල්ලා ඡන්දය තියන එක, ඉස්සර ක්‍රමයට. නමුත් ඇත්ත තත්ත්වය ගත්තොත්, අවුරුද්දක් ගිහිල්ලා පළාත් සභා ඡන්දය තියනකොට විපක්ෂයේ මේ තත්ත්වයත් දුර්වල වන බවට අපට කිසිම සැකයක් නැහැ. මොකද, අපි ප්‍රතිපත්ති හරියට ක්‍රියාත්මක කරලා තිබෙන ආණ්ඩුවක්. ලංකාවේ පළමු වතාවට ගෙවිච්ච අවුරුද්දෙන් කියන්න පුළුවන් එක දෙයක් තිබෙනවා. ඒ මොකක්ද? සියයට සියයක් දූෂණයෙන් තොර පාලනයක් අවුරුදු 76කට පස්සේ ලංකාවේ ක්‍රියාත්මක වන බව අද මේ රටේ ජනතාව දන්නවා.

මේ යෝජනාව ඇත්තටම ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා තමයි ගෙනාවේ. මට සැකයක් තිබෙනවා, අපේ පැත්තේ කිහිප දෙනෙක් එක්ක හරි සම්බන්ධයක් ඇතිව මේ යෝජනාව ගෙනාවාද කියලා.

බොහොම ස්තුතියි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Madam Chair, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා table කරනවා කියලා කිව්වා, ඒ සම්බන්ධයෙන් documents වගයක්. මම ඒවා ඉල්ලුවා. මෙට්‍රික්ටොන් 20,000කට විතරයි කියලා අර ටෙන්ඩර් එක දැම්මේ 30,000ක් SMEsලාට දෙනවා කියලා. හැබැයි, එහෙම document එකක් table කළේ නැහැ කියලා හැන්සාඩ් දෙපාර්තමේන්තුවෙන් කියනවා. කරුණාකරලා අපට ඒ documents ටික ගන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඒ ගැන හොයලා කියන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Thank you.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.05]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු ලාල් කාන්ත අමාත්‍යතුමා ආණ්ඩුවේ වැඩ පිළිවෙළ පිළිබඳව පැහැදිලි කිරීමක් කළා. විපක්ෂයේ අපි මෙම යෝජනාව ඉදිරිපත් කළේ, ඔබතුමන්ලාගේ අවුරුදු 5 තුළදීම කරන වැඩ පිළිවෙළ ගැන නොවෙයි, අවුරුද්දක කාලය තුළ ඉටු කළ යුතු පොරොන්දු ගැන මතක් කර දීමක්, එහෙම නැත්නම් ඉටු නොවුණු පොරොන්දු ගැන මතක් කරදීමක් කරන්නයි. ඒකයි අපේ අදහස වුණේ.

පළමු කාරණය මම පටන් ගන්නම්, ජනාධිපති ධුරය ගැන කථා කරමින්. මා හිතන විධියට, ඔබතුමන්ලාගේ ප්‍රධානම පොරොන්දුව තමයි විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම. මම කියන්නේ නැහැ මේ වෙද්දී එය අහෝසි කරලා තිබෙන්න ඕනෑ කියලා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද ඒ සඳහා මේ වෙද්දි ගත්ත ක්‍රියාමාර්ග? මම කියන්නේ අවුරුද්දෙන් එය කරන්න කියන එක නොවෙයි. ඒ සඳහා මොකක් හෝ ආරම්භයක් අරගෙන තිබෙනවාද? මොකද, මම දැක්කා මාධ්‍යයට යන අය දිගටම කියන්නේ, "අපිට දැන් 159දෙනා මදි. මේ අවුරුදු 5 මදි. මේක කරන්න අපිට තව අවුරුදු 5ක් ලැබුණොත් අපි බලන්නම් විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න පුළුවන් ද කියලා" යනුවෙන්. දැන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමතක වෙලා තිබෙනවා, විධායක ජනාධිපති ධුරය අහෝසි කරන එකත් අමතක වෙලා තිබෙනවා. හැබැයි, ජනාධිපතිතුමාට බිලියන 11ක් නම් -කලින් තිබුණාටත් වැඩිය බිලියන දෙකක් වැඩි වෙලා- වෙන් වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඊට අමතරව තිබෙනවා, දිගු කාලීන වැඩ පිළිවෙළ; ඔබතුමා කියපු අර අවුරුදු 5 වැඩ පිළිවෙළ. ඒ වාගේම කෙටි කාලීන වැඩ පිළිවෙළවල් තිබෙනවා. තව ඒවා තිබෙනවා,

[ගරු ඩී.වී. චානක මහතා]

ඉතා කෙටි කාලීන වැඩ පිළිවෙළවල්. දිගු කාලීන, කෙටි කාලීන, ඉතා කෙටි කාලීන වැඩ පිළිවෙළවල්. මොකක්ද, මේ ඉතා කෙටි කාලීන වැඩ පිළිවෙළවල් කියන්නේ? ජනාධිපතිතුමා වේදිකාවේ කියනවා, "මම විදුලි බිල ඉතා කෙටි කාලීනව අඩු කරනවා" කියලා. ඒ කියන්නේ, රුපියල් 9,000 නම් බිල තිබෙන්නේ රුපියල් 6,000ට අඩු කරනවා ඉතා කෙටි කාලීනව; රුපියල් 6,000 නම් තිබෙන්නේ රුපියල් 4,000ට අඩු කරනවා ඉතා කෙටි කාලීනව - *[බාධා කිරීමක්]* කිව්වා. කිව්වා. රුපියල් 3,000 නම් තිබෙන්නේ, රුපියල් 2,000ට අඩු කරනවා ඉතා කෙටි කාලීනව. ඊට පස්සේ ඡන්දය ඔන්න මෙන්න, අප්‍රේල් මාසය ඔන්න මෙන්න තියලා ඔන්න ඉතා කෙටි කාලීනව අඩු කළා. අන්තිමට විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 20ක් පාඩු ලැබුවා. ඡන්දය ඉවර වෙච්ච ගමන් අනෙක් පැත්තට විදුලි බිල වැඩි කළා. ඔන්න, තවත් සියයට 6කින් වැඩි කළාම අන්න තිබුණු ගණනටම ආපහු විදුලි බිල එනවා. ඒ, විදුලි බිල. අනෙක් පැත්තෙන් තෙල් මිල ගැනත් ඒ වාගේම කිව්වා.

ඊට පස්සේ තව ඉතා කෙටි කාලීන දෙයක් ගැන කිව්වා. මම හිතන විධියට නුවරඑළිය පැත්තේ, බදුල්ල පැත්තේ අය ඉන්නවා නම්, මේ ගැන දන්නවා ඇති. වතු කම්කරුවන්ට රුපියල් 1,700ක් දෙනවා කිව්වා, ඉතා කෙටි කාලීනව. අවුරුද්දක් ඇතුළත ගෙවල් 4,000ක් හදලා දෙනවා කිව්වා, ඉතා කෙටි කාලීනව. ගෙවල් 4,000 හදලා දුන්නාද? රුපියල් 1,700 දුන්නාද වතු කම්කරුවන්ට, ඉතා කෙටි කාලීනව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වාගේම දැනට පවතින ආර්ථික වර්ධන වේගය ගැනත් මම කියන්න ඕනෑ. ඔබතුමන්ලා හැම තැනකම කියනවා, බංකොලොත් රටක් භාර ගත්තේ; ඉතාම අසීරු ආර්ථිකයක් භාර ගත්තේ කියලා. හැබැයි, මේ කියන රටේ, ඔබතුමන්ලා භාර ගත්ත රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5.3යි; ඔබතුමන්ලා අමාරුයි කියපු රටේ ආර්ථික වර්ධන වේගය සියයට 5.3යි. කෘෂිකාර්මික කටයුතුවල වර්ධන වේගය සියයට 3.7යි. ඊළඟට, කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධන වේගය 10.1යි. සංචාරක කටයුතුවල වර්ධන වේගය සියයට 2.6යි. ඔබතුමන්ලාගේ කාලයේ වැඩි වෙලා තිබෙන්නේ එකම එකයි. ඒ, සංචාරක කටයුතු විතරයි. සංචාරක කටයුතු නම් සියයට 2.6 ඉඳන් සියයට 3.9ට වැඩි වෙලා තිබෙනවා. සාමාන්‍යයෙන් සංචාරක කර්මාන්තය ගත්තොත්, පෞද්ගලික අංශයෙන් තමයි සියයට 99ක් එන්නේ. කමක් නැහැ. අපි ආණ්ඩුවට credit එක දෙන්නම්. අපේ කෘෂිකර්ම ඇමතිතුමා සභාවේ ඉන්නවා. හැබැයි එතුමා කියනවා, විශාල ජයග්‍රහණ ගත්තා කියලා. හැබැයි, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධනය සියයට 3.7 ඉඳන් සියයට 2 දක්වා කඩාගෙන වැටිලා. කර්මාන්ත වර්ධනය සියයට 10.1 ඉඳන් සියයට 5.8 දක්වා කඩාගෙන වැටිලා.

ඇමෙරිකාවට ගිහිල්ලා ජනාධිපතිතුමා ආපු ගමන් කියනවා, ආයෝජකයන්ට සුදුසු තත්ත්වයක් රටේ නැහැ කියලා. අද ලෝක බැංකුවෙන් කියනවා, සියයට 1.5ක target එකක් FDIs වලට තිබුණා, දශම 5ක්වත් නැහැ කියලා. රටේ ආර්ථිකය එන්න එන්නම බරපතළ තැනකට වැටෙනවා. එක පැත්තකින් අමාත්‍යවරයා කියනවා, ගොවීන් අද පාරේ නැහැ කියලා. හැබැයි, අද වට්ටක්කා ගොවියා පාරේ ඉන්නවා, රුපියල් 30කටවත් වට්ටක්කා ටික විකුණා ගන්න බැහැ කියලා. ලූනු ගොවියා පාරේ ඉන්නවා; වී ගොවියා පාරේ ඉන්නවා; උක් ගොවියා පාරේ ඉන්නවා; බඩඉරිඟු ගොවියා පාරේ ඉන්නවා. අන්තිමට අනෙක් පැත්තෙන්, පාරිභෝගිකයා අඬනවා උද්ධමනය වැඩි වෙලා. ඔබතුමන්ලාට මේ රට භාර දෙනකොට අවධමනයක් තිබුණේ; සෘණ දශම 5ක අවධමනයක් තිබුණේ. අද උද්ධමනය සියයට 1.5කට වැඩි වෙලා. ඔබතුමන්ලාගේ දත්තවලයි මේවා තිබෙන්නේ. ගිහිල්ලා බලන්න, Central Bank Report එක, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ report එක, සියයට සෘණ දශම 5ක්ව තිබුණු අවධමනය උද්ධමනයක් දක්වා වැඩි වුණේ කොහොමද කියලා, බඩු මිල වැඩි වුණේ කොහොමද කියලා, හාල් මිල වැඩි වුණේ කොහොමද කියලා.

දඹුල්ලේ ගිහිල්ලා ශීතාගාරයක් open කළා. හැබැයි අද ඒ open කරපු එකකවත් බඩු ගන්නේ නැහැ. අද ගොවියාට තම නිෂ්පාදන ටික විකුණාගන්න බැහැ. අනෙක් පැත්තෙන්, පාරිභෝගිකයා අඬනවා, අවශ්‍ය බඩු ටික ගන්න බැරුව. අද fried rice එකක් හදාගන්න සම්බා හාල් ටිකක් නැහැ. හැබැයි ඇමතිවරු කියනවා, "රටේ ප්‍රශ්නයක් නැහැ. මොකද, මිනිස්සු පාරට එන්නේ නැහැ" කියලා. අද රටේ ප්‍රශ්නයක් තිබෙන බව බලාගන්න දර්ශකය තමයි මිනිස්සු පාරට එනවාද, නැද්ද කියන එක. ඒක හින්දා ජනතාවට කියන්න තිබෙන්නේ තමන්ට ප්‍රශ්නයක් තිබෙනවාද කියලා මේ ආණ්ඩුව බලාගන්නේ ජනතාව පාරට එනවාද, නැද්ද කියන එකෙන් බවයි. ඒක හින්දා තමන්ට ප්‍රශ්නයක් තිබෙනවා නම් එන්න පාරට. නැත්නම් ආණ්ඩුව කියයි, "ඔයගොල්ලන්ට මේ රටේ කිසිම ප්‍රශ්නයක් නැහැ" කියලා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.12]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි මේ විවාදයට ගන්නේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන අපේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳවයි. මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, මේ ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳවත්, ආණ්ඩු පක්ෂය විධියට පසුගිය වසරක කාල සීමාව තුළ අපි ඉටු කරපු කාර්යයන් පිළිබඳවත් අපේ රටේ ජනතාව වෙත අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාවක් ලබා දීම පිළිබඳව.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පිටු 231ක් පුරා දිවෙන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය අහම්බෙන් මතු වුණු එකක් නොවෙයි. අපි මේ පිළිබඳව සාකච්ඡාව පටන් ගත්තේ 2018 වර්ෂයේ. අපි 2018 වර්ෂයේ සිට මෙරට විවිධ ජන කොටස් සමඟ, ප්‍රාමාණික බුද්ධිමතුන් සමඟ, විවිධ ක්ෂේත්‍රවල ඉන්න අයත් සමඟ සාකච්ඡා කරලා තමයි පළමුවෙන්ම මේ ප්‍රතිපත්ති ප්‍රකාශය 2019 පෙබරවාරි මාසයේ එළි දැක්වූයේ. ඊට පස්සේ 2019 නොවැම්බර් මාසයේ එවකට තිබුණු ජනාධිපතිවරණයේදී අපි මෙහි මූලික හරය ඉදිරිපත් කළා. ඉන්පසු ගත වූ වසර කිහිපය පුරා ඒ ඇති වෙච්ච සන්දර්භයන් පිළිබඳව හොඳින් අධ්‍යයනය කරලා තමයි, 2024 සැප්තැම්බර් 21වැනි දා පැවැති පසුගිය ජනාධිපතිවරණයේදී අපි "පොහොසත් රටක් -

ලස්සන ජීවිතයක්" කියන මේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉතා සුවිශේෂ ප්‍රතිපත්ති ප්‍රකාශයක් ලෙස එළි දැක්වූයේ.

මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ හරය කුමක්ද, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි? මේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ හුයක් වාගේ දිවෙන එක හරයක් තිබෙනවා. ඒ හරය තමයි, මේ රට ඉල්ලා සිටි නව සමාජ සන්දර්භය. අපේ සමාජයේ ඒ වෙනකොට තිබුණු සමාජ සන්දර්භය කුමක්ද? අපි විශේෂයෙන්ම මේ ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කරලා මේ පිළිබඳව සමාලෝචනය කරමින් යනකොට 2022 වර්ෂයේදී අරගළයක් ඇති වුණා. ඒ අරගළය තුළින් සමාජය මොකක්ද ඉල්ලා සිටියේ? සමාජය ඉල්ලා සිටියා, වංචාවෙන්, දූෂණයෙන් තොර පාලනයක්. ඒ වාගේම, නීතියේ ආධිපත්‍යය පිහිටුවන්න කියලාත් ඉල්ලා සිටියා. මොකද, එදා සමාජය පුරා වංචාව පැතිරිලා තිබුණා, දූෂණය පැතිරිලා තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වසරක් තුළ අපි දේශපාලන ක්ෂේත්‍රයේ වංචාව, දූෂණය, හොරකම බින්දුවට බස්සලා තිබෙනවා. අපි දන්නවා, තව ගමනක් යන්න තිබෙනවා කියලා. අපි සුපිළිපන්න දේශපාලනයක් මේ රටට හඳුන්වා දීලා තිබෙනවා. මට කලින් කථා කරපු ගරු ලාල් කාන්ත ඇමතිතුමා සඳහන් කළා වාගේ අපි දේශපාලන ක්ෂේත්‍රයේ සුවිශාල පරිවර්තන ගණනාවක් මේ රටට හඳුන්වා දීලා තිබෙනවා, වර්ෂයකට අඩු ඉතාම කෙටි කාලයක් තුළ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට ජනතාව අපෙන් ඉල්ලා සිටියේ මොකක්ද? ඔවුන් ඉල්ලා සිටියේ නීතියේ ආධිපත්‍යය තහවුරු කරන්න කියලායි. ඒ තිබුණු සමාජය මොකක්ද? ධනවත් අයට, බලවත් අයට එක නීතියක්. දුබල අයට, සාමාන්‍ය පුරවැසියාට තව නීතියක්. නීතිය ඉහළ යැයි සම්මත පුද්ගලයන් කරා ළඟා නොවෙනවා කියන මතයක් සමාජය තුළ තිබුණා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ගත වූ මාස කිහිපය තුළ අපි නීතියේ ආධිපත්‍යය තහවුරු කරලා තිබෙනවා. Rule of law කියලා කියන්නේ මොකක්ද? බලවත් වෙන්න පුළුවන්; ධනවත් වෙන්න පුළුවන්; ව්‍යාපාරිකයන් වෙන්න පුළුවන්; හිටපු ජනාධිපතිවරුන් වෙන්න පුළුවන්; ඇමතිවරුන් වෙන්න පුළුවන්, නීතිය සැමට සමානයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය වසරකට ආසන්න කාලය තුළ හිටපු ජනාධිපතිවරුන් ළඟට, හිටපු ඇමතිවරුන් ළඟට, පොලිස්පතිවරුන් ළඟට, බන්ධනාගාර කොමසාරිස්වරුන් ළඟට, පොලීසියේ, හමුදාවේ අය ළඟට -ඕනෑම ක්ෂේත්‍රයක සෑම කෙනෙකු ළඟටම- නීතිය ළඟා වුණා. සමාජය තුළ නීතිය සැමට සමානයි කියන තහවුරුව ඇති කරන්න අපට හැකියාව ලැබුණා. ඒවා තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වසරක් තුළ අප ලබා ගත් සුවිශේෂ ජයග්‍රහණ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සියවස් ගණනක් තිස්සේ ජනතාව විසින් අපේක්ෂා කරන ලද, ඔවුන්ගේ දැල්වූ බලාපොරොත්තුවල හරය කුමක්ද? ඔවුන් ඉල්ලා සිටියා, එක් ශ්‍රී ලාංකීය ජාතියක්. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි වූ විවිධ ජන කොටස්වලට බෙදිලා අපි අවුරුදු 30කට ආසන්න කාලයක් යුද්ධ කර ගත්තා. අපි ඒ තුවාලවලට තවමත් ප්‍රතිකාර හොයනවා. ඒවා ජාත්‍යන්තරකරණය වෙලා තිබෙනවා. ඒ තත්ත්වයෙන් මිදුණු, ජනවාර්ගිකත්වය නොසලකා සියලු දෙනාට සමානව සලකන සමාජයක් අපි බිහි කරනවා. අපේක්ෂා භංගත්වයෙන් ඉන්නේ නැතිව, 'අපි සියලු දෙනා සමානයි' කියලා හිතන්න පුළුවන්, 'අපි ශ්‍රී ලාංකීය ජාතියයි' කියලා හිතන්න පුළුවන් සමාජයක් අපි හදනවා.

ඉතිහාසයේ පළමුවැනි වතාවට ජාතික ජන බලවේගය තමයි ලංකාවේ මැතිවරණ දිස්ත්‍රික්ක 22න් 21ක් තනි දේශපාලන පක්ෂයක් විධියට ජයග්‍රහණය කළේ. ඒ ජයග්‍රහණයෙන් උදන් අනනවාට වඩා උතුර, නැඟෙනහිර, මධ්‍යම කඳුකරය ඇතුළු සමස්ත රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ආදි වූ සියලු ජනතාව අප කෙරෙහි විශාල බලාපොරොත්තුවක් ඇති කර ගත්තා. අන්න ඒ බලාපොරොත්තුව ඉටු කිරීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මෙන්න මේ සන්දර්භය තුළ අපි දේශපාලන ක්ෂේත්‍රයේ මෙවැනි ප්‍රතිසංස්කරණ ඇති කරලා, නීතියේ ආධිපත්‍යය තහවුරු කරලා "ශ්‍රී ලාංකීය ජාතිය" කියන ඒ අනන්‍යතාව ආරක්ෂා කරගෙන යනකොට විපක්ෂයේ අය විවාදයක් ඉල්ලා මොනවාද කියන්නේ කියලා අපි බැලුවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

පත්තර කෑලි දෙකක තිබුණු කරුණු වගයක් අරගෙන අද ඔවුන් කථා කරනවා. පිට කවරය බලලා තමයි ඔවුන් කථා කරන්නේ. ඊයේ පෙරේදා නිකුත් කළ ලෝක බැංකු වාර්තාවක තිබෙනවා, 2024දී අපේ රටේ දිළිඳු ජනතාව සියයට 24.9යි කියලා. ඒ වාර්තාවේම ඇස්තමේන්තු කරලා තිබෙනවා 2025දී ඒක සියයට 22.3ට අඩු වෙනවා කියලා. සියයට 24 සිට සියයට 22ට අඩු වෙන එක ගැන කියන්නේ නැතිව අර 24.9ට තව ටිකක් එකතු කරලා කියනවා. ඒ වාර්තා හරියට කියවන්න. අපි කියන්නේ නැහැ, අපේ රටේ දිළිඳුකම තුරන් වෙලා කියලා. නමුත් බොරු කියන්න එපා. යථාර්ථය කියන්න.

මම බැලුවා විපක්ෂය තව මොනවාද කියන්නේ කියලා. ඒ අය දැන් කිව්වා, අපි පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 50කින් අඩු කරන බවක් කිව්වා කියලා. මේවා තමයි ඒ අය කියන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2024 ජූලි මාසයේ ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 344යි. අගෝස්තු 31වන විට ඡන්දයක් ප්‍රකාශයට පත් කරලා තිබුණා. සැප්තැම්බර් 21වන දා තමයි ජනාධිපතිවරණය පැවැත්වුණේ. ඡන්දය ප්‍රකාශයට පත් කරලා තිබෙන කොට අගෝස්තු 31වන දා පෙට්‍රල් ලීටරය රුපියල් 344 සිට 332 දක්වා රුපියල් 12කින් අඩු කළා. අද පෙට්‍රල් ලීටරය රුපියල් 299යි. ඉතින්, මිල අඩු වෙලා නැද්ද? එදා ඉඳලා බැලුවත් පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 33කින් අඩු වෙලා තිබෙනවා. විපක්ෂය ඒවා ගැන කියන්නේ නැහැ. අර කොහේදෝ තිබෙන එකක් අරගෙන කථා කරනවා.

ඊළඟට කියනවා, අපි IMF පදයට නටනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා ඒ දවස්වල විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකු විධියට වැඩ කරන කොට, හිටපු ජනාධිපතිවරයාත් එක්ක අපි සාකච්ඡාවකට ගියා, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් පිළිබඳව සාකච්ඡා කරන්න. අපට කිව්වා, ගිහිල්ලා IMF එකත් එක්ක කථා කරන්න කියලා. එහෙම නම්, කවුද IMF එකේ පදයට නැටුවේ? අපට කිව්වා, ගිහින් IMF එකත් එක්ක කථා කරන්න කියලා; IMF එක වෙනස් කිරීම් කරන්න දෙන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප් වැඩි කළා විතරක් නොවෙයි, මුළු රාජ්‍ය සේවකයන්ගේම වැටුප් වැඩි කළා. අපට කිව්වා, ආදායම් බදු සීමාව වෙනස් කරන්න බැහැ කියලා. වාර්ෂික ආදායම් බදු සීමාව රුපියල් ලක්ෂ 12 ලෙසයි තිබුණේ. අපි ඒක රුපියල් ලක්ෂ 18ට ගෙනිච්චා. අපි කියනවා, ඒක තවත් එහාට ගෙන යන්න ඕනෑ කියලා. එසේ කළ යුතු බව අපි දන්නවා. එය ලක්ෂ 24 දක්වා ගෙන යන්න පුළුවන් නම් හොඳයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි වසරක් තුළ ඉහත කී කටයුතු කරලා තිබෙනවා.

ඒ වාගේ තව පට්ටපල් බොරුවක් කිව්වා. සංචාරක ක්ෂේත්‍රයේ වර්ධනය සියයට 2යි කිව්වා. අපි දන්නවා, අපේ රටට සංචාරකයෝ වැඩිපුරම ආවේ 2018 වර්ෂයේදී බව. හැබැයි,

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

පසුගිය අවුරුදු ගණනාව තුළ සම්පූර්ණයෙන්ම මේ ක්ෂේත්‍රය කඩාගෙන වැට්ටුවා. දැන් මේ අස්සේ මොකද වෙලා තිබෙන්නේ? අපේ ඉලක්කය සංචාරකයන් ලක්ෂ 25 දක්වා යන්න. මේ මාස කිහිපය වෙනකොට සියයට 2 නොවෙයි සියයට 20ක වර්ධනයක් තිබෙනවා. බින්දුව අමතක වෙලා. සංඛ්‍යාලේඛන බලන්න. සියයට 20ක වර්ධනයක් තිබෙනවා. නමුත්, සියයට 2යි කියනවා. ජනතාව මේවායෙන් වැටෙන්නේ නැහැ.

සමහර අය දිගින් දිගටම කියන්න උත්සාහ කරනවා අපේ රටේ දරිද්‍රතාව වැඩි වෙලා කියලා. මම අහන්න කැමතියි, දරිද්‍රතාව කියන්නේ මොකක්ද කියලා. ඒ ගැන විවිධ නිර්වචන තිබෙනවා. ඒ නිසා පත්තරේ තිබෙන එක විතරක් කියන්න එපා. බහුමාන දරිද්‍රතාව ගැන කියන්න. ආර්ථික දරිද්‍රතාව ගැන විතරක් කියන්න එපා. ඒ සම්බන්ධයෙන් මම ඉතා වැදගත් නිර්වචනයක් ඉදිරිපත් කරන්න කැමතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අමාර්ත්‍ය සෙන් කියන්නේ සමාජ විද්‍යා ක්ෂේත්‍රයේ ඉතා විශිෂ්ට විද්වතෙක්. ඔහු දරිද්‍රතාව ගැන කියන්නේ මෙන්න මේ විධියට. "දරිද්‍රතාව යනු, පුද්ගලයෙකුට ආත්ම අභිමානයෙන් යුතුව ජීවිතය පවත්වා ගෙන යෑමට තිබිය යුතු ශක්‍යතා නොමැති තත්ත්වයකි." අමාර්ත්‍ය සෙන් එහෙම කියන්නේ, 1979දී. දරිද්‍රතාව තුරන් කිරීමට අපි කරන්න ඕනෑ කුමක්ද? ඒ සඳහා ජනතාවට ආත්ම අභිමානයෙන් යුතුව ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කරන්න ඕනෑ. ඒ පරිසරය නිර්මාණය කිරීම, ඒකට අවශ්‍ය පහසුකම් සැලසීම, ඒ සමාජ තත්ත්ව, ඒ ආර්ථික තත්ත්ව නිර්මාණය කිරීම තමයි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි අපේ කාර්යභාරය. ඒ සඳහා අපි ආර්ථිකය ස්ථාවර කරලා තිබෙනවා. සංචාරක ක්ෂේත්‍රයෙන් වාගේම විදේශ ප්‍රේෂණවලිනුත් සැලකිය යුතු වර්ධනයක් ළඟා කරගෙන තිබෙනවා. ඒ වාගේම ආනයන අපනයන අතර පරතරය අඩු කරලා තිබෙනවා. අපි සාර්ව මට්ටමින් විශාල ජයග්‍රහණ ගණනාවක් ළඟා කරගෙන තිබෙනවා.

අපේ රටේ තවමත් බලාගත යුතු පහළම, දිළිඳු ජන කොටසක් ඉන්නවා. ඔවුන්ට යම් සහනාධාර අවශ්‍යයි. අපි බලයට පත් වුණාට පස්සේ දිළිඳුම ජන කොටස්වලට අවශ්‍ය සහනාධාර ලබා දුන්නා. විශේෂයෙන්ම අපේ රටේ දසලක්ෂයකට ආසන්න වැඩිහිටියන් ප්‍රමාණයකට ඒ වෙනකොටත් දීපු රුපියල් 3,000ක දීමනාව අපි රුපියල් 5,000 දක්වා වැඩි කර දුන්නා. ඒ වාගේම තමයි අස්වැසුම ප්‍රතිලාභය. අපි කිව්වේ, අවමය රුපියල් 10,000ක් දෙනවා කියලා. නමුත්, අද වෙනකොට අපි කාණ්ඩ වශයෙන් රුපියල් 17,500ක් දෙනවා, රුපියල් 15,000ක් දෙනවා, රුපියල් 10,000ක් දෙනවා. සහනාධාර අවශ්‍ය අයට අපි සහනාධාර දෙනවා. අපි බලයට එනකොට ආබාධිත පුද්ගලයන්ට ලැබුණේ, රුපියල් 7,500ක දීමනාවක්. අපි ඒ දීමනාව රුපියල් 10,000ක් දක්වා වැඩි කර ලබා දෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මහපොළ මාසික දීමනාව වශයෙන් ලැබුණේ, රුපියල් 5,000යි. අපි ඒක රුපියල් 7,500ක් කළා. ශිෂ්‍යාධාර දීමනාව තිබුණේ, රුපියල් 4,000යි. අපි ඒක රුපියල් 6,500ක් කළා. මේ විධියට සහනාධාර අවශ්‍ය අයට සහනාධාර ලබා දෙමින් සුබසාධනය අවශ්‍ය අයට සුබසාධනය ලබා දෙමින් - සමාජයේ පහළම ජන කොටස්වලට ඒ තත්ත්වය ඇති කරලා - අපි ආර්ථිකය ස්ථාවර කරගෙන, සාර්ව මට්ටමින් ඇති වෙච්ච ආර්ථික වර්ධනය ක්ෂුද්‍ර මට්ටම දක්වා ගෙන යෑම සඳහා සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම මම වගකීම දරන අමාත්‍යාංශය තුළ අලුතින් ග්‍රාම සංවර්ධන කාර්යාංශයක් ආරම්භ කරලා මේ වෙනකොට දිවයින පුරා ග්‍රාම සංවර්ධන ව්‍යාපෘති 184ක් ආරම්භ කරලා තිබෙනවා. ආර්ථික වශයෙන් නොවෙයි, සමාජයීය වශයෙනුත් ප්‍රජාව සවිබල ගැන්වීමේ දැවැන්ත වැඩ පිළිවෙළක් අපි ආරම්භ කරලා තිබෙනවා. මේ වෙනකොටත් එහි ප්‍රතිඵල අපි ළඟා කරගනිමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රටේ ජනතාව සියවස් ගණනාවක් තිස්සේ දුටුවේ සැබෑ ලෙසම පොහොසත් රටක සිහිනය. ඒ පොහොසත් රට විතරක් නොවෙයි, ඒ පොහොසත් රට තුළ සිටින සියලු ජනතාවගේ ජීවිත ලස්සන කිරීමේ වගකීමත් අපි අරගෙන තිබෙනවා. ඒ සඳහා ඉතාම වැදගත් පියවර කිහිපයක් පසුගිය වසරකට ආසන්න කාලය තුළ අප විසින් ළඟා කරගෙන තිබෙන බව සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බෙහෙවින් ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.25]

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද පැවතුණු විවිධ කථා බහ තුළ අපේ ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා එතුමන්ලා ගැන මොන බොරුද නොකිව්වේ කියලා. එතුමා මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. මේ රට ලොකු අර්බුද ගොඩකට යනවා, තෙල් පෝලිම් ඇති වෙනවා, කන්න නැති වෙනවා, අපේ ස්වාමීන් වහන්සේලාට දානය නැති වෙනවා, පෙරහැර නැති වෙනවා කියලා අපි කියපු බවක් එතුමා කිව්වා. මම නම් ඒවා කිව්වේ නැහැ. මම ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්තිය ප්‍රකාශය කියෙව්වා. මම කිව්වා, මේ පොත මිනිස්සුන්ට කියවන්න දෙන්න, කියෙව්වොත් ඡන්දය දෙන්නේ නැහැ කියලා. අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු වේදිකාවලදී එහෙම කිව්වේ, ඔබතුමන්ලා සමාජවාදී මාක්ස්වාදී ගමනක යන්න හදන්නේ කියලා එතුමන්ලා අවංකව හිතුව නිසා. නමුත් මම පැහැදිලි කරලා දුන්නා, ඒක එහෙම දෙයක් නොවෙයි කියලා. ගරු ලාල් කාන්ත ඇමතිතුමා "ද්විසටනාත්මක භෞතිකවාදය" කියන කල්‍යානන්ද තිරාණගම මහතාගේ පොත තමයි කියවලා තිබෙන්නේ. දැන් ඒ මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් කියපු දේ පවා දේශීය විධියට අනුවර්තනය වෙලා තිබෙනවා. ඔබතුමන්ලා තමයි කිව්වේ, බෝධි වන්දනාව බොහොම සාම්ප්‍රදායික වැඩක්, ඒක මෝඩ වැඩක් කියලා. ඒවා කිව්වාම තමයි විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා භය වුණේ. හැබැයි, එහෙම වෙන්න හේතුවක් නැත්තේ ඇයි? මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම අකුරට ඉටු කරන බව පැහැදිලි වෙමින් පවතින්නේ, මේ පොතේ දක්වා ඇති අයුරින්ම අපේ රටේ භෞමික අඛණ්ඩතාව හා ඒකීයත්වය පිළිබඳ එතුමන්ලාගේ අද ස්ථාවරය දිහා බැලුවාමයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අද මහත් සේ කනගාටු වෙනවා. අපේ විදේශ ඇමතිවරයා වන හේරත් මුදියන්සේලාගේ විජිත හේරත් කියන්නේ හොඳ සම්භවයක් තිබෙන, ශ්‍රී ලාංකික සංස්කෘතිය, සභ්‍යත්වය ගැන විශ්වාසයක් තිබෙන පවුලකින් පැවත එන කෙනෙක්. එතුමා අද පාර්ලිමේන්තුවේදී කියපු කරුණු අතර මෙහෙම දෙයක් කිව්වා. "අපි ජිනීවාවල පැවති 60වැනි සැසියේදී එම මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද A/HRC/60/L.1/Rev.1 යෝජනාවේ තිබෙන ඒ කරුණුවලට ඡන්දයක් ඉල්ලුවේ නැත්තේ අපට එහෙම ඡන්දයක් ඉල්ලා වැඩක් නැති නිසා" කියලා එතුමා කිව්වා. හැබැයි,

හිමාලි අරුණතිලක මැතිනියගේ ප්‍රකාශය තිබෙනවා. ඒකේ කියනවා, මේක බරපතළ තත්ත්වයක් කියලා. මේ බරපතළ තත්ත්වයට අපි විරුද්ධයි. අපි විරුද්ධ නම් ඒ සඳහා කළ යුත්තේ කුමක්ද? අපි වෙනුවෙන් කථා කළා, විනය. අපි වෙනුවෙන් කථා කළා, කියුබාව. අඩුම ගණනේ අපි ඡන්දයක් ඉල්ලුවා නම්, ඡන්දයෙන් දිනන්නට නොවෙයි, අපේ ඒ ප්‍රකාශනය ඉදිරිපත් කරන්නට තිබුණා.

මම දන්නවා, විටින් විට විවිධ දේශපාලන පක්ෂ මේ ජීනීවා පිළිබඳ විවිධ මත දරා තිබෙන බව හා විවිධ විධියට භාවිත කර තිබෙන බව. නමුත්, ඊට එහාට ගිය කාරණයක් අද මෙහිදී තහවුරු වුණා. විශේෂයෙන්ම අපේ විදේශ අමාත්‍යවරයා අද කිව්වා, ස්වාධීන අභිචෝදක කාර්යාලයක් දමන්න ඉඩ දෙනවා කියලා. ඒ මොකටද ස්වාධීන අභිචෝදක කාර්යාලයක් දමන්නේ? අපේ නීතිපති දෙපාර්තමේන්තුව ගැන විශ්වාසයක් නැද්ද? අපේ රටේ දැනට පවතින නීති පද්ධතිය ගැන විශ්වාසයක් නැද්ද? මෙන්න මේක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. අපේ ආදරණීය ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනි, මම ඔබට එකක් කියන්නම්. කරුණාකරලා හෘදය සාක්ෂියට එකඟ වෙන්න. අපි ඔක්කොම නිදහස් අධ්‍යාපනයෙන් මෙතැනට ආපු අය. ආචාර්ය, මහාචාර්ය තනතුරු තිබුණත් නැතත් ඔබ කොහොම හරි නිදහස් අධ්‍යාපනයෙන් ආපු අය. ඔබ ගමේ ඉපැදිලා, ගමේ මිනිස්සුන්ගේ ඡන්දයෙන් ආපු අය. ඔබට වගකීමක් තිබෙනවා, මේ රට මෙතරම් අනතුරුදායක තත්ත්වයකට පත් වෙනකොට හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන්නට. ඔබට පෙනෙන්නට ඕනෑ, මේ වෙන්න යන්නේ කුමක්ද කියලා. ඔබට පෙනෙන්නට ඕනෑ, ඔබත් අපිත් සියලුදෙනා ජාති, ආගම් භේදයකින් තොරව ජීවත් වන, මේ සාමකාමී ශ්‍රී ලංකාව බිහි කරන්න විශාල කැප කිරීමකින් කටයුතු කළ, ඔබ සෙබළුන් හැටියට හඳුන්වන, අපි රණවිරුවන් හැටියට දකින ඔවුන්ට හා ඔවුන්ගේ පවුල්වලට අනාගතයේදී අත් විය හැකි ඉරණම. මේ යෝජනාවලිය හරහා අපට ඉදිරියේදී මුහුණදීමට සිදු වන තත්ත්වයේ බරපතළකම ඔබ සුළු කොට තකනවා නම්, මම ඉතා කනගාටු වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මේ රටේ සිංහල, දෙමළ, බර්ගර්, මුස්ලිම් ඒ කවුරු හෝ වේවා, අපට අවශ්‍යයි නිදහස් ශ්‍රී ලංකාවක්. මේ නිදහස් ශ්‍රී ලංකාවට කිසිම කෙනෙකුට බලපෑම් කරන්නට අපි ඉඩ තබන්න නරකයි. අපේ අතින් අඩුපාඩු වෙලා තිබෙනවා නම්, ඒවා විසඳා ගන්නට අපි තවදුරටත් සාකච්ඡා කරන්නට ඕනෑ. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි අපේ අනන්‍යතාව සම්පූර්ණයෙන් පාවා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙලා තිබෙන්නේ වෙන මොකුත් නොවෙයි. අද තිබෙන්නේ අවාසනාවන්ත, රූකඩ ආණ්ඩුවක්. මේ regime change කියන සංකල්පය යටතේ ලෝකය පුරා රූකඩ ආණ්ඩු හදලා තිබෙනවා. ඉතාම දුර්වල ආණ්ඩු නිර්මාණය කරලා තිබෙනවා. අතිශය දුර්වල ආණ්ඩුවක් අපි නිර්මාණය කරගෙන තිබෙනවා. කොටින්ම කිව්වොත්, අපට විශ්වාසයක් තිබුණේ නැහැ, ඡන්දයක් ඉල්ලන්නට. ඇයි? අපි BRICS එකට ගියේ නැහැ. අපි ෂැංහයි සමුළුවට ගියේ නැහැ. අපට අද මිත්‍රයෝ නැහැ. අපි අද ගමේ කරන දේශපාලනය කරන්න යනවා, රටවල් එක්ක. රටවල් එක්ක ගනුදෙනු කරන්නට අපට තිබුණු ජාතික පෞරුෂත්වය, අපේ රටට හිමි වෙලා තිබුණු, ශිෂ්ටාචාරයකින් උරුම කරගෙන තිබුණු පෞරුෂත්වය පාවා දීලා, අද අපි විශ්වාසයක් නැති ජාතියක් බවට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ කොතරම් අවාසනාවන්ත තත්ත්වයක්ද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැම තිස්සේම ලැබෙන්නේ විනාඩි දෙකයි. ඒ විනාඩි දෙක තුළ-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිතව තිබෙන කාලයේ අවසන් විනාඩි දෙක.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
පෝල් කගාමේ, මාර්ටින් ලූතර් කිං වැනි පුද්ගලයන්ගේ ප්‍රකාශ තමයි අද අපේ ගරු ජනාධිපතිතුමා ගිහිල්ලා උපුටා දක්වන්නේ. මම අද උදේ සහභාගි වුණා, දේව මෙහෙයකට. එම දේව මෙහෙයේදී අපේ කාදිනල් උන්නාන්සේ කළ ප්‍රකාශයක් උපුටා දක්වන්නට මම කැමැතියි. උන්නාන්සේ ප්‍රකාශ කළා, "අද අප සියලුදෙනා ශීලාචාරයි, ශිෂ්ට සම්පන්නයි කියලා කියන බොහෝ දේ මෙන්න මේ උරුමයෙන් අපට ඇවිල්ලා තිබෙන දේවල් ලෙස අපි සලකන්නට ඕනෑ. ඒ නිසා ප්‍රගතිය කියලා කියන වචනයත් සමඟ මේ සංස්කෘතිය, මේ සභ්‍යත්වය අනිවාර්යයෙන්ම අත්වැල් බැඳගෙන ගමනක් යා යුතුයි. අපට උරුම නැති බාහිර සංස්කෘතීන් හා සභ්‍යත්වයන්ගෙන් යහපත් දේ තෝරා බේරා ගැනීමට අපි දැන ගත යුතුයි. ප්‍රගතිය කියලා කියන්නේ, අනුන් අනුකරණය කිරීම නොවෙයි. තමන්ට සුදුසු දේ කියන දේ තෝරා බේරා ගෙන, තමන්ගේ රටට ප්‍රගතිය සඳහා වන දෙයක් තිබෙනවා නම් ඒ දේ තේරුම් බේරුම් කරගෙන මේ රට තුළ ඒවා ක්‍රියාත්මක කිරීම සියලුදෙනාගේම වගකීමක්. මේක දේශපාලන නායකත්වයේ වගකීමක් නොවෙයි. මේක මුළු රටේම වගකීමක්" කියලා. ඊට පසුව උන්නාන්සේගේ ප්‍රකාශය මෙන්න මේ විධියට අවසන් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. "ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වහලුන් විය යුතු වන්නේ නැහැ. මේ රටේ ජනතාවගේ පවතින ඒ විශාල දරිද්‍රතාව ඔවුන්ට වැටහෙන්නේ නැහැ. ජාත්‍යන්තර වශයෙන් අද ලෝකය තුළ පැතිරිලා තිබෙන ආර්ථික ක්‍රමවේදයේ යම් යම් ලාභ ප්‍රයෝජන ලබා ගත් රටවල මුදල් ආයෝජනය කිරීමෙන් තමයි ඒ බැංකු නිර්මාණය වෙලා තිබෙන්නේ. එහෙම නම් ඒ ධනවත් රටවල ආකල්පවලට අනුව අපි ණය ලබාගෙන, ඒ රටවල වහලුන් බවට පත් විය යුතු වන්නේ නැහැ. මේ රටේ අපටත් ආත්ම ගරුත්වයක් කියලා එකක් තිබෙනවා..."

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම හිතන විධියට එය ඓතිහාසික ප්‍රකාශයක්. අපේ අගරදගුරු මැල්කම් රංජිත් කාදිනල්තුමාගේ ඒ සම්පූර්ණ ප්‍රකාශය මම **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජීනිවාහිදී අපට අත්කර දුන් මේ තත්ත්වයට මේ රටේ සියලු ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් මෙතුමන්ලා සම්පූර්ණයෙන්ම වග කියන්නට ඕනෑ බව අවසාන වශයෙන් ප්‍රකාශ කරමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.34]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විනාඩි දෙකක් ඉල්ලා ගත්තේ ඉතාම වැදගත් කාරණයක් කියන්න. මේ මගේ අතේ තිබෙන්නේ, 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම් පනත. ඊට අදාළ පනත් කෙටුම්පත සම්මත වුණේ, 2018 ජූනි මාසයේ 21වැනි දා. ඒ පනතේ පරමාර්ථය වුණේ, 1990 සුවසැරිය පදනම ස්ථාපනය කිරීම. ඒකෙන් බලාපොරොත්තු වුණේ, මේ රටේ ඕනෑම තැනැත්තෙකුට පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක්, හදිසි ප්‍රතිකාර සේවාවක් නොමිලේ සැපයීම. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒකට නිශ්චිත පරමාර්ථයක් තිබුණා. ඒ නිශ්චිත පරමාර්ථය පිළිබඳව මේ පනතේ ඉතාම පැහැදිලිව කියා තිබෙනවා. මෙය පූර්ව රෝහල් ප්‍රතිකාර ගිලන් රථ සේවාවක්. ඒකට logo එකක් තිබෙනවා. මේ මගේ අතේ තිබෙන්නේ ඒ logo එකේ පින්තූරයක්. අද වන විට මේ රටේ සියලුදෙනා තමන්ට කරදරයක් වුණාම - ලෙඩක්, දුකක් වුණාම - 1990 සුවසැරිය ගිලන් රථ සේවයට කථා කරනවා. අද රටේ ජනතාව වැඩිපුරම ආදරය කරන සේවාව, 1990 සුවසැරිය ගිලන් රථ සේවාව. ඒ කෙරෙහි ජනතාව තුළ ලොකු ගරුත්වයක් තිබෙනවා; විශ්වාසයක් තිබෙනවා. පැය 24ම එය වැඩ කරනවා. මේක එක දවසකට කිලෝමීටර 28,000ක් යනවා, 1,050ක් පමණ දෙනෙක් ඉස්පිරිතාලෙට අරගෙන යනවා. අද වන විට මේ රටේ ජනතාවගෙන් මිලියන 2.5කට මේ සේවාව ලබා දීලා තිබෙනවා. නමුත් කනගාටුවෙන් වුණත් මට අද මේ කාරණය කියන්න සිද්ධ වෙලා තිබෙනවා. මෙච්චර කල් මම මේ ගැන කථා කළේ නැහැ. නමුත් මම කියන්න ඕනෑ, දැන් ඒ කට්ටියට directive එකක් දීලා තිබෙන බව, ඒක වෙනස් කරන්න කියලා; "සුවසැරිය" කියන එක අයින් කරන්න කියලා. මම මේ පින්තූර දෙක **සභාගත*** කරනවා.

"1990 සුවසැරිය" කියන වචන අයින් කරන්න කියලා තිබෙනවා. ඒකේ පාට වෙනස් කරන්න කියලා තිබෙනවා. මොකක්ද මේ කරන්නේ? ඇයි මෙහෙම කරන්නේ? ඔයගොල්ලන්ගේ පාට දමන්න කියලා තිබෙනවා. "සුවසැරිය" කියන එක අයින් කරන්න කියලා තිබෙනවා. අපි මේක ගෙනාවේ යම් වැඩකට. ඒක තමයි, පූර්ව රෝහල් ප්‍රතිකාර සේවාව; that is a pre-hospital care service. හදිසි ගිලන් රථ සේවාවක් නොවෙයි, මේක. ඒකට නොවෙයි අපි මේක ගෙනාවේ. මෙය පූර්ව රෝහල් - pre-hospital - ප්‍රතිකාර සේවාවක් සඳහා තිබෙන්නේ. ඒ නිසා මම ඉතා ඕනෑකමින් ඉල්ලනවා, මේක විනාශ කරන්න එපා කියලා. අද රටේ ජනතාව ආදරේ කරන සේවාව, මේක. ඔයගොල්ලන් 76 වසරක ශාපයක් ගැන කොච්චර කිව්වත්, මේවාත් මේ රටේ සිද්ධ වුණා.

මට විනාඩි දෙකයි දුන්නේ. මම තව එක කාරණයක් කියන්න ඕනෑ. මේකේ නිර්මාතෘ හැටියට මම කියන්නේ, කරුණාකරලා මේ වාගේ දේවල් කරන්න එපා. මේවා වෙනස් කරන්න එපා. මේවා කරගෙන යන්න. අපි කකුලෙන් අදින්නේ නැහැ. විපක්ෂයේ හිටියත් හැම දාම මේකට අපි ආශිර්වාද කරනවා. මේ සේවාවේ වැඩ කරන අයට අපේ සම්පූර්ණ ගෞරවය තිබෙනවා. ඕනෑම අවස්ථාවක අපි මේ සඳහා උදවු කරන්න කැමැතියි. මේවා වෙනස් කරන්න එපා. එහෙම වෙනස් කරනවා නම් ඔයගොල්ලන් පාර්ලිමේන්තුවට amendment එකක් ගෙනෙන්න. Amendment එකක් ගෙනැල්ලා මේ පනත වෙනස් කරන්න. පනත වෙනස් කරන්නේ නැතිව මේක වෙනස් කරන්න එපා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.37]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන් 2010න් පස්සේ අපේ රට තුළ නිතරම ඇසුණු ගීතයක් තමයි, "රට අනතුරේ" කියන එක. "අපේ රණ විරුවෝ අනතුරේ" කිව්වා. මේ සින්දුව තමයි ඔවුන් දිගින් දිගටම තමන්ගේ බලය ලබා ගැනීම වෙනුවෙන් පාවිච්චි කළේ. ජනතාව තුළ බිය ඇති කළා. යුද්ධයෙන් පස්සේ අපි බලාපොරොත්තු වෙච්ච දේ තමයි, අවිශ්වාසය වෙනුවට ජනතාව අතර විශ්වාසය ගොඩ නහලා, ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් සපයලා, ඒ හරහා රට ගොඩ නඟයි කියන එක. ඒ බලාපොරොත්තුවත් එක්ක තමයි මේ රටේ ජනතාව හිටියේ. හැබැයි, තමන්ගේ නාළිකාවන් පාවිච්චි කරලා, රට අනතුරක තිබෙන්නේ, රට විනාශයකට යන්නේ කියන පණිවුඩය හැම විටම මේ රටේ ජනතාවට කිය කියා ඒගොල්ලන්ම තමයි මේ රට විනාශ කළේ. ඒගොල්ලන් මතු කරන දේ තමයි, දුර්වල ආණ්ඩුවක් තමයි හැදිලා තිබෙන්නේ කියන එක.

ඒගොල්ලන් 2019-2020 කාලයේදී ලෝකයේ ප්‍රබලම ආණ්ඩුව හදලා අපේ රටේ මිනිස්සු පෝලිම්වල මැරෙන තත්ත්වයකට පත් කළා. ලජ්ජයි! තමන් ශක්තිමත් ආණ්ඩුවක් හදන්න නායකත්වය ලබා දෙන්න සූදානම් වාගේ පණිවුඩ දෙන අය තමයි මේ රටේ සමගිය විනාශ කළේ, මේ රටේ සංවර්ධනය

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

විනාශ කළේ. මේ රටේ සියල්ල විනාශ කරපු අය වීරයෝ වාගේ කියනවා, අද අපි ජාත්‍යන්තරය ඉදිරියේ කොන් වෙලා ලු. නමුත්, අද වනකොට ජාත්‍යන්තරය තුළ අපි ගැන විශාල පැහැදීමක් ඇති වෙලා තිබෙනවා. ජාත්‍යන්තරය තුළින් අපට ස්වර්ණමය පණිවුඩයක් ලැබී තිබෙනවා. ඒ තමයි, ජාතීන් අතර වූ විශ්වාසය නැවත ගොඩ නඟන්න පුළුවන් හොඳම ආණ්ඩුව බිහි වෙලා තිබෙන බවට වූ පණිවුඩය.

මේගොල්ලන් නැවත නැවතත් ජනතාවගෙන් තමන්ට ඡන්දය ලබා ගන්න උත්සාහ කරන්නේ බිය ජනිත කිරීමෙන්. මම හිතන විධියට ව්‍යවසායකත්වයෙන් රට ගොඩ නඟන්න නම්, විශ්වසනීයත්වය මුලින්ම රට තුළ ගොඩ නඟන්න ඕනෑ. විශ්වසනීයත්වය ගොඩ නඟන්නේ නැතිව අවිශ්වාසය ගොඩ නඟලා මේ රට කවදාවත් යහපත් තැනකට පත් කරන්න අපට බැරි වෙනවා. අපි බලය ලබාගෙන දැනට අවුරුද්දක් වෙනවා. நாங்கள் அதிகாரத்தைப் பெற்று ஒரு வருடமாகின்றது. நாங்கள் அரசாங்கத்தைப் பொறுப்பெடுக்கின்றபோது, அபிவிருத்தி தடைப்பட்ட நாடாகவல்ல, அபிவிருத்தி முடக்கப்பட்ட ஒரு நாடாகவே இந்த நாடு காணப்பட்டது என்பது உங்களுக்குத் தெரியும். 2015க்குப் பின்பு இந்த நாட்டில் பாரிய அபிவிருத்தித் திட்டங்கள் எதுவும் மேற்கொள்ளப்படாத நிலை காணப்பட்டது. நாட்டில் நிறுத்தப்பட்டு அல்லது முடக்கப்பட்டு இருந்த பல்வேறு அபிவிருத்தித் திட்டங்களை குறுகிய காலத்துக்குள் நாங்கள் மீண்டும் ஆரம்பித்திருக்கிறோம்.

குறிப்பாக, கடவத்தை - மீரிகம மத்திய அதிவேக நெடுஞ் சாலைப் பணிகளை ஆரம்பித்திருக்கின்றோம். அதேபோன்று, பெரும்பாலான பாடசாலைகள் கட்டிட வசதிகளின்றி பல ஆண்டுகளாக இயங்கி வந்தன. அந்த வகையில், நிறுத்தப் பட்டிருந்த அக்கட்டிடப் பணிகளை எமது அரசாங்கத்தினூடாக மீண்டும் ஆரம்பிக்கக்கூடியதாக இருந்தது. அத்தோடு, சுகாதார தேவைகளுக்காகவும் மாணவர்கள் கற்றல் உபகரணங்களைப் பெறுவதற்காகவும் எமது முதல் வரவு செலவுத்திட்டத்தினூடாக நிதி ஒதுக்கியிருந்தோம். இப்படியான நிலையில், இன்று சிலர் எமது அரசாங்கம் என்ன செய்கின்றதென எம்மிடம் கேட்கின்றார்கள். எமது நாட்டில் உள்ளவர்கள் மாத்திரமல்ல, வெளிநாடுகளில் வாழ்கின்ற இலங்கையர்களும் இன்று எம்மிடம் சொல்கின்றார்கள், இந்நாடு இந்த அரசாங்கத்திடம் வந்திருக்காது விட்டால், இது 'ஐஸ்லாந்தாக' மாறியிருக்கும் என்று. அதாவது, இந்த நாடு போதைப்பொருள் வியாபாரிகளின் இராச்சியமாக மாறியிருக்கும். அதாவது, போதைபொருள் வியாபாரிகளின் சுகபோக இடமாக மாறியிருக்கும். பாடசாலை மாணவர்கள் மட்டுமல்லாது, மாணவிகளும் போதைப்பொருள் பாவனைக்கு அடிமையாகி இருப்பார்கள். வடக்கு, கிழக்கு, தெற்கு உட்பட நாடு பூராவும் உள்ளவர்கள் போதைப்பொருள் பாவனைக்கு அடிமைப் படுவதற்கு ஒத்துழைப்பை வழங்கி, அதற்கான பாதுகாப்பை வழங்கி கடந்த அரசாங்கத்தில் இருந்துகொண்டு அதனைப் போசித்தவர்கள் இன்று இந்த அரசாங்கம் என்ன செய்கின்றதென்ற கேள்வியை எம்மிடம் கேட்கின்றார்கள். பிடிபடுகின்ற போதைப்பொருட்கள் நாட்டில் பாவனைக்கு வந்திருந்தால், இந்த நாடு எந்த நிலைக்கு இன்று சென்றிருக்கும்!

இன்று இந்த நாட்டில் பல்வேறு தொழிற்சாலைகள் உருவாக்கப்பட்டு இருக்கின்றன. ஆனால், கடந்த காலத்தில் இருந்த அரசாங்கங்கள் உருவாக்கியது 'ஐஸ்' தொழிற் சாலையைத்தான். பாதாள உலகத்தினரைப் பலப்படுத்தி, பாதுகாத்து தமது அரசியல் தேவைக்காகப் பயன்படுத்திய நிலைமை இந்த அரசாங்கத்தின் ஒரு வருட காலத்துக்குள் மாறியிருக்கின்றது என்பதை எம்மால் சொல்ல முடியும். அத்துடன், ஊழல் மற்றும் இலஞ்சம் சம்பந்தமான விடயங்கள் பற்றி இங்கே குறிப்பிட வேண்டும். இன்று எமக்கு ஆதரவளிக்காத, எமக்கு வாக்களிக்காத, நேர்மையாகவும் நியாயமாகவும் சிந்திக்கின்ற இந்த நாட்டின் பிரஜைகள் எம்மிடம் சொல்கின்றார்கள், உண்மையிலேயே தற்போது இந்த நாட்டில் ஊழல், இலஞ்சம் என்பன குறைந்து வருகின்ற தென்று. என்றாலும், அவை முற்றாக ஒழிக்கப்படவில்லை. அவை ஒழிக்கப்பட வேண்டும். அவற்றை முற்றாக ஒழிப்பதனூடாகத்தான் எமது கொள்கைப் பிரகடனத்தில் குறிப்பிட்டு இருப்பதைப் போன்று, "வளமான நாடு - அழகான வாழ்க்கை" என்பதை நோக்கிப் பயணிக்க முடியும். அந்தப் பயணத்துக்கான முதற்கட்ட நடவடிக்கையைத்தான் நாங்கள் இந்தச் செயற்பாட்டினூடாக மேற்கொண்டு வருகின்றோம்.

கடந்த கால அரசாங்கங்கள் மக்களுடைய சொத்துக்களை வீணாக, பிழையாகப் பயன்படுத்தின என்பதை இன்று மக்கள் நன்கு உணர்ந்திருக்கிறார்கள். தங்களது சுகபோகத்துக்காக பிழையான வழிமுறைகளைப் பயன்படுத்தி மக்களின் சொத்துக்களை கடந்த அரசாங்கத்தில் இருந்தவர்கள் எவ்வாறு சூறையாடி இருக்கிறார்கள் என்பது இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர் மிகத் தெளிவாக விளங்குகின்றது. இன்றைய அரசாங்கத்தினர் ஊழலில் ஈடுபடுகின்றார்கள், மக்கள் சொத்தைப் பிழையாகப் பயன்படுத்துகின்றார்கள், அநியாயமாக அவற்றை வீண்விரயம் செய்கின்றார்கள் என்ற குற்றச்சாட்டை யாரும் சுமத்தவில்லை. அத்தகையதொரு நல்ல அரசியல் கலாசாரத்தை எம்மால் இந்த நாட்டிலே உருவாக்க முடியுமாக இருக்கின்றது. அதேபோன்று, இன்னொரு விடயத்தையும் குறிப்பிட வேண்டும். பொதுவாக, கடந்த காலங்களில் இருந்த ஆட்சியாளர்கள் ஆட்சிக்கு வந்ததன் பின்னர் தமது பதவிகளைத் தக்கவைத்துக் கொள்வதற்காகத் தொடர்ந்தும் இனவாதத்தைப் போஷித்து, அதற்குப் பக்கபலமாக இருந்து, அதற்குத் துணைபோனார்கள் என்பது உங்களுக்குத் தெரியும். இந்த அரசாங்கம் இனவாதத்தைப் போஷிக்கின்ற நடவடிக்கையை எந்தவொரு சந்தர்ப்பத்திலும் செய்யவில்லை என்பதைக் குறிப்பிட்டுச் சொல்லலாம்.

மேலும், இன்று எமது அரசாங்கம் பல்வேறு அபிவிருத்தித் திட்டங்களைத் தொடர்ந்தும் செய்தவண்ணம் இருக்கின்றது. இலங்கையிலுள்ள பிரபல்யமான பத்திரிகை ஒன்று 2025.07.23ஆம் திகதி தனது பத்திரிகைச் செய்தியினூடாக, இந்த அரசு நாட்டின் வருமானத்தை அதிகரிக்கும் நடவடிக்கைகளைச் செய்து வருகின்றது என்று தெளிவாகக் குறிப்பிட்டிருந்தது. அதேபோன்று, ஏற்றுமதித் துறையில், சேவைகளை வழங்குகின்ற துறையில் ஒரு வளர்ச்சியை இந்த அரசாங்கம் தொடர்ந்தும் காண்பித்து வருகின்றது. அதுமாத்திரமன்றி, எதிர்க்கட்சி உறுப்பினர் குறிப்பிட்டது போன்று சுற்றுலாத்துறையில் சிறந்ததொரு வளர்ச்சியை இந்த அரசாங்கம் கண்டு வருகின்றது. சுற்றுலாத்துறையை வலுப்படுத்தி, அத்துறையிலுள்ளவர்களை உற்சாகப்படுத்தி அதன் வளர்ச்சிக்கான பல்வேறுபட்ட புதிய திட்டங்களை எமது அரசாங்கம் முன்வைத்து வருகின்றது. அந்த வகையில், அண்மையில் பிரதான சுற்றுலாத்தலங்களை இணைக்கும் நோக்குடன் 'ருஹுனுறிங்' என்ற புதிய திட்டத்தை எம்மால் அறிமுகப்படுத்த முடியுமாக இருந்தது. அது மாத்திரமல்ல, மாண்புமிகு சனாதிபதி அவர்கள் பதவியேற்று ஒரு வருட பூர்த்தியின்போது வடக்கிலிருந்து அபிவிருத்திச் செயற் பாடுகளை ஆரம்பிப்பதற்கான ஏற்பாடுகளை மேற் கொண்டிருந்தார். பல்துறை சார்ந்த விடயங்களில் இன்னும் வளர்ச்சியை நோக்கிச் செல்ல வேண்டும் என்பதை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம்.

[ගරු මුනීර් මුලාෆර් මහතා ]

පසුගිය මැතිවරණ කාලයේදී, අපේ ආණ්ඩුවක් ආවොත් මෙහෙම වෙයි කියලා සමහරු අනාවැකි කියා තිබුණු බව අපි දන්නවා. ඒ කියපු අනාවැකි මේ සභාව තුළ නැවත නැවතත් මතක් කළා. ජනතාව තුළ විශාල බියක් ඇති කළා, අපේ ආණ්ඩුවක් ආවොත් ජනතාව පීඩාවට පත් වෙයි කියලා. හැබැයි, මේ ආණ්ඩුව පත් නොවුණා නම් මත්ද්‍රව්‍ය, පාතාලය, සමාජ විරෝධී දේවල් විශාල ලෙස සමාජගත වෙලා මේ සමාජය විනාශ මුඛයටම යන්න තිබුණා නේද කියන ප්‍රශ්නය තමයි අද ජනතාව අහන්නේ. ඒ අනුව ශ්‍රී ලාංකිකයන් ලෙස අපි හැමකෙනාටම වගකීමක් තිබෙනවා, ඒ සමාජ විරෝධී ලේබල්වලින්, ඒ උවදුරුවලින් මේ රට බේරාගෙන, ලස්සන ජීවිතයක් ගොඩනහන ගමන සමඟ අත්වැල් බැඳගෙන යන්න.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.49]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වර්තමාන ජනාධිපතිතුමා පත් වෙලා වසරක් සම්පූර්ණ වෙලා, පාර්ලිමේන්තු මහ මැතිවරණය අවසන් වෙලා වසරක් පිරෙන්න ඔන්න මෙන්න කියා තිබියදී මැතිවරණයට ඉස්සෙල්ලා ජනතාවට දුන්නු ආකර්ෂණීය පොරොන්දුවලින් තවමත් ඉෂ්ට කර ගන්න බැරි වුණු ඒවා රජයට මතක් කර දීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ගෙනා මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් ස්වල්පයක් එකතු කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපි මේ සභාව කල් තබන අවස්ථාවේ විවාදය පවත්වන මොහොත වනවිට ලංකා ඉතිහාසයේ තනි දේශපාලන ව්‍යාපාරයක් සඳහා ලැබුණු විශාලතම ජන වරමට වසරක් ගත වෙලා තිබෙනවා. මේ ජන වරම ලබා ගන්නට ජාතික ජන බලවේගය ජනතාවට කප්පරක් පොරොන්දු දුන් බව අපට මතකයි. පසුගිය මැතිවරණයේදී ජාතික ජන බලවේගය "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ආකර්ෂණීය පොරොන්දු රොත්තක් ලබා දුන්නා. තමුන්නාන්සේලා රට හමුවේ තබපු මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් දුන්නු පොරොන්දු සහ කරනවා කියපු නොයෙක් ක්‍රියාකාරකම් දිහා බලනකොට, 1,300ක් විතර පොරොන්දු මේ පොත තුළ අඩංගු කරලා තිබෙනවා. ඒ පොරොන්දු ඉටු කරන්න "රට අනුරට දෙන්න" කියලා ජනාධිපතිවරණයේදී රට වටේ ගිහින් කිව්වා. ඊට පස්සේ මහ මැතිවරණයේදී මොකක්ද කිව්වේ? මාලිමාව රට වටේ ගිහින් කිව්වා, මේ මැතිවරණයේදී දියවන්නාව සුද්ද කරන්න ඕනෑ කියලා. වල් පැළ වෙනුවට මල් පැළ ගේන්න කියලා ජනතාවට යෝජනා කළා. අන්තිමට ජනතාව ලොවෙත් නැති බලයක් ලබා දීලා, මල් වත්තක්ම දියවන්නාවට එවන්න කටයුතු කළේ රටම ලස්සන කරයි කියන විශ්වාසය ඇතුවයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් ඒ මල් වත්තට වසරක් ගත වෙනකොට දැන් මල් පැළ අතරින් වල් පැළත් මතු වෙන්න පටන්ගෙන තිබෙනවා. "පුදන කොටම කාපි යකා" කියන්නා වාගේ, ආණ්ඩුව පත් කළ පළමුවෙනි තනතුරේදීම මොකක්ද වුණේ? මේ ආණ්ඩුව පත් කළ පළමුවෙනි තනතුර තමයි, කථානායක තනතුර. මේ මල් වත්තේ මුල් පුටුවේ වාඩි කෙරෙව්වා කථානායකවරයෙක්. ඒ වෙලාවේ කථානායකවරයාගේ අධ්‍යාපන සුදුසුකම් කියන්න ගිහින් ඇනගත්තා. අන්තිමට සහතිකයත්, තනතුරත් දෙකම නැති වෙලා එතුමා දැන් මේ සභාවේ ඉන්න හැටි අපි දකිනවා.

මේ රජය ජනතාවට දුන්නු ආකර්ෂණීය පොරොන්දුවක් තමයි, ඉන්ධනවලට පනවන අසාධාරණ බදු ඉවත් කරනවා කියන එක. ඇමතිතුමාගේ සාක්කුවට පෙට්‍රල් ලීටරයකින් රුපියල් 50ක් යනවා, ඒක නතර කරලා පෙට්‍රල් ලීටරයක් රුපියල් 150කට දෙනවා කියලා ජනතාවට පොරොන්දුවක් ලබා දුන්නා. ආණ්ඩුවට අවුරුද්දක් වුණත් අද ලංකාවේ කොහේවත් පිරවුම් හලක අපට පෙට්‍රල් ලීටරයක් රුපියල් 150ට දකින්න නැහැ. මැතිවරණ වේදිකාවේදී ජනාධිපතිතුමා කිව්වා, විදුලි බිල සියයට 30කින් අඩු කරන හැටි. ජනාධිපතිතුමාම කිව්වා, රුපියල් 9,000 විදුලි බිල මෙන්න මේ ගාණ කරනවා, රුපියල් 6,000 නම් බිල මේ ගාණයි වෙන්නේ කියලා. ජනතාවට චිත්‍රයක් මවලා පෙන්වූවා, විදුලි බිල අඩු වෙන හැටි. ඔන්න දැන් නැවත විදුලි බිල සියයට 6කින් විතර වැඩි කරන්න මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අවසරය ඉල්ලා තිබෙනවා.

ඊළඟට, පළමු අය වැයෙන්ම අත්‍යවශ්‍ය භාණ්ඩ මත පනවා තිබෙන වැට් එක අඩු කරනවා කියලා පොරොන්දු වුණා. ඒ වාගේම පාසල් උපකරණ මත පනවා තිබෙන වැට් එක සම්පූර්ණයෙන්ම ඉවත් කරනවා කියලා පොරොන්දුවක් දුන්නා. කෘෂි උපකරණ මත පනවා තිබෙන වැට් එක zero කරනවා කියලා කිව්ව හැටිත් අපට මතකයි. මේ විධියට දරුවෝයි, ගොවියෝයි විතරක් නොවෙයි, පංච මහා බලවේගයම රවටපු හැටි අපට මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පෙනෙන්න තිබෙනවා.

ගොවි ජනතාවට කිව්වා, "රටින් හාල් ගෙන්වලා දෙන්න නම් ආණ්ඩුවක් මොකටද? ඒක කරන්න නම් පිටකොටුවේ මුදලාලි කෙනෙකුටත් පුළුවන් නේ" කියලා. එක හාල් ඇටයක්වත් පිට රටින් ගේන්නේ නැහැ කියලා බලයට ආපු මේ ආණ්ඩුව, අන්තිමට ටොන් ගණනින් හාල් පිට රටින් ගෙන්වන්න මේ අවුරුද්ද තුළ ක්‍රියා කරපු හැටි අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගොවි ජනතාවට තමන්ගේ වී නිෂ්පාදනවලට කිලෝවකට රුපියල් 150කවත් සහතික මිලක් තිබිය යුතුයි කියලා තමයි මැතිවරණයට ඉස්සෙල්ලා චිත්‍රයක් පෙන්නුවේ, මේ ජනතාවගේ ඡන්දය ගන්න. අන්තිමට ගොවීන්ට සහතික මිලට වී විකුණා ගන්න බැරිව කුණු කොල්ලයට විකුණද්දී, මෝල් හිමියන් ඇවිල්ලා එම වී ඩැහැ ගනිද්දී රට පුරාම ඉන්න ගොවි ජනතාව නඟපු අඳෝනාව අපට ඇහෙන්න පටන් ගත්තා. පොහොර සහනාධාරය වෙලාවට දෙන්න බැරි වුණා. ඒ වාගේම ගොවි උපකරණවල VAT එක අඩු කරන්න බැරි වෙලා තිබෙනවා.

දැන් අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා ගුරුවරු ගැන කථා කරනවා මම අහගෙන හිටියා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔබතුමියත් ගුරුවරියක් කියලා තමයි මම අහලා තිබෙන්නේ. ගුරුවරුන්ගේ සහ විදුහල්පතිවරුන්ගේ වැටුප් විෂමතාව කඩිනමින් ඉවත් කරනවා කියායි මේ උදවිය බලයට ආවේ. ගුරු වෘත්තිය මේ රටේ ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට ගෙනෙනවාය කිව්වා. ගුරුවරුන්ට පොරොන්දු වෙච්ච ඉතුරු තුනෙන් දෙකක වැටුප තවම දීලා නැහැ කියලා ගුරුවරු බොහොම කලකිරීමෙන් කථා කරනවා. අපේ රංජිත් මද්දුම

බණ්ඩාර මැතිතුමා මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළාම මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ඇහුවා, "මේ තුනෙන් දෙක විග්‍රහ කරන්න පුළුවන්ද?" කියලා. මම එතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. මේ උදවිය බලයට පත් වෙලා අවුරුද්දක් යන්නත් ඉස්සෙල්ලා, මාස කිහිපයක් ඇතුළතදී පවත්වපු පළාත් පාලන මැතිවරණයේදී මේ ආණ්ඩුව ලක්ෂ 22ක් ඡන්ද අහිමි කර ගත්තා. ඔබතුමන්ලා පළාත් සභා මැතිවරණය තියන්න. එතකොට තුනෙන් දෙක විග්‍රහ කරන්න ගුරුවරු බලාගෙන ඉන්නවා කියන එකත් මම එතුමාට මතක් කරන්න කැමැතියි. වතු කම්කරුවන්ට කිව්වා, ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් කරනවා කියලා. තවම බැරි වුණා, ඒක ඉෂ්ට කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආණ්ඩුව වනසතුන්ගෙන් වගාවන්ට සිදු වන හානිය වළක්වන්න කියලා ඉතිහාසයේ පළමුවැනි වතාවට අරුම පුදුම රිළා සංගණනයක් සිදු කළා. අන්තිමට මේ රිළා සංගණනය අසාර්ථක වුණා. ජනතාව ඒක විහිළුවට ගත්තා. ඇමතිතුමාම මේ සභාවේදී කිව්වා, ඒ සංගණනයේ සියයට 50ක්ම අසාර්ථකයි කියලා. අවසානයේදී වුණේ විශාල මුදල් නාස්තියක් විතරයි. රිළවු ගණන් කර ගන්නත් බැරි වුණා. වගා හානි නතර කර ගන්නත් බැරි වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම විනාඩි දෙකට අමතරව අපේ ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමාගේ කාලයෙනුත් විනාඩි දෙකක් ලැබෙනවා.

මේ ආණ්ඩුව රිළා සංගණනය වාගේම Clean Sri Lanka වාගේ ව්‍යාපෘති පටන් ගත්ත ආකාරයත් අපි දැක්කා. ලත් තැනම ඒවා ලොප් වෙලා ගියා. "නටපු නැටුමකුත් නැහැ, බෙරේ පලුවකුත් නැහැ." වාගේ වැඩ තමයි මේ ආණ්ඩුව ගත කරපු මේ අවුරුද්ද තුළ අපි නම් වැඩි හරියක් දැකලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ජීවිතයේ සැඳෑ සමය ගෙවන විශ්‍රාමිකයන්වත් ඇන්දෙව්වා. බලය ගන්නකොට ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතුවලට සාමාන්‍ය බැංකු පොලී අනුපාතයට වඩා සියයට 5ක පොලී අනුපාතයක් ලබා දෙනවා කියලා ඒ මිනිසුන්ව රැවැට්ටුවා. නමුත්, දුන්නේ සියයට 3ක් විතරයි. ආණ්ඩුව විශ්‍රාමිකයින්ගේ පොලී ආදායමෙනුත් සියයට 10ක බද්දක් ගහලා තිබෙනවා. බලය ගන්න කියපු බොරු කන්දරාව දෙස බලද්දී චෛතිය රජ්ජුරුවන්ටත් එහා ගිය බොරු කීමට ගිනස් වාර්තාවක් තියලා, නොබෙල් තෑග්ග වුණත් ගන්න පුළුවන් මට්ටමේ ආණ්ඩුවක් කියන එක තමයි අවුරුද්දකට පසුව අපට මේ ආණ්ඩුව ගැන කියන්න තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඒ විතරක් නොවෙයි. මේ වෙද්දී ආණ්ඩුවේ මැතිඇමතිවරුන්ගේ වත්කම් ගැනත් විශාල සංවාදයක් ඇතිවෙලා තිබෙනවා. ජනතාවට මේගොල්ලන් පෙන්වපු චිත්‍රය නොවෙයි, සැබෑ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් එකක් කියලා ජනතාව දැන් හොඳට තේරුම් අරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණු ඒවා ගැන, කරපු දේවල් ගැන මේ ආණ්ඩුව කියන්න හැදුවා. නමුත්, නොකරපු දේවල් ගැන කියන එක තමයි අපේ වගකීම. සෑම කිලෝමීටර 4කට, 5කටම ප්‍රාථමික පාසල් ඇති කරනවා කියලා කිව්වා. ගමේ දරුවෝ ගමේ පාසලේම රඳවා ගන්නා විධිය ගැනත් කිව්වා. නමුත්, අද වෙනකොට අන්තිමට ඒ කිලෝමීටර 4ට, 5ට ප්‍රාථමික පාසල් ඇති කිරීම කෙසේ වෙතත්, පාසල් ගණනාවක්ම වසා දමන්න පිඹුරුපත් සකස් කරගෙන යනවා. දැනටත් සමහර පාසල් වැහිලා තිබෙනවා. කිලෝමීටර 4ක්, 5ක් ඇතුළත පාසලක් දෙනවා කියපු ආණ්ඩුව දැන් කිලෝමීටර 4ක්, 5ක් ඇතුළත යම් වැසිකිළි ප්‍රමාණයක් ඉදිකිරීමේ අවශ්‍යතාව ගැන කථා කරන්න පටන්ගෙන තිබෙනවා. පාසල් අමතක වෙලා, වැසිකිළි හදන හැටි ගැන තමයි දැන් කථා කරන්නේ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන මේ පොත රටේ සංවර්ධන සැලැස්ම බවට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණා. ඒත් පළමු වසර ඇතුළත පොරොන්දු කීයෙන් කීයක් ද ඉටු කර තිබෙන්නේ කියන ප්‍රශ්නය අද ජනතාවට මතු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ත්‍රිපෝෂ ටික අද දීගන්න බැරි වෙලා තිබෙනවා. අද ඒකටත් බඩඉරිඟු පිට රටින් ගෙන්වන තත්ත්වයට මේ ආණ්ඩුව පත්වෙලා තිබෙනවා.

මම කථාව අවසන් කරන්න පෙර මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. මම උදේ ඉඳලා මේ විවාදය අහගෙන හිටියා. මේ වෙලාවේ විතරක් නොවෙයි, ආණ්ඩුවේ මැති ඇමතිවරු මේ සභාවේ කථා කරද්දී ඒ හැම කථිකයෙක්ම හැම දාම වාගේ 76 වසරක ශාපය ගැන කථා කරනවා. ඒ 76 වසරක ශාපය ගැන කථා කරන්නේ, ඒ වසර 76 ඇතුළත හදපු පාර්ලිමේන්තුවේම ඉඳගෙන. මේ පාර්ලිමේන්තුවත් ඒ 76 වසරක ශාපය කාලයේ ප්‍රතිඵලයක්. හැබැයි, මේ අය 76 වසරක ශාපය ගැන කියනකොට ගොඩක් දේවල් අමතක කරලා කථා කරන්නේ. සේනානායකවරුන්ගේ කාලයේ "ජාතියේ පියා" අගමැති වෙලා ගොවි ජනපද ඇති කළා අපට මතකයි. ඒ වාගේම මහා ජලාශ ඉදි කරපුවා, කර්මාන්ත ඇති කරපුවා අපට මතකයි. ආසියාවේ පළමුවැනි තෙල් පිරිපහදුව හැදුවේ ඩඩ්ලි සේනානායක ආණ්ඩුවයි. ආසියාවේ කිසිම රටක තෙල් පිරිපහදුවක් හදන්න ඉස්සෙල්ලා තමයි එතුමා 1969දී අපේ රටේ තෙල් පිරිපහදුව විවෘත කළේ. ඒ විතරක් නොවෙයි. අවුරුදු තිස් ගණනකින් කරන්න තිබුණු මහවැලිය අවුරුදු 6න් හදපු එක අමතක කරලා තමයි දැන් මේ ශාපය ගැන කථා කරන්නේ. වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, කොත්මලේ, උල්හිටිය, රත්කිඳ, මාදුරුඔය වාගේ සප්ත මහා ජලාශ හදපුවා සම්පූර්ණයෙන්ම අමතක කරලා ශාපය ගැන කථා කරනවා. ඒ විතරක් නොවෙයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ජයවර්ධනපුර රෝහල, ගාල්ල කරාපිටිය මහ රෝහල වාගේ ඒවා ඒ ශාපය කාලයේ තමයි හැදුවේ. දැන් ඒවා අමතක කරලා කථා කරනවා. විශ්වවිද්‍යාල, අධ්‍යාපන විද්‍යාපීඨ, තරුණ සේවා සභාව, නිදහස් වෙළෙඳ කලාප වාගේම රට පුරා ඇඟලුම් කර්මාන්තශාලා, සීනි කර්මාන්තශාලා, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණ හදපුවා, දරුවන්ට පෙළ පොත් සහ නිල ඇඳුම් දීපු ඒවා, ගෙවල් හදපුවා, ගම්වලට විදුලිය දීපු ඒවා, සංචාරක ව්‍යාපාරය හදපු හැටි අමතක කරලා තමයි දැන් මේ අය කථා කරන්නේ.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ජේ.ආර්. ජයවර්ධන මහත්මයා රාජ්‍ය ඇමති හැටියට මම සිටින බෙන්තර ප්‍රදේශයේ තමයි මුලින්ම සංචාරක ව්‍යාපාරය ඇති කළේ. මේවා ඔක්කෝම අමතක කරලා තමයි මේ අය කථා කරන්නේ. මේ ශාපය ගැන කථා කරනකොට අපේ කාලයේ කරපු හොඳ වැඩ විතරක් නොවෙයි මේ අය අමතක කරලා තිබෙන්නේ. CTB බස් පුච්චපුවාත් ඒ ශාපය කාලයේ කරපු දේවල්. නමුත්, ඒවා අමතකයි. ට්‍රාන්ස්ෆෝමර් පුච්චපුවා ගැන කථා කරන්නේත් නැහැ, වී ගබඩා පුච්චපුවා ගැන කථා කරන්නේත් නැහැ. ගොවිජන සේවා මධ්‍යස්ථාන ගිනි තියපුවා, තේ කර්මාන්තශාලා ගිනි තියපුවා ගැන කථා කරන්නේත් නැහැ. ඒ ශාපය කාලයේ තුණ්ඩු කැල්ලෙන් කඩ වැහුවා. කට වචනයට ලයිට් නිවලා කරුවලේ ඉන්න වුණා. හැඳුනුම් පත් උදුරා ගත්තා. මේ දෙපැත්තම අමතක කරලා තමයි ශාපය කාලයේ හදපු පාර්ලිමේන්තුවේ ඉඳගෙන මේ උදවිය දැන් කථා කරන්නේ.

කාලය අවසන් නිසා, මට විනාඩි දෙකක අමතර කාලයක් ලබා දීම පිළිබඳව ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමාට ස්තුති කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියටත් ස්තුති කරමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. CHANAKA MADUGODA took the Chair.*

[பி.ப. 4.00]

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! இன்றைய தினம் எதிர்க்கட்சியினரால் கொண்டுவரப்பட்டு இருக்கின்ற "வளமான நாடு - அழகான வாழ்க்கை" என்ற எங்களுடைய அரசாங்கத்தின் கொள்கைப் பிரகடனம் தொடர்பான ஒத்திவைப்புப் பிரேரணையை நான் உண்மையிலேயே வரவேற்கின்றேன். ஏனெனில், எங்களுக்கும் ஒரு தேவை இருந்தது. அதாவது, நாங்கள் கடந்த ஒரு வருட காலத்தில் என்னென்ன விடயங்களைச் செய்திருக்கிறோம் என்பதை இலங்கையில் வாழுகின்ற மக்களுக்கு எடுத்துச்சொல்ல வேண்டிய தேவை எங்களுக்கு இருந்தது. இன்னும் சில வாரங்களில் அடுத்த ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட இருக்கின்றது. அதற்கு முன்னர், எங்களுடைய கடந்த ஒரு வருட கால செயற்பாடுகள் பற்றி மக்களுக்கு எடுத்துச் சொல்வதற்கான ஓர் அரிய வாய்ப்பை இன்றைக்கு எதிர்க்கட்சியினர் எங்களுக்குப் பெற்றுக்கொடுத்து இருக்கிறார்கள். அதற்காக அவர்களுக்கு முதலில் எங்களுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

எனக்கு முன்னர் இங்கு பேசிய கௌரவ கயந்த கருணாதிலக்க அவர்கள், 1987, 1989ஆம் ஆண்டு காலப்பகுதியில் நடந்தவற்றை ஞாபகமூட்டி, அவற்றை நீங்கள் மறந்துவிட்டீர்களா? எனக் கேட்டார். அதுதான் அவருடைய பாணியாக இருக்குமாக இருந்தால், நானும் அவ்வாறான சில கேள்விகளைக் கேட்கின்றேன். அதாவது, 1977ஆம் ஆண்டு ஏற்பட்ட இனக் கலவரத்துக்கு நீங்கள் பதில் சொல்வீர்களா? 1978ஆம் ஆண்டு ஏற்பட்ட இனக் கலவரத்துக்கு நீங்கள் பதில் சொல்வீர்களா? 1979ஆம் ஆண்டு கொண்டுவரப்பட்ட அவசரகாலச் சட்டம் மற்றும் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை நீங்கள் ஏற்றுக்கொள்வீர்களா? 1982ஆம் ஆண்டு இடம்பெற்ற சர்வஜன வாக்கெடுப்பு மோசடியை நீங்கள் ஏற்றுக் கொள்வீர்களா? 1983ஆம் ஆண்டு யூலை இனக் கலவரம்மூலம் ஏற்படுத்தப்பட்ட மிருகத்தனமான நடவடிக்கைகளை நீங்கள் ஏற்றுக்கொள்வீர்களா? 1981ஆம் ஆண்டு யாழ். நூலகத்தை எரித்த பாவித்தனமான நடவடிக்கையை ஏற்றுக் கொள்வீர்களா? எனக் கேட்கின்றேன். இவ்வாறானதொரு விவாதத்தை மேற்கொள்வதாக இருந்தால், நாங்களும் அவ்வாறே செய்துகொண்டு போகலாம். கௌரவ தலைமை தாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டை நாசமாக்கியதில், தேசிய ஒற்றுமையைச் சிதைத்ததில் ஐக்கிய தேசியக் கட்சி முன்னணி வகிக்கின்றது என்பதில் எந்தவித மாற்றுக் கருத்துக்கும் இடமில்லை. நான் அது தொடர்பாக கூடுதலாகப் பேச விரும்பவில்லை. ஏனெனில், கடந்த ஒரு வருட காலப் பகுதியில் நாங்கள் செய்த வேலைகள் சம்பந்தமாகச் சொல்லவேண்டிய தேவை எனக்கு இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த வருடம் செப்ரெம்பர் மாதத்துக்கு முதல் எமது நாடு எந்த நிலையில் இருந்தது? அந்த நிலையில் இருந்த எமது நாட்டை இன்று நாங்கள் எந்த நிலைக்குக் கொண்டுவந்து இருக்கின்றோம்? என்பதையே பார்க்க வேண்டும். கடந்த வருடம் செப்ரெம்பர் மாதம் 22ஆம் திகதி மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் சனாதிபதியாகப் பதவியேற் பதற்கு முன்னர், இந்த நாடு பொருளாதார ரீதியாக, அரசியல் ரீதியாக, சமூக ரீதியாக, கலாசார ரீதியாக எந்த இடத்தில் இருந்தது என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்! நாங்கள் மக்கள் மத்தியில் சென்று பிரசார நடவடிக்கைகளை முன்னெடுக்கும்போது அவர்கள் எங்களிடம் கேட்டது வேறு எதுவுமல்ல, "நீங்கள் ஆட்சிக்கு வந்தால், இந்த நாட்டில் பல தசாப்த காலமாகப் புரையோடிப்போய் இருக்கின்ற இலஞ்ச, ஊழல், மோசடிகளை ஒழித்து, இந்த நாட்டை மீட்டெடுப் பீர்களா?" என்றுதான். விசேடமாக வட, கிழக்கில் வாழுகின்ற

மக்கள், "எங்களுக்குப் பல்வேறு பிரச்சினைகள் இருந்த போதிலும்கூட, இப்பொழுது எங்களுடைய பிரதேசத்தில் போதைப்பொருள் பாவனை தலைவிரித்தாடுவதால் எங்களுடைய இருப்பு கேள்விக்குறியாகி இருக்கின்றது. எனவே, அதிலிருந்து எங்களுடைய பிள்ளைகளை மீட்டெடுப் பதற்குரிய நடவடிக்கைகளை எடுப்பீர்களா? அல்லது அதற்கான நடவடிக்கைகளை எடுப்பதென உறுதிமொழியை யாவது தருவீர்களா?" என்று கேட்டார்கள். இன்று நாங்கள் அந்த மக்களை அந்தப் பொறியிலிருந்து வெளியே எடுத்திருக்கிறோம் என்பதை மகிழ்ச்சியுடன் கூற முடியும். அது முற்றுமுழுதாக முடிவுக்கு வரவில்லை. இருந்தபோதிலும், நல்ல திசையை நோக்கி நாடு நகர்ந்துகொண்டு இருக்கின்றது என்பதை எங்களால் உறுதியாகக் கூற முடியும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 'கடந்த 76 வருட சாபக்கேடு' என்று நாங்கள் சொல்வது வேறு எதுவுமல்ல, கடந்த 76 வருடங்களாக இந்த நாட்டின் அரசியலானது மேட்டுக்குடியினருக்கு மாத்திரம் அல்லது தனவந்தர்களுக்கு மாத்திரம் அல்லது நிலச்சுவாந்தார்களுக்கு மாத்திரம் சொந்தமாக இருந்ததைத்தான். இவ்வாறானவர் களுக்கு மாத்திரம் சொந்தமாக இருந்த அரசியலில், அவர்கள் போடுகின்ற தாளத்துக்கு ஏற்பவே மற்றவர்கள் ஆடினார்கள் அல்லது மற்றவர்களை ஆட்டுவித்தார்கள். இவர்கள் ஒவ்வொரு காலகட்டத்திலும் மக்களுக்கு வாக்குறுதிகளை மாத்திரம் வழங்கி, அவர்களிடமிருந்து வாக்குகளைப் பெற்றுக்கொள்ளக் கூடியவர்களாக இருந்தார்கள் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்!

இவ்வாறான நிலைமையில், இந்த நாட்டில் மேட்டுக் குடியினருக்கு மாத்திரம் அல்லது உயர் வர்க்கத்தினருக்கு மாத்திரம் சொந்தமாகவிருந்த அரசியல் அதிகாரம் கடந்த வருடம் செப்ரெம்பர் மாதத்திலிருந்து சாமானிய மனிதர்களின் கைகளுக்குக் கிடைத்திருக்கின்றது. இந்த அரசாங்கமானது சாதாரண மனிதர்களை மதிக்கின்ற, அவர்களுடைய தேவை களையும் அபிலாஷைகளையும் பூர்த்திசெய்கின்ற அரசாங்கம் என்பதை எவரும் மறந்துவிடக்கூடாது என்று நாங்கள் கூறுகின்றோம். இலங்கையில் வாழுகின்ற கிட்டத்தட்ட 220 இலட்சம் மக்கள் ஒருபோதும் இந்த அரசாங்கத்தை வீழ்த்து வதற்கோ, அரசாங்கத்தை விட்டு விலகிச் செல்வதற்கோ முயற்சிக் கமாட்டார்கள் என்பது உறுதி! அவர்கள் நாளுக்கு நாள் எங்களைச் சூழ அணிதிரண்டு வருகின்றார்கள் என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட்டாக வேண்டும். இந்த நிலைமையில், நாங்கள் கடந்த ஒரு வருட காலத்தில் என்னென்ன விடயங்களைச் செய்திருக்கிறோம் என்பதைத் திரும்பிப் பார்க்கவேண்டி இருக்கின்றது.

வட, கிழக்குப் பிரதேசங்களிலும் சரி, நாட்டின் ஏனைய பிரதேசங்களிலும் சரி, கடந்த காலங்களில் இருந்த பொருளாதாரப் பிரச்சினை எங்கள் எல்லோருக்கும் தெரியும்! அதாவது, 2024ஆம் ஆண்டளவில் எமது நாடானது, சாதாரணமாக வெளிநாட்டிலிருந்து பொருட்களை இறக்குமதி செய்வதற்குத் தேவையான LCஐ வங்கியில் open செய்து கொள்ள முடியாத நிலைமையிலே இருந்தது. அதுமாத்திர மன்றி, தனியார் வங்கிகளின் சிபாரிசுக் கடிதங்கள் வேண்டுமெனக் கேட்கப்பட்டது, வங்கிகளில் வட்டி வீதம் அதிகரித்திருந்தது, பொருளதார ரீதியாகத் தளம்பல் நிலை இருந்தது. மேலும், நாளுக்கு நாள் டொலரின் பெறுமதி அதிகரித்துக்கொண்டு இருந்தது. இவ்வாறு இருந்த நாட்டை இன்று நாங்கள் பொருளாதார ரீதியில் நிலையானதொரு நாடாக மாற்றியமைத்து இருக்கின்றோம். அதுமாத்திரமல்ல, மக்களிடம் நம்பிக்கையையும் ஏற்படுத்தி இருக்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த 76 வருடங்களாக இல்லாத நிலைமைகள் இப்போது நாட்டில் உருவாகி இருக்கின்றன. விசேடமாக, வெளிநாடுகளில் வாழுகின்ற வடக்கு, கிழக்குப் பிரதேசங்களைச் சேர்ந்த தமிழர்கள் - diaspora - நிம்மதியாக மீண்டும் இலங்கைக்குக் காலடிவைக்கக்கூடிய சூழ்நிலை ஏற்பட்டு இருக்கின்றது. இவ்வாறான காலப்பகுதி வேறெதுவுமல்ல கடந்த ஒரு வருட காலப் பகுதிதான். கடந்த 76 வருடங்களாக இந்த நாட்டில் அரசியல்வாதிகள் இனவாதத்தையும் மதவாதத்தையும் மாத்திரமே நம்பியிருந்தார்கள். அவர்கள் நாளுக்கு நாள் இனரீதியான பிளவுகளை ஏற்படுத்திக்கொண்டு இருந்தார்கள். அதன்மூலம் அவர்கள் தங்களுடைய இருக்கைகளைத் தக்க வைத்துக் கொள்வதற்காக அரசியல் ரீதியான நடவடிக்கைகளை மேற்கொண்டு வந்தார்கள். கடந்த வருடம் செப்ரெம்பர் மாதத்திலிருந்து இன்றுவரை இந்த நாட்டில் இனவாதம் சம்பந்தமான, மதவாதம் சம்பந்தமான எந்தவொரு பிணக்கும் ஏற்படவில்லை. இவ்வாறு நாங்கள் ஒரு புறத்தில் அரசியல் கலாசாரத்தைக் கட்டியெழுப்பி, சாதாரண மக்களும் இந்த நாட்டில் அரசியல் செயற்பாடுகளில் ஈடுபட முடியும் என்ற நம்பிக்கையை ஏற்படுத்தி இருக்கின்றோம். மறுபுறத்தில், கடந்த 76 வருடங்களாக மாத்திரமல்ல, வெள்ளையர்களின் ஆட்சிக் காலத்தில்கூட, நாட்டில் தமிழ், சிங்கள, முஸ்லிம் மக்கள் மத்தியில் ஏற்படுத்தப்பட்டு இருந்த பிளவுகளை முடிவுக்குக் கொண்டுவந்து இருக்கின்றோம். இவ்வாறு எங்களுடைய கடந்த ஒரு வருட ஆட்சிக் காலத்தைத் திரும்பிப் பார்க்கும்பொழுது, எங்களுக்கு மகிழ்ச்சியாக இருக்கின்றது.

இன்று நாங்கள் எங்களுடைய பிரதேசங்களை முன்னேற்று வதற்கான நடவடிக்கைகளை ஆரம்பித்து இருக்கின்றோம். வடக்கில் குறிப்பாக, யாழ்ப்பாணத்தில் பல்வேறு அபிவிருத்தித் திட்டங்களை முன்னெடுத்து வருகின்றோம். அது குறிகட்டுவான் இறங்குதுறையின் புனரமைப்பு விடயமாக இருக்கலாம், மயிலிட்டி மீன்பிடித் துறைமுகத்தின் அபிவிருத்தி விடயமாக இருக்கலாம், மண்டைதீவு கிரிக்கெட் மைதானத்தை அமைக்கும் விடயமாக இருக்கலாம், சர்வதேச தரத்துடனான உள்ளக விளையாட்டரங்கை அமைக்கும் விடயமாக இருக்கலாம், அங்கு வீடு இல்லாமல் இருக்கின்றவர்களுக்கு வீட்டுரிமையைப் பெற்றுக்கொடுக்கும் விடயமாக இருக்கலாம்! அங்குள்ள மக்களிடமிருந்து பறிக்கப்பட்ட காணிகள் அல்லது இராணுவத்தினர் வசமிருக்கின்ற மக்களுடைய காணிகள் மீளவும் அந்த மக்களுக்குப் பெற்றுக்கொடுக்கப்பட்டு இருக்கின்றன. கொடுக்கப்படாது இருக்கின்ற காணிகளை எதிர்வரும் காலங்களில் விரைவாகப் பெற்றுக் கொடுப்பதற்கு நாங்கள் நடவடிக்கை எடுத்து வருகின்றோம்.

KKS பிரதேசத்தை எடுத்துக்கொண்டாலும் சரி, பரந்தன் பிரதேசத்தை எடுத்துக்கொண்டாலும் சரி, மாங்குளம் பிரதேசத்தை எடுத்துக் கொண்டாலும் சரி, இந்தப் பிரதேசங்கள் அனைத்தையும் கைத்தொழில் வலயமாக மாற்று வதற்கான நடவடிக்கைகளை நாங்கள் எடுத்து வருகின்றோம். இன்று வடக்கில் இருக்கின்ற தமிழ் இளைஞர்கள் அங்கு வாழ்வதா, இல்லையா? எனச் சிந்தித்துக்கொண்டு இருக்கின்ற நிலைமையில், நாங்கள் அவர்களுக்கு நம்பிக்கையை ஏற்படுத்தும் வகையில் நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம். இவ்வாறான நடவடிக்கைகளால் அங்கிருக் கின்ற மக்களுடைய வாழ்க்கை நாளுக்கு நாள் முன்னேறி வருவதுடன், அவர்கள் மத்தியில் நம்பிக்கையும் ஏற்பட்டிருக் கின்றது. இன்று வடக்கு, கிழக்குப் பிரதேசங்கள் முழுவதும் பாரிய அபிவிருத்திப் பணிகள் துரிதமாக முன்னெடுக்கப் படுவதன் காரணமாக, கடந்த 76 வருடங்களாகத் தாங்களும் தங்களுடைய பிரதேசங்களும் அபிவிருத்தியில் புறக்கணிக்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

கப்பட்டு வருகின்றோம் என்ற மனநிலையில் இருந்த மக்களிடம் நம்பிக்கை ஏற்பட்டிருக்கின்றது. அதாவது, கடந்த கால அரசாங்கங்கள்போல் இந்த அரசாங்கம் எங்களை ஏமாற்றாது என்ற திடமான நம்பிக்கை அவர்களிடம் ஏற்பட்டு இருக்கின்றது. அந்த நம்பிக்கைக்கு நாங்கள் ஒருபோதும் துரோகம் இழைக்க மாட்டோமெனக் கூறி, விடைபெறு கின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

මීළඟට, ගරු වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.14]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**

(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)

(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் தற்போதைய அரசாங்கத்தின் செயற்பாடுகள் சம்பந்தமாகப் பேச வேண்டிய அவசியம் இருக்கின்றது. கௌரவ அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்கள் பேசும்போது, ஏனைய அமைச்சர்கள் யாரும் headphone போடவில்லை. ஆனால், நான் பேசும்போது போட்டுக் கொள்கிறார்கள். அப்படியென்றால், அவர்கள் எங்களுடைய கருத்தைத் தெரிந்துகொள்வதற்கு ஆசைப் படுகிறார்கள் என்றே நான் நினைக்கின்றேன். එහෙම නේද? අපි මොනවාද කියන්නේ කියන එක අහන්න තමයි ඔබතුමන්ලා කැමති. අපි බණින්නේ නැහැ, ඔබතුමන්ලාට. නමුත් වෙලා තිබෙන වැඩ ටික ගැන කථා කරනවා. එච්චරයි.

ஒரு நாட்டில் மக்களைத் துன்பத்தில் ஆழ்த்தும் வகையில் அதிக வரியை விதித்து, அதனூடாக மேற்கொள்ளும் அபிவிருத்தியை நாங்கள் அபிவிருத்தி என்று சொல்ல முடியாது. நாட்டில் உற்பத்தியை அதிகரித்து, அதன்மூலம் ஏற்றுமதியை அதிகரித்து, அதன்மூலம் பெறப்படுகின்ற வருமானத்தினூடாக மேற்கொள்ளப்படும் அபிவிருத்தியே உண்மையான அபிவிருத்தி என்பது என்னுடைய கருத்தாகும். இன்று நாட்டில் பல்வேறு பிரச்சினைகள் உருவாகி இருக்கின்ற போதிலும், நீங்கள் நல்லதொரு விடயத்தைச் செய்கின்றீர்கள். அதாவது, நாட்டில் ஊழலை ஒழிக்கும் செயற்பாட்டைச் செய்கின்றீர்கள். நாட்டில் ஊழலை ஒழித்தால் மட்டும் போதாது. நடுத்தர மற்றும் வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கின்ற மக்களுடைய வாழ்க்கைத் தரத்தையும் உயர்த்துவதற்கான வசதிகளைச் செய்து கொடுக்க வேண்டும். அதை இந்த அரசாங்கம் செய்யவில்லை என்பது எங்களுடைய குற்றச்சாட்டாக இருக்கின்றது. வங்குரோத்து நிலையில் இருந்த இந்த நாடு, அதிலிருந்து மீண்டு ஓரளவுக்கு முன்னேறி வருகின்ற இந்தச் சந்தர்ப்பத்தில், நாங்கள் வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கின்ற மக்களுடைய, நடுத்தர மக்களுடைய பிரச்சினைகள் பற்றியும் பார்க்க வேண்டும். மேல் மட்டத்திலுள்ள மக்களுடைய வாழ்க்கையை மட்டும் சிந்தித்துச் செயலாற்றுவது ஒரு நாட்டுக்கு உகந்ததாக இருக்காது.

இன்று எமது நாட்டில் அதிகளவான 'கார்'கள் இறக்குமதி செய்யப்படுகின்றன. அதை நாங்கள் வரவேற்கின்றோம். எனினும், இந்த நாட்டில் பொருளாதாரத்தில் கீழ்மட்டத்தில் இருக்கின்ற மக்களுடைய துன்ப, துயரங்களைத் துடைப் பதற்கான நடவடிக்கைகள் எடுக்கப்படவில்லை; அதிலிருந்து அவர்களுக்கு விமோசனம் கிடைக்கவில்லை என்பதுதான் எங்களுடைய குற்றச்சாட்டாக இருக்கின்றது. பெரும்பாலும் நகரத்தில் வாழ்கின்றவர்கள் போதுமானளவு சம்பளத்தைப் பெற்று, தமது வாழ்க்கையைக் கொண்டு நடாத்துகின்றார்கள். அதற்கான சந்தர்ப்பம் அவர்களுக்கு இருக்கின்றது. ஆனால், பெருந்தோட்டப் பகுதியில் வாழ்கின்ற மக்கள் அதிலும் கிராமத்தில் வாழ்கின்ற மக்கள் வருமானத்தை ஈட்டிக் கொள்வதற்கு மிகவும் கஷ்டப்படுகின்றார்கள். அவர்களது வருமானத்தை அதிகரித்துக்கொள்ள என்னென்ன விடயங்களைச் செய்ய முடியும் என்பது பற்றி சிந்திக்க வேண்டும்.

இன்று சிறு தொழில்களைச் செய்கின்றவர்கள் தங்களது தொழில்களைத் தொடர்ந்து செய்ய முடியாத நிலைமையில் இருக்கின்றார்கள். ஏனெனில், அவர்கள் வைத்திருக்கும் factoriesஐ மூடவேண்டிய சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. Electricity bill அதிகம், tax அதிகம், தொழிலாளர்களது வினைத்திறனுக்கு ஏற்ப சம்பள அதிகரிப்பு போன்ற பல்வேறு பிரச்சினைகள் காரணமாக உற்பத்திச் செலவு அதிகமாக உள்ளது. இதனால் அவர்களது உற்பத்திப் பொருட்களை விற்க முடியாத சூழ்நிலை ஏற்பட்டிருக்கின்றது. எனவே, இதனைக் கருத்திற்கொண்டு உரிய நடவடிக்கைகளை எடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

எமது நாட்டில் பிரதான உணவுப் பொருளாகக் கருதப்படுவது அரிசி! இன்று அரிசியின் கட்டுப்பாட்டு விலை - controlled price - 260 ரூபாய் என்று சொல்லப்படுகின்றது. ஆனால், இன்று அரிசி ஆலைகளில் இருந்து ஒரு கிலோகிராம் அரிசியை 310 ரூபாய்கு கொள்வனவு செய்ய வேண்டியிருக் கின்றது. அதாவது, 310 ரூபாய்க்கு வாங்கி எப்படி 260 ரூபாய்க்கு விற்பது? இப்பொழுது கடைகளில் controlled priceக்கு அரிசியை விற்காதவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கிறார்கள். நல்ல விடயம்! அவர்களுக்கு அரிசியை 250 ரூபாய்க்குக் கொடுத்தால்தான் அவர்களால் அதனை 260 ரூபாய்க்கு விற்க முடியும். இது மிக அண்மையில் ஏற்பட்ட துன்பகரமான நிலைமையாகும். அரிசிக்கு விலை நிர்ணயம் செய்யப்பட்டு இருப்பதாகச் சொன்னாலும், அரிசி ஆலைகளில் இருந்து கொள்வனவு செய்யப்படுகின்ற அரிசியின் விலையைக் கட்டுப்படுத்துவதற்கு நீங்கள் முயற்சி எடுக்கவில்லை. அரிசியின் மொத்த விலையைக் கட்டுப்படுத்து வதற்குரிய நடவடிக்கைகளை நீங்கள் எடுத்திருந்தால், சாதாரணமாக கடைகளில் அரிசி விற்பவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கவேண்டிய அவசியம் ஏற்பட்டிருக்காது. இன்று நீங்கள் சாதாரண கடைகளில் கட்டுப்பாட்டு விலையிலும் பார்க்க அதிக விலைக்கு அரிசியை விற்பனை செய்பவர்களுக்கு எதிராகச் சட்ட நடவடிக்கை எடுக்கின்றீர்கள். எனினும், அரிசி ஆலைகளில் அதிக விலைக்கு அரிசி விற்கப்படுவது தொடர்பில் நடவடிக்கை எடுப்பதில்லை. எனவே, நீங்கள் இந்த விடயம் தொடர்பில் சற்றுச் சிந்திக்க வேண்டும் என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது.

இன்று இலங்கையில் வாழும் மக்களில் 24.8 சதவீதமானவர்கள் வறுமையில் வாழ்கின்றார்கள். இது கோட்டாபய ராஜபக்ஷ அவர்களின் ஆட்சிக் காலத்தில் 13 சதவீதமாக இருந்தது. இப்பொழுது வறுமையில் வாழும் மக்களின் சதவீதம் அதிகரித்துக் காணப்படுகின்றது. 'அஸ்வெசும' கொடுப்பனவு வழங்கப்பட்டாலும் இந்த நாட்டில் வறுமை ஒழிக்கப்படவில்லை என்பதுதான் எங்களுடைய கருத்தாக இருக்கின்றது. இன்று எமது நாட்டில் உல்லாசப் பிரயாணத்துறை நன்றாக வளர்ந்து வருகின்றது. இது

வரவேற்கக்கூடிய ஒரு விடயமாகும். உல்லாசப் பிரயாணத்துறை மூலம் கிடைக்கின்ற வருமானத்தை இந்த நாட்டில் வறுமையை ஒழிப்பதற்குப் பயன்படுத்தினால் மிகவும் நன்றாக இருக்குமென நான் நினைக்கின்றேன்.

இன்று பெருந்தோட்டப் பகுதியில் வாழும் மக்களுக்கு வீடுகள் கொடுக்கப்படுகின்றன. இது மிகவும் சந்தோஷமான விடயம்! கடந்த காலங்களிலும் இவ்வாறு வீடுகள் கொடுக்கப்பட்டன. அதற்கு உறுதி வழங்குகின்ற நிகழ்வுகள் பல கட்டங்களில் நடைபெற்று இருக்கின்றன. கௌரவ திகாம்பரம் அவர்கள் அமைச்சராக இருந்த காலத்திலும் அது நடைபெற்றது; கௌரவ தொண்டமான் அவர்கள் அமைச்சராக இருந்த காலத்திலும் அது நடைபெற்றது. அந்த மக்களுக்கு உண்மையான உறுதிகள் வழங்கப்பட வேண்டும். நான் நினைக்கின்றேன், கௌரவ அமைச்சர் அவர்கள் தற்பொழுது அதற்கான முயற்சிகளை எடுத்திருக்கிறார் என்று. எனவே, அந்த உறுதிகளை நல்ல முறையில் கொடுப்பதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும். வெறும் காகிதங்களைக் கொடுத்து, அந்த மக்களை ஏமாற்றுகின்ற வேலைகளில் ஈடுபடக்கூடாது என்பது என்னுடைய கருத்தாக இருக்கின்றது.

NPP அரசாங்கத்தைப் போல்தான், அந்தக் காலத்தில் டெல்லியில் அண்ணா ஹசாரே அவர்கள் ஊழலை ஒழிக்க முடிவு எடுத்தார். அதற்குப் பின்னர் கெஜ்ரிவால் என்பவர் டெல்லியில் Chief Ministerஆக வந்தார். அவர் தனது பணிகளை நன்றாகச் செய்தார். இரண்டு தடவை அவர் அந்தப் பதவியை வகித்தார். ஆனாலும், மக்கள் அதை ஏற்றுக் கொள்ளவில்லை. அதேபோல, உங்களுடைய கொள்கை நல்லதாக இருந்தாலும், மக்கள் துன்பப்படுகின்ற நிலைமை வந்தால், அதை மக்கள் ஏற்றுக்கொள்ள மாட்டார்கள். அதை நீங்கள் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

தற்பொழுது, இங்கு கௌரவ அமைச்சர் சமந்த வித்யாரத்ன அவர்கள் இருக்கின்றார். நான் அன்று கேட்ட கேள்விக்கு இன்றைக்கு அவர் பதிலளிப்பார் என்று நினைக்கின்றேன். ඔබතුමාට New Villages Development Authority for Plantation Region ගැන උත්තරයක් අද දෙන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලයෙන් මිනිත්තුවක් අරගෙන එතුමාට ඒකට උත්තර දෙන්න කියන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාට වෙන් කළ කාලයක් තිබෙනවා.

ගරු සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.21]

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතනවා, අද විපක්ෂයෙන් සභාව කල් තබන අවස්ථාවේදී ඉදිරිපත් කරපු යෝජනාව අපට හොඳ යෝජනාවක් කියලා. එතුමන්ලා අපේ ආණ්ඩුවේ වර්ෂයක ශේෂ පත්‍රය තමයි පරීක්ෂා කරලා බලන්නේ. මම ඔබතුමන්ලාට මේ යෝජනාව කරනවා. ඔබතුමන්ලාට පරීක්ෂා කරලා බැලිය යුතු ශේෂ පත්‍ර දෙකක් තිබෙනවා. ඒ, ආණ්ඩුවේ ශේෂ පත්‍රය සහ විපක්ෂයේ ශේෂ පත්‍රය. විපක්ෂයටත් මොකද වුණේ කියලා බලන එක හොඳයි. අපි කවුරුත් කියන, අවුරුදු 76ක පාලනයක් කළේ අද විපක්ෂය හොබවන තමුන්නාන්සේලා. ඒ අවුරුදු 76ක කාලයේ දීපු පොරොන්දු ඔබතුමන්ලාට ඉෂ්ට කරන්න බැරි වෙලා අද දුක්ගැනවිලි කියලා තේරුමක් නැහැ. අපි "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා අපේ තේමා පාඨය දැම්මා වාගේ තමුන්නාන්සේලාත් ඒ ඒ කාලවලදී එක එක තේමා පාඨ දැම්මා. ජේ.ආර්. ජයවර්ධන මහත්තයා දැම්මා, "ධර්මිෂ්ඨ සමාජයක්" කියලා. හැබැයි, ඒ 17 අවුරුදු පාලනය අවසන් වෙන කොට ධර්මිෂ්ඨ කෙසේ වෙතත් අධර්මිෂ්ඨ සමාජයක් නම් නිර්මාණය වෙලා තිබුණා, දහස් ගණනින් ජනතාව මරණයට පත් කළා. "සුබ අනාගතයක්" කියලා ඇවිල්ලා අසුබ අනාගතයක් හැදුවා. "මහින්ද චින්තනය" කියලා එකක් ඇවිල්ලා හොඳටම හිංසනය දියත් කළා. මේ රටේ ඒවා ගැන දැන් සාකච්ඡා වෙන මොහොතක්. අන්තිමට ආවේ හොඳම එක. ඒ, "සෞභාග්‍යයේ දැක්ම". ඉන්ධන ටික නැතුව ගියා, විදුලිය නැතුව ගියා, පොහොර ටික නැතුව ගියා. අන්තිමට මිනිස්සු පාරට බැහැලා අරගළ කරලා, බරපතළ ප්‍රශ්නවලට මුහුණ දුන්නා. අන්න ඒ අවුරුදු 76ක ගමනේ අවසානයේ තමයි ඔබතුමන්ලා විපක්ෂයට ගිහිල්ලා අපි ආණ්ඩු පක්ෂයට ආවේ. දැන් වසරක් යනකොට නව ආණ්ඩුවක් හැටියට අපි කටයුතු කරපු දිහා බලනකොට මම කිව්වා නේ විපක්ෂයේ ශේෂ පත්‍රයත් බලන්න කියලා. විපක්ෂයට ශක්තිය දීපු තැන් කඩාගෙන බිඳ ගෙන වැටෙන කොට, විපක්ෂයට ශක්තිය දුන් තැන් සුනු විසුනු කරන කොට විපක්ෂයට දැන් වෙලා තිබෙන්නේ මොකක්ද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

පාතාලය මඩිනකොට විපක්ෂය සමතලා වෙලා ගිහිල්ලා. කුඩු මඩිනකොට විපක්ෂය කුඩු පට්ටම් වෙලා. දූෂණය මඩින විට සුන්නද්දූලි වෙච්ච විපක්ෂයක් බවට පත් වෙලා. ලංකා ඉතිහාසයේ අවුරුදු 76කට පස්සේ විපක්ෂය එක ගොඩකට වැටුණා. කැබලි වෙච්ච විපක්ෂය දැන් එක ගොඩක තිබෙනවා. ඒක සුන්නද්දූලි වෙලා, කැබලි වෙලා තිබෙනවා. ඇත්තටම ගත්තොත් දැන් තමයි ලංකා දේශපාලනයේ නියම කඳවුරු දෙක බෙදුණේ. එක කඳවුරක තමුන්නාන්සේලා ඔක්කෝම එකතු වෙලා ඉන්නවා. එතැන පාතලයට සම්බන්ධ, කුඩුවලට සම්බන්ධ, දූෂණයට සම්බන්ධ කණ්ඩායම් අඩු වැඩි වශයෙන් ඉන්නවා. අනෙක් පැත්තෙන් ඉන්නවා, මේ රටට නායකත්වය සපයන ප්‍රගතිශීලී, මේ රටේ සැබෑ උගත්, බුද්ධිමතුන් එකතු වෙච්ච දේශපාලන ව්‍යාපාරයක්. ඒක නිසා මේ ශේෂ පත්‍ර දෙක ඒ විධියට බලන්න ඕනෑ.

තමුන්නාන්සේලාගෙන් මම මේ කාරණය අහන්න කැමැතියි. අපි බලයට එන කොටත් පොරොන්දු දුන්නා නේ, "පොහොහසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා. ඔබතුමන්ලාත් කිව්වා නේ, අපි බලයට ආවොත් මොකක්ද වෙන්නේ කියලා. බලන්න, මේ තිබෙන්නේ ඔබතුමන්ලා කියපුවා. හිටපු අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා අපි බලයට එන එක වළක්වන්න මොකක්ද කිව්වේ? එතුමා කියනවා, "මේ ගමන නැවතුණොත් යළි පෝලිම්" කියලා. ඒ කියන්නේ ඔබතුමන්ලාගේ ගමන නැවතිලා අපි බලයට ආවොත් පෝලිම් එනවා කිව්වා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ඔබතුමන්ලාගේ කාලයේ තිබුණු පෝලිම් යුගය මේ වසරේ අපේ රජය යටතේ ආවේ නැහැ; ඉන්ධන පෝලිම්, කිරි පිටි පෝලිම්, ගෑස් පෝලිම් ආවේ නැහැ. එහෙම නම් ඔබතුමන්ලා කියපු දේ ඉවරයි; දීපු පොරොන්දු ඉෂ්ට වුණේ නැහැ.

මෙන්න බලන්න, ඔය පැත්තේ අයගේ න්‍යායාචාර්ය රනිල් වික්‍රමසිංහ ඒ කාලයේ කියපු ඒවා. "ලයිසන් නැති පිරිසකට

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

පාර්ලිමේන්තු බලයක් දුන්නොත් රට කොහේ ගෙනයාවිදැයි කියන්න බෑ" එහෙම කිව්වේ රනිල්. දැන් කොහේටද ගිහිල්ලා තිබෙන්නේ රට? රනිල්ට යන එන මං නැති වුණාට අපි එයාලටත් පාරවල් නිර්මාණය කරලා තිබෙනවා. රට යස අපූරුවට යන බව, කුහකකම් තිබෙන, ඉරිසියාව තිබෙන විපක්ෂයේ සමහර ඇත්තන්ට නොතේරුණාට ජාත්‍යන්තර සංවිධාන ඒක අගයනවා; රටේ මිනිස්සු අගයනවා. ඔබතුමන්ලාට මේක තේරුම් කරන්න වෙන භාෂාවක් නැහැ. මේ තමයි අපි බලයට ආවොත් වෙනවා කියපු ඒවා. ඒවා කිව්වේ ඔබතුමන්ලා. දැන් මම අහන්නේ, ඔබතුමන්ලා කියපු ඒ අනාවැකි ඉෂ්ට වුණාද කියලායි. අපේ ඒවා ඉෂ්ට වුණාද කියලා බලනකොට ඒවාත් ඉෂ්ට වුණාද කියලා බලන්න එපායැ. ඊළඟට මොකක්ද කියලා තිබෙන්නේ? "මාලිමාවේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් වාර්ෂිකව කෝටි ලක්ෂයක් රටට අහිමි වෙනවා" මෙහෙම කියන්නේත් රනිල්. වාර්ෂිකව කෝටි ලක්ෂයක් අහිමි වෙනවා කිව්වා. අපි බලයට ඇවිල්ලා වර්ෂයක් ගත වෙනකොට කොහෙන්ද ඒක අහිමි වුණේ? රටේ හිඳිලා තිබුණු භාණ්ඩාගාරයට රුපියල් ට්‍රිලියනය පන්නලා දැන් අපි එකතු කර තිබෙනවා. භාණ්ඩාගාරයේ ඩොලර් සංචිතයත් වර්ධනය වෙමින් වේගයෙන් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. එතකොට, රනිල්ලා, ඔබතුමන්ලා කියපු ඒවා පව වුණා, බොරු වුණා, නැති වුණා. ඔන්න ශේෂ පත්‍රය!

ඊළඟට, ඔබතුමන්ලාගේ පැත්තේ ඉන්න මන්ත්‍රීතුමියක් වන කවිරත්න මන්ත්‍රීතුමිය ඒ කාලයේ "දිනමිණට" කියා තිබෙන්නේ මොනවාද? "ජවිපෙ ආණ්ඩුව ආවොත් ඩොලර් පමණක් නොව රුපියලත් නැත්තටම නැතිවී යනවා."

මේ, ඔබතුමන්ලා කියපුවා. දැන් නැත්තටම නැති වෙලා තිබෙන්නේ විපක්ෂය. අපි කියපු ඒවා බලනකොට, දැන් ඔබතුමන්ලා කියපු ඒවාට මොකද වෙලා තිබෙන්නේ? ලකුණු බින්දුවයි. ඔබතුමන්ලා ඒ කියපු දේවල් වෙලා නැහැ. තව ගොඩක් තිබෙනවා, ඔබතුමන්ලා කියපු ඒවා. මොනවාද කිව්වේ? ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ආවොත් ආගම් අදහන්න වෙන්නේ නැහැ කිව්වා, පෙරහැර කරන්න වෙන්නේ නැහැ කිව්වා, ආයෙත් අලි ඇත්තු දකින්න වෙන්නේ නැහැ කිව්වා. ඒකද වුණේ, වෙන එකක්ද වුණේ? ලස්සනට පෙරහැර සිද්ධ වුණා. මහා දළඳා දැක්මක් වසර ගණනාවකට පසුව සිද්ධ වුණා. සියලු ආගම් අදහන අයට නිදහසේ ආගම සමරන්න පුළුවන් ඉඩකඩක් හම්බ වුණා. මොකක්ද වුණේ? ඔබතුමන්ලා කියපු දේ වුණේ නැහැ. එතකොට මේ අනෙක් පැත්තනේ වෙලා තිබෙන්නේ. ඕකයි ශේෂ පත්‍ර පරීක්ෂාව!

ඔබතුමන්ලා කිව්වා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල රට දමලා යයි කියලා. ගියාද? ඒ වාරික ටික ටික දීගෙන අපි රටත් ආරක්ෂා කරගෙන ගමනක් යනවා, මේ රටේ ආර්ථිකයත් ආරක්ෂා කරගෙන. ඔබතුමන්ලා කිව්වා අපට ජාත්‍යන්තරයක් නැහැ කියලා. අපට පෙට්ටි කඩයක් කරන්න බැහැ කිව්වා. දැන් ඔබතුමන්ලාගේ කඩේට මොකද වෙලා තිබෙන්නේ? ඒවා සමතලා වෙලා තිබෙන්නේ. වෙන වෙනම දමා ගත්ත කඩ ඔක්කෝම බිඳ වැටෙනකොට, දැන් විපක්ෂය අච්චාරු කඩයක් දමාගෙන තිබෙනවා. ඔබතුමන්ලා මේක තේරුම් ගන්න. ඔබතුමන්ලා කියපුවා බොරු වුණා. ඔබතුමන්ලා කිව්වා, ජාතික ජන බලවේගය බලයට ඇවිල්ලා වසරක් යන්න ඉස්සෙල්ලා වාහන 2-3 තිබෙන ඒවා ගනියි, ගෙවල් තිබෙන ඒවා ගනියි කියලා. තව කොච්චර දේවල් කිව්වාද? දැන් ඒ ඔක්කෝම පව වෙලා නේ තිබෙන්නේ. දැන් පව තිබෙන්නේ ඔතැන නේ. ඔබතුමන්ලා පව නැව් පිටින් බැවේ. ඒ නිසා මම ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි, ඔබතුමන්ලා කියපු දේවල් බොරු බවට පත් වෙලා තිබෙන බව. අපි ආවොත් ජාතිවාදය, ආගම්වාදය එයි කිව්වා. මෑත ඉතිහාසයේ ජාතිවාදය, ආගම්වාදය ඇවිස්සුණේ නැති වසරක් අපි ගෙවා දැම්මා. අපි ඒ ගැන සතුටු වෙනවා. එහෙම අවුස්සපු කට්ටිය ඔක්කෝම දැන් ඔළු හංගාගෙන ඉන්නේ. ඒක ඔබතුමන්ලා තේරුම් ගන්න ඕනෑ. මේ තිබෙන්නේ වෙන ප්‍රශ්නයක්. මම මුලින් කිව්වා වාගේ ඔබතුමන්ලාගේ දේශපාලනයට ශක්තිය සැපයූ, ඔබතුමන්ලාගේ ගර්භාෂයේ තිබුණු පාතාලය සුනු විසුනු වෙනකොට, කුඩු අල්ලනකොට, දූෂණයට එරෙහිව කටයුතු කරනකොට ඔබතුමන්ලාට වෙන කියන්න දෙයක් නැහැ. ඒ නිසා ගහන්න පුළුවන් මඩ ලෝඩ් පිටින් ගහනවා. දැන් සමහරු වියරු වැටිලා ඉන්නේ. වියරු වැටිලා ගහන්න පටන් අරගෙන තිබෙන්නේ. අපි ඔබතුමන්ලාට ඒවා ගැනත් මතක් කරන්න කැමැතියි.

ඊළඟට, වසරක අපේ ශේෂ පත්‍රය පරීක්ෂා කරමු. ඔබතුමන්ලා දැන් අපි මොනවාද කළේ කියලා නේ අහන්නේ. මේවා නොදන්නවා නොවෙයි. දැන දැන බොරු කියන විපක්ෂයක් තිබෙන්නේ. අපි මේ රජය භාර ගන්නකොට රට තිබුණු තැන අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. අපේ කථික සහෝදර සහෝදරියන් ඒ ගැන කිව්වා. ඔබතුමන්ලා අපට දුන්නේ හොඳට හදපු දරුවෙක් නොවෙයි. නීරෝගී සම්පන්න රටක් නොවෙයි අපට භාර දුන්නේ. අසාධ්‍යයට පත් වෙච්ච රටක් අපට භාර දුන්නේ. ජාතිවාදය, ආගම්වාදය තිබෙන, මහ බැංකුවේ, භාණ්ඩාගාරයේ ඩොලරුත් නැති, රුපියලුත් හිඳුණු රටක් අපට භාර දුන්නේ. ලෝකයේ ණය ශ්‍රේණිගතකිරීම්වලින් යටින්ම හිටපු රටක් අපට භාර දුන්නා. දුර්වල රටක් අපට භාර දුන්නා. අමනුෂ්‍ය දේශපාලන වාතාවරණයක් තිබෙන රටක් අපට භාර දුන්නා. මම මේවා මේ රටේ ජනතාවගෙන් අහන්නේ.

අපි මෙහෙම හිතමුකෝ. වැරදිලා හෝ අනුර කුමාර දිසානායක සහෝදරයා ජනාධිපති නොවුණා නම්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ආවේ නැත්නම්, මේ ඉන්න විපක්ෂයේ කවුරු හරි ජනාධිපති වෙලා ඒ ආණ්ඩුවක් නම් තිබෙන්නේ, අන්න ඒක සංසන්දනය කර බලන්නකෝ. එහෙම නම් මොකක් වෙයි කියලාද හිතෙන්නේ? එහෙනම් ජනාධිපති ඔය සැප සම්පත් අත හරින්නේ නැහැ. අර මාළිගා ටික ඔක්කෝම එයා ළඟ තියාගෙන, අතට පයට කට්ටිය ළඟින් තියාගෙන, මුදල් කාබාසිනියා කරගෙන යන ගමනක් යනවා. නමුත් වර්තමාන ජනාධිපති, අනුර දිසානායක මැතිතුමා ලොකු දේශපාලන ආදර්ශයක් ඉතිහාසයේ පළමුවෙනි වතාවට ලබා දීලා තිබෙනවා. එතුමා වරප්‍රසාද අතහැරලා තිබෙනවා. ඔබතුමන්ලා හිතනවාද, ජාතික ජන බලවේගයේ ජනාධිපති කෙනෙක් ආවේ නැත්නම් ඒවා අත හරියි කියලා? සජිත්ලා, නාමල්ලා ආවා නම් ඒවා අත හරියි කියලා හිතනවාද? නැහැ. තව තව බදා ගන්නවා, බෙදා ගන්නවා. එහෙම බදා ගෙන බෙදා ගත්තා නම් ජනතාවට බෙදන්න දෙයක් ඉතුරු වෙන්නේ නැහැ. අපි ඉතුරු කළා; ඒවා ජනතාවට බෙදුවා. ඒකයි ඇත්ත කථාව.

රට හතරවටේ තිබෙන ජනාධිපති මාළිගා සංචාරක ව්‍යාපාරයට, වෙන වෙන ව්‍යාපෘතිවලට අපි භාර දුන්නා. ජනාධිපති නිල නිවාසයේ එක රැයක් බුදිය ගන්නේ නැති ජනාධිපති කෙනෙක් බවට අනුර දිසානායක ජනාධිපතිතුමා පත් වුණා. ඔබතුමන්ලා බලයට ආවා නම්, ඇමති මණ්ඩලය 25ට අඩුවෙන් තියයිද, වැඩියෙන් තියයිද? මම රටේ ජනතාවගෙන් මේවා අහන්නේ. එහෙම වුණා නම්, මේක ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් නොවුණා නම්, අද ඇමති මණ්ඩලය 100න් එහා නවතින්නේ. මොකද, එක්කාසු වෙච්ච ඔක්කෝම කල්ලි, කණ්ඩායම් සන්තෝෂ කරන්න ඇමතිකම් බෙදුවා නම් එහෙමයි සිද්ධ වෙන්නේ. මෙතුමන්ලා බලයට ආවා නම්, ඇමති බංගලා අත හරියි කියලා හිතනවාද? මම මේවා අහන්නේ රටේ ජනතාවගෙන්.

එහෙම නම් ඔය ඇමති බංගලා අද වෙනකොටත් මේ කට්ටිය බුක්ති විඳිනවා. එහෙම වුණා නම් මේ රටේ ජනතාව ඒවායේ විදුලි බිල් ගෙවන්න ඕනෑ, වතුර බිල් ගෙවන්න ඕනෑ, මේ කට්ටිය හදා වඩා ගන්න ඕනෑ. දැන් මේ කිසිදු ඇමති කෙනෙක් තමන්ගේ ඥාති වර්ගයා කාර්ය මණ්ඩලවලට දමාගෙන නැහැ. ඔබතුමන්ලා ආවා නම්, බිරිඳ, දරුවෝ ඔක්කෝම තමන්ගේ කාර්ය මණ්ඩලයට දමා ගන්නවා. දැන් නව දේශපාලන සංස්කෘතියක් මේ රටේ ස්ථාපිත කර තිබෙනවා. වසරක ප්‍රගතිය, ඒ ශේෂ පත්‍රය අරගෙන බලන්න. ජාතික ජන බලවේග ආණ්ඩුව ආවේ නැත්නම් ඔය අල්ලන කුඩු ඇල්ලෙයිද? නැත්නම් ඔය කුඩු ටික මේ රටේ දරුවෝ, තරුණ තරුණියන් බොයිද? මේ රටේ තරුණ තරුණියන්ට ඔය කුඩු ටික බෙදා හරිනවා. ඒ නිසා මේ ආණ්ඩුවේ වටිනාකම මේ රටේ ජනතාව දන්නවා.

මම අහනවා, ඔය අල්ලපු පාතාලය අපේ ආණ්ඩුවක් නොතිබුණා නම් අල්ලයිද කියලා. තමන්ගේ එකා අල්ලන ආණ්ඩු බිහි වෙන්නේ නැහැ නේ. ඔය පාතාලයේ අග මුල හොයන කොට දැන් අහුවෙන්නේ අහුකොන් නොවෙයි. ඔක්කෝම මුල් ගිහිල්ලා නවතින්නේ එක්කෝ කාල්ටන් එකේ, එක්කෝ තව කොහේ හරි කොතක. ඉතින්, මේවා ඔක්කෝම අරගෙන බලනකොට කාටත් සත්‍ය තේරෙනවා. පාතාලය මේ විධියට මැඩෙන්නේ ජාතික ජන බලවේග ආණ්ඩුවක් ආපු නිසායි. මේ ආණ්ඩුව නාවා නම් කොහොම වෙයි කියලාද හිතෙන්නේ? අධිකරණයේ නීතිය දැන් කාටත් සමානයි, ඇමතිවරු, ජනාධිපතිවරු කියලා නැහැ. හිටියා වෙන්න පුළුවන්, ඉන්නවා වෙන්න පුළුවන්, ඒ කාටත් නීතිය ක්‍රියාත්මක වෙනවා. මම මේ රටේ ජනතාවගෙන් අහනවා, වැරදිලා හෝ ජාතික ජන බලවේග ආණ්ඩුවක් ආවේ නැත්නම් දේශපාලන බලවතුන්ට ඔය නඩු ටික වැටෙයිද, හොරකම්, වංචා නවතීවිද කියලා. ඒක කාටත් තේරෙන්න ඕනෑ. එම නිසා ඒ ගැන බලන්න නම් පසුගිය අවුරුද්දක ප්‍රතිඵලය අනෙක් පැත්ත ගහලා බලන්න කියලා මම ඉල්ලනවා. ඒ නිසා ඔබ තමුන්නාන්සේලාට මම මතක් කරන්න කැමැතියි, මේ රට නොමඟ යවන්න හැදුවත්, මේ රටේ ජනතාවට මේ කාරණය තේරෙන බව.

ඔබතුමන්ලාට සංඛ්‍යා වශයෙන් ඒ කටයුතුවලින් ටිකක් මම කියන්නම්. ඕන්න ඔය විධියට ඉතුරු-පහදු කරපු මුදල්; ඒ වාගේම වංචා, දූෂණ නවත්වලා, කළමනාකාරණය කරලා, ඉතුරු කර ගත් මුදල් තිබෙනවා. ජනාධිපති අරමුදලේ මුදල් පාවිච්චි කළේ කොහොමද? ඒවා ගැන දන්නවා නේ. මේ රටේ නායකයින් ගුවන් ගමන් ගියේ කොහොමද? ඒවා මේ රටේ ජනතාව දන්නවා. තමන්ගේ නිවස තමන්ම ගිනි තබාගෙන හෝ කාට හරි කියලා ගිනි තබාගෙන හෝ වන්දි ගත් හැටි ජනතාව දන්නවා. රජයේ ඉඩම්වලට වන්දි ගත්ත රාජපක්ෂ පුතාලා ගැනත් දන්නවා.

ඉතින්, අපි ඒවා ඔක්කෝම නවත්වලා තිබෙන්නේ. අන්න එහෙම එකතු කරගත් මුදල් සාධාරණ ලෙස මේ රටේ ජනතාවට බෙදා හරින මොහොතේ, අපි අස්වැසුම ප්‍රතිලාභීන්ට ලබා දුන් රුපියල් 8,500 රුපියල් 10,000ක් කළ බව ඔබතුමන්ලා නොදන්නවා නොවෙයි. ඒ වාගේම රුපියල් 15,000ට තිබුණු අස්වැසුම දීමනාව රුපියල් 17,500ට ගෙනාවා, මේ වසරක කාලය තුළ. වකුගඩු රෝගියෙකුට ලබා දුන් රුපියල් 7,500ක දීමනාව, ආර්ථික මට්ටම සලකා බලා මසකට රුපියල් 10,000ක් දක්වා වැඩි කරන්න කටයුතු කළා. අපි එහෙම දුන්නා. වැඩිහිටියන්ට ලබාදෙන රුපියල් 3,000 දීමනාව රුපියල් 5,000 දක්වා වැඩි කළා. රාජ්‍ය සේවක වැටුප්, පෞද්ගලික අංශයේ සේවක වැටුප් වැඩි කළා. ඔබතුමන්ලා ඇහුවා, වතු කම්කරුවාගේ වැටුප රුපියල් 1,700ක් කරනවා කිව්වාට ඒක කෙරුණේ නැත්තේ ඇයි කියලා. ඒක කෙරුණේ නැත්තේ නැහැ, ඒක කෙරෙනවා. ඒක කරන්න මුල පුරලා තිබෙන්නේ. මේ වෙනකොට අපි ජනාධිපතිතුමාත් එක්ක ඒ ගැන දීර්ඝ සාකච්ඡාවක් කරගෙන යනවා. වතු හාම්පුත්තු සහ වතු සේවකයින් අවබෝධතා ගිවිසුම් ගහගෙන හිටියා, සාමූහික ගිවිසුම් ගහගෙන හිටියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ඇමතිතුමා මට තව කාලය ලබා දෙන්න සූදානම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අන්තිමට සාමූහික ගිවිසුම ගහන්න ගිහිල්ලා මොකද වුණේ? වෘත්තීය සමිති නියෝජනය කරලා ගිය ඔබතුමන්ලා යකා නටලා පොළොවේ ගහලා ආවා. දැන් සාමූහික ගිවිසුමකට යන්න බැහැ. දැන් කම්කරුවාගේ ප්‍රශ්නය විසඳන්න සාමූහික ගිවිසුමකට යන්න බැහැ. හැබැයි, අපි බැහැ කියලා නවතින්නේ නැහැ. අපි රජයක් හැටියට කම්කරු ඇමතිතුමා එක්ක එකතුවෙලා හාම්පුත්තු ගෙන්වලා සාකච්ඡා වාර තුනක් පැවැත්වූවා. මම වතු කම්කරු ජනතාවට සහතික කරලා කියනවා, අපි වෙච්ච එකඟතාව අනුව ඔවුන්ට ජීවත්වීමට සරිලන ආදායමක් ලබා දීම සඳහා අපි හාම්පුත්තු එක්ක සාකච්ඡා කරලා කටයුතු කරනවා කියලා. ඒ වාගේම අපි රජයක් හැටියටත් ඒ වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්නවා. අපි ඒක කරනවා. අපිට ඒකට කාලය දෙන්න. ඒ ජනතාව ඒක දන්නවා.

එදා මේ රටේ දුවා දරුවෝ ඉගෙන ගන්නකොට ඔබතුමන්ලා බාධා කළාට, මේ රටේ දරුවන්ගේ අනාගතය වනසන්න මත් කුඩු බෙදුවාට, අපේ මේ රජය ආවාට පස්සේ දරුවන්ගේ පැත්තට හැරුණා. මහපොළ ශිෂ්‍යත්වයට ලබා දුන් රුපියල් 5,000ක මුදල, අපි රුපියල් 7,500ක් කළා. ඒ අනුව ශිෂ්‍යාධාර දීමනාව රුපියල් 4,000 සිට රුපියල් 6,500 දක්වා වැඩි කළා. පහ ශ්‍රේණියේ දරුවන්ට දීපු රුපියල් 750ක ශිෂ්‍යාධාරය, රුපියල් 1,500ක් කළා. වෘත්තීය අධ්‍යාපනය හදාරන දරුවන්ට දීපු රුපියල් 4,000, රුපියල් 5,000ක් කළා. අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් සඳහා රුපියල් 6,000ක දීමනාවක් ලබා දුන්නා. පරිවාස භාරයේ සිටින දරුවන්ට, වීදි දරුවන්ට රුපියල් 5,000ක දීමනාවක් ලබා දුන්නා. මේ සමාජය විසින් නොසලකා හැරපු, බැල්ම හෙළපු නැති පහළම සිටින, අසරණ වෙච්ච ජනතාවට සහන බෙදුවේ එහෙමයි. ඔබතුමන්ලා නොදන්නවා වුණාට ජනතාව මේවා දන්නවා. ඒ විධියට තමයි අපි කරගෙන ගියේ.

නිෂ්පාදන ආර්ථිකයකට මේ රට ගෙනයන්න ඔබතුමන්ලා මොකද කළේ? මේ රටේ පොහොර නැති කළා. ඒ නිසා සෑම ගොවියෙකුම ප්‍රශ්නයකට මුහුණ දුන්නා. දැන් රුපියල් 15,000 පොහොර සහනාධාරය රුපියල් 25,000 දක්වා වැඩි කර තිබෙනවා. අපේ අමාත්‍යාංශයට පොල් කර්මාන්ත ක්ෂේත්‍රයත් අයිතියි. පසුගිය කාලයේ රටේ පොල් හිඟ වුණා. පොල්වලට අවුරුදු පහක් පොහොර නැති වුණා. අපේ අමාත්‍යාංශය යටතේ තමයි හලාවත වැවිලි සමාගම තිබෙන්නේ. අවුරුදු පහක් පොහොර දැම්මේ නැහැ. පසුගිය කාලවල පොල්වලටත් ඇමතිවරු හිටියා. හැබැයි, මම සතුටින් කියන්න කැමැතියි, අපට මෙට්‍රික් ටොන් 55,000ක පොහොර නැවක් ලැබුණු බව. අපි රුසියාවට ස්තුතිවන්ත වෙනවා. ඉන් අඩක් කෘෂිකර්ම අමාත්‍යාංශයට දුන්නා. අඩක් අපට ලැබුණා, පොල් පොහොර සඳහා. රුපියල් 9,500ක් වෙච්ච පොල් පොහොර මිටිය අපි දැන් රුපියල් 4,000ට ගොවීන්ට ලබා දෙනවා. මීට පෙර අවුරුදු පහක් ආණ්ඩු කළේ කවුද? කල්පනා කරලා බලන්න. අතුරු භෝග සඳහා අපි ආධාර ලබා දුන්නා. මේ විධියට අපි විශාල වැඩ කොටසක් කරලා තිබෙනවා කියන එක ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි.

[ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා]

මේ ආණ්ඩුව ආවේ නැත්නම් ජනාධිපති ලේකම් කාර්යාලයේ වාගේම, අපේ අමාත්‍යාංශවලත් තිබෙන සුඛෝපභෝගී වාහන වෙන්දේසි වෙයිද කියලා අපි අහනවා. ජනාධිපතිතුමාගේ සුඛෝපභෝගී වාහන වෙන්දේසි වෙනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් ආවා නම් ඒවා අදත් පාරේ දුවනවා, හොර පෙට්‍රල් ගහනවා, සර්විස් කරනවා, කාබාසිනියා කරනවා. ඒ නිසා රටේ තිබෙන අමාරු තත්ත්වය සලකා අපේ ආණ්ඩුව අද වැඩ කරනවා. ඔබතුමන්ලා රුපියල් ලක්ෂ දහය ගණනේ රක්ෂණයක් හදාගෙන තිබුණා. වසරයි ගියේ, අපි ඒ ලක්ෂ දහය ලක්ෂ දෙකහමාරට බස්සලා දැම්මා. ජනතාව පැත්තට හැරුණා. ඔබතුමන්ලාගේ සුබසාධන කැපුවා. ඒවා ගැන වේදනාවක් දැණුනාට අපට කරන්න දෙයක් නැහැ. මන්ත්‍රී විශ්‍රාම වැටුප අහෝසි කිරීමේ පනතත් ළඟදීම එනවා. ඒකත් කියපු විධියටම කෙරෙනවා. ඒ නිසා මේ දීපු පොරොන්දු, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන්නේ වසරකින් නිම කරන්න නොවෙයි, වසර පහකින් නිම කරන්න. දැන් පළමුවැනි සැතපුම් කණුව පසු වුණා පමණයි. අවුරුදු දෙක, තුන, හතර, පහ යනකොට ලබා දුන් පොරොන්දු ඉක්මවා ගිය යම් යම් වැඩ කොටස් කරන්න අපි සූදානම් කියන එක මතක් කරන්න කැමැතියි.

පසුගිය කාලයේ ඇමතිවරු වාහන හත, අට පාවිච්චි කළා. මේ ආණ්ඩුව ඇවිල්ලා ඇමතිවරයෙකුට වාහන දෙකක් පමණක් සීමා කළා; එකක යන්නත්, අනෙක් එක හදිසියට තියා ගන්නත් කියලා දුන්නා. ඇමතිවරුන්ට ලීටර් 2,100ක ඉන්ධන දීමනාවක් තිබුණා. ඔබතුමන්ලා නීතිය හදලා තිබුණේ එහෙමයි. නමුත්, අපි ඒක ලීටර් 900ට බැස්සුවා. අපි මේ වැඩ කරනවා. අමාත්‍යාංශ සිය ගණන් තබාගෙන කොච්චර කාබාසිනියා කරන්න ඇතිද? අපි ඇවිල්ලා මේ රටට වැඩක් කෙරුණේ නැද්ද? මේ රටට නව දේශපාලන සංස්කෘතියක් හැදුණේ නැද්ද? ඒවා දිරවා ගන්න බැරිවද ඉන්නේ කියලා මම අහන්න කැමැතියි. ඒ නිසා, අපි විශාල කාර්යභාරයක් කරලා තිබෙනවා කියන එක ඔබ තමුන්නාන්සේලා තේරුම් ගන්න. ඔබ තමුන්නාන්සේලාගේ දේශපාලනයේ අක්මුල් විහිදා ගිය, ජාත්‍යන්තරයට ගිහිල්ලා සැඟවිලා හිටපු පාතාලයේ නායකයෝ ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ආවේ නැත්නම්, -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම අවසන් කරනවා.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් බලයට ආවේ නැත්නම් "කෙහෙල්බද්දර පද්මේ" මෙහෙද? එහෙද? මම කියන්නේ සජිත්ලා, මහින්ද රාජපක්ෂලා බලයට ආවා නම්. එහෙනම් එයා එහෙ. දැන් එයා මෙහෙ. මම අහන්නේ "කමාන්ඩෝ සලින්ද" එහෙද, මෙහෙද? එහෙනම් එහේ. අවුරුදු ගණන් අල්ලන්න බැරිවුණු කට්ටිය දැන් මෙහෙ එනවා. එහෙම නම් "පානදුර නිලංග", "බැකෝ සමන්" කියන ඔක්කෝම එහේ. එයාලා විතරක් නොවෙයි, තව කට්ටිය පෝලිමේ යන්න තිබෙනවා.

අපේ අමාත්‍යාංශය ගැනත් මම වචනයක් කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු ඇමතිතුමනි. කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2024 අවුරුද්දයි, 2025 මේ අවුරුද්දයි සංසන්දනය කළාම මාස 8ක් යනකොට අපි තේවල ආදායම ඩොලර් මිලියන 1,436ක් දක්වා ඉහළට අරගෙන තිබෙනවා. පසුගිය අවුරුද්දේ එය තිබුණේ ඩොලර් බිලියන එකේ. ඒ වාගේම පසුගිය අවුරුද්දේ පොල්වල අපනයන ආදායම ඩොලර් මිලියන 562යි. අපි ඒක මේ වෙනකොට -මාස 8ක් යනකොට- ඩොලර් මිලියන 778ට ගෙනැල්ලා තිබෙනවා. මේ විධියට, අපි සෑම ක්ෂේත්‍රයක්ම ඉස්සරහට අරගෙන ඇවිල්ලා තිබෙනවා. ශේෂ පත්‍රයේ ලකුණු හොඳින් රැස් කර තිබෙන බවත්, ඔබතුමන්ලා බින්දුවට වැටී තිබෙන බවත් අවසාන වශයෙන් මම කියන්න කැමැතියි.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ගජේන්ද්‍ර කුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
ගරු ඇමතිතුමනි, NEVIDA එක ගැන, -

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
ගරු මන්ත්‍රීතුමාගෙන් විනාඩියක් දෙනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. අපි කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ, ගරු ඇමතිතුමනි.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
විනාඩියක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, තත්පර 30කින් අවසන් කරන්න.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)
හොඳයි.

මම දන්නවා, ඔබතුමා අහන ප්‍රශ්නයට අදාළ කාරණය සම්බන්ධයෙන් තවත් මන්ත්‍රීවරු අරගේ මෙහේ සමාජ මතයක් හදනවා කියලා. ඒක සත්‍යක් නොවෙයි. වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය - NEVIDA එක - මීට වඩා ශක්තිමත් කරලා වැවිලි ප්‍රජාවගේ - ජනතාවගේ - සිතුම් පැතුම් ඉෂ්ට කරන්න ඒක ඉදිරියට ගෙනෙනවා කියන වචනය තමයි ඔබතුමාට කියන්න තිබෙන්නේ.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களிடம் இரண்டு கேள்விகளைக் கேட்க வேண்டும். கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் சொன்ன விஷயத்துக்கு நீங்கள் சொன்னீர்கள், சில பேர் சமூக வலைத்தளங்களில் தவறான விஷயத்தைப் பரப்பு கிறார்கள் என்று. கௌரவ மனோ கணேசன் அவர்கள் நேற்று சனாதிபதி செயலகத்திலிருந்து ஒரு கடிதத்தைப் பெற்றிருக் கிறார். அந்தக் கடிதத்தில் தெளிவாக எழுதப்பட்டு இருக் கின்றது, நாங்கள் இன்னும் அதை மூடுவதற்கு-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතැන point of Order එකක් නැහැ. කාලය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු ජී.ජී. පොන්නම්බලම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த 29ஆம் திகதி -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඊළඟ කථාව තිබෙනවා. ඒ වෙලාවේදී ඔබතුමා කථා කරන්න.

[பி.ப. 4.41]

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2025 செப்ரெம்பர் மாதம் 29ஆம் திகதி கிளிநொச்சி தெற்கு வலயக் கல்விப் பணிப்பாளர், கிளிநொச்சி, கோணாவில் மகா வித்தியாலய அதிபருக்குக் கடிதமொன்றை எழுதியிருக்கிறார். அதில், 2024ஆம் ஆண்டு நடைபெற்ற sports meetஇன்போது, குறிஞ்சி இல்லத்தின் வாயில் முகப்பு தமிழர் தாயக நிலப் பகுதியைக் குறிக்கும் வகையில் அமைக்கப்பட்டு இருந்தமை தொடர்பிலும், போரில் உயிரிழந்த போராளிகளுடைய துயிலும் இல்ல வாயிலை ஒத்ததாக அமைக்கப்பட்டு இருந்த வளையம் தொடர்பிலும் விசாரிக்க குறிஞ்சி இல்லத்துக்குப் பொறுப்பான ஆசிரியர்களுடைய விபரங்களையும், அந்த இல்லத்தைச் சார்ந்த மாணவர்களுடைய விபரங்களையும் பயங்கரவாதத் தடுப்புப் பிரிவு கோரியிருப்பதாக குறிப் பிடப்பட்டு இருக்கின்றது. இதுதான் இன்றைய நிலை!

இந்த அரசாங்கம் பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை செப்ரெம்பர் மாதம் முடிவடைவதற்கு முன்னர் முழுமையாக நீக்குவதாகக் கூறியிருக்கிறது. இன்றைக்கு அரசாங்கமே போரில் உயிரிழந்தவர்களை நினைவுகூருவதற்கு அனுமதி கொடுத்திருக்கிறது. அவ்வாறான நினைவுகூரல் நடக்கும் போது, துயிலும் இல்லங்களில் அந்த வளையங்கள் வழமையாகச் செய்யப்பட்டு இருக்கும். இன்றைக்கும் அது பல இடங்களில் இருக்கின்றது. பல மாணவர்கள் தங்களுடைய தாய்மார், தந்தைமார், உறவினர்களை யுத்தத்தில் இழந்திருக்கின்ற நிலையில், ஒரு பாடசாலையில் இல்ல விளையாட்டுப் போட்டியின்போது, துயிலும் இல்லங்களில் அமைக்கப்பட்டு இருக்கின்ற வளையங்களை ஒத்ததாக அல்லது தமிழர் தாயக நிலப் பகுதியைக் குறிக்கும் வகையிலான இல்ல முகப்பை உருவாக்கி இருக்கிறார்கள். பயங்கரவாதத் தடுப்புப் பிரிவு அவர்களை விசாரிக்கின்ற அளவுக்கு, அந்த மாணவர்களுடைய விபரங்களைக் கோருகின்ற அளவுக்கு இன்றைக்கு நிலைமை இருக்கின்றது என்றால், இந்த அரசாங்கத்தை நம்பி என்ன பிரயோசனம்? எந்த விடயத்தில் இந்த அரசாங்கம் உண்மையைச் சொல்லி இருக்கின்றது? பயங்கரவாதத் தடுப்புச் சட்டத்தை செப்ரெம்பர் மாதம் முடிவடைவதற்கு முன்னர் நீக்குவதாகச் சொல்லப்பட்ட நிலையில், ஒரு பாடசாலையில் மாணவர்களின் விபரங்களைக் கோருகின்ற அளவுக்குத்தான் இன்றைய நிலைமை இருக்கின்றது. இதுதான் உண்மை!

கௌரவ பிமல் ரத்நாயக்க அவர்கள் கடந்த மார்ச் மாதம் 30ஆம் திகதி யாழ்ப்பாணத்துக்கு விஜயம் செய்தபோது, அவருக்குத் தெரிந்த தமிழில் சொல்லியிருந்தார், 'அபி பொய் இல்லை' என்று. 'අපි බොරු කියන්නේ නැහැ' කියලා දෙමළෙන් කිව්වා. அப்போது அவர், ஆறு மாதத்துக்குள் பலாலி Airportஇன் இரண்டாவது கட்ட - second phase - அபிவிருத்திப் பணிகளை முடித்துக்கொடுப்பதாக வாக்குறுதி வழங்கி யிருந்தார். இன்று ஆறு மாதங்கள் கடந்துள்ள நிலையிலும், அந்தப் பணிகளை முடிப்பது தொடர்பில் அல்ல, ஆரம்பிப்பது தொடர்பாகக்கூட அரசாங்கம் கவனம் செலுத்தவில்லை. பலாலி விமான நிலையத்தின் இரண்டாம் கட்ட அபிவிருத்தி வேலைத்திட்டம் என்பது, அங்கு ஏற்கெனவே இருக்கின்ற 75 மீற்றர் அகலமும் 2,300 மீற்றர் நீளமும் கொண்ட runwayஐ முழுமையாகப் புதுப்பிப்பது - resurface பண்ணுவது - மட்டும்தான். இந்தியாவின் நிதி உதவியோடு மேற்கொள்ளப் பட்ட இதன் phase - Iமூலம், 75 மீற்றர் அகலமும் 2,300 மீற்றர் நீளமும் கொண்ட runwayஇன் 45 மீற்றர் அகலமும் 950 மீற்றர் நீளமும் உடைய பகுதி மாத்திரமே புனரமைக்கப்பட்டு இருக்கின்றது.

அதன் phase-IIஆனது, இருக்கின்ற runwayஐ மீளவும் surface பண்ணுவது ஆகும். இதற்கு 6 மாதங்கள்கூட தேவையில்லை. ஆனால், இதுவரை அது பற்றி சிந்தித்தே பார்க்கவில்லை. பேச்சளவில் மட்டும்தான் இருக்கிறது. இதனைச் செய்வதில் உங்களுக்கு என்ன பிரச்சினை? இதற்குத் தேவையான நிதி இருக்கிறது. இதனை அபிவிருத்தி செய்வதற்கு ஒரு நாடு முன்வந்திருக்கிறது. ஓர் அங்குலக் காணியைக்கூட கூடுதலாக அபகரிக்கத் தேவையில்லை. இருக்கின்ற வளங்களைக் கொண்டு உங்களால் இதைச் செய்ய முடியாமல் உள்ளது. நீங்கள் ஆட்சிக்கு வந்து ஒரு வருடம் ஆகிவிட்டது. ஐந்து வருடங்களில் ஒரு வருடம் கடந்த பிறகு, "இப்பொழுதுதான் நாங்கள் ஆட்சிக்கு வந்தோம்" என்று சொல்லிக்கொண்டு இருப்பதில் எந்தப் பிரயோசனமும் இல்லை. பலாலி விமான நிலையம் தொடர்பில் கொடுத்த வாக்குறுதியை உங்களால் நிறைவேற்ற முடியாதுள்ளது. ஆனால், சென்ற கிழமை நீங்கள் 3 பில்லியன் ரூபாய் செலவில் Ratmalana Airportஐ அபிவிருத்தி செய்வதற்கு

[ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා]

நிதி ஒதுக்கியிருக்கிறீர்கள். அதற்கு Cabinet approval எடுத்திருக்கிறீர்கள்.Tenders call பண்ணி, Sunken Construction (Pvt.) Limitedக்குக் கொடுத்திருக்கிறீர்கள்.

வடக்கில் யாழ். மாவட்டத்திலுள்ள international airportஇல் வெறுமனே ஒரு propeller plane மட்டுமே வந்து இறங்கக்கூடிய நிலையுள்ளது. அதனை எவருமே அபிவிருத்தி செய்வதற்கு விரும்புகிறார்கள் இல்லை. வாரத்தில் ஒரு நாளைக்கு அல்லது இரண்டு நாட்களுக்கு இந்தியாவுக்குச் சென்று வருவதற்கு மட்டும்தான் அதனைப் பயன்படுத்துகிறார்கள். அங்கு போக்குவரத்தில் ஈடுபடுகின்ற விமானத்தில் பயணிக்கின்ற ஒருவர் 15 கிலோ கிராமுக்கு மேல் பொருட்களைக் கொண்டு செல்ல முடியாது. நீங்கள் யாரை ஏமாற்றுகின்றீர்கள்? இரத்மலானை விமான நிலையத்தை அபிவிருத்தி செய்வதற்கு என்ன அவசரம்? யாழ். மாவட்டத்திலுள்ள விமான நிலையத்தை அபிவிருத்தி செய்வதற்கு அவசரம் இல்லையா? சுமார் 76 வருடங்களாகக் காத்துக்கொண்டு இருக்கின்ற எங்களுக்கு அவசரம் இல்லையா? இதுதான் இன்றைய நிலைமை!

இந்த அரசாங்கம்கூட, இன்றைக்கு தனது வாக்கு வங்கியைத் தக்கவைத்துக் கொள்வதற்காகவே செயற்படு கின்றது. அவர்களுக்கு நன்றாகத் தெரியும், இனி வடக்கில் மக்களைப் பெரிதாக ஏமாற்ற இயலாது என்று. அதனால் இருக்கின்ற நிதி எல்லாவற்றையும் தங்களுக்கு வாக்குகள் கிடைக்கக்கூடிய இடங்களுக்கு மாற்றுகின்றார்களே தவிர வட, கிழக்கில் தேவைப்படுகின்ற விஷயங்கள் எதையும் செய்கிறார்கள் இல்லை. இதுதான் உண்மை! இப்படி தொடர்ந்து செயற்பட முடியாது. எங்களுடைய மக்களுக்கு வழங்கப்பட்ட எத்தனையோ வாக்குறுதிகள் இன்னும் நிறைவேற்றப்படவில்லை. மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் கடந்த செப்ரெம்பர் மாதம் முதலாம் திகதி கச்சேரியில் Passport Officeஐத் திறந்து வைப்பதற்கு யாழ்ப்பாணத்துக்கு வருகை தந்திருந்தார். அப்போது அவர், இராணுவத்திடம் இருக்கின்ற தனியார் காணிகள் அனைத்தும் விடுவிக்கப்படுமென அங்குள்ள மக்களுக்கு வாக்குறுதி கொடுத்தார். இது தொடர்பான செய்தி அனைத்துப் பத்திரிகை களிலும் கொட்டை எழுத்தில் வெளிவந்தது.

சனாதிபதி அவர்கள் இவ்வகையான வாக்குறுதிகளைக் கொடுத்துள்ள நிலையில், வலிகாமம் வடக்கில் பலாலி வீதிக்குக் கிழக்கில் 7 ஏக்கர் காணியில் இராணுவம் தனது தேவைக்காக ஒரு வைத்தியசாலையைக் கட்டிக்கொண்டு இருப்பதாக 'யாழ். தினக்குரல்' பத்திரிகையில் செய்தியொன்று வெளிவந்து இருக்கின்றது. இராணுவத்துக்கு அங்கு வைத்தியசாலை கட்டுவதற்கு என்ன தேவை? அது தனியாருக்குச் சொந்தமான காணி. அதுவும் ஐந்து பேருக்குச் சொந்தமான காணி. அதுமட்டுமல்ல, அது வசாவிளான் மானம்பராய் பிள்ளையார் கோவிலுடைய காணி. இன்றைக்குச் சட்டவிரோதமாக அந்தக் காணியில் இராணுவம் அவசர அவசரமாக வைத்தியசாலையைக் கட்டிக்கொண்டு இருக்கின்றது. இதுதான் உண்மை! ஜெனீவாவை அல்லது வேறு ஏதேனும் தலத்தை மையப்படுத்தி வாக்குறுதிகளை அள்ளிக் கொடுத்துவிட்டு, அவற்றை நிறைவேற்றாமல் இருப்பதுதான் இன்றைய நிலை! இதுதான் உண்மை! இந்த அரசாங்கம் நிறைய வாக்குறுதிகளை வழங்கியும், அவற்றை நிறைவேற்றுவதற்கு எந்தவிதமான ஆக்கபூர்வமான நடவடிக்கையையும் எடுக்கவில்லை.

உதாரணத்துக்கு, தையிட்டி விகாரையை எடுத்துக் கொள்ளுங்கள்! அது முழுக்க முழுக்க தனியார் காணியில் அமைக்கப்பட்டு இருப்பது இவர்களுக்கு நன்றாகவே தெரியும்! இவ்விடயம் தொடர்பாக வழங்கிய வாக்குறுதியையாவது இவர்கள் இந்த ஒரு வருட காலப் பகுதிக்குள் நிறைவேற்றி இருக்கலாம். இராணுவம் வேண்டுமென்றே தனியார் காணியில் அந்த விகாரையைக் கட்டியது. அதாவது, அந்த விகாரைக்குரிய காணி அயலில் இருக்கத்தக்கதாக, அப்போதிருந்த இராணுவத் தளபதி சவேந்திர சில்வா வேண்டுமென்றே தனியாருடைய காணிகளைப் பறித்து, அதில் அந்த விகாரையை சட்டவிரோதமாகக் கட்டுவித்திருக்கிறார்.

அந்த விகாரையைக் கட்டுவதற்குத் தொடங்கிய உடனேயே, ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் அரசாங்கப் பிரதிநிதிகள், எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்கள், தமிழ் பாராளுமன்ற உறுப்பினர்கள் என அனைவரும் இணைந்து ஏகமனதாக அதை உடனடியாக நிறுத்த வேண்டுமெனக் கோரிக்கை விடுத்தார்கள். அப்படியிருந்தும், இராணுவம் அந்த இடத்தை High Security Zoneஆக அறிவித்து, இரகசியமாக அந்த விகாரையைக் கட்டியது. இந்த விடயம் இந்த அரசாங்கத்துக்குத் தெரியாதா? இதனைச் சட்டவிரோத நடவடிக்கையாகக் கருதி, அதற்கு எதிராக அரசாங்கம் நடவடிக்கை எடுத்திருக்கிறதா? இல்லை! நீங்கள்தான் இதை மதவாதமாக மாற்றினீர்கள். "இது மதம் சார்ந்த விடயம் என்பதால் நாங்கள் ஒன்றும் செய்ய முடியாது. இதனை இடிக்கக்கூடாது" என நீங்கள்தான் போலியாகச் சொல்கிறீர்கள். இதுதான் உண்மை! இராணுவம் செய்த சட்டவிரோத நடவடிக்கைக்காக இன்றைக்கு நீங்கள் அவர்களுக்குத் துணையாக இருக்கின்றீர்கள். இன்றைக்கும் குறித்த பிக்குவால் அந்த எட்டு ஏக்கர் காணியில் புதிதாகக் கட்டிடங்கள் கட்டப்பட்டு வருகின்றன. மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள் யாழ்ப்பாணத்துக்கு வந்தபோது, அந்த நிகழ்வுக்கு அந்தப் பிக்குவை அழைத்து கௌரவித்தார். இது அங்குள்ள தமிழ் மக்களுக்கு எப்படி இருக்கும்? அதிலும் காணிகள் பறிக்கப்பட்ட மக்களுக்கு எப்படி இருக்கும்? சற்று யோசித்துப் பாருங்கள்! தமிழ் மக்களைப் பொறுத்தவரையில், உங்களுடைய அரசாங்கத்துக்கு வழங்கப்பட்டு இருக்கின்ற சந்தர்ப்பம்தான் கடைசிச் சந்தர்ப்பம்! நான் இதைப் பல தடவை சொல்லியிருக்கிறேன்.

கடந்த 76 வருடங்களுக்கும் மேலாக நாங்கள் தொடர்ச்சி யாக மாறி மாறி ஆட்சிக்கு வந்த ஒவ்வோர் அரசாங்கத்தாலும் ஏமாற்றப்பட்டோம். இந்தக் காலப் பகுதியில் இரண்டு கட்சிகள்தான் இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்தன. அவை 76 வருடங்களாகத் தொடர்ச்சியாக தமிழ் மக்களை ஏமாற்றின. இம்முறைதான் முதற் தடவையாக முற்றிலும் வித்தியாசமான ஒரு தரப்பு ஆட்சிக்கு வந்திருக்கிறது. இனவாதம் இல்லையென்று சொல்லி ஆட்சிக்கு வந்த நீங்களாவது வித்தியாசமாக நடந்துகொள்ள வேண்டும். உங்களுடைய ஆட்சிக் காலத்தில் முதலாவது வருடத்தில்தான் நீங்கள் கடுமையான முடிவுகளை எடுக்கலாம். மக்கள் அதை ஏற்றுக் கொள்வார்கள். ஆனால், நீங்கள் அவ்வாறான முடிவுகளை எடுப்பதற்குத் தவறுகின்றீர்கள். வட, கிழக்கு தொடர்பில் நீங்கள் எடுக்கவேண்டிய முக்கியமான முடிவுகளை எடுக்கத் தவறும்பட்சத்தில், காலப்போக்கில் உங்களால் அவ்வாறான முடிவுகளை எடுக்க முடியாதவொரு நிலைமை நிச்சயமாக ஏற்படும். அவ்வாறான நிலைமையை நீங்கள்தான் ஏற்படுத்துகிறீர்கள் என்பதைச் சரியாக விளங்கிக்கொள்ள வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன்.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු පොන්නම්බලම් මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කරලා සාවද්‍ය ප්‍රකාශයක් කරපු නිසා ඒ ගැන කියන්න මට විනාඩියක් ලබා දෙන්න.

පළමුවන කාරණය මේකයි. අපි පලාලි අන්තර්ජාතික ගුවන්තොටුපළ සංවර්ධනය කරන්න තීන්දු අරගෙන ඒකට අදාළ කරන මුදල් වෙන් කිරීම් කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා, රජයක් Procurement Guidelines අනුගමනය කළ යුතු බව. පලාලි ගුවන්තොටුපළට මම ගිය දවස්වල මිනිස්සුන්ට වතුර බොන්න තැනක් තිබුණේ නැහැ; වාඩි වෙන්න තැනක් තිබුණේත් නැහැ. අපි දැනට temporary හොඳ shelter එකක් හදලා තිබෙනවා. Runway එක යම් ප්‍රමාණයක් දියුණු කරලා අපි එතැන terminal එකක් හදනවා. ඒවා අපි කරන දේවල්. ඒ නිසා මන්ත්‍රීතුමාට ඔච්චර සැරෙන් කථා කරන්න දෙයක් වෙලා නැහැ.

දෙවැනි කාරණය මේකයි. ඔබතුමා දන්නවා, ONUR එකත්, අධිකරණ ඇමතිතුමාත් සම්බන්ධ වෙලා අපි තයිඉට්ටි පන්සල සම්බන්ධව සම්පූර්ණයෙන්ම වාර්තාවක් හදා තිබෙන බව. කමිටුව රැස්වෙලා තිබෙනවා. මම හිතන විධියට, ආගමික කටයුතු ඔබතුමා විසඳන විධියට විසඳන්න ගියොත් එහෙම ආගමික ගැටුමක් මිසක් වෙන දෙයක් වෙන්නේ නැහැ. නමුත් අපි දන්නා තරමින් ඒ පිළිබඳව ඉතාම කෙටි කාලයකින් විසඳුම් ලබා දෙනවා. මම හිතනවා, තයිඉට්ටි පන්සල පිළිබඳ කාරණය සති කිහිපයක කරුණක් බවට පත් වෙයි කියලා. මගේ උත්සාහය තමයි, ගජේන්ද්‍ර මන්ත්‍රීතුමාට අපට විරුද්ධව කථා කරන්න තිබෙන points එක එක අඩු කරමින් ගිහිල්ලා, ඔබතුමා අපේ හොඳ කියන තත්ත්වයට පත් කරන එක.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)
සියයට 10යි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා Switzerland ගිහිල්ලා, ෆෙඩරල් ගැන කථා කරලා වැඩක් නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[பி.ப. 4.54]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முதலில் இன்றைய தினம் இந்தச் சபை ஒத்திவைப்புப் பிரேரணையைக் கொண்டுவந்த கௌரவ நலின் பண்டார ஜயமஹ அவர்களுக்கு என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஏனெனில், கடந்த ஒரு வருட காலத்தில் இந்த அரசாங்கத்தின் செயற்பாடுகள் எவ்வாறு அமைந்திருந்தன என்பது தொடர்பில் விவாதிப்பதற்கு எனக்கு ஒரு தருணம் கிடைத்துள்ளது.

என்னுடைய உரையை ஆரம்பிப்பதற்கு முன்னர், கௌரவ பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர் அவர்களின் கவனத்துக்கு ஒரு விடயத்தைக் கொண்டுவர விரும்புகின்றேன். அதாவது, லக்ஷபான தோட்டத்திலுள்ள கிட்டத்தட்ட 772 தொழிலாளர்கள் தொழில் புரியும் தேயிலைத் தொழிற்சாலையில் நேற்று இரவு தீ விபத்து ஏற்பட்டு இருக்கிறது. அதற்குரிய நடவடிக்கைகளை கட்டாயம் அரசாங்கம் எடுக்குமென நான் நம்புகின்றேன்.

இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்து ஒரு வருடம் முடிவடைந்து இருக்கிறது. இந்த ஒரு வருட ஆட்சி தொடர்பில் அரசாங்கத்துக்குப் பாராட்டுக்கள் இருக்கின்ற அதேநேரம், அரசாங்கத்தின்மீது விமர்சனங்களும் இருக்கின்றன. இன்று நான் இங்கு ஜீவன் தொண்டமானாகப் பேச வரவில்லை. மாறாக, மலையகத்தைச் சார்ந்த ஓர் இளைஞனாகவே பேச வந்திருக்கிறேன். அந்த அடிப்படையில், மாண்புமிகு சனாதிபதி அவர்கள் தேர்தல் காலத்தில், 'ஹட்டன் பிரகடனம்' என்ற ஒன்றை வெளியிட்டது எனக்கு ஞாபகம் இருக்கின்றது. அந்த

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

'ஹட்டன் பிரகடனத்தில்' பெருந்தோட்ட மக்களுக்கான காணி உரிமை மற்றும் வீடமைப்பு, அரச சேவை, கல்வி, சுகாதாரம், சம்பளப் பிரச்சினை, பெருந்தோட்ட நிறுவனங்களின் செயற்பாடுகள் என்பன சம்பந்தமாகக் குறிப்பிடப்பட்டு இருந்ததுடன், அவற்றுக்கான தீர்வுகளும் முன்வைக்கப்பட்டு இருந்தன. இவை தொடர்பில் நாம் ஒவ்வொன்றாகப் பார்ப்போம்.

முதலாவதாக, பெருந்தோட்ட மக்களுக்கான காணி உரிமை மற்றும் வீடமைப்புத் தொடர்பாகப் பார்ப்போம். எனக்கு ஞாபகம் இருக்கின்றது, இதே சபையில் ஒரு வருடத்துக்கு முன்னர் சில மலையகப் பிரதிநிதிகள், "நாங்கள் ஒரு வருடத்துக்குள் 4,500 வீடுகளைக் கட்டுவோம்" என்று எனக்குச் சவால் விட்டார்கள். இப்போது அவர்களை இந்தச் சபையில் காணவில்லை. நான் அன்றைய தினமே சொன்னேன், "4,500 வீடுகள் அல்ல, 400 செங்கற்களைக்கூட வைக்க முடியாது" என்று. கௌரவ அமைச்சர் அவர்களே, இப்பொழுது எத்தனை வீடுகள் கட்டப்பட்டு இருக்கின்றன என்பதைத் தெரிவிக்க முடியுமா?

கடந்த அரசாங்கத்தில் நாங்கள் காணி உறுதிப்பத்திரம் வழங்குவதற்காக 4,000 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்திருந்தோம். நான் ஏற்கனவே இந்தச் சபையில் கூறியிருந்தேன், காணி உரிமை வேறு, வீட்டு உரிமை வேறு என்று. கௌரவ அமைச்சர் அவர்கள் இம்மாதம் 12ஆம் திகதி நடைபெறவுள்ள நிகழ்வொன்றுக்கு எனக்கு அழைப்பிதழ் வழங்கியிருக்கிறார். அதற்காக என்னுடைய மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். ஆனால், அந்த நிகழ்வு என்ன என்பதை மக்களுக்குத் தெளிவுபடுத்தியாக வேண்டும். நீங்கள் எனக்கு வழங்கிய அழைப்பிதழில் தெளிவாகக் குறிப்பிடப்பட்டு இருக்கின்றது, "10,000 வீட்டுத்திட்டத்தில் 2,000 வீடுகளுக்கான உரித்தை வழங்கப்போகிறோம்" என்று. நான் சரியாகவே சொல்கிறேன், நீங்கள் வழங்கப்போவது 2,000 வீடுகளுக்கான காணி உறுதிப்பத்திரம் கிடையாது. மாறாக, தற்பொழுது எனது கையில் இருக்கும் இந்த ஆவணத்தைத்தான். இந்த ஆவணத்தில் என்ன எழுதப்பட்டு இருக்கின்றது என்றால், "உங்களுக்கு இந்த அரசாங்கத்தில் ஒரு வீடு வழங்கப்படுகிறது" என்றுதான். இந்த ஆவணத்துக்கு எந்தவிதமான சட்டரீதியான வலுவும் கிடையாது.

There is no legal strength or substance to this document. It is a document which merely says, "You have been allotted a house under this Government." This document, by the way, has been given by successive governments to beneficiaries. That is not the problem. நீங்கள் கிட்டத்தட்ட 2,088 பேருக்கு இந்த certificateஐ வழங்கப் போகிறீர்கள். ஆனால், நீங்கள் காணி உறுதிப்பத்திரம் வழங்கப்போவது 237 பேருக்குத்தான். அதிலும் நிகழ்வன்று 10 பேருக்குத்தான் வழங்கப் போகிறீர்கள். இந்த 237 பேருக்கு காணி உறுதிப்பத்திரம் வழங்கும் விஷயம் எனக்கு எப்படித் தெரியுமென்றால், இந்த 237 காணி உறுதிப்பத்திரங்களுக்கு பிள்ளையார்சுழி போட்டது நான்தான். கடந்த அரசாங்கத்தில் கிட்டத்தட்ட 1,000 காணி உறுதிப்பத்திரங்கள் வழங்கப்பட வேண்டுமெனத் தீர்மானிக்கப்பட்டதன் அடிப்படையிலேயே நாங்கள் அந்தத் திட்டத்தை மேற்கொண்டோம். ஆனாலும், அந்தத் திட்டத்தைத் தயார்செய்யும்போது நான் வெளிப் படையாக இந்தச் சபையில் சொன்னேன், "இது காணி உறுதித் திட்டம் கிடையாது. வீட்டுரிமைத் திட்டம்" என்று. நீங்கள் வழங்கப்போகும் பத்திரமானது யார், யாருக்கு அரசாங்கம் மூலம் வீடுகள் கட்டப்படுகின்றதோ அவர்களுக்குத்தான் அந்த காணி உறுதிப்பத்திரம்! இது பொய் என்றால், தயவுசெய்து திருத்துங்கள்! நான் சொல்வது உண்மை என்று எனக்கும் தெரியும்; உங்களுக்கும் தெரியும்!

நாங்கள் தெளிவாகவே சொல்லியிருக்கிறோம், "வீட்டுரிமை வேறு. காணியுரிமை வேறு" என்று. அரசாங்கம் வீடு கட்டித்தான் உறுதிப்பத்திரம் வழங்க வேண்டும் என்றால், அதற்குப் பெயர் தீர்வு கிடையாது. அது உங்களுடைய கடமை! அது மலையகத் தமிழர்களுக்கு மட்டுமல்ல, இந்த நாட்டிலுள்ள எல்லோருக்கும் வழங்கப்பட வேண்டும். அது சிங்கள மக்களாக இருக்கட்டும், ஈழத் தமிழர்களாக இருக்கட்டும், முஸ்லிம்களாக இருக்கட்டும், யார் வேண்டுமானாலும் இருக்கட்டும்! இலங்கையிலங்கையயில் இந்த நாட்டில் இலங்கையர் களுக்கு யாராவது வீடு கட்டினால், அவர்களுக்கு காணி உறுதிப்பத்திரம் வழங்குவது உங்களுடைய கடமை! நாங்கள் கேட்பது தீர்வு! 200 வருடங்களாக எங்களுடைய மக்கள் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கிறார்கள். மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்கள் 66,000 வீடுகளைக் கட்டியிருக்கின்றன. ஆனாலும் தீர்வு வரவில்லை. அப்படி இருக்கும்போது, நீங்களும் அதையே திரும்பத் திரும்ப செய்தால், அதில் என்ன பிரயோசம்? நீங்கள் தீர்வை வழங்குவதாக இருந்தால், அந்த மக்களுக்கு காணி உறுதிப்பத்திரத்தை வழங்குங்கள்! மக்கள் இப்போது வாழுகின்ற இடத்தில் 10 பேர்ச்சஸ் காணியைக் கொடுங்கள்! நீங்கள் நம்புகிறீர்களோ, இல்லையோ, மலையகத்தில் இருக்கின்ற தோட்டத் தொழிலாளர்களும் அவர்களைச் சார்ந்த நபர்களும் தானாகவே வீடுகளைக் கட்டிக் கொள்வார்கள். இதுதான் உண்மை! எதிர்வரும் 12ஆம் திகதி நடக்க இருப்பதை வீட்டுரிமைப் பத்திரங்கள் வழங்கும் ஒரு நிகழ்வாக என்னால் ஏற்றுக்கொள்ள முடியாது. அது ஓர் ஏமாற்று வேலை!

நீங்கள் 'ஹட்டன் பிரகடனத்தில்' இன்னொரு விஷயத்தையும் சொல்லி இருக்கிறீர்கள். அதாவது, அரச சேவையை மக்கள் மத்தியில் கொண்டு சேர்ப்பதற்குத் தங்களாலான முழு முயற்சியையும் எடுப்பதாகச் சொல்லி இருக்கிறீர்கள். அப்படியென்றால், இந்தக் கேள்விக்கு நீங்கள் பதில் சொல்லுங்கள்! அரச சேவை மக்களைச் சென்றடைய வேண்டும் என்பதற்காவே நாங்கள் எல்லோரும் இணைந்து

officeஐக் கொண்டுவந்தோம். உங்களுடைய 'ஹட்டன் பிரகடனத்தில்' குறிப்பிடப்பட்டு இருக்கிறது, "புதிய DS officeஐ உருவாக்குவோம்" என்று. ஆனால், நீங்கள் ஆட்சிக்கு வந்த பிற்பாடு, Norwood DS officeஐ மூடிவிட்டு, அதனை ஹட்டனுக்கு மாற்ற வேண்டுமெனச் சொன்னீர்கள். மக்களின் எதிர்ப்பு, அவர்களால் முன்னெடுக்கப்பட்ட போராட்டங்கள், ஆர்ப்பாட்டங்கள் காரணமாகத்தான் இன்றைக்கும் Norwood DS office அங்கேயே இருக்கின்றது. அங்கு வளங்கள் போதியளவு இல்லை. அதற்காக அதன் அத்திவாரத்தில் கைவைக்க முடியாது.

இதே 'ஹட்டன் பிரகடனத்தில்' நீங்கள் NEVIDA எனப்படுகின்ற பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபை பற்றி தெளிவாகக் குறிப்பிட்டு இருக்கிறீர்கள். இது மலையக மக்களுக்குத் தேவையான சேவைகளைக் கொண்டுபோய்ச் சேர்க்கும். ஆகையால், இதனுடன் சம்பந்தப்பட்ட சட்டத்தில் திருத்தம் கொண்டுவருவோம் என்று நீங்கள் அதில் சொல்லி இருக்கின்றீர்களே தவிர, இதனை ஒட்டுமொத்தமாக இல்லாமலாக்கப் போவதாகச் சொல்லவில்லை. இதனை

எங்களிடமும் சொல்லவில்லை; மக்களிடமும் சொல்லவில்லை. இங்கு பேசிய கௌரவ இராதாகிருஷ்ணன் அவர்கள் இந்த அதிகாரசபை தொடர்பில் கேள்வி ஒன்றை எழுப்பினார். அதற்கு கௌரவ அமைச்சர் அவர்கள், "நாங்கள் அதனை மேம்படுத்தத்தான் பார்க்கின்றோமே தவிர, அதை இல்லாமல் செய்யப் போவதில்லை" என்று பதில் சொல்லியிருந்தார்.

நாட்டின் சனாதிபதி அவர்கள், கௌரவ மனோ கணேசன் அவர்களிடம் ஓர் உறுதிமொழி கொடுத்திருக்கிறார், "நாங்கள் இதை மூட மாட்டோம்" என்று. ஆனால், அவருக்குக்கீழ் இயங்குகின்ற சனாதிபதி செயலகம் கடிதம் ஒன்றை வழங்கியிருக்கிறது. அதன் பிரதியை நேற்றைய தினம் கௌரவ மனோ கணேசன் அவர்கள் பாராளுமன்றத்தில் சமர்ப்பித்தார். அதில் தெளிவாகக் குறிப்பிடப்பட்டு இருக்கிறது, "மூடப்படும் நிறுவனங்களில் இதுவும் ஒன்று; எங்களுடைய முடிவை நாங்கள் மீள்பரிசீலனை செய்து பார்ப்போம். ஆனால், மாற்ற முடியாது" என்று. அந்தக் கடிதம் கௌரவ மனோ கணேசன் அவர்களிடம் இருக்கின்றது. NEVIDA எனப்படுகின்ற பெருந்தோட்டப் பிராந்தியத்துக்கான புதிய கிராமங்கள் அபிவிருத்தி அதிகாரசபையானது முக்கிய மானதொரு அதிகாரசபையாகும். உண்மையைச் சொல்வ தென்றால், பெருந்தோட்ட நிறுவனங்களின் ஆதிக்கத்தின்கீழ் PHDT இருக்கும் வரைக்கும் மலையகத்துக்கு development நடக்காது; உரிமை சார்ந்த விடயங்கள் கிடைக்காது.

காரணம் என்னவென்றால், Plantation Human Development Trustஐ இயக்குவது பெருந்தோட்ட நிறுவனங்கள்! NEVIDAவை இயக்குவது அரசாங்கம்! அரசாங்கம் என்ற வகையில், நீங்கள்தான் மலையக மக்களைப் பொறுப்பேற்க வேண்டும். பெருந்தோட்ட நிறுவனங்களின் websiteக்குப் போய்ப் பாருங்கள்! இந்த விடயத்தை நான் கட்டாயம் ஆங்கிலத்தில் செல்லியாக வேண்டும். ஏனெனில், எல்லோருக்கும் புரிய வேண்டும். Today, the regional planation companies state on their websites, "We have built 44,000 houses, we have done this for the workers and we have done that for the workers". Hon. Prime Minister, since you are here, I would like to explain this to you as well. Plantation companies have not done anything for the workers. They are sitting on the Board of the Plantation Human Development Trust and with whatever money that is allocated from the Treasury to that Trust, the work is being done. So, that is not the plantation companies' money or our money, but taxpayers' money. But, today, the plantation companies are taking the benefit out of it, which is why I urge the Government to utilize NEVIDA because NEVIDA removes middlemen and then, we do not have to depend on the companies. These are our people.

நான் இன்னொரு விடயத்தையும் சொல்ல விரும்புகின்றேன். அரச சேவையைப் பொறுத்தவரை, நாம் வரலாற்றைக் கொஞ்சம் எடுத்துப் பார்க்க வேண்டும். நாங்கள் மலையகத்தில் கிராம சேவையாளர் பிரிவுகளை அதிகரித்தேயாக வேண்டும். அதனை உடனடியாகச் செய்வதாக உங்களுடைய 'ஹட்டன் பிரகடனத்தில்' சொல்லி இருக்கின்றீர்கள். ஆனால், அதுவும் நடைபெறவில்லை. சுகாதாரம் மற்றும் கல்வித்துறை சம்பந்தமாக மலையகத்தில் 456 EMAs இருக்கின்றன. அவற்றை அரசாங்கம் பொறுப் பேற்க வேண்டுமென நாங்கள் ஏற்கனவே அமைச்சரவை அனுமதி எடுத்திருக்கிறோம். Schoolsஐப் பொறுத்தவரை, அங்குள்ள எல்லா schoolsஇலும் development நடந்திருக்கிறது. ஆனால், போதியளவு teachers இல்லை. நாங்கள் அறிமுகப்படுத்திய STEM teacher trainingமூலம் இந்தியாவில் இருந்து teachers வரவழைக்கப்பட்டு, ஆயிரக்கணக்கான teachersக்கும் studentsக்கும் training கொடுக்கப்பட்டது. இன்றைக்கு அது நிறுத்தப்பட்டு இருக்கின்றது. மலையகத்தில் கிட்டத்தட்ட 1,197 creches இலுள்ள - சிறுவர் பராமரிப்பு நிலையங்களிலுள்ள - 26,000 குழந்தைகளுக்கு இலவச காலை உணவு வழங்கும் திட்டத்தை நாங்கள் மேற்கொண்டோம். ஆறு மாதங்களின் பின்னர் அதுவும் நிறுத்தப்பட்டு இருக்கின்றது. நிலைமை இப்படி இருக்கும்போது, நீங்கள் எதைச் சொல்ல முடியும், ஒரு வருடத்தில் மலையகத்துக்கு இதைச் செய்திருக்கிறோம் என்று.

இறுதியாக, ஒரேயொரு விடயத்தைக் கேட்கின்றேன். இப்பொழுது நீங்கள்தான் சொன்னீர்கள், "நாங்கள் பெருந் தோட்ட நிறுவனங்களோடு நெருங்கி வேலை செய்கிறோம்; கட்டாயம் ஒரு தீர்வை எடுப்போம்" என்று. ஆனால், நீங்கள் 'ஹட்டன் பிரகடனத்தில்', பெருந்தோட்ட நிறுவனங்கள் தோட்டத் தொழிலாளர்களுக்கு எதிரான முறையில் செயற்பட்டுக்கொண்டு இருப்பதாகவும் Outgrower systemஐ கொண்டுவந்து இருப்பதாகவும் அதனை நிறுத்துவதாகவும் சொல்லி இருக்கிறீர்கள். எனினும், நீங்கள் அதை நிறுத்தவில்லை. பெருந்தோட்ட நிறுவனங்கள் மறைத்து வைத்திருக்கும் இலாபத்தை audit பண்ணி, அவர்களைச் சட்டத்துக்கு முன்னால் நிறுத்துவதாகச் சொன்னீர்கள். ஆனால், அப்படிச் செய்யவில்லை. நஷ்டத்தில் இயங்குவதாகக் கூறும் பெருந்தோட்ட நிறுவனங்களின் கீழுள்ள பெருந் தோட்டங்களை இன்னொரு நிறுவனத்துக்குக் கைமாற்றிக் கொடுப்பதாக நீங்கள் உறுதிமொழி கொடுத்து இருக்கிறீர்கள். நான் இன்றைக்குச் சொல்கின்றேன், 22 பெருந்தோட்ட நிறுவனங்களில் 16 பெருந்தோட்ட நிறுவனங்கள் நஷ்டத்தில் இயங்குவதாகக் காண்பித்துக்கொண்டு இருக்கின்றன. உங்களுக்குத் திராணி இருந்தால், அந்த 16 பெருந்தோட்ட நிறுவனங்களின் கீழுள்ள பெருந்தோட்டங்களை எடுத்து ஏனைய நிறுவனங்களுக்குக் கைமாற்றிக் கொடுங்கள் பார்ப்போம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Give me one more minute, Sir. I am almost done.

கடைசியாக, ஒரு விடயத்தைச் சொல்லி எனது உரையை முடிக்கிறேன். சம்பளப் பிரச்சினை தொடர்பில் நான் உங்களை அவ்வளவாக விமர்சிக்க விரும்பவில்லை. ஏனென்றால், சம்பளத்தை அதிகரித்து வழங்குவது என்பது எவ்வளவு கஷ்டமென்று எனக்குத் தெரியும்! வரலாற்றில் இரண்டு முறை அதிகளவு சம்பள உயர்வைப் பெற்றுக்கொடுத்து இருக்கிறேன். எனக்குச் சம்பளம் சம்பந்தமாக ஒரேயொரு கேள்விதான் இருக்கிறது. அதற்கு நீங்கள் பதில் சொல்வீர்களென நான் எதிர்பார்க்கின்றேன். பெருந்தோட்டத் தொழிலாளர்களுக்கு 1,700 ரூபாய் நாட்சம்பளம் கொடுக்க வேண்டுமென நீங்கள் தீர்மானித்துள்ளீர்கள். திருப்தியான விடயம்! நீங்கள் அந்த 1,700 ரூபாயை எப்படிக் கொடுக்கப் போகின்றீர்கள்? 1,350 ரூபாய் அடிப்படைச் சம்பளத்தில் ஏதாவது அதிகரிப்பு இருக்கின்றதா? இல்லாவிட்டால், நீங்கள் எல்லாவற்றையும்

[ගරු ජීවන් තොන්ඩමන් මහතා]

incentiveஆகக் கொடுக்கப் போகின்றீர்களா? இதனைக் கூட்டு ஒப்பந்தம் மூலமாகக் கொடுக்கப் போகின்றீர்களா? சம்பள நிர்ணய சபை மூலமாகக் கொடுக்கப் போகின்றீர்களா? என்னைப் பொறுத்தவரைக்கும், இது 'ஹட்டன் பிரகடனம்' அல்ல. ஹட்டன் விபரீதம்! நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.06]

**ගරු විජිත හේරත් මහතා (විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித ஹேரத் - வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சர்)
(The Hon. Vijitha Herath - Minister of Foreign Affairs, Foreign Employment and Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ලංකාවේ ඉතිහාසයේ පළමු වතාවට කිසිදු ප්‍රචණ්ඩකාරීත්වයක් නැති මැතිවරණ පවත්වන අලුත් ආදර්ශය ලබා දුන්නා. ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, ප්‍රාදේශීය සභා මැතිවරණය ඉතාම සාමකාමීව, සාධාරණව හා නිදහස්ව පැවැත්වුවා. ලංකා ඉතිහාසයේ කවදාකවත් මේක වෙලා නැහැ. එතැනින් තමයි අපි ගමන ආරම්භ කළේ. මේ ගෙවිච්ච අවුරුද්ද තුළ ඔබතුමන්ලා මොන මොන විවේචන ඉදිරිපත් කළත් අපි ඉතා ආඩම්බරයෙන් කියනවා, ලංකාවේ කිසිදු ආකාරයක ජාතිවාදී ගැටුමක් ඇති වුණේ නැහැ, කිසිදු ආකාරයක ආගම්වාදී ගැටුමක් ඇති වුණේ නැහැ කියලා. ජාතිවාදී, ආගම්වාදී ගැටුම්වලින් තොරව, සාමකාමී, නිදහස් මැතිවරණ පවත්වා ලංකාවේ දේශපාලනය අලුත් මාවතකට ගමන් කිරීම ආරම්භ කළේ මේ ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුවයි කියන එක මම මුලින්ම සඳහන් කරන්න කැමැතියි. ඒ වාගේම තමයි අපි සම්බන්ධයෙන්, අපේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පසුගිය දවස්වල "මාර්තු 12 ව්‍යාපාරය" ඉතා පැහැදිලි විශ්ලේෂණයක් කළා. ඒ විශ්ලේෂණය තුළ ඉතා පැහැදිලිව, දත්ත සහිතව පෙන්නුම් කර තිබෙනවා අපේ භාවිතාව කොයි වාගේද කියලා, අපි දීපු පොරොන්දු සහ අපේ ක්‍රියාකාරීත්වය පිළිබඳව. ඉතින්, එය පරිශීලනය කරන්න කියාත් මම ඉල්ලා සිටිනවා.

මේ ගෙවුණු කාලය තුළ විශේෂයෙන්ම මතු කළා, රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා රටට වාසිදායක විධියට ලබා ගැනීම සම්බන්ධව. අපි එන්න කලින් අපේ විරුද්ධවාදීන් කිව්වේ, අපි ආවාට පසු අපට ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වන්න පුළුවන් උතුරු කොරියාව, කියුබාව, චීනය එක්ක විතරයි කියලායි. නමුත්, ඉතා පැහැදිලිව, වගකීමෙන් අපි ඔප්පු කර පෙන්වා තිබෙනවා ඒක එහෙම නොවෙයි කියලා. ලෝකයේ සියලුම රටවල් එක්ක ඉතාම කිට්ටු රාජ්‍ය තාන්ත්‍රික මිත්‍ර සම්බන්ධතා අපි පවත්වාගෙන යනවා. ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, රුසියාව, ජපානය, ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ලතින් ඇමෙරිකානු රටවල්, අප්‍රිකානු රටවල් ආදී ලෝකයේ සෑම මහාද්වීපයක්ම ආවරණය වන විධියට ඒ සියලුම රටවල් එක්ක ඉතාම කිට්ටු, මිත්‍ර රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා අපි පවත්වාගෙන යනවා. ඒ විතරක් නොවෙයි. ඒ සියලුම රාජ්‍යයන්වලින් රටේ ජනතාවට යහපත් වන බොහෝ දේවල් අපි ලබාගෙනත් තිබෙනවා, ලබාගනිමිනුත් තිබෙනවා. ඒ හැම රටකින්ම අපේ රටට ආයෝජකයෝ එනවා. අදත් තව සුළු මොහොතකින් ඇමෙරිකා එක්සත් ජනපදයේ ආයෝජකයින් 23දෙනෙක් ලංකාවට එනවා. ඒ අය එක්ක හෙට, අනිද්දා, ඉන් අනිද්දා අපි සාකච්ඡා පවත්වා අලුත් ආයෝජන කැඳවා ගන්නවා.

අපි ඉන්දියාවට ගියා; චීනයට ගියා; වියට්නාමයට ගියා; ජර්මනියට ගියා; ඇමෙරිකා එක්සත් ජනපදයට ගියා. ඒ විතරක් නොවෙයි, ජපානයටත් ගියා. අපි ඒ හැම රටකින්ම ලංකාවට විශේෂ වෙච්ච වාසි ගොඩක් ගෙනැල්ලා තිබෙනවා. ඊයේ පෙරේදා ජපානයට ගිය ගමනින් රුපියල් බිලියන 2කට ආසන්න ප්‍රදානයක් අපි ලබාගත්තා. ලංකාවේ ග්‍රාමීය කිරි නිෂ්පාදනය නඟා සිටුවන්න යෙන් මිලියන 463ක ආධාරයක් අපට ලැබුණා. ඒක ආසන්න වශයෙන් ලංකාවේ මුදලින් රුපියල් මිලියන 1,000ක්. අපේ නාවික හමුදාවේ ආරක්ෂක කටයුතු සඳහා යෙන් මිලියන 500ක ප්‍රදානයක් ලැබුණා. ඒක ආසන්න වශයෙන් ලංකාවේ මුදලින් රුපියල් බිලියනයක්. මේ දෙක එකතු කළත් රුපියල් බිලියන 2ක්. ඒවා සම්පූර්ණයෙන්ම ප්‍රදාන හැටියට ලැබුණේ. අපේ චීනයේ ගමනත් එක්ක අපි අවබෝධතා ගිවිසුම් අත්සන් කර, අපට වාසිදායක ගොඩක් දේවල් ලබාගත්තා. 2025 අවුරුද්දට මුළු ලංකාවේම පාසල් දූ දරුවන්ට පාසල් නිල ඇඳුම් චීනයෙන් අපට නොමිලේ ලබා දුන්නා. 2026 අවුරුද්දටත් අපට එවැනිම වූ ආකාරයට පාසල් දරුවන්ට නොමිලේ නිල ඇඳුම් ලබා දෙනවා. මේ මාසයේ 13වැනි දා අපේ අගමැතිතුමිය චීනයට යනවා, එහිදී නැවත වතාවක්. චීන ජනාධිපතිතුමා මුණ ගැසෙනවා. චීනයේ ප්‍රධාන දේශපාලන අධිකාරියේ කිහිපදෙනෙක් එක්ක ද්විපාර්ශ්වික සම්බන්ධතා නැවත ශක්තිමත් කරනවා. ඒවායින් අපි තවත් වාසිදායක දේවල් රටට ගෙනෙනවා. ඒ ගමන අවසන් කරපු ගමන් ගරු අගමැතිතුමිය ඉන්දියාවට යනවා. ඉන්දියාවේදී එතුමිය නැවත ඉන්දියානු අගමැතිතුමා හමු වෙනවා, විදේශ ඇමතිතුමා ඇතුළු ඒ රාජ්‍ය තාන්ත්‍රිකයන් මුණ ගැසෙනවා. ඒ හරහාත් අපේ රටට තවත් ගොඩක් දේවල් ගෙනෙනවා. අපි දවසින් දවස ලෝකයේ විවිධ රටවල් එක්ක රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා ශක්තිමත් කරගෙන යනවා. අද බෙලරුස් ජනරජයේ තානාපතිවරයා මෙහි ආවා. බෙලරුස් තානාපතිවරයාත් එක්ක කළ සාකච්ඡාවේදී බෙලරුස්වල ඉඳලා ශ්‍රී ලංකාවට සෘජු ගුවන් ගමන් ආරම්භ කිරීම ගැන අපි සාකච්ඡා කළා. දැනට අපි licences දීලා තිබෙනවා. Charter flightsවලට අපි ඉඩ දීලා තිබෙනවා. අපි තවත් ඉස්සරහට ගිහිල්ලා බෙලරුස්වල ඉඳන් ලංකාවට ඒ අයගේ ගුවන් යානා ගුවන් ගමන් ආරම්භ කිරීම පිළිබඳ සාකච්ඡා කරනවා; ඒ සඳහා වන අවබෝධතා ගිවිසුම්වලට එළඹෙනවා. මේ කෙටි කාලය තුළ අපි ලබා ගත් ජයග්‍රහණ ගොඩක් තිබෙනවා. ඒවායින් එකක්, දෙකක් තමයි මම කිව්වේ.

ඒ වාගේම මම කියන්න කැමැතියි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සලයේදී පසුගිය 6වැනි දා සම්මත වෙච්ච යෝජනාව ගැන. ඒක අලුත් යෝජනාවක් නොවෙයි. ඒක 2021 වසරේ ඉදිරිපත් වෙච්ච යෝජනාව. ඒකට අදාළව අවස්ථා දෙකකදී කාලය දිගු කළා. මේ 6වැනි දා වුණේත් අවුරුදු දෙකකට නැවත කාලය දිගු කිරීමක්. අපට තිබෙනවා, 2027 සැප්තැම්බර් මාසය වන කොට ලංකාව තුළ අපේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සම්බන්ධව වගවීමේ ක්‍රියාවලිය පිළිබඳ ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරන්න. ඉතින්, ඒක තමයි සිද්ධ වුණේ. ඒක පාවා දීමක් නොවෙයි. මේ රටේ මානව හිමිකම් ආරක්ෂා කරලා, අපේ ජාතික සංහිඳියාව ඇති කිරීමට අපේ රට ඇතුළේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නවා කියලා සහතික කරලා, අපි ඒක ප්‍රායෝගිකව ඔප්පු කරලා පෙන්වනවා. අපි දැනටමත් ඇතැම් ඒවා කරලා තිබෙනවා. නිදහස් මැතිවරණ පැවැත්වීමෙන් අපි ඔප්පු කරලා තිබෙන්නේ ඒකයි. ජාතික සංහිඳියාව වෙනුවෙන් තමයි ජාතිවාදී, ආගම්වාදී ගැටුම්වලින් තොරව අපේ රට ඉදිරියට ගෙන යන්නේ. අපි ඒක ඔප්පු කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දූෂණ වංචා පිළිබඳව සහ සිදු වෙච්ච එවැනි විවිධ සිදුවීම් පිළිබඳව

පරීක්ෂණ කරලා ඒවාට නිසි ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙනවා. පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳව ඉතා ගැඹුරු පරීක්ෂණයක් කරගෙන යනවා. ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල නොබෝ දිනකින් එයි. ඒ අනුව නීත්‍යනුකූල ක්‍රියාමාර්ග ගන්නවා.

ඊයේ පැවැති උසස් නිලතල පිළිබඳ කාරක සභාවේදී කිසිසේත් සාකච්ඡා වෙච්ච නැති දෙයක් ගරු මන්ත්‍රීවරයෙකු වැරැදි විධියට මාධ්‍යවලට නිකුත් කර තිබෙනවා. මම ඒ ගැන කනගාටු වෙනවා. මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ඒ පිළිබඳව දැනටමත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර තිබෙනවා. ඒ පැමිණිල්ලට අනුව ඒ වැරැදි ප්‍රවෘත්තිය ප්‍රචාරය කරපු අයටත්, ඒ ප්‍රවෘත්තිය ලබා දීපු අයටත් එරෙහිව අනිවාර්යයෙන් නීතිය ක්‍රියාත්මක වෙනවා. ඔවුන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. මම වගකීමෙන් කියනවා, පොලීසිය භාර අමාත්‍යාංශයේ අපේ රවි සෙනෙවිරත්න ලේකම්වරයා පාස්කු ප්‍රහාරය ඉන්දියාවේ වුවමනාවට ක්‍රියාත්මක වෙච්ච එකක්, මේකේ මහ මොළකරුවා ඉන්දියාවයි කියලා කොහෙත්ම කියලා නැති බව. එවැන්නක් කියා තිබෙනවා කියන එක මුළුමනින් ප්‍රතික්ෂේප කරනවා. කිසිම රටක් ගැන සඳහන් කරලා නැහැ. ගරු අගමැතිතුමිය තමයි එම කාරක සභාවේ සභාපතිත්වය දැරුවේ. එතැන කිසිසේත් ඉන්දියාවක් ගැන කථාවක්වත් කළේ නැහැ; කිසිම රටක් ගැන සාකච්ඡා කළේ නැහැ. නමුත්, ඉතාම වැරැදි විධියට, ඉතාම සාහසික, වැරැදි ප්‍රවෘත්තියක් නිර්මාණය කරලා තිබෙනවා, ඒ කමිටුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. ඒක ඉතාම වැරැදි පූර්වාදර්ශයක්. ඒ නිසා ඒකට අදාළව ගන්න පුළුවන් උපරිම නීත්‍යනුකූල ක්‍රියාමාර්ග අනිවාර්යයෙන් ගන්නවා. මොකද එකක් තමයි, උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ කථා වෙන දේවල් මාධ්‍යවලට දෙන්න සදාචාරාත්මක අයිතියක් නැහැ. එසේ කිරීම වැරැදියි. ඒ කාරක සභාවේ කටයුතු ගැන හරි අවබෝධයක් තිබෙනවා නම් ඒ ප්‍රතිපත්තිය රකින්න ඕනෑ. එතැන කථා වෙන සියල්ල මාධ්‍යවලට දෙන සම්ප්‍රදායක්, සදාචාරයක් කිසිසේත් නැහැ. ඒක රීතිවලට පටහැනියි. ඒ නිසා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, එවැනි දේවල් මීත් මත්තට කරන්න එපා කියලා. ඒක එතැන කථා වෙච්ච දෙයකුත් නොවෙයි. ඒක එතැනදී කිසිසේත් කථා වෙච්ච දෙයක් නොවෙයි. අපි ගොඩ නඟාගෙන යන රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා මේ ආකාරයට වැරැදි ප්‍රවෘත්ති ලියලා බිඳ වට්ටන්න හිතාමතාම කරන වැඩක් එය. අද දෙමළ පුවත් පත් කිහිපයකත්, සමාජ මාධ්‍යවලත් එය ප්‍රචාරය වෙමින් යනවා. අපි එය සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරනවා. එවැනි කිසිදු ආකාරයක ප්‍රකාශයක් ලේකම්වරයා කිව්වේත් නැහැ; රජයක් විධියට අපි එහෙම කියන්නේත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, මේ කෙටි කාලය තුළ අප අපේ රටේ ආර්ථිකය තුළ, ආයෝජනවල, අපේ අපනයන ආදායම්වල, අපේ විදේශ සංචිතවල ඉහළ වර්ධනයක් ඇති කරගෙන තිබෙන බව. අද වන විට අපේ රටේ විදේශ සංචිතය ඩොලර් බිලියන 6.2 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. අපි අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 13ටත් එහාට වර්ධනය කරගෙන තිබෙනවා. අපේ සංචාරක ව්‍යාපාරයේ ආදායම මේ ගෙවී ගිය මාස කිහිපයේදී විතරක් ඩොලර් බිලියන 2.3ක්. මේ කාලසීමාව තුළ සංචාරකයන්ගේ පැමිණීම 1,725,000ක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. අපි එහි සියයට 20ක වර්ධනයක් ඇති කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපේ විදේශ ප්‍රේෂණවලින් - remittancesවලින් - මේ වන විට ඩොලර් බිලියන 4කට ආසන්න ප්‍රමාණයක් අපි උපයාගෙන තිබෙනවා. එතැනම ඩොලර් බිලියන 6.3ක් අපි ආදායම් විධියට උපයාගෙන තිබෙනවා. අපේ රටේ සංචාරක කර්මාන්තය දවසින් දවස දියුණු වෙනවා. ඒ එන සංචාරකයෝ backpackersලා නොවෙයි. ඒ එන සංචාරකයෝ ඉන්දියාව, එක්සත් රාජධානිය, රුසියාව, ජර්මනිය, චීනය, ප්‍රංශය, ඕස්ට්‍රේලියාව, නෙදර්ලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය ඇතුළු යුරෝපයේ ප්‍රධාන රටවලින් තමයි වැඩිපුරම එන්නේ. යුරෝපීය රටවලින් එන්නේ backpackersලා නොවෙයි. එවැනි රටවලින් එන්නේ ඉහළ ආකාරයෙන් වියදම් කරන සංචාරකයෝ; ඉහළ මට්ටමේ සංචාරකයෝ. ඒ නිසා අපි මේ කෙටි කාලය තුළ සංචාරක කර්මාන්තය ප්‍රමාණාත්මකව විතරක් නොවෙයි, ගුණාත්මකවත් වර්ධනය කර තිබෙනවා. අපි ඒ බව ඔප්පු කර තිබෙනවා මේ කෙටි කාලය තුළ. අද රටේ දේශපාලන ස්ථාවරත්වයක් තිබෙනවා. රටේ ආර්ථිකය වේගයෙන් ඉදිරියට යමින් පවතිනවා. දේශපාලන ස්ථාවරත්වයත්, ආර්ථිකයේ ශක්තිමත්භාවයත්, රටේ පවතින සාමකාමී තත්ත්වයත් නිසා සංචාරකයන්ගේ පැමිණීම වැඩි වෙනවා. අපි ඒකට අවශ්‍ය යටිතල පහසුකම් ඇතුළු බොහෝ දේවල් වර්ධනය කර තිබෙනවා. තව ඉදිරියටත් අපි බොහෝ ක්‍රියාමාර්ග ගන්නවා.

අවසාන වශයෙන් මම කියන්න කැමැතියි, මේ කෙටි කාලය තුළ රජය විධියට අපි මේ රටේ අවුරුදු ගණනක් තිස්සේ තිබිච්ච සියලුම රජයන් නොකරපු දේවල් කරමින් සිටින බව. එම රජයයන් විසින් දේශපාලන වශයෙන් අගාධයට තල්ලු කරලා ආර්ථික වශයෙන් බංකොලොත් තත්ත්වයට පත් කරලා තිබිච්ච අපේ රට අවුරුද්දක් වැනි කෙටි කාලයක් තුළ සම්පූර්ණයෙන්ම අනෙක් පැත්තට, ධනාත්මක පැත්තට වෙනස් කරන්න පළමුවැනි පියවර අපි තියලා සාර්ථක ගමනක් ඇවිල්ලා තිබෙනවා. ඉදිරි කාලයේදී අපි ඉතාම ජයග්‍රාහී මට්ටමින් මේ රටේ ජනතාවට ජයග්‍රහණ රාශියක් ලැබෙන ආකාරයට අපේ වැඩ කටයුතු ඉස්සරහට ගෙන යනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආචාර්ය අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.17]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்திப் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු කරුණු අපේ ආණ්ඩුව කොච්චර දුරට ඉෂ්ට කරලා ද, එමඟින් ඇති වෙච්ච ප්‍රගතිය කුමක්ද යන්න පිළිබඳවයි අද මේ විවාද කරන්නේ. ආණ්ඩුවක් තමුන්ගේ දැක්ම, දර්ශනය අනුව අදාළ වැඩ කටයුතු කිරීමේදී මොන වාගේ ගමන් මාර්ගයකද යන්නේ කියලා විපක්ෂය ප්‍රශ්න කරලා, ඒ සම්බන්ධයෙන් අද සාකච්ඡා කරන එක ඉතාම හොඳ දෙයක් කියලා මම හිතනවා. එය තක්සේරු කිරීමට ප්‍රථම අපි අවබෝධ කරගත යුතු වෙනවා, ප්‍රතිපත්ති ප්‍රකාශනයක් කියන්නේ මොකක්ද; එහි අන්තර්ගතය මොන වාගේ එකක්ද කියන එක. ප්‍රතිපත්ති ප්‍රකාශනයක් තුළ හුදෙක්ම යම් යම් ක්‍රියාමාර්ග ගැන සඳහන් කළත්, එහි ප්‍රධාන වශයෙන්ම අන්තර්ගත වන්නේ තමන් මේ රට මෙහෙයවමින් යන්නේ මොන දිශාවටද කියන එකයි.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ බව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තේමාව හැටියට ඉතා පැහැදිලිව සඳහන් කර තිබෙනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යනුවෙන්. පොහොසත් රටක් කියන එකෙන් අදහස් කරන්නේ නැහැ හුදෙක්ම මුදල් වශයෙන් පොහොසත් වීම පමණක්, මුදල් ගොඩ ගසා ගැනීම පමණක් කරනවා කියන එක. සෑම ක්ෂේත්‍රයකින්ම පොහොසත්, පරිපූර්ණ වෙච්ච තත්ත්වයක් තමයි අපි මේ ගොඩනගන්න හදන්නේ. අද ලෝකය අත්පත් කරගෙන තිබෙන ආර්ථික දියුණුව, සමාජයීය දියුණුව, සංස්කෘතික දියුණුව, තාක්ෂණයේ දියුණුව යන ආදියත් එක්ක ගත්තාම අපි ගොඩක් පිටුපසින් ඉන්නේ. අපි එතැනට යන්න ඕනෑ කියන දර්ශනය තමයි මේ "පොහොසත් රටක්" කියන එකේ අදහස වී තිබෙන්නේ. ඒ වාගේම ඒ පොහොසත් රට ඇතුළේ පොහොසත්භාවය ජනනය වනකොට රටේ ජීවත් වන පුරවැසියන්ට ඒ කියපු ලස්සන ජීවිතය අත්පත් වෙන්න නම්, ඒ පොහොසත්භාවයෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණ මට්ටමකින් මිනිසුන් අතරට යන්න ඕනෑ. ඒ අනුව තමයි මේ කියන ලස්සන ජීවිතය අත්පත් වෙන්නේ. තමුන්ගේ ජීවිතය ලස්සන වෙන්න නම් තමුන්ගේ ආහාර, ඇඳුම් පැළඳුම්, සෞඛ්‍ය, අධ්‍යාපනය, එදිනෙදා කරන වැඩකටයුතු ආදි සියල්ලටම බය නැතුව වියදම් කරන්න පුළුවන් වන ගෞරවාන්විත ජීවිතයක් අත්පත් කර ගැනීමේ හැකියාව තිබෙන්න ඕනෑ. ඒකට තමයි "ලස්සන ජීවිතයක්" කියන්නේ. එහෙම බැලුවාම, මේ තේමාවට අදාළ ප්‍රතිඵලය එක වර, දවස් ගණනාවකින්, මාස ගණනාවකින්, අවුරුද්දකින් අත් පත් කර ගන්න පුළුවන් එකක් නොවෙයි. අපි දන්නවා, මේක දිගුකාලීන ගමනක් බව. අපි මේ තක්සේරු කිරීමේදී, අපේ ප්‍රගතිය විමර්ශනයට ලක් කිරීමේදී බලන්න ඕනෑ, මෙන්න මේ කියන දිසාවටද යන්නේ කියලා. ඇත්ත වශයෙන්ම අපි සැලකිල්ලට අරගෙන තිබෙන කරුණු කාරණා අනුව අපේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් පෙන්වපු, අපි යන්න ඕනෑ දිසාව වෙනස් කරලා නැහැ. ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඒ ආකාරයෙන්ම ගනිමින් තිබෙනවා. ඉදිරියටත් ඒ ආකාරයෙන්ම අපි ඒ ක්‍රියාමාර්ග ගන්නවා.

විපක්ෂය විසින් මේක අර දින 100ක ප්‍රගතියක් විධියට කරුණු ඉදිරිපත් කරන්න ගත්තා. ඇත්තටම මේ දින 100 ප්‍රගතිය පිළිබඳ පාරිභාෂණයක් එන්නේත් ඉතා ඈත අතීතයක ඉඳලා. 1933දී ඇමෙරිකානු එක්සත් ජනපදයේ ජනාධිපතිවරයෙකු වූ රූස්වෙල්ට්ගේ කාලයේ ඇති වෙච්ච තත්ත්වයකදී New Deal ලියවිල්ල ඉදිරිපත් කරලා ඒ පැවතෙන තත්ත්වයෙන් රට ඉදිරියට අරගෙන යන්නේ කොහොමද, ඒ කරුණු බේරාගන්නේ කොහොමද කියන කාරණයෙන් තමයි මේ දින 100 වැඩසටහන පළමුවෙන්ම එන්නේ, ඉතිහාසයට. දින 100කදී ඇත්තටම බලන්නේ සමස්ත ආර්ථිකය ප්‍රතිසංස්කරණය කරලා කොච්චර ප්‍රතිලාභ ගත්තාද, කර්මාන්ත දියුණු කළාද කියන කාරණායි. ආයෝජනය කරනවාට වඩා වැදගත් කාරණය තමයි පවතින තත්ත්වය හරියට කළමනාකරණය කරලා නිවැරදි දේශපාලන දිශානතියකට රට ගෙනියනවාද කියන එක. අපේ මේ දින 100 ඇතුළත කාලය අරගෙන බැලුවාම ඉතාම නිවැරදිව අපි මේ කාරණය කළමනාකරණය කරලා තිබෙනවා. අපි ආණ්ඩුව ලබා ගන්නකොටම අපට ලැබුණේ බිඳ වට්ටපු රටක්, එක තැන නැවතිච්ච රටක්. ඇත්ත වශයෙන්ම ගත්තොත්, අගාධයට යමින් තිබ්ච්ච රටක්. එහෙම නම් අපේ දිශානතිය වන්නේ ඒ නැවතිච්ච තත්ත්වය ඉදිරියට ගෙනයන්න අවශ්‍ය පරිසරය හදන එක. ඒක තමයි ස්ථායීකරණය කියන්නේ. අගාධයට යමින් තිබ්ච්ච එක වළක්වාගන්න එක, තවදුරටත් වැටෙන්න නොදී වළක්වාගන්න එක තමයි අපේ පළමුවැනි කාර්යභාරය. ඒකට දින 100ට වඩා වැඩි කාලයක් යනවා. නමුත් අපට පුළුවන්කම ලැබුණා, ඉතා කෙටි කාලයකදී මේ ස්ථාවරභාවය අත්පත් කරගන්න. ඒ ස්ථාවරභාවය මත ඉඳගෙන තමයි ඉතුරු කටයුතු කරන්න අපට සිදු වෙලා තිබෙන්නේ.

අපේ ප්‍රගතිය සාකච්ඡා කරන ගමන්ම මම පොඩ්ඩක් කැමැතියි, මේ කාරණයත් සඳහන් කරන්න. කලින් ආණ්ඩුවලදී ප්‍රතිපත්ති ප්‍රකාශ පිළිබඳ මේ වාගේ වාද විවාද කළාද කියලා මම දන්නේ නැහැ. හැබැයි අද මේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු හිටපු ආණ්ඩු -අපි 2010, 2015, 2019 කියන ආණ්ඩු තුන- අරගෙන බලමු, සාරාංශයක් විධියට. ප්‍රධාන වශයෙන් 2010දී පත් වුණු ආණ්ඩුව ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් ඉදිරිපත් කරනවා, දූෂණ විරෝධී, දූෂණය නැති යහපත් ආණ්ඩුවක් හදාගන්නවා කියලා. ඒ වාගේම 2009දී යුද්ධය අවසාන වෙලා රට සංවර්ධනය කරයි කියලා රටට නව බලාපොරොත්තුවක් ඇති වුණා. හැම දෙනෙක්ම ඒ ගැන කථා බහ කළා; විද්වතුන් ලිපි ලිව්වා. ආයෝජකයෝ කිව්වා, ආයෝජන ප්‍රගුණ කරන්න දැන් විශාල අවස්ථා තිබෙනවා කියලා. ඔවුන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණා, "පශ්චාත් යුධ සංහිඳියාව හරහා ආර්ථික සංවර්ධනය" කියලා. හැබැයි මොකක්ද 2010-2015 ආණ්ඩුව අවසානයේදී ඉතුරු වුණේ? මේ රට දූෂණයෙන් පිරිච්ච රටක් බවට පරිවර්තනය කළා. අන්න ඒ නිසා අපේ ප්‍රගතිය සාකච්ඡා කරන ගමන්ම ඔයගොල්ලන්ගේ ප්‍රගතිය ගැනත් අවම වශයෙන් කරුණු කිහිපයක්වත් සාකච්ඡා කරන්න. ඒ වාගේම තමයි ණය. රට විශාල ණය බරක හිර කරලා තිබෙනවා, ඒ කාල පරිච්ඡේදය තුළ. ඒවායේ ප්‍රතිඵල තමයි අපට මේ භුක්ති විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ඊළඟට, අපි 2015-2019 යහ පාලන ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් කරුණු කිහිපයක් අරගෙන බලමු. ඔවුන්ට යහ පාලන ආණ්ඩුව කියලා නම පට බැඳෙන්නේත් යහපත් ආණ්ඩුකරණය - good governance - සහ දූෂණය පිටු දකිනවා කියන එක මත. ආර්ථිකය වර්ධනය කිරීම, දියුණු කිරීම කියන කාරණා ගණනාවක් ඒක ඇතුළේ ඉදිරිපත් කළා. නමුත් අපි කවුරුත් දන්නවා, ආණ්ඩුව පටන්ගෙන මාස කිහිපයක් යනකොට ඉතාම සුප්‍රසිද්ධ මහ බැංකුව නිකුත් කරන ලද බැඳුම්කර වංචාව සිද්ධ වූ බව. වංචාව, දූෂණය නවත්වනවා කියලා තමයි ඔවුන් බලයට ආවේ. ඒ නිසා ඉතිහාසය අරගෙන බැලුවාම අපට හොඳටම පෙනෙනවා, ඒ ආණ්ඩුවල ප්‍රතිපත්ති ප්‍රකාශවල තිබුණු කාරණා ඉෂ්ට කළේ නැහැ කියලා.

ඒ වාගේම, අපි 2019 ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය අරගෙන බැලුවාම එහිත් තිබෙනවා, යහපත් ආණ්ඩුකරණය - good governance, සංහිඳියාව, නීතිය, සාධාරණත්වය වාගේම, ආර්ථිකය පැත්තෙන් ආර්ථික සමෘද්ධිය සහ ස්ථාවරත්වය ඇති කිරීම - creating economic prosperity and stability - යන කරුණු. හැබැයි මොකක්ද වුණේ? ආර්ථික සමෘද්ධිය සහ ස්ථාවරත්වය නොවෙයි, ආර්ථිකය බිඳ වට්ටලා අන්තිමට මහජනතාව විසින් ගහලා පන්නන තත්ත්වයකට පත් වුණා. ඒ නිසා ඒ අය ප්‍රතිපත්ති ප්‍රකාශ හදලා අනුගමනය කරපු තත්ත්වය විශ්ලේෂණය කරලා බැලුවා නම් අද ඒ අය අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රගතිය විශ්ලේෂණය කරන්න එන්නේ නැහැ. මොකද, අපේ ප්‍රගතිය ඉතාම ප්‍රශංසනීයයි. නිවැරදි දිසාවට අපි ගමන් කරමින් තිබෙනවා.

අපේ ප්‍රගතිය කොතැනින්ද පෙන්නුම් කරන්නේ කියලා අපි ඒ කරුණු කාරණා එකින් එක අරගෙන බලමු. ඒ සමස්තය ඇතුළේ ඉතාම වැදගත් වන කාරණය තමයි, ස්ථායීකරණය. ස්ථායීකරණය කොයි තරම් වැදගත් කාරණයක්ද කියනවා නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 102 වන පිටුවේ ඒ ගැන සඳහන් වනවා. අපි කලිනුත් ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කර තිබෙනවා. මෙවර අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 102 වන පිටුවේ සඳහන් කරනවා, ස්ථායීකරණය සඳහාම වූ වැඩ පිළිවෙළක්. මූල්‍ය ස්ථායීකරණය, රාජ්‍ය මූල්‍ය ස්ථායීකරණය, විදේශ අංශයේ ස්ථායීකරණය කළ යුතු වන්නේ

කොහොමද, ඒ සඳහා වන අපේ දැක්ම මොකක්ද කියලා එහි කියනවා. ඒ කියන්නේ, එය අපි දුර සිට දැක්කා, අපේ ආණ්ඩුවක අපි ඒ ස්ථායිකරණය කරනවා කියලා. ඒ ස්ථායිකරණයේදී වැදගත් වනවා ආර්ථික වර්ධනය. අපි සෑහීමකට පත් වන ආර්ථික වර්ධනයක් දැන් අත්පත් කරගෙන තිබෙනවා. විවිධ පුරෝකථන යටතේ මේ තත්ත්වයේදී අපට අත්පත් කර ගන්න පුළුවන් වනවා කිව්වේ සියයට 3.5ක් වාගේ ආර්ථික වර්ධනයක්. නමුත්, 2024 වර්ෂයේ අවසාන කාර්තුවේදීත්, 2025 වර්ෂයේ පළමු සහ දෙවැනි කාර්තුවලදීත් අපට පුළුවන් වුණා සියයට 5කට ආසන්න ආර්ථික වර්ධනයකට එන්න. අපට ඇත්තටම අවශ්‍ය කරනවා මීන් එහාට ලොකු වර්ධනයකට යන්න. නමුත්, මේ ස්ථායිකරණය ඇතුළේ මේ වර්ධනය ඉතාම හොඳයි. ලෝක බැංකුව 2025 ජනවාරි මාසයේදීත්, අප්‍රේල් මාසයේදීත් පුරෝකථනය කළේ අපට සියයට 3.5ක වාගේ ආර්ථික වෘද්ධියකට යන්න පුළුවන් වෙයි කියලා. නමුත්, ඔක්තෝබර් මාසයේ ඉදිරිපත් කළ නවතම වාර්තාව අනුව ඔවුන් කියනවා, අපට සියයට 4.6ක වර්ධනයකට යන්න පුළුවන් කියලා. ආර්ථික වර්ධනය පැත්තෙන් ගත්තත් අද හොඳ දිශාවක් තිබෙන්නේ.

උද්ධමනයේදී මිල පාලනය කිරීම කියන කාරණය ගත්තත්, අපි කවුරුත් දන්නවා කලින් ආණ්ඩුව අර්බුදයට ගිය වෙලාවේ රුපියල් 100කට මිලදී ගන්න භාණ්ඩ ගන්න රුපියල් 170ක්, 180ක් මට්ටමට ගිය බව. ඒකට තමයි උද්ධමනය සියයට 70කින්, 80කින් වැඩි වුණා කිව්වේ. එම නිසා අපට මොකක්ද කරන්න පුළුවන් වුණේ? මේ ස්ථාවරත්වය ඇතුළේ විශ්වාසය ගොඩනැඟුණාට පස්සේ ඒ විධියට වෙළෙඳ පොළේ මිල අසාමාන්‍ය ලෙස ඉහළ ගියේ නැහැ. අපි මූල්‍ය විනය නිසි පරිදි පෙන්වුවා. අපි වෙළෙඳ පොළට අනවශ්‍ය විධියට මුදල් මුද්‍රා හැරියේ නැහැ.

ඒ වාගේම තමයි, ව්‍යාපාරිකයන්ගේ වෙළෙඳ පොළේ හැසිරීම.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
අන්න ඒ ස්ථායිකරණය ඇතුළේ අපට පුළුවන් වුණා උද්ධමනය පාලනය කර ගන්න. ඒ කොතෙක්ද කියනවා නම්, අපේ ආණ්ඩුව යටතේ මේ අගෝස්තු, සැප්තැම්බර් මාස වන කල්ම උද්ධමනය තිබුණේ සියයට බින්දුව හෝ ආසන්න වශයෙන් ඉතා කුඩා සෘණ අගයක. ඒ කියන්නේ උද්ධමනය පාලනය කිරීම මඟින් මිල උච්චාවචනය අවම වෙලා. දැන් යම් ආකාරයක පුංචි උද්ධමනයක් පැවතීම හොඳයි. ඒකත් අපි උද්ධමනය පාලනය කිරීමේ, වැඩසටහන් රාමුවක් ඇතුළේ ක්‍රියාත්මක වෙන්නේ. 2023 -2026 ඇතුළේ නම්‍යශීලී උද්ධමන ඉලක්කයක් - flexible inflation target එකක්- ඇතුළේ වැඩ කරන්නේ. ඒ ඉලක්කය සියයට 5යි. ඒ කියන්නේ, සියයට 5කට අඩු උද්ධමනයක් හෝ සියයට 5ක උද්ධමනයක් පවත්වාගෙන යනවා නම් ආර්ථිකය හරියට වර්ධනය වනවා. ඒ තත්ත්වය අපි අත්පත් කර ගෙන තිබෙන්නේ සියයට 5ට අඩුවෙන් උද්ධමනය පවත්වාගෙන යැමෙන්. ඒ කියන්නේ, සියයට 1.2ක උද්ධමනයක් පවත්වාගෙන යැමෙන්. ඒ වාගේම ආදායම් ලබා ගැනීමේ තත්ත්වයත් ඉතාම ඉහළ මට්ටමක තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසන් කරන්න කලින් විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, තත්ත්වය යථාවත් කරගෙන අපේ ප්‍රගතිය පෙන්වනකොට අපට සිද්ධ වුණා අතරමඟ නවත්වපු ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් පටන් ගන්න. ඒවාත් හදා ගනිමින් අපේ ආර්ථික ගමන් මාර්ගයත් කියන ඒ ඔක්කෝම එකට යන්න ඕනෑ. වංචාවටත්, දූෂණයටත් පහර ගසමින් මේ කරුණු කාරණා සියල්ල එකට ගෙන යන්නයි තිබුණේ. ඒ අනුව අපි මෑතකදී පටන් ගත්තා මධ්‍යම අධිවේගී මාර්ගයේ වැඩ. ඒක නවතා දමා තිබූ ව්‍යාපෘතියක්. ඒ කඩවත - මීරිගම කොටස. එහි ප්‍රධාන කොටස් දෙකක් තිබෙනවා. මෙහිදී විපක්ෂය වැරදි තොරතුරු සමාජගත කරනවා. එතැනදී අපට සිද්ධ වුණා කොන්ත්‍රාත්කරුවන් එක්ක විශාල negotiation එකකට ගිහින් නැවත ඒ කොන්ත්‍රාත්තුව පවත්වාගෙන යැමේ කාර්යයට එන්න. ඔවුන් කොන්ත්‍රාත්තුව අත්සන් කරලා අවුරුදු පහකට ආසන්න කාලයක් මුදල් හොයා ගන්නේ නැතුව ඒ කොන්ත්‍රාත්තුව වසරෙන් වසර දීර්ඝ කරගෙන ඇවිල්ලා තිබෙනවා එක වගන්තියක්වත් වෙනස් කරන්නේ නැතුව. එම නිසා අපට සැකයක් තිබෙනවා, වංචාවක් හෝ දූෂණයක් කළාද කියලා. ඩොලර්වලින් වියදම් කරන ඒවා මාරු කිරීම පැරණි අනුපාතයට, ඒ කියන්නේ රුපියල් 135ට යොදලා තිබුණා. ඒ ගිවිසුම ක්‍රියාත්මක වෙමින් තිබුණේ. නමුත්, අපේ ආණ්ඩුව ආවාම අපි ඒක අහෝසි කළා නම් නඩු කටයුතුවලට යන්න සිදු වනවා. ඒ සඳහා තවත් දීර්ඝ කාලයක් යන නිසා, ඒ පාඩුවත් දරමින් අපි ඉදිරියට ගියා. ඒ අනුව මාර්ගයේ පළමු කොටසත් අපි බේරා ගත්තා. හැබැයි, යම් පාඩුවක් දරන්න සිද්ධ වුණා.

දෙවැනි කොටස සඳහා China Exim Bank එක සමඟ ඇති කර ගත් ගනුදෙනුවේදී සමාජගත කළා, අපි වැඩි පොලියට ණය ගත්තා කියලා. ඒක සම්පූර්ණයෙන් වැරදියි. මොකද, China Exim Bank එක තවදුරටත් ස්ථාවර පොලී අනුපාතයක් යටතේ ණය දෙන්නේ නැහැ. අපි වෙහෙස මහන්සි වෙලා, සාකච්ඡා කරලා, මුදල් අමාත්‍යාංශය චීනයට ගිහින් සාකච්ඡා කරලා එකඟ වුණා ඉතාම වාසිදායක පොලී අනුපාතයක් යටතේ ණය ගන්න. සාමාන්‍යයෙන් ඔවුන් වෙළෙඳ පොළේ පවතින පොලී අනුපාතයට යම් කොටසක්, අධිභාරයක් - premium එකක් - එකතු කරලායි ණය දෙන්නේ.

ඒත් දැන් අපි එකඟ වෙලා තිබෙනවා, ඒ දෙන පොලී අනුපාතයෙන් අපට දශම 8ක වට්ටමක් - discount එකක් - ලබා ගන්න. දැනට චීනයේ මේ පොලී අනුපාතය සියයට 3.5ක් වාගේ ගණනක තිබෙන්නේ. එයින් දශම 8ක් අඩු කළාම, සියයට 2.7යි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු අමාත්‍යතුමනි.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මට තව තත්පර කිහිපයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ අනුව, මේ පවතින තත්ත්වයට සාපේක්ෂව වාසිදායක තත්ත්වයකට මේ සියල්ල අපි ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම නව සංවර්ධන ව්‍යාපෘති ඉදිරියේදී එන්න ඉඩ තිබෙනවා. මේ සියලු කාරණා සැලකිල්ලට භාජන කළාම මම කියන්න කැමතියි, අපේ මේ කෙටි කාලය ඇගයීමට ලක් කළ යුතු වන්නේ මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ හුදෙකලාව වෙන් කරලා තිබෙන කෑල්ලක් දෙකක් අරගෙන නොවෙයි කියන එක. සමස්තයක් වශයෙන් අපි

[ගරු ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

මනුෂ්‍යත්වය ඉහළින් ඔසවා තැබීම වෙනුවෙන්, මනුෂ්‍යත්වයට එරෙහිව සිදු වෙන සියලු ක්‍රියාකාරකම් නවතා දැමීම වෙනුවෙන්, දූෂ්පත්කම තුරන් කිරීම වෙනුවෙන්, මුළු රටම ව්‍යසනයක් ලෙස වෙලා ගෙන තිබෙන මත්ද්‍රව්‍ය උවදුරෙන් රට සදාකාලිකව බේරා ගැනීම වෙනුවෙන්, අපරාධ මැඩ පැවැත්වීම වෙනුවෙන්, වංචා හා දූෂණ සම්පූර්ණයෙන්ම නැවැත්වීම වෙනුවෙන්, සැමට සතුටින් ජීවත් විය හැකි සමාජයක් බවට මේ සමාජය පරිවර්තනය කරන්නේ කොහොමද කියන කාරණය වෙනුවෙන්, අපට ජනතාව ලබා දුන්න ජනවරම පාවිච්චි කරලා තිබෙන්නේ කොහොමද, පාවිච්චි කරමින් තිබෙන්නේ කොහොමද කියන කාරණා අත්හදා බැලීම තමයි ඉතාම වැදගත් වෙන්නේ. ඒ අතින් අපි නිවැරදිවම මේ ගමන් මාර්ගයේ යනවා. සැබෑ ලෙසම, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" වෙනුවෙන් අපි මේ සමාජය පරිවර්තනය කරනවා කියන කාරණය මා සඳහන් කරනවා.

බොහොම ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.30]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு ஒதுக்கப்பட்ட 8 நிமிடத்தையும் தயவுசெய்து தருமாறு கேட்டுக் கொள்கிறேன்.

இலங்கையிலே கட்டமைக்கப்பட்ட இன அழிப்புக்கும் பௌத்த மயமாக்கலுக்கும் மிகவும் மோசமாக உட்படுத்தப் படுகின்ற மாவட்டங்களில் முதலாவதாகவும், அபிவிருத்தியிலே கடைசி நிலையிலும் தொடர்ந்தும் தக்கவைக்கப்படும் முல்லைத்தீவு மாவட்டத்தைச் சார்பாக்கும் ஒரு பாராளுமன்ற உறுப்பினர் நான். படையினரை அதிகம் கொண்ட இந்த மாவட்டத்தில்தான் காடுகளுக்குள்ளும் ஆற்றங்கரைகளிலும் சட்டவிரோதமாக மணல் களவாடப்பட்டு, எமது நிலம் சூறையாடப்படுகிறது. காடுகள் பாதுகாக்கப்பட்டுச் சூழலியல் சுற்றுலா நடைமுறைபடுத்தப்படும் இதே தீவிலேதான் இன்றும் சட்டவிரோதமாக எமது காடுகள் அழிக்கப்பட்டு எமது வளங்கள் வேறுறுக்கப்படுகின்றன. சொந்த நிலத்தில் பயிரிடப் போகும் தமிழர்களை வழக்குகள் போட்டுச் சிறைப்படுத்தும் வனவளத் திணைக்களம், சட்டவிரோத காடழிப்பு மற்றும் மணல் கொள்ளை தொடர்பில் வாய்மூடி மௌனம் காக்கின்றது.

இருந்தாலும், காலாகாலமாகப் பௌத்தமயமாக்கலில் மட்டும் கரிசனைகொண்ட அரசுகளிலிருந்து வேறுபட்டு, உங்களுடைய அரசு முல்லைத்தீவின் அபிவிருத்தியையும் சற்று கருதுகிறது. இவ்வாண்டுக்கான வெட்டுவாய்க்கால் பாலக் கட்டுமானம், சாலைகள் மேம்பாடு, அடுத்தாண்டில் தொடங்க வுள்ள கொக்கிளாய் - புல்மோட்டைப் பாலக்கட்டுமானமென எங்களின் கோரல்களை நீங்கள் கருத்தில் கொள்வதை வரவேற்கின்றோம். எனினும், இன்னமும் உங்களால் எங்களது மாவட்டத்தில் கவனிக்கப்படாத பக்கங்கள் எண்ணிறந்தவை! இறுதிப் போரில் பேரிழப்பை உயிரிலும் உடைமையிலும் அங்கங்களிலும் தாங்கி வாழும் முல்லைத்தீவு நெய்தல், மருதம், குறிஞ்சி, முல்லை என நால்வகை நிலங்களையும் கொண்ட எழில் நிறைந்த மாவட்டம்! போருக்குப் பின்னரான அபிவிருத்தியில் மிகவும் பின்தங்கிய நிலையில் உள்ள இம்மாவட்டத்தின் பசுமை நிறைந்த இயற்கை வனப்பு, நீர்நிலைகள், வரலாற்றுச் சிறப்புமிக்க இடங்கள், பண்பாட்டு வளங்கள் முல்லைத்தீவு மாவட்டத்தை ஒரு சிறந்த சுற்றுலாத் தளமாக மாற்றும் திறன்கொண்டன. இருப்பினும், அதன் கவன ஈர்ப்புக்கு அடிப்படை வசதிகளின் பற்றாக்குறை, சந்தைப் படுத்தலில் உள்ள சவால், பாதுகாப்பு மற்றும் கண்ணிவெடி சார்ந்த பிரச்சினைகள், வடக்கும் தெற்கும் கொள்ளும் போர் சார்ந்த முரண் மனப்பாங்கு, உள்நாட்டு, வெளிநாட்டு முதலீட்டாளர்களின் குன்றிய முதலீடுகள் உள்ளிட்டவை சவாலாகின்றன.

இயற்கை வனப்போடு இணைந்த சுற்றுலாத் தளங்களுக்கான வாய்ப்புகள் இங்கு நிறைவாக உள்ள நிலையிலும் அவற்றை அணுகுவதற்கு ஏற்ற போக்குவரத்து வசதிகள் மிகவும் குறைவாக உள்ளன. பல சுற்றுலாத் தளங்களுக்குப் பொதுப் போக்குவரத்து வசதிகள் இல்லை. உணவகங்கள், கழிவறைகள் உள்ளிட்ட அடிப்படை வசதிகள் இல்லை. முக்கிய சுற்றுலா இடங்கள் பற்றிய காட்சிப் படுத்தல்கள் சார்ந்த பன்னாட்டு ஊடகப்படுத்தல் இல்லை. தன்னார்வலர்களின் முக்கிய குறிப்புகளைத் தாண்டி, அரசின் சிரத்தை ஆக்கபூர்வமானதாக இல்லை. சுற்றுலாப் பயணிகளுக்கான பாதுகாப்பு உட்கட்டமைப்பு வசதிகள் இல்லை. தேசிய கண்ணிவெடிச் செயற்பாட்டு மையத்தின் 2023ஆம் ஆண்டுக்கான அறிக்கைக்கு அமைவாக, இலங்கையில் அதிகூடிய வெடிபொருட்களைக் கொண்ட மாவட்டமாக முல்லைத்தீவு அடையாளப்படுத்தப்பட்டு உள்ளது. எனவே, இன்னும் அங்கு அகற்றப்படாதுள்ள வெடிபொருட்கள் மிகவும் விரைவாக அகற்றப்பட்டு, மக்களின் பாதுகாப்பான நடமாடுகையை அரசு உறுதிசெய்தல் வேண்டும்.

விடுதலைப் புலிகள் பயன்படுத்திய நீர்மூழ்கிகள் மற்றும் வாகனங்களைப் போர் வெற்றி நினைவுச் சின்னங்களாகப் பார்வைக்கு வைத்திருக்கும் அரசு, பத்தாண்டுகளுக்கும் மேலாகப் பல்லாயிரக்கணக்கான தமிழ் மக்கள் கூடி அஞ்சலிக்கும் முள்ளிவாய்க்கால் நினைவேந்தலுக்கான தளத்தை அமைப்பதற்கான அனுமதியைத் தர முன்வரவில்லை. உங்களின் போர் வெற்றிச் சின்னங்களை இங்குள்ள எந்தவோர் ஈழத் தமிழரும் பார்க்க வருவதும் இல்லை; பார்த்து வியப்பதும் இல்லை. எங்கள்மீது நடாத்தப்பட்ட இனப் படுகொலையைத் தாங்கியே அச்சின்னங்கள் காணப்படு கின்றன. யுத்தம் நிறைவடைந்து பதினைந்து ஆண்டுகள் கடந்தும் இன்றளவும் இங்குள்ள மக்கள் போராடுகிறார்கள்; தங்கள் நிலத்துக்கும் வழிபாட்டு உரிமைக்கும் உங்களால் காணாமலாக்கப்பட்ட உறவுகளுக்காகவும் போராடுகிறார்கள். தொடர்ந்தும் தகிக்கின்றவாறு இந்த மண்ணை நீங்கள் கையாள்வதால்தான் இங்குள்ள பாதுகாப்பு நிலைப்பாட்டின் மீது உள்நாட்டு மற்றும் வெளிநாட்டு முதலீட்டாளர்கள் அச்சம் கொள்கின்றனர்; முல்லைத்தீவில் முதலிடத் தயங்குகின்றனர்.

இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபையின் மீளாய்விலுள்ள 2024ஆம் ஆண்டுக்குரிய வருடாந்தப் புள்ளி விபரவியல் அறிக்கையின்படி, கடந்த ஆண்டுடன் ஒப்பிடுகை யில் சுற்றுலாப் பயணிகளின் வருகை 38.07%ஆல் அதிகரித்துள்ளமையை அறிய முடிகிறது. இவ்வறிக்கையில் மாகாணங்களுக்கு இடையிலான சுற்றுலாப் பரம்பலின் கடுமையான சமமற்ற நிலையும் சுட்டிக்காட்டப்படுகிறது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්

**ගරු තුරෙෙරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
தயவுசெய்து எனக்கு மேலும் ஒரு நிமிடம் தாருங்கள்!

மாகாணங்களுக்கு இடையில் சுற்றுலாப் பயணிகளின் பாய்ச்சலைக் கணக்கிடுதல் கடினம். எனினும், சுற்றுலாத் தங்குமிடங்களின் பரவலின் அடிப்படையில் இத்தீவின் மொத்தச் சுற்றுலாத் தங்குமிடங்களின் 36% மேல் மாகாணத் திலும், 25.5% தென் மாகாணத்திலும், 2%ஐ அண்மிக்கும் தங்குமிடங்கள் வட மாகாணத்திலும் காணப்படுவதை இனங்காண முடிகிறது. மாவட்ட வாரியாக அதிகூடிய 20% சுற்றுலா விடுதிகளைக் கொண்டதாகக் கொழும்பும், அதிகுறைந்ததாக வன்னியும் காணப்படுகிறது. ஒட்டுமொத்தச் சுற்றுலா விடுதிகளில் முல்லைத்தீவு மற்றும் கிளிநொச்சி 0.1% ஐயும், மன்னார் 0.08%ஐயும், வவுனியா 0.2%ஐயும், யாழ்ப்பாணம் 1.3%ஐயும் கொண்டுள்ளது. ஆகவே, தயவுசெய்து சுற்றுலாத் தளங்களை எங்களுடைய முல்லைத்தீவு மாவட்டத்திலும் அமைத்து, சுற்றுலா அபிவிருத்தியைப் பேணி, நல்ல முறையில் அதைச் செயற்படுத்த வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.37]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනට විපක්ෂය අපෙන් මේ විවාදය ඉල්ලුවේ මැතිවරණයේදී ජාතික ජන බලවේගය ඉදිරිපත් කළ පොරොන්දු, කරුණු කාරණා, අපේ ප්‍රතිපත්ති ඉටු කිරීම පිළිබඳව සාකච්ඡා කරන්නටයි. ඒගොල්ලන්ට අවශ්‍ය වුණේ අපි ඉටු නොකරන පොරොන්දු පිළිබඳව සාකච්ඡා කරන්නයි. නමුත් අපට පේනවා, සුපුරුදු පරිදි අදත් විපක්ෂයේ ආසන හිස් බව. යෝජනාව ස්ථිර කළ මන්ත්‍රීවරයාවත් මෙතැන නැහැ. නමුත් ආණ්ඩුවේ කාර්යභාරය අපි කළ යුතුයි. අපි මේ ආණ්ඩුව පිහිටුවා දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. අපි ඉදිරිපත් කළ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු ක්‍රියාමාර්ග එකින් එක ඉටු කරමින් යන මොහොතක තමයි මේ සාකච්ඡාව ගන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපිට මූලිකම අභියෝගය වෙලා තිබුණේ මේ රට වෙළාගෙන තිබුණු දූෂණයට, වංචාවට, නාස්තියට එරෙහිව කටයුතු කිරීමයි. මෙතෙක් පැවැති පාලනයන් නොයෙක් ආකාරයේ ඥාති සංග්‍රහ මඟින් තමන්ගේ හිතවතුන්ට නොයෙක් වරදාන දීම නැවැත්වීම සහ දුර්වල රාජ්‍ය කළමනාකරණය නිසා රාජ්‍ය සේවයේ බිඳ වැටීම නැවත ගොඩනැංවීම තමයි අපේ බලාපොරොත්තුව වුණේ. මෙන්න මේවා නැවත නිවැරදි කරන්න තමයි ජාතික ජන බලවේගයේ අපට පසුගිය අවුරුද්ද තුළ මැදිහත් වෙන්න සිද්ධ වුණේ. ඒ නිසා අපි දූෂණයට, වංචාවට ලැබුණු ඉඩ නැති කරන්නට හැකි තරම් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. අපරාධ මර්දනය කරන්න ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය භාවිතය අවම කරන්නට ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. ඉදිරියටත් අපි ඒ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනවා. අපට තිබුණු අභියෝගවලට මුහුණ දීම තමයි අපි මේ කරමින් සිටින්නේ.

නමුත් අපේ විපක්ෂයේ මන්ත්‍රීවරු සුපුරුදු විධියට හැම දාම කථා කරන කරුණු හුවා දක්වමින් ආණ්ඩුව පොරොන්දු ඉටු නොකළ බවට කියන්නට උත්සාහ කළා. කිසිම විද්‍යාත්මක හැදෑරීමකින් තොරව තමයි මෙතුමන්ලා මේ කරුණු ඉදිරිපත් කළේ. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ කථිකයින් ඉදිරිපත් කළ කරුණුවලට සවන් දීමටවත් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට උනන්දුවක් තිබුණේ නැහැ.

හැබැයි, ආයතන දෙකක් කටයුතු කරලා තිබෙන ආකාරය අපි දැක්කා. පැෆ්රල් ආයතනය සහ "මාර්තු 12 ව්‍යාපාරය" ආණ්ඩුවේ ප්‍රතිපත්ති පිළිබඳව ඉතාම හොඳ විශ්ලේෂණයක යෙදෙන්නට උත්සාහ කරලා තිබුණු ආකාරය. ඒගොල්ලන් ඉතාම නිවැරදිව, කැබිනට් එක ගන්න තීරණ, අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන පනත් කෙටුම්පත් සහ අපි ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කරමින් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉතාම හොඳින් විශ්ලේෂණය කරමින් ඉන්නවා. ඉදිරියටත් ඒ අය එම කටයුත්ත කරනවා.

ඒ වාගේම වෙරිටේ රිසර්ච් ආයතනයත් ඒ කාර්යයම කරමින් ඉන්නවා. අපේ වැඩ කටයුතු ඉදිරියට කරගෙන යන්නේ කොහොමද කියලා ආණ්ඩුවට ඉගෙන ගන්න ඒ සාධනීය විවේචන සහ සාධනීය කරුණු වැදගත් වෙයි කියලා අපි හිතනවා. පැෆ්රල් ආයතනය, "මාර්තු 12 ව්‍යාපාරය" තුළින් අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අඩංගු "පරිසමාප්ත ජීවිතයක් - සුවපහසු රටක්" කියන මාතෘකාව යටතේ ක්‍රියාමාර්ග 335ක් පිළිබඳව සොයා බලමින් ඉන්නවා; "ගෞරවනීය ජීවිතයක් - සුරක්ෂිත රටක්" කියන මාතෘකාව යටතේ ක්‍රියාමාර්ග 181ක් නිරීක්ෂණය කරමින් ඉන්නවා; "නවීන ජීවිතයක් - පොහොසත් රටක්" කියන මාතෘකාව යටතේ ක්‍රියාමාර්ග 604ක් නිරීක්ෂණය කරමින් ඉන්නවා. "අභිමානවත් ජීවිතයක් - නොසැලෙන රටක්" කියන මාතෘකාව යටතේ ක්‍රියාමාර්ග 213ක් නිරීක්ෂණය කරමින් ඉන්නවා; අපිත් එක්ක සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ ආකාරයට අපි ඉදිරිපත් කර තිබෙන ක්‍රියාමාර්ග 1,333ක් සම්බන්ධයෙන් පැෆ්රල් සංවිධානය සහ "මාර්තු 12 ව්‍යාපාරය" නිරීක්ෂණය කරමින්, අපිත් සමඟ සාකච්ඡා කරමින් අපේ මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට උදවු වෙමින් ඉන්නවා. ඇත්තටම ඒක සාධනීය කාරණයක්. නමුත්, අපි බලාපොරොත්තු වුණු ආකාරයට විපක්ෂය ඒ කාර්යය ඉෂ්ට කරන්නේ නැහැ කියන එක තමයි අද ඔවුන් තහවුරු කර තිබෙන්නේ. ඒ නිසා අපට සිද්ධ වෙනවා, මින් ඉදිරියටත් මේ ආයතනත් සමඟ කටයුතු කරමින් අපේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳව විශ්ලේෂණයක යෙදෙන්න.

ඒ වාගේම උපයන විට ගෙවීමේ බද්ද සංශෝධනය කිරීම පිළිබඳව වෙරිටේ රිසර්ච් ආයතනය විසින් කළ විශ්ලේෂණයකදී වාර්තා කර තිබෙනවා, "එය ඉටු කර ඇත" කියලා. 2025 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන 2025 අංක 2 දරන දේශීය ආදායම් පනත මඟින් බදු කාණ්ඩ සංශෝධනය කර ඇති අතර, උපයන විට ගෙවීමේ බද්ද සහ බදු සීමාව රුපියල් 100,000 සිට 150,000 දක්වා වැඩි කර ඇත, ඒ වාගේම අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට රුපියල් 10,000ක් හෝ ඊට වැඩි සහනාධාර මුදලක් ලබා දීමේ සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ අර්ධ වශයෙන් ඉටු කර තිබෙනවා කියලායි ඒ වෙලාවේ වාර්තා කර තිබෙන්නේ. නමුත්, අපි තවදුරටත් අස්වැසුම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව විමසිලිමත් වෙමින්, නිරීක්ෂණය කරමින් අභියාචනා පිළිබඳව සැලකිලිමත් වෙමින් ඒ කාර්යය ඉෂ්ට කරමින් ඉන්නවා. ඒ වාගේම ජොෂ්ඨ

[ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා]

පුරවැසියන්ට රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දීමේ වැඩ පිළිවෙළත් අර්ධ වශයෙන් ඉටු කර තිබෙනවා කියලායි එහි වාර්තා කර තිබෙන්නේ. ඒ කියන්නේ, පසුගිය සැප්තැම්බර් මාසයේ ලද ජයග්‍රහණයෙන් පසුව රුපියල් 3,000යි අපි වැඩි කළේ. ඒ නිසා තමයි 'අර්ධ වශයෙන්' යනුවෙන් සඳහන් කරන්නේ. ආධාර අවශ්‍ය නිදන්ගත රෝග සහිත පුද්ගලයන්ට අවම වශයෙන් මසකට රුපියල් 10,000ක මූල්‍යාධාරයක් සපයනවා. ඒක රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා 2025 අප්‍රේල් මස සිට වැඩි කරලා තිබෙනවා. ඒ නිසා එයත් අප ඉටු කර තිබෙන බව වෙරිටේ රිසර්ච් ආයතනය වාර්තා කර තිබෙනවා.

ඊළඟට, ජීවන වියදමට සරිලන ලෙස කඳුකර වතු කම්කරුවන්ගේ වැටුප ඉහළ නැංවීම ගැන ඒගොල්ලන් වාර්තා කර තිබෙන්නේ, 'අර්ධ වශයෙන් ඉටු කරමින් සිටී' කියලා. ඒ වාගේම තර්කානුකූලව වෙන් කරන අමාත්‍යාංශ 25කට ඇමතිවරුන් 25ක් සහ අනුරූපී නියෝජ්‍ය ඇමතිවරුන් පත් කිරීම සහ රාජ්‍ය ඇමති ධුර අහෝසි කිරීම පිළිබඳවත් වෙරිටේ රිසර්ච් ආයතනය වාර්තා කර තිබෙනවා. ජාතික ජන බලවේගයේ අපි ඉදිරිපත් කරපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රතිපත්ති පිළිබඳව විද්‍යාත්මක විශ්ලේෂණයක් කරමින්, අපේ පොරොන්දු ඉටු කිරීම පිළිබඳව ඔවුන් ජනතාවට කරුණු ඉදිරිපත් කරමින් සිටිනවා. ජාතික ජන බලවේගය රජයේ අපි සෑහෙන පරිශ්‍රමයක් දරලා තමයි මේ ප්‍රතිපත්ති ප්‍රකාශනය සකස් කළේ. අපේ ජාතික විද්වත් සංවිධානය සකස් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනය 2019 මැතිවරණයට ඉදිරිපත් කළා. ඉන් පසුව 2024 මැතිවරණයටත් ඉදිරිපත් කළා. ඒ ප්‍රතිපත්ති ප්‍රකාශනය අපේ ආණ්ඩුව දිගින් දිගටම ක්‍රියාත්මක කරලා ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කරන්න ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මොහොමඩ් නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.46]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபை தேர்தல் இல்லாத ஒரு தேர்தல் பிரசார மேடையாக மாறிவிட்டதை நான் காணுகின்றேன். මැතිවරණයක් නැති මැතිවරණ ප්‍රචාරක රැළියක්. මම තනි වෙලා. මේ පාක්ෂිකයන් දෙදෙනා නොහිටියා නම් මම හුදෙකලාවේ තමයි. කමක් නැහැ, කඩවුණු පොරොන්දුවක් ගැන තමයි මම කථා කරන්න හිටියේ. ඊට අදාළ කාරණා කිහිපයක් මම දෙමළ භාෂාවෙන්ම කියන්නම්.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களைப் பொறுத்தவரை இந்த அரசாங்கம் மாகாண சபைத் தேர்தலை நடத்தவில்லை என்பதை நேற்றும் சொன்னோம், இன்றும் சொல்கிறோம், நாளையும் சொல்லத்தான் போகின்றோம். நீங்கள் பொருளாதார ரீதியாகச் சில வெற்றிகளைப் பெற்றுள்ளதாகவும் ஊழலை ஒழிப்பதற்காக நடவடிக்கை எடுத்து வருவதாகவும் திரும்பத் திரும்பக் கூறினாலும்கூட, வடக்கு, கிழக்கு மாகாணங்களை, முஸ்லிம் சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் ஒரு கட்சியின் செயலாளர் என்ற வகையிலும், அந்தப் பிரதேசத்தைச் சேர்ந்தவனென்ற முறையிலும் மாகாண சபைத் தேர்தல் பற்றி நான் பேசிக்கொண்டே இருப்பேன்.

கௌரவ அமைச்சர் லால் காந்த அவர்கள் பேசும்போது, "அவசரப்படத் தேவையில்லை. இந்த வருடம்தான் ஒரு தேர்தல் நடைபெற்றது. மக்கள் மத்தியில் அரசாங்கம் எவ்வளவு ஜனரஞ்சகமாக இருக்கின்றது என்பதை நிரூபிப்பதற்கு வருடத்துக்கு ஒரு தேர்தலை நடத்துவது போதுமானது. எனவே, அடுத்த வருடம் மாகாண சபைத் தேர்தலை நடத்தலாம்" என்று தெரிவித்திருந்தார்.

ගරු ලාල් කාන්ත ඇමතිතුමා කිව්වා, අවුරුද්දෙන් අවුරුද්දට මැතිවරණ පවත්වන්න ඕනෑ නැහැ, ආණ්ඩුව කොච්චර ජනප්‍රියද කියලා පෙන්වන්න ඊළඟ අවුරුද්දේ මැතිවරණය පැවැත්වූවාම ඇති කියලා. "ඒක විපක්ෂයටත් හොඳයි, එතකොට ඒගොල්ලන්ටත් තේරුම් ගන්න පුළුවන්, ආණ්ඩුව කුමන ස්ථානයේද ඉන්නේ කියලා" යනුවෙන් එතුමා කිව්වා. ඒක සම්පූර්ණයෙන්ම වැරදි මතයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා ඉල්ලන්නේ, NPP පක්ෂය - NPP රජය - දිනනවාද, සජබ දිනනවාද, Sri Lanka Muslim Congress එක දිනනවාද, ITAK පක්ෂය දිනනවාද කියන කාරණයට නොවෙයි. අපට ඒක අදාළ නැහැ. මෙතැනදී අදාළ වෙන්නේ, ජනතාවට තමන්ගේ ඡන්ද අයිතිය පාවිච්චි කරලා, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පිහිටුවූ පළාත් සභාවලට අවම බලතල බෙදා දී, ජනතාවගේ නියෝජිතයන් හරහා පළාත් සභා පාලනය විය යුතුයි කියන එකම හේතුවයි. මම ඒ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරන්න ඕනෑ.

நாங்கள் மாகாண சபைத் தேர்தலை நடத்துமாறு கேட்பது, அதில் யார் வெற்றி பெறப்போகிறார்கள் என்ற அடிப்படையில் அல்ல; அது எங்களுக்கு matter கிடையாது; it is not relevant to us. ஆனால், அரசியல் யாப்பில் இருக்கின்ற குறைந்தபட்ச அதிகாரப் பரவலாக்கலுக்காகப் பதின்மூன்றாவது திருத்தச் சட்டத்தினூடாகக் கொண்டுவரப்பட்ட மாகாண சபைகளுக்கு மக்களுடைய பிரதிநிதிகள் தெரிவுசெய்யப்பட வேண்டு மென்பது எமது அவா. அதற்கு எந்தக் கட்சியைச் சேர்ந்தவர்கள் வரவேண்டுமெனத் தீர்மானிப்பது எங்களுடைய கையில் இல்லை, அது மக்களுடைய கையில்! அதை அவர்களே தீர்மானிப்பார்கள். இதில் NPP-JVP வென்றாலும், ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸ் வென்றாலும், SJB வென்றாலும், மற்றைய கட்சிகள் வென்றாலும் அது மக்களுடைய தீர்ப்பு! அதை நாங்கள் ஏற்றுக் கொள்வோம். ஆனால், உங்களுடைய ஒவ்வொரு பிரசார மேடையிலும் மாகாண சபைத் தேர்தலை நடத்துவோமென நீங்கள் சொன்னீர்கள். அது மாத்திரமல்ல, ஜனாதிபதி அவர்களும் இந்தச் சபையில் வைத்து அதைச் சொன்னார். ஆகவே, நீங்கள் அதை நடத்த வேண்டும். இந்த விடயத்தில் நீங்கள் எந்தவிதமான பொய்ச் சாட்டையும் கூற முடியாது.

இன்னுமொரு விடயத்தையிட்டு நான் கவலை யடைகிறேன், அதில் எந்தளவு உண்மை, பொய் இருக்கின்ற தென எனக்குத் தெரியாது. இது BBCஇன் ஒரு documentaryஇல் சொல்லப்பட்டது. அதாவது, அடுத்த வருடம் தேர்தல் ஆணைக்குழுவுக்கு 6 பில்லியன் ரூபாய் தான் ஒதுக்கப் பட்டிருப்பதாகச் சொல்லப்பட்டது.

I hope it is wrong, that only Rs. 6 billion has been allocated to the Election Commission. It cannot be

because for the Provincial Councils Election, we need at least, I believe, Rs. 10 billion. So, maybe, it is wrong and I wish it is wrong. I believe this Government would allocate sufficient funds to the Election Commission so that they could hold the election next year under whatever law we could pass or under the old system. நான் இந்தக் கருத்தை முதலாவதாக முன்வைக்கின்றேன்.

அடுத்து, நுரைச்சோலை வீட்டுத் திட்டம் பற்றி சொல்ல வேண்டும். என்னுடைய சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ உதுமாலெப்பை அவர்களும் இதுபற்றி பேசியிருந்தார். இது சம்பந்தமாகவும் ஒரு பிழையான கருத்து இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
கௌரவ தலைமைதங்கும் உறுப்பினர் அவர்களே, நான் முடித்துக் கொள்கிறேன். நுரைச்சோலை வீட்டுத்திட்டத்தை ஏற்கனவே, உயர் நீதிமன்ற தீர்ப்பின் காரணமாக, அவை அந்த மாவட்டத்தின் இன விகிதாசாரத்தின் அடிப்படையில் கொடுக்கப்பட வேண்டுமென்ற புதிய கோஷம் எழுந்திருக்கின்றது.

නොරොච්චෝල නිවාස ක්‍රමය රුපියල් බිලියන ගණනක් වියදම් කරලා හදලා, ඒක ප්‍රයෝජනයක් ගන්න බැරි තත්ත්වයට පත් වුණාම ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව පදනම් කරගෙන, "කමක් නැහැ, දිස්ත්‍රික්කයේ තිබෙන ජන අනුපාතය අනුව ලබා දීමට ක්‍රියා කරමු" කියන ස්ථාවරයට ඇවිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙරත් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් හා අභියාචනාධිකරණයෙන් දෙන ලද තීන්දු වෙනස් කිරීම සඳහා පාර්ලිමේන්තුව මෙය නීතිගත කරලා තිබෙනවා. මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. Revocation of Irrevocable Deeds of Gifts (Special Provisions) Act කියලා එකක් තිබුණා. ඒ කියන්නේ, නැවත අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු අවලංගු කිරීම සඳහා අධිකරණය මඟින් නියෝගයක් ගන්න ඕනෑ කියන ප්‍රතිපාදනය, එසේ නොවිය හැකියි, අධිකරණයට නොගිහිනුත් ඒක අවලංගු කරන්න පුළුවන් කියලා නඩු තීන්දුවක් තිබුණා. මට මතක විධියට, ඒක ශිරාණි තිලකවර්ධන විනිශ්චයකාරතුමියගේ නඩු තීන්දුවක්. පාර්ලිමේන්තුවේ පනතක් මඟින් ඒක වෙනස් කළා. නොරොච්චෝල නිවාස ක්‍රමය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම් අම්පාර දිස්ත්‍රික්කයේ සුනාමියෙන් බලපෑමට ලක් වූ සියලු ජන කොටස්වලට ඒවා ලබා දෙන්න, ප්‍රශ්නයක් නැහැ. நுரைச்சோலை வீட்டுத் திட்டம் தொடர்பில் வழக்கை ஒரு சாட்டாக இங்கே சொல்லத் தேவையில்லை. நாங்கள் அதற்கான ஒரு சட்டமூலத்தைக் கொண்டுவந்து, அம்பாறை மாவட்டத்தில் சுனாமியால் பாதிக்கப்பட்ட அனைத்து மக்களுக்கு அவற்றை வழங்குவோம். அவ்வாறு வழங்கும் போது யார் யார் எல்லாம் அதற்காகத் தகுதி பெறுகிறார்களோ, அவர்கள் எந்தச் சமூகமாக இருந்தாலும் கொடுப்போம். ஏனென்றால், கரையோரப் பகுதியிலுள்ள தமிழ் பேசுகின்ற தமிழ், முஸ்லிம் மக்கள்தான் அதிகமாகப் பாதிக்கப்பட்டார்கள். பொத்துவில் பகுதியில் உள்ள சிங்கள மக்களும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். பாதிக்கப்பட்ட மக்களுக்குத்தான் அது வழங்கப்பட வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Hon. Presiding Member, I am winding up.

இந்தச் சூழ்நிலையில், இப்படியொரு சந்தர்ப்பத்தை வழங்கியதற்கு நன்றியைத் தெரிவித்து, விடைபெறுகிறேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.54]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින මෙම විවාදයේ මාතෘකාව තෝරා ගැනීම පිළිබඳව අපි විපක්ෂයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මොකද, අනෙක් අය වාගේ නොවෙයි, අපි මේ අවුරුද්ද තුළ වැඩ කරලා තිබෙනවා, ඒ නිසා අපිට කියන්න දේවල් තිබෙනවා. මගේ සහෝදර මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියලා ඉතා පැහැදිලිව පෙන්වූවා, රටේ ආර්ථික ස්ථාවරත්වය, අදූෂිත දේශපාලන සංස්කෘතියේ පැමිණීම, නාස්තිය අවම වීම ආදී සියල්ල. නමුත්, තව වැදගත් දෙයක් කියන්න තිබෙනවා. අපි නිතරම දකින දෙයක් තිබෙනවා. මේ විපක්ෂය හරි පව්. ඒකට හේතුව, ඒගොල්ලන් වෙනම මානසික ආතතියකින් ඉන්නවා, මේ ආණ්ඩුව වැටුණේ නැත්නම් අපිට මොනවා වෙයිද කියලා භයකින්. හැමදාම මොනවා හරි එකක් මවමින් භය වෙවී ඉන්නවා. කථාවක් තිබෙනවා නේ, එළුවාගේ මොකක්ද එකක් වැටෙයි කියලා බලාගෙන එළුවා පස්සේ යන නරියෙක් ගැන. අන්න ඒ වාගේ තමයි, මේ විපක්ෂය හැසිරෙන්නේ. ඒ වුණාට මේ ආණ්ඩුව වැටෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ලේඛනය කියවන්නම්. මේක අද මේ මොහොතේදී වෙච්ච දෙයක්. "IMF staff and the Sri Lankan authorities have reached staff-level agreement on economic policies to conclude the Fifth Review of Sri Lanka's reform programme supported by the IMF's Extended Fund Facility. Once the review is approved by the IMF Executive Board, Sri Lanka will have access to about US Dollars 347 million..." මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? පස්වැනි staff-level agreement එක ඇවිල්ලා තිබෙනවා. මේ දක්වා IMF එක හිතුවාටත් වඩා හොඳ ආර්ථික recovery එකක්, programme එකක්, progress එකක් මේ ආණ්ඩුව පෙන්වනවා. මේ staff-level agreement එක යටතේත් අපි ඒ දක්වා වැඩ කරනවා. අපි මේ විධායක මණ්ඩලය මුණගැසෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඔවුන් මේ මුදල

[ගරු නිතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

දෙසැම්බර් 31වන දාට කලින් අනුමත කරයි කියලා. ඒ නිසා, "මේ ආර්ථිකය වැටෙනවා, පෝලිම් එනවා, මේගොල්ලන්ට බැහැ" කියපු අයට අපට කියන්න තිබෙන්නේ මෙච්චරයි, ගිහිල්ලා මොළේ පරීක්ෂා කරවා ගන්න. හැබැයි දැන් තිබෙන්නේ වෙනත් තත්ත්වයක්. දැන් තිබෙන්නේ මොකක්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ, නීති හදන තැන. ඒ කියන්නේ ව්‍යවස්ථාදායකය. මෙතැනට නීතියක්, අණපනතක් ගෙනාවාම අපි විවාද කරන්නේ ඇයි? අපි විවාද කරන හැම දෙයම හැන්සාඩ්ගත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, යම් නීතියක් ගැන අධිකරණයට පවා යම් මතයක් ගන්න ඕනෑ නම් ඒගොල්ලන් බලන්නේ හැන්සාඩ් වාර්තාව. ඒ, මොකද? ඒ නීතිය ගෙනෙන්න පාදක වෙච්ච ව්‍යවස්ථාදායකයේ චේතනාව - thinking එක - හොයනවා. අපි වුණත් උසාවියේදී පරණ හැන්සාඩ් වාර්තා බලනවා. ඔය 1960 ගණන්වල, 1970 ගණන්වල හැන්සාඩ් වාර්තාවල තිබෙන්නේ ඉතාම සාරවත් -හරවත්- සාකච්ඡා. මේ වර්තමාන විපක්ෂයට පින්සිද්ධ වෙන්න දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? "අරූ හොරා, මූ හොරා" කියලා උදේ පාන්දර YouTube කෑලි ටික එනවා. එහෙම නැත්නම් ලෝකයට බිල්ලෙක් මවනවා. පනත ගැන වචනයක් කථා කරන්නේ නැහැ. සම්පූර්ණයෙන්ම අසභ්‍ය දේශපාලන සංස්කෘතියක් විපක්ෂය විසින් මේ පාර්ලිමේන්තුව තුළ නඩත්තු කරනවා. පාර්ලිමේන්තුවේ Privileges පාවිච්චි කරලා, එළියේ කියන්න බැරි පව් අට්ටි පිටින් අත්හරිනවා. මිනිසුන්ව අපහාසයට ලක් කරනවා. ඒ මදිවාට රජයේ විමර්ශනවලටත් බාධා වන දේවල් පවා අද මේ පාර්ලිමේන්තුවේදී කියැවෙනවා. මෙන්න මේ දුෂ්ට, දූෂිත වුවමනාව තිබෙනකල් විපක්ෂයකට කවදාවත් සාධනීය ලෙස ආණ්ඩුකරණයකට සහාය වෙන්න හෝ සාධාරණ විවේචන ඉදිරිපත් කරන්න හැකියාවක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක විපක්ෂයක් නොවෙයි, ආඩි හත්දෙනාගේ කැඳ හැළිය වාගේ එකක්. මෙලෝ හසරක් නැහැ, බිම ගහපු පොල් මල, පුවක් මල වාගේ කෑලි කැඩිලා ගිහිල්ලා. මේ රට වැටෙනකල් බලාගෙන ඉන්න කුහක නින්දිතයෝ ටිකක් තමයි මේ විපක්ෂයේ ඉන්නේ. දැන් නම් දෙදෙනෙක් හැරුණුකොට අනෙක් එක්කෙනෙක්වත් සභාවේ නැහැ.

අපි මොනවාද කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අපි කරපු දේවල් මම කියන්නම්. දැන් පාතාල සාමාජිකයෝ අල්ලනවා; ඔවුන් මැරෙන්නේ නැහැ; ආයුධ පෙන්වන්න ගෙන යන්නේ නැහැ. ඔවුන් දේශපාලනඥයන්ගේ නම් වමාරනවා. තාජුඩීන්ගේ ඝාතනය ගැන තොරතුරු එළියට එනවා. පාස්කු ප්‍රහාරය ගැන තොරතුරු එළියට එනවා. ඒ දවස්වල පාතාල සාමාජිකයෝ අල්ලා ගත්තාම මරනවා. මොකද, එතකොට තමයි දේශපාලනඥයා බේරුණේ. අද අපේ ආණ්ඩුව ආයුධ පෙන්වන්න ගෙන ගිහිල්ලා මිනිස්සු මරන්නේ නැහැ. අන්න ඒ නිසා දැන් දේශපාලන පවුල්වල නම් එළියට එනවා. අපි පාතාල සාමාජිකයෝ අල්ලනකොට, කුඩු අල්ලනකොට කලබල වෙන්නේ, මැදමූලන. ඒවාට හේතු තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද රවී සෙනෙවිරත්නට පහර ගහනවා. Bribery Commission එකේ රංග දිසානායකට පහර ගහනවා. ඇයි ඒ? මෙච්චර කාලයක් නොතිබිච්ච දේවල් අපි මේ රටට ගෙනාවා. ඒක තමයි, නීතියේ විධානයේ ආධිපත්‍යය. හැමෝම නීතියට යටත්. අන්න ඒ තත්ත්වය අපි ගෙනාවා. අධිකරණ සේවා කොමිෂන් සභාවට, ප්‍රීති පද්මන් සූරසේන ගරු අග්‍ර විනිශ්චයකාරතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමා විසින් අපි පොරොන්දු වෙච්ච දේවල් කීයක් දැන් කරලා අරගෙන තිබෙනවාද? අංක 1 තමයි, sudden court inspections. වර්තමානයේදී විනිශ්චයකාරතුමන්ලාත් නීතියට යටත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. He has started sudden court inspections. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් හදිසි අධිකරණ පරීක්ෂණ ගණනාවක් දැන් එතුමා විමර්ශන කරලා, අවශ්‍ය විනය ක්‍රියාමාර්ග අරගෙන, ඉවත් කරන්න ඕනෑ අය ඉවත් කරලා තිබෙනවා. මීට කලින් මේ රටේ එහෙම වුණාද? නැහැ. අපි ස්තුතිවන්ත වෙනවා, ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමාට, ඒ කරන ක්‍රියාවලිය සම්බන්ධයෙන්.

ඊළඟට, නඩු විශාල සංඛ්‍යාවක් පවතින සංචාරක අධිකරණ හඳුනාගෙන ඒවා ස්ථිර අධිකරණ බවට පත් කරන්න අපි කටයුතු කරනවා. අධිකරණ පද්ධතිය මුල් වතාවට ඩිජිටල්කරණය කිරීම සඳහා ගරු අගවිනිසුරුතුමා විසින් ආරම්භ කර ඇති ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට අපි අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඉන්නවා. මට මේ ඔක්කෝම කියන්න වෙලාවක් නැහැ. ඒ නිසා කිහිපයක් මම මේ කියන්නේ. ඒ වාගේම 2024 ජනවාරි සිට 2025 සැප්තැම්බර් දක්වා නඩු කටයුතු ප්‍රමාදවීම් හා විනිශ්චයකාරවරුන්ට, අධිකරණ කාර්ය මණ්ඩලයට එරෙහිව ලැබී ඇති පැමිණිලි, පෙත්සම් 650කට වැඩි ප්‍රමාණයකට අදාළව තීන්දු තීරණ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම තවත් දුක්ගැනවිලි රාශියකට අදාළව පියවර ගනිමින් ඉන්නවා. මොකද, අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාවට තමයි පරමාධිපත්‍ය බලය තිබෙන්නේ කියන කාරණාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වනවිට අණපනත් රාශියක් ගෙනැවිත් තිබෙනවා. ඒ අණපනත්වලට අමතරව තවත් පනත් 60 ගණනක් මේ අවස්ථාවේදී කමිටු මට්ටමේ තිබෙනවා. අන්තර්ජාතික පිළිගැනීම්වලට අවශ්‍ය විධියට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, Online Safety Act වාගේ ඒවා සම්බන්ධව අපි කටයුතු කරනවා. ඒ අනුව, මේගොල්ලන් අවුරුදු 50ක් හිටියත් කරන්නේ නැති දේවල් මේ අවුරුද්ද තුළ අපි කරලා තිබෙනවා. මා ඉතා ගෞරවයෙන් කියා සිටිනවා, මේ රජය විසින් මේ ගෙන යන වැඩ පිළිවෙළ හරහා අපේ මේ ඉතිරි අවුරුදු 4 අවසන් වෙනකොට තවත් අවුරුදු 5කට මේ රටේ මිනිස්සු අපට බලය දෙන බව. මොකද, එකක් අපේ දක්ෂතාව. අනෙක, ඇත්තටම අද විපක්ෂයක් නැහැ; ඉන්න එකටත් හොඳටම පිස්සු. එහෙනුත් ගැහුවා නේද අත්පුඩියක්? නැහැ, ඒ අපේ කට්ටිය නේද? *[බාධා කිරීමක්]* No, not you, Hon. Kariapper. Sorry! - *[Interruption.]*

ඔව්. අපි දන්නවා, අපට ජනතාව සලකන විධිය. මොකද, අපි අනෙක් කට්ටිය වාගේ හැංගිලා ඉන්නේ නැහැ. අපි පාර තොටේ ඇවිදිනවා, සුපර් මාර්කට් එකට යනවා. ඇවිල්ලා මොකක්ද කියන්නේ? "ඇමතිතුමා, සන්තෝෂයි ඔය විධියට ඉන්නවාට. අලුත් සංස්කෘතියක්, අපි ඒකට කැමැතියි. ආණ්ඩුව හොඳයි, වැඩ හොඳයි. තව පොඩ්ඩක් මහන්සි වෙලා වැඩ කරන්න. හොරු ටික තවම එළියේ" කියනවා. අපි කියනවා, "හරි, බොහොම ස්තුතියි. පිළිගත්තා, අපි වැඩේ කරන්නම්" කියලා. ඒ නිසා මතක තබා ගන්න, අද මේ ආණ්ඩුව විවේචනය කරන කිසි කෙනෙකුට මේ ආණ්ඩුව වට්ටන්න වුවමනාවක් නැහැ. ඒගොල්ලන් කියන්නේ භාර ගත්ත වැඩේ තව ටිකක් හොඳට කරමු කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ හේතුව නිසා තමයි අපි අධිකරණ සේවා කොමිෂන් සභාවත් එක්ක කථා කරලා අලුතින් අධිකරණ දෙකක්, විශේෂයෙන්ම අල්ලස් නඩු අහන්න අවශ්‍ය අධිකරණ දෙකක් ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙන්නේ. දැනටත් ඒ සඳහා වෙනම සුවිශේෂී අධිකරණයක් පිහිටෙව්වා. අධිකරණ තුනක අල්ලස් හා දූෂණ වංචා නඩු අහන්න අපි කටයුතු කරනවා. මේ රටේ නඩු ඉක්මනට අහනවා. නඩු අහලා අධිකරණයෙන් තීන්දු දෙයි. දැන් සමහරු - නැහැ, කෙළින්ම නම කියලාම කියමු- "නාමල් රාජපක්ෂගේ කට වැඩියි, භය නැහැ. ඇයි මෙහෙම?" කියලා අහනවා. මම කිව්වා,

"නැහැ, ඔහුට අයිතියක් තිබෙනවා කථා කරන්න" කියලා. එතකොට, "බලන්නකෝ භය නැතිව කථා කරන හැටි" කියනවා. මම කිව්වා, කනත්තක් ළඟින් යනකොට ඔවුන් අසභ්‍ය වචන කියන්නේ භය නැතිකම නිසා නොවෙයි, භයට කියලා. මට නාමල් මහත්මයා දකිනකොට ඒක තමයි මතක් වෙන්නේ. කමක් නැහැ, පොඩ්ඩක් කෑ ගහමින් ඉන්න. අපේ දේශපාලන පළිගැනීම් නැහැ. නඩු අහයි, ඒවාට උත්තර දෙන්න. ඔබතුමන්ලා කැමැති දෙයක් කර ගන්න. ජාතික ජන බලවේගයට ජය වේවා!

*එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.*

*පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.02ට, 2025 ඔක්තෝබර් 10වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.*

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.02க்கு, பாராளுமன்றம் 2025 ஒக்ரோபர் 10, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.02 p.m. until 9.30 a.m. on Friday, 10th October, 2025.*

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### කැබිනට් අමාත්‍යාංශ සඳහා පත් කරන ලද උපදේශකයන්: විස්තර
### அமைச்சரவை அமைச்சுகளுக்காக நியமிக்கப்பட்டுள்ள ஆலோசகர்கள்: விபரம்
### ADVISERS APPOINTED TO CABINET MINISTRIES: DETAILS

543/2025

**1. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) කැබිනට් අමාත්‍යාංශ සඳහා පත් කර ඇති මුළු උපදේශකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් උපදේශකයාගේ නම, පත් කරන ලද දිනය, අධ්‍යාපන සුදුසුකම්, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු, ඔහුට/ඇයට වාහන ලබා දී තිබේ නම් වාහනයේ අංකය, වාහනයේ වර්ගය, වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව, ඔහුට/ඇයට කාර්යාලයක් ලබා දී තිබේ නම් එම කාර්යාලය පිහිටි ස්ථානය සහ එම කාර්යාලය සඳහා ගෙවනු ලබන මාසික කුලිය එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சுகளுக்காக நியமிக்கப்பட்டுள்ள ஆலோசகர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அத்தகைய ஒவ்வோர் ஆலோசகரின் பெயர், நியமிக்கப்பட்ட திகதி, கல்வித் தகைமைகள், செலுத்தப்படுகின்ற மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப்பனவுகள், முந்தைய சேவை நிலையங்கள் மற்றும் வகித்துள்ள பதவிகள், குறித்த நபருக்கு வாகனம் வழங்கப் பட்டிருப்பின், வாகன இலக்கம், வாகனத்தின் வகை, வாகனத்துக்காக வழங்கப்படுகின்ற மாதாந்த எரிபொருள் கொடுப்பனவு, குறித்த நபருக்கு அலுவலகமொன்று வழங்கப் பட்டிருப்பின் அந்த அலுவலகம் அமைந்துள்ள இடம் மற்றும் அந்த அலுவலகத்துக்காகச் செலுத்தப்படுகின்ற மாதாந்த வாடகை ஒவ்வோர் அமைச்சு வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) total number of advisers appointed to the Cabinet Ministries; and

(ii) name, the date of appointment, educational qualifications, monthly salary and allowances paid, previous places of work and positions held in respect of each of the aforesaid advisers, the vehicle number, type of vehicle and the monthly fuel allowance paid for the vehicle of each of the aforesaid advisers if he/she has been provided with vehicles and the location of the office and the monthly rent paid for the office if he/she has been provided with an office, separately according to each Ministry?

(b) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ)(අ) (i) මේ වන විට අමාත්‍යාංශ 10ක් සඳහා උපදේශකවරු 37දෙනෙකු පත් කර ඇත. එම උපදේශකවරු පත් කර ඇති ආකාරය අමාත්‍යාංශ අනුව වෙන් වෙන් වශයෙන් අමුණුම 01හි* දක්වා ඇත.

---

** පුස්තකාලයේ තබා ඇත.*
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහතා]

එම උපදේශකවරු පත් කර නොමැති අමාත්‍යාංශ ලැයිස්තුව ඇමුණුම 02හි* දක්වා ඇත.

(ii) අමාත්‍යාංශ අනුව පත් කර ඇති ඉහත උපදේශකවරුන්ගේ තොරතුරු ඇමුණුම 03A සිට 03J* දක්වා වෙන් වෙන් වශයෙන් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) தற்போது 10 அமைச்சுகளுக்கு 37 ஆலோசகர்கள் நியமிக்கப்பட்டுள்ளனர். அந்த ஆலோசகர்கள் நியமிக்கப்பட்டுள்ள விதம் அமைச்சு வாரியாக வெவ்வேறாக இணைப்பு 01*இல் குறிப்பிடப் பட்டுள்ளது.

ஆலோசகர்கள் நியமிக்கப்படாத அமைச்சுகளின் பட்டியல் இணைப்பு 02*இல் குறிப்பிடப் பட்டுள்ளது.

(ii) அமைச்சு வாரியாக நியமிக்கப்பட்டுள்ள ஆலோசகர்களின் மேற்குறித்த தகவல்கள் இணைப்பு 03A முதல் 03J* வரை வெவ் வேறாகக் குறிப்பிடப்பட்டுள்ளன.

(ஆ) ஏற்புடையதல்ல.

(a) (i) Thirty Seven (37) advisers had been appointed to 10 Ministries so far. The manner in which these advisers had been appointed, in accordance to the Ministries, is given separately in Annex 01*.

The list of Ministries to which advisers have not been appointed is given in Annex 02*.

(ii) The above information on the advisers appointed, in accordance to the Ministries, is given separately in Annexes 03 A to 03 J*.

(b) Does not arise.

## නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය: විස්තර
### பிரதி அமைச்சர்களின் தனிப்பட்ட பணியாட்டொகுதி: விபரம்
### PERSONAL STAFF OF DEPUTY MINISTERS: DETAILS

545/2025

**2. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත් කර ඇති එක් එක් නිලධාරියාගේ නම,ලිපිනය, පත් කරන ලද දිනය, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, එම වැටුප පෞද්ගලික බැංකු ගිණුමකට බැර නොවන්නේ නම් එය බැර කරනු ලබන බැංකුව, ගෙවනු ලබන වෙනත් දීමනා, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් එම වාහනයේ අංකය, වාහනයේ වර්ගය සහ වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) பிரதி அமைச்சர் ஒருவரின் தனிப்பட்ட பணியாட் டொகுதிக்காக அங்கீகரிக்கப்பட்ட அலுவலர் களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அப்பிரதி அமைச்சர்கள் ஒவ்வொருவருடைய தனிப்பட்ட பணியாட்டொகுதிக்கும் நியமனம் செய்யப்பட்ட ஒவ்வோர் அலுவலரினதும் பெயர், முகவரி, நியமனம் செய்யப்பட்ட திகதி, செலுத்தப்படும் மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப்பனவுகள், அச்சம்பளம் தனிப்பட்ட வங்கிக் கணக்குக்கு வைப்பிடப்படாவிடின், அவை வைப்பிடப்படும் வங்கி, செலுத்தப்படும் ஏனைய கொடுப்பனவுகள், அவ்வலுவலர் களுக்கு வாகனங்கள் வழங்கப்பட்டிருப்பின், அவ்வாகனத்தின் இலக்கம், வாகனத்தின் வகை மற்றும் அவ்வாகனத்துக்காக மாதாந்தம் செலுத் தப்படும் எரிபொருள் கொடுப்பனவுகள் என்பன ஒவ்வோர் அமைச்சு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of officers approved for the personal staff of a Deputy Minister; and

(ii) name, the address, the date of appointment, monthly salary and allowances paid, the bank to which the salary is credited, if such salary is not credited to a personal bank account, other allowances paid and the number and the make of the vehicle and the monthly fuel allowance if a vehicle is assigned to her/him, in respect of each of the officers who had been appointed to the personal staff of each Deputy Minister, separately, according to each Ministry?

(b) If not, why?

* * *පුස්තකාලයේ තබා ඇත.*
* * *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** *Placed in the Library.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ)(ඇ) (i) 12කි.

(ii) විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සහ බලශක්ති අමාත්‍යාංශය සඳහා නියෝජ්‍ය අමාත්‍යවරුන් පත් කර නොමැති අතර, නියෝජ්‍ය අමාත්‍යවරු පත් කර ඇති අමාත්‍යාංශ 22හි තොරතුරු ඇමුණුම් 01 සිට 22* මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) 12.

(ii) விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சு, வலுசக்தி அமைச்சு ஆகியவற்றுக்காக பிரதி அமைச்சர்கள் நியமிக்கப்படவில்லை என்ப துடன், பிரதி அமைச்சர்கள் நியமிக்கப்பட்டுள்ள 22 அமைச்சுகள் பற்றிய தகவல்கள் இணைப்பு 01 முதல் 22* வரை குறிப்பிடப்பட்டுள்ளன.

(ஆ) ஏற்புடையதல்ல.

(a) (i) 12.

(ii) Deputy Ministers have not been appointed to the Ministry of Science and Technology and the Ministry of Energy, and the information regarding the 22 Ministries for which Deputy Ministers had been appointed is given in Annexes 01 to 22*.

(b) Does not arise.

## කැබිනට් අමාත්‍යවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය: විස්තර

### அமைச்சரவை அமைச்சர்களின் தனிப்பட்ட பணியாட்டொகுதி: விபரம்

### PERSONAL STAFF OF CABINET MINISTERS: DETAILS

546/2025

**3. ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු වන අමාත්‍යවරයකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා පත් කර ඇති එක් එක් නිලධාරියාගේ නම,ලිපිනය, පත් කරන ලද දිනය, ගෙවනු ලබන මාසික වැටුප හා දීමනා, එම වැටුප පෞද්ගලික බැංකු ගිණුමකට බැර නොවන්නේ නම් එය බැර කරනු ලබන බැංකුව, ගෙවනු ලබන වෙනත් දීමනා, ඔහුට/ඇයට වාහන ලබාදී තිබේ නම් එම වාහනයේ අංකය, වාහනයේ වර්ගය සහ වාහනය වෙනුවෙන් ලබා දෙන මාසික ඉන්ධන දීමනාව එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சர் ஒருவரின் தனிப்பட்ட பணியாட்டொகுதிக்காக அங்கீகரிக்கப்பட்ட அலுவலர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி அமைச்சர்கள் ஒவ்வொருவருடைய தனிப்பட்ட பணியாட்டொகுதிக்கும் நியமனம் செய்யப்பட்ட ஒவ்வோர் அலுவலரினதும் பெயர், முகவரி, நியமனம் செய்யப்பட்ட திகதி, செலுத் தப்படும் மாதாந்தச் சம்பளம் மற்றும் கொடுப் பனவுகள், அச்சம்பளம் தனிப்பட்ட வங்கிக் கணக்குக்கு வைப்பிடப்படாவிடின், அவை வைப்பிடப்படும் வங்கி, செலுத்தப்படும் ஏனைய கொடுப்பனவுகள், அவ்வலுவலர் களுக்கு வாகனங்கள் வழங்கப்பட்டிருப்பின், அவ்வாகனத்தின் இலக்கம், வாகனத்தின் வகை மற்றும் அவ்வாகனத்துக்காக மாதாந்தம் செலுத்தப்படும் எரிபொருள் கொடுப்பனவுகள் என்பன ஒவ்வோர் அமைச்சு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House the -

(i) number of officers approved for the personal staff of a Minister of the Cabinet of Ministers; and

(ii) name, the address, the date of appointment, monthly salary and allowances paid, the bank to which the salary is credited, if such salary is not credited to a personal bank account, other allowances paid, the number and the make of the vehicle and the monthly fuel allowance if a vehicle is assigned to him/her, in respect of each of the officers who had been appointed to the personal staff of each Minister of Cabinet of Ministers, separately, according to each Ministry?

(b) If not, why?

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

(අ) (i) 15කි.

(ii) ආරක්ෂක අමාත්‍යාංශය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යන අමාත්‍යාංශයන් හි අමාත්‍යවරුන් සඳහා පෞද්ගලික කාර්ය මණ්ඩලයක් පත් කර නොමැති අතර, අමාත්‍යවරයා සඳහා පෞද්ගලික කාර්ය මණ්ඩලයක් පත් කර ඇති අමාත්‍යාංශ 21හි තොරතුරු ඇමුණුම් 01 සිට 21* මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

(அ) (i) 15.

(ii) பாதுகாப்பு அமைச்சு, நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு மற்றும் டிஜிட்டல் பொருளாதார அமைச்சு ஆகியவற்றின் அமைச்சர்களுக்குத் தனிப்பட்ட பணியாட்டொகுதி நியமிக்கப்படவில்லை என்பதுடன், அமைச்சருக்கான தனிப்பட்ட பணியாட்டொகுதி நியமிக்கப்பட்டுள்ள 21 அமைச்சுகள் பற்றிய தகவல்கள் இணைப்பு 01 முதல் 21* வரை குறிப்பிடப்பட்டுள்ளன.

(ஆ) ஏற்புடையதல்ல.

(i) 15.

(ii) A personal staff has not been appointed for the Ministers of the Ministry of Defence, the Ministry of Finance, Planning and Economic Development and the Ministry of Digital Economy, and the information regarding the 21 Ministries for which a personal staff had been appointed for the respective Minister is given in Annexes 01 to 21*.

(b) Does not arise.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.